# පහන් කණුව ධර්ම දේශනා

## 6 - වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# පහන් කණුව
# ධර්ම දේශනා

*සයවන වෙළුම*

ISBN 955 - 1255 - 06 - 02

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

ප්‍රකාශනය
ධර්මග්‍රන්ථ මුද්‍රණභාරය

2006



ධම්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2006

පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
   'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.
2. රෝයල් ඉන්ස්ටිටියුට්,
   191, හැව්ලොක් පාර,
   කොළඹ 5.
3. ඩී. ටී. වේරගල මහතා
   422, වැලිපාර, තලවතුගොඩ.
4. අනුර රූපසිංහ මහතා
   27, කොළඹ වීදිය, මහනුවර
5. මහා භාරකාර දෙපාර්තමේන්තුව
   2, බුලර්ස් පටුමග,
   කොළඹ 07.

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැහිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
දුරකතනය: 011-4302312

'සබ්බපාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං
එතං බුද්ධානසාසනං'

බුද්ධවග්ග, ධම්මපද

හැම පවින් වැළැකුම
කුසල් වෙතටම එළැඹුම
සිත පිරිසිදු කැරුම
සස්න මෙයමැයි හැම බුදුන්ගෙම



## පටුන

පිටු

හැඳින්වීම v

ප්‍රකාශක නිවේදනය viii

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය x

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින්
පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායකවීම xi

අමා ගඟ xii

26. 'යො වදතං පවරො මනුජෙසු' 4

27. 'අප්පමාදරතො භික්ඛු' 28

28. 'යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති' 56

29. 'උට්ඨානකාලම්හි අනුට්ඨහානො' 82

30. 'පණ්ඩුපලාසොව දානිසි' 108

# හැඳින්වීම

දහම් දන හැමදන්ම පරදයි
දහම්රස හැම රසම පරදයි
දම් ඇලුම හැම ඇලුම් පරදයි
නිවන් සුව හැමදුක්ම පරදයි

අනුත්තර ධර්මරාජයාණන් වහන්සේගේ ධර්මවිජයට අරමුණුවූයේ දෙව් මිනිසුන්ගේ චිත්ත සන්තානයයි. අනාදිමත් කාලයක් තුළ මෝහයෙන් මුළාවී සසර දුක් ගින්නෙන් දැවෙමින් සිටින ලෝ සතුන්ගේ සිත් සතන් දහම් අමා දහරින් සිසිල් කර අමා මහ නිවනින් නිවා සුවපත් කිරීම ඒ මහා කාරුණිකයාණන් වහන්සේගේ ධර්මවිජය පරමාර්ථය විය. දුක් ගිනි වඩන දිග්විජය වෙනුවට දුක් ගිනි නිවන ධර්මවිජයක් බුදුපියාණන් වහන්සේ ලෝකයාට හඳුන්වා දුන්හ.

ධර්මදානය අන් හැම දානයකටම වඩා උතුම් වන්නේ සිතකට වැටෙන දහම් පදයකින් පූර්ණ ජීවිත පරිවර්තනයක් පවා සිදුවිය හැකි බැවිනි. බාහිර වස්තු දානයෙන් සැළසෙන තාවකාලික සහනය මෙන් නොව, එය සනාතන සැනසුමකට මහ හෙළිකරයි. මොහාතකට දිවගට දැනී-නොදැනී යන ආමිස රසය මෙන් නොව, නිරාමිස දහම් රසය අසහනය දුරුකොට සිත් සනහන ගැඹුරු අර්ථ රසයකි. සසර වඩන ගේහසිත ඇලුම් මෙන් නොව, ලොවුතුරු දහමට ඇති ඇල්ම සසර ගමන කෙටිකරයි. තණ්හා පිපාසය සන්හිඳුවන අමා මහ නිවන සියලු සසර දුක් නිවාරණය කරයි.

'නිවනේ නිවීම' පොත් පෙළෙන්* අප දියත් කළ ධර්මදාන වැඩ පිළිවෙළෙහි දෙවැනි අදියර වශයෙන් මේ **'පහන් කණුව ධර්ම දේශනා'** පොත් පෙළ එළි දකී. මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි යෝගාවචර සඟපිරිස හමුවේ අප විසින් දේශනා කරන්නට යෙදුන දෙසුම් **33** ක් රැගත් යටකී පොත් පෙළට වඩා සරල අන්දමින්. ජන ජීවිතයේ එදිනෙදා ගැටළුවලට එල්ල කොට දෙසන ලද බැවින් මෙම ධර්මදේශනා මාලාව බොහෝ දෙනෙකුට වැඩදායක වනු ඇතැයි සිතමු. සසරදුක් ලියලවන විවිධ විෂම දෘෂ්ටි

---



මතවාදයන්ගෙන් ගැවසීගත් පොත් පත් සහරා 'සහරාවක' අතරමංව සිටින වත්මන් පාඨක සමාජයට මේ තුළින් ලොවුතුරු මඟට යම් 'තරු සළකුණක්' හෝ ලැබෙතොත් අප දැරූ උත්සාහය සඵල වූ ලෙස සළකමු.

'ආනුපුබ්බී කථා' නම් වූ අනුපිළිවෙළ කථාමාර්ගයක් අනුගමනය කරමින් දහම් දෙසූ බුදු පියාණෝ එවැනිම 'අනුපිළිවෙළ කථාවක්' ධර්මදේශකයින්ට අනුදැන වදාළහ. දාන කථාව, සීල කථාව, සග්ග කථාව, කාමයන්ගේ ආදීනව හා නෙක්ඛම්මයෙහි ආනිසංස ඒ අනුපිළිවෙළ කථාවට අයත්වේ. ඒ සියල්ල තුළින් සකස් වූ, මෘදුවූ, පුබුදුවූ. පහන්වූ සිතට චතුරාර්යසත්‍ය දේශනාව මැනවින් විෂය වේ. දේශනා විලාස වශයෙන් සළකන කල, බුද්ධ දේශනාවෙහි ඉස්මතුව පෙනෙන ආදර්ශවත් අංග සතරක්ද ඇත. එනම්, උපමා, නිදර්ශන, ආදියෙන් ධර්ම කරුණු සන්දර්ශනය කිරීම ('සන්දස්සෙති') සිත් කාවදින අන්දමින් එත්තු ගන්වාලීම (සමාදපෙති) ඒවා ප්‍රතිපත්තියට නැංවීමෙහිලා උත්සාහවත් කිරීම (සමුත්තෙජෙති) සහ අසන්නන්ගේ සිත්සතන් ප්‍රසාදයට පත්කිරීමයි (සම්පහංසෙති).

ධර්මපදයෙන් තෝරාගත් ගාථා මාතෘකා කොටගෙන පැවැත්වෙන මෙම දෙසුම් පෙළෙහිදීද හැකිතාක් දුරට ඉහත සඳහන් මූලධර්ම අනුගමනය කිරීමට තැත් දැරුවෙමු. බුද්ධෝත්පාද කාලයක ලැබිය හැකි අග්‍රඵලය වන අර්හත් ඵලයෙන්ම දේශනාවක් කුළුගැන්වීමට උනන්දු වීමු. වෙනත් සුලභ ලෞකික පරමාර්ථ තුළ අසන්නන් සිරකොට නොතබා, බුදුපියාණන් වහන්සේ වදාළ අප්‍රමාද පදය සිහිගන්වමින් සංසාර විමුක්තිය දෙසටම ඔවුන් යොමු කරවීම අපගේ පරම අධ්‍යාශය විය. 'පහන් කණුවෙන්' විහිදෙන මෙම ධර්මාලෝකයෙන් ලෝකයාට නිවන් මඟ හෙළි පෙහෙළි වේවා!

මෙම 'පහන් කණුව ධර්මදේශනා' පොත් පෙළද, 'නිවනේ නිවීම' දෙසුම් පෙළ එළිදැක්වීම උදෙසා කොළඹ හැව්ලොක් පාරේ 'රෝයල් ඉන්ස්ටිටියුට්හි' පින්වත් ජී.ටී. බණ්ඩාර මහතා විසින් මහාභාරකාර දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලද 'ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරය' මගින් මුද්‍රණය කරවීමට මහාභාරකාර තැන්පත් යූ. මාපා මහතා තීරණය කිරීම අපට මහත් ධෛර්යයක් විය. අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා පාඨකයින් අතට පත්කිරීමේ අප ප්‍රතිපත්තියට දිරිදෙන ඒ පින්වත් මහතුන් දෙපොළටත්, මේ සත්කෘත්‍යයට සහාය දීමට මේතාක් ඉදිරිපත්වූ පරිත්‍යාගශීලී හැම පින්වතුන්ටත්. පටිගත කළ 'පහන් කණුව' දෙසුම් පිටපත් කරදීමේ කාර්යයට සහාය වන පින්වත් ඒ.එස්.වයි. අබේවර්ධන මහතාට සහ අනුලා හිඳගොඩ, එම්. නාගහවත්ත, ජයන්ති රණවීර යන මහත්මීන්ටත්, දෙන දේ පිරිසිදුව දීමට ශෝභන ලෙස මුද්‍රණ කටයුතු නිම කරන, සීමාසහිත කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ

අධ්‍යක්ෂක මහතුන්ට හා කාර්‍ය මණ්ඩලයටත් අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ. ඒ හැම දෙනාටම මෙම ධර්මදානමය කුශලය පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම හේතුවාසනා වේවායි පතමු.

'චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මාසම්බුද්ධ සාසනං'

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර
දේවාලේගම
(2542) 1999 පෙබරවාරි 12



# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශන මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 5ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත්

බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය



# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමඟ බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.



සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

**පහන් කණුව ධර්ම දේශනා - සවන වෙළුම**

**(ප්‍රථම මුද්‍රණය)**

මෙම ධර්ම ග්‍රන්ථය සදහම් පිපාසිතයින් අතට පත්කිරීම උදෙසා කාලය, ධනය, ශ්‍රමය ශාසන දයාවෙන් පරිත්‍යාග කළ සැමදෙනාටම අමිල වූ ධර්මය නොමිලයේ බෙදාදීමෙන් ජනිත කුශල ශක්තිය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස හේතු වාසනා වේවා! යි පතමු.

- සම්පාදක
(2550) 2006 මැයි

# 26 වන දේශනය

# 26 වන දේශනය

**'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'**

**'යො වදතං පවරො මනුජෙසු**
**සක්‍යමුනී භගවා කතකිච්චො**
**පාරගතො බලවිරිය සමංගී**
**තං සුගතං සරණත්තමුපෙමි**

**රාග විරාගමනෙජමසොකං**
**ධම්මමසංඛතමප්පටිකූලං**
**මධුරමිමං පගුණං සුවිභත්තං**
**ධම්මමිමං සරණත්තමුපෙමි**

**යත්‍ථ ච දින්න මහප්ඵලමාහු**
**චතූසු සුචීසු පුරිසයුගෙසු**
**අට්ඨ ච පුග්ගල ධම්මදසා තෙ**
**සංඝමිමං සරණත්තමුපෙමි**

**- ඡත්ත මානවක විමානවත්‍ථු**

සැදැහැවත් පින්වතුනි,

තෙරුවන් සරණ යාමත් ශීල සමාදානයත් මේ ශාසනයේ ආරම්භක පියවරක් පමණයි. එහෙම නමුත් ඒ සරණ ගමන මාත්‍රයකින්මත් අශ්වර්යවත් ආනිශංස ලබාගත හැකිවීම තුණුරුවන්ගේ අනුභාවසම්පන්න බවට සාධකයක්. සරණ ශීල මාත්‍රයෙන්ම සුගතිගාමී වුනු සැදැහැවතුන් ගැන ධර්ම සාහිත්‍යයේ කොතෙකුත් සදහන් වෙනවා. ඡත්ත මානවකයා පිළිබඳ කථාන්තරය ඒ වගේ එකක්.

තිලෝගුරු බුදුපියාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වාසය කරන කාලයේ සේතව්‍යා නුවර ඡත්ත කියන බ්‍රාහ්මණ තරුණයෙක්, බ්‍රාහ්මණ මානවකයෙක්, උක්කට්ඨා නුවර පොක්ඛරසාති කියන බ්‍රාහ්මණ

ආචාර්යවරයා වෙත ගිහිල්ලා ශාස්ත්‍ර ඉගෙන ගෙන අවසාන කරලා ආපසු තමාගේ මව්පියන් දකින්න සේතව්‍යා නුවරට ඇවිල්ලා ගුරුපඬුරු වශයෙන් දහසක් කහවණු අරගෙන නැවතත් තමාගේ ගුරුවරයා හමුවීමට යමින් සිටියා. එදා උදෑසන බුදුපියාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියෙන් ලෝකය බලා වදරණකොට ඡත්ත මානවකයා පෙනීගිය නිසා ඒ මාර්ගයේ ගහක් මුලට වැඩලා වැඩ හුන්නා. ඡත්ත මාණවකයා බුදුරජාණන් වහන්සේ දැකල, ඇවිල්ල බොහොම ප්‍රසාදයකින්, පැහැදීමකින්, යුක්තව තුණුරුවන් සරණ ගිහිල්ලා බණ අහලා පිටත් උනා. යන්න කලින් බුදු පියාණන් වහන්සේ තෙරුවන් සරණයාමට තෙරුවන් ගුණ කියවෙන ගාථා තුනක් ඡත්ත මානවකයාට ඉගැන්නුවා. ඒ ගාථා සිහිකරමිනුයි ඡත්ත මානවකයා යන්න පිටත් වුනේ. ඒ ගාථා තුන තමයි අපි මේ ආරම්භක වශයෙන්, මේ මාතෘකාව වශයෙන් තැබුවේ.

**'යො වදතං පවරො මනුජෙසු'** - මනුෂ්‍යයින් අතර වාදීන්ගෙන් උතුම් වූ එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨ වූ, **'සක්‍යමුනි'** - ශාක්‍ය මුනීන්ද්‍ර වූ **'භගවා'** භාග්‍යවත් වූ **'කතකිච්චො'** - විමුක්තිය සඳහා කළයුතු කෘත්‍යයකර අවසන් **'පාරගතො - බල විරිය සමංගී'** - සසර කතරින් එතෙරවූ සංසාර සාගරයෙන් එතෙරවූ ඒ කියන්නේ නිවන් දුටුවාවූ කායබල වීර්යබල වීර්යාදියෙන් සමන්විත වූ **'තං සුගතං සරණත්තමුපෙමි'** - ඒ සුගතයන් වහන්සේගේ සරණ මම යමි. පිහිට කොට යමි කියන එකයි. ඒ මුල් ගාථාවේ කියවෙන්නේ. දෙවෙනි ගාථාවේ **"රාග විරාගමනෙජමසොකං"**- රාගය දුරුකරන්නාවූ රාගවිරාග **අනෙජං** - තණ්හාව රහිතවූ, **'අසොකං'** නිඃශෝකිවූ **'ධම්මමසංඛත මප්පටිකූලං'** - නොපිළිකුල්වූ **'අසංඛතධම්ම'** නම් වූ නිර්වාණ ධර්මයද **'මධුරමිමංපගුණං සුවිභත්තං'**, මිහිරිවූ මැනවින් බෙදන ලද්දාවූ ප්‍රගුණ වූ මේ පර්යාප්ති ධර්මයද **'ධම්මමිමං සරණත්ථමු පෙමි'** - මම පිහිට කොට යමි. **"යත්ථච දින්න මහප්ඵලමාහු"** - යම් ආර්ය සංඝ රත්නයක් කෙරෙහි දෙනලද්ද මහත්ඵල යයි කියනු ලැබේද **'චතුසුච යෙසු පුරිසයුගෙසු'** පිරිසිදු පුරුෂ යුගල සතරක්වූ **'අට්ඨච පුග්ගල ධම්මදසා තෙ'** නිර්වාණ ධර්මය ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටුවාවූ ඒ අෂ්ටාර්‍ය පුද්ගල සංඝරත්නය නම් වූ **'සංඝමිමං සරණත්තමුපෙමි'** මේ සංඝයා වහන්සේලා සරණ යමි. උන්වහන්සේලා පිහිටකොට යමි. කියන අදහසයි ඒ අවසාන ගාථාවේ තියෙන්නෙ. ඉතින් මේ ගාථා තුන කියමින් පියවරින් පියවර ඉදිරියට යන අතරේ මංසන්ධියකදී හොරු මේ තරුණයා ළඟ ධනය ඇතැයි කියන සංඥාවෙන් විදල මැරුවා. ඒ මරණයත් එක්කම ඡත්ත මානවකයා අර කියාපු තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, අර ශීලසමාදනයත් පංච ශීලය සමාදන්වීමත් බණ ඇසීමෙන් ඇති කරගත්තු ශ්‍රද්ධාවත් ඒ හැම එකක්ම





පිහිට කරගෙන තව්තිසා දිව්‍යලෝකෙ තිස්යොදුන් විමානයක පහළ උනා කියල කියවෙනවා. ඊළඟට ඒ තරුණයා මළ බව අහල මව්පියනුත් ඒ සේතව්‍ය නුවර වැසියනුත් එකතුවෙලා අවමංගල කටයුතු කරන්න සූදානම් වෙන අවස්ථාවේ බුදුපියාණන් වහන්සේ එතෙන්ට වැඩියා.

බුදුපියාණන් වහන්සේ එතෙන්ට වැඩියාම අර ඡත්ත මානවකයා දිව්‍යලෝකේ ඉඳල විමානය සහිතවම එතෙන්ට පැමිණියා. බුදු පියාණන් වහන්සේ පිරිසට ඒ කාරණය ඇඟවීම් වශයෙන් ඒ දිව්‍ය පුත්‍රයාගෙන් ඇසුවා මේ ඉර හඳටත් වඩා බබලන විමානයක් සහිතව දෙව්ලොවින් ආපු ඔබ කව්ද? කොයි විදියේ පිනක් කරලද මේ තත්ත්වය ලැබුවේ කියල. ඡත්ත දිව්‍ය පුත්‍රයාගේ කටින්ම කියවන්න සැලැස්සුවා. "මම තමයි භාග්‍යවතුන් වහන්සේ මා කෙරෙහි කරුණාවෙන් ගිහිල්ලා ඒ ගසක් මුල වැඩ සිටිද්දී එදා හමුවුන බ්‍රාහ්මණ තරුණයා. භාග්‍යවතුන් වහන්සේ මගෙන් ඇසුවා තුණුරුවන් සරණ යාම කියන එක දන්නවාද? කියලා. මම කිව්වා නැහැ කියලා. භාග්‍යවතුන් වහන්සේ මට ඒක කියලා දුන්නා. ඒ කියපු ආකාරයට සරණ ගියා, පන්සිල් දන්නවාද? කියල ඇහුවා. ඒක මම දන්නේ නැහැ කිව්වා. ඊළඟට ඒකත් මට කියල දුන්නා. මේ අපිරිසිදු වූ ප්‍රාණඝාතය සතුන් මැරීම කියන එක අතහරින්න. නුවණැත්තන් ඒක ප්‍රශංසා කරන ප්‍රතිපත්තියක් නොවෙයි. ඒ වගේම නොදුන්දේ ගැනීම, පර අඹුවන් කරා යාම, බොරුකීම, සුරාපානය කිරීම යන මේවා නුවණැත්තන් විසින් වර්ණනා කරන ප්‍රතිපත්ති නොවේ. මේවා අපිරිසිදු ප්‍රතිපත්ති කියල කිව්වට පස්සේ මම ඒ ආකාරයටම ශීලය අධිෂ්ඨාන කරගත්තා. එහෙම යන අතරෙ සොරු මට විදලා මාව මරණයට පත්කළා. දිව්‍ය ලෝකයේ ඉන්න අනිත් දෙව්වරු මගේ මේ යසස දැකලා කොයි විදියට මේ තත්ත්වයක් ලැබුවාද? ලබනවද? කියලා පුදුමයෙන් වගේ ප්‍රකාශ කරනවා කියලා. ඔය කාරණය ඡත්ත දිව්‍ය පුත්‍රයා ප්‍රකාශ කළා.

එතකොට මේ පොඩි කථාන්තරය ආශ්‍රයෙන් අපට පෙනෙනවා තෙරුවන් සරණ යාමත් පංචශීලය සමාදන්වීමත් කොයිතරම් ආනිශංස සම්පන්නද කියලා. විශේෂයෙන්ම හිතා ගන්න තියෙන්නෙ අර ශීලසමාදනය - දැන් මේ පින්වතුන් කවුරුත් දන්නවා සිල් සමාදන්වීමට කලින් සරණයාමක් කරනවා. තුණුරුවන් සරණයාමත් සුලු පටු දෙයක් නෙවෙයි. ඒ තුළින් කෙරෙන්නේ තමාගේ ශ්‍රද්ධාව මතුකර ගැනීමයි. ශ්‍රද්ධාව උඩයි ශීලය ක්‍රියාත්මක වෙන්නේ. යම් ප්‍රමාණයකට ශ්‍රද්ධාව බලවත් නම් ඒ ප්‍රමාණයට ශීල ශික්ෂාපද රැකීමට පෙළඹෙනවා. ශීලයේ පිහිටියා වෙනවා. ඉතින් ඡත්ත මානවකය අර විදියට ගාථා කිය කියා යනකොට - ඒකට

කියන්නේ තුණුරුවන් ගුණ සිහිකරමින් යාමයි. බුද්ධානුස්සති, ධම්මානුස්සති සංඝානුස්සති වශයෙන් තුණුරුවන් ගුණ සිහිකරමිනුයි ගියේ - ඒ සිතින්, ඒ ආසන්න සිතින්, කළුරිය කිරීම නිසා තමයි දිව්‍ය ලෝකයේ අර තත්ත්වය ලැබුවේ. අපි ධර්මයෙ අහලා තියෙනවා, දැන් කෙනෙකුගේ ඊළඟ උත්පත්තිය ගැන කියවෙන කොට ගරුකකර්ම කියල කියන ආනන්තරිය කර්ම වැනි බරපතල කර්මයක් නැත්නම් මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුද්ධ ශරීරයෙන් ලේ සෙලවීම, සංඝභේද කර්මය - ඇතැම් විට දක්වනව නියත මිථ්‍යාදෘෂ්ටියත් එකක් හැටියට - ඒ විදියෙ බරපතල කර්මයක් ඉදිරිපත් නුනොත් කෙනෙකුගේ මීළඟ උත්පත්තිය තීරණය කෙරෙන්නේ අවසාන අවසථාවේ කරපු කර්මයකින් හෝ, කලින් කරලා අවසාන අවසථාවේ සිහිපත් කළ කර්මයකින්. ඒකට කියනවා ආසනන කර්මය කියලා. එතකොට ගරුක කර්මය නැතිවෙනකොට ආසන්න කර්මය. ඒකත් නැතිවෙනකොටයි ඊළඟට අර ආචිණ්ණ කියලා කියන තමන් නිරන්තරයෙන් කිරීම තුළින් පුරුදු කරගත්තු කර්මයක් ඉදිරිපත් වෙනවා. එහෙමත් නැතිවෙනකොට වෙන යම්කිසි අවසථාවක කළ **'කටත්තා'** කර්මින් හඳුන්වන යම්කිසි කර්මයක් කොහොම නමුත් ඉදිරිපත් වෙනවා ඊළඟ උත්පත්තියට. දැන් මෙතන අපට පෙනෙනවා ආසන්න කර්මය. බුදු පියාණන් වහන්සේ ඇත්ත වශයෙන් ඒ අවසථාවේ වැඩියේ මරණයෙන් ගැලවීමට නොවෙයි. උන්වහන්සේගේ මහා කරුණා සමාපත්ති ඤාණය තුළින් පෙනෙන්ට ඇති ඡත්ත මානවකයා තුළ අර විදියේ ගැඹුරු ශ්‍රද්ධාවක් ඇති කර ගන්න ශක්තියක් තිබෙනවා කියලා. එතකොට අවසාන සිත සකස් කිරීමටයි බුදු පියාණන් වහන්සේ එතනට වැඩම කළේ. ඒ හැටියටම ඡත්ත මානවකයත් මෙතෙක් අහලවත් නැති, මෙතෙක් නොගිය සරණ යාමක් කළා. මෙතෙක් අහලවත් නැති ශීලයක් සමාදන් වුනා. ඒ සුලු වෙලාව තුළ ඇති කරගත්තු කුශල චේතනාවෙනුයි අර විදියේ දිව්‍ය සම්පත්තියක් ලැබුවේ.

එතකොට අපි ඒ තුළින් කල්පනා කරන්නට ඕන. ඇත්ත වශයෙන්ම අපේ ශීල සමාදානය තහවුරු වෙන්නෙ, ශ්‍රද්ධාව පිහිට කරගෙනයි. කෙනෙකුට කියන්න පුළුවන් නම් **"නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං"** "මට වෙන පිහිටක් නැත. බුදුරජාණන් වහන්සේම මට පිහිටයි. ධර්මයම මට පිහිටයි. සංඝයා වහන්සේම පිහිටයි කියලා ඒ තරම් ප්‍රබල ශ්‍රද්ධාවක් තිබෙනව නම් ඒ තැනැත්තා ඒ සරණ යාම කරනවා. සරණයාම කියල කියන්නේ පිහිට සොයා යාම. ඒ පිහිට සොයන්න වෙන්නෙ, ශීල, සමාධි, ප්‍රඥා තුළිනුයි. බුදුරජාණන් වහන්සේට කවුරුවත් ගලවගන්න බැහැ. නමුත් අර ශීල, සමාධි, ප්‍රඥා වැඩීමට ආරම්භය සරණගමනයයි. ඒකයි මේ කාලයේ පවා ශීල සමාදනයට කලින් තුන්වරක්ම "බුද්ධං සරණං





ගච්ඡාමි' ආදී වශයෙන් මේ අපි සරණයාම කරන්නෙ. ඒක එසේ මෙසේ දෙයක් නොවෙයි. දැන් එතකොට මේ ඡත්ත මානවකයාට ඒ බුද්ධ කාලයේ තිබුණු මාරක අනතුරක් නිසා, උවදුරක් නිසා, ඒ විදියට හදිසියෙ ජීවිතය නැති වුනා. ඒ බුද්ධ කාලයටත් වඩා මේ කාලයේ ඉන්න මානවක මානවිකාවන්ට - දරු දැරියන්ට - මග තොටේ කොයිතරම් උපද්‍රව අනතුරු තියෙනවාද කියල මේ පින්වතුන් දන්නවා. පාරේ මේ පැත්තෙ ඉඳල එහා පැත්තට පනින්න කලින් මේ පුංචි අපි යටකරගෙන යන්න අධිවේගී දැවැන්ත වාහන වීදියක් වීදියක් ගානේ දුවනවා. ඒවගේම මේ පුංචි අපේ මහ වියදම, චරිතය, ජීවිතය කොල්ල කාගන්න නොයෙකුත් ආකාරයේ පල්හොරුන්, දාමරිකයන්, මිනීමරුවන් හන්දියක් හන්දියක් ගානේ ඉන්නවා. දැන් එතකොට මේ මෑත යුගයක ඉඳලා බෞද්ධ ජනනායකයින් පාසැල් සිසුන්ට පාසලෙන් පිටත්වෙන අවස්ථාවේදී, පාසැල් වැඩ නිමකරලා ගෙදර යන අවස්ථාවේදි, මේ අපි කලින් සඳහන් කළ ගාථා තුන සිහිපත් කරන්න, ඒවා කියන්න, පිළිවෙතක් හැටියට යොදලා තියෙනවා. මේ කාලේ ඒ ගාථාවල අර්ථය පවා තේරුම් කරලා දෙන්න කෙනෙක් නෑ. ඒවා විකෘති කරගෙන විහිළු බවට පත්කරගෙන ඇතැම් කෙනෙක් ඉන්නේ. නමුත් ඉතාම බලසම්පන්න ගාථා තුනක්. දැන් බුද්ධකාලයටත් වඩා මේ කාලයේ අනතුරු බහුල නිසා අපට කියන්න වෙන්නෙ පාසැලෙන් පිටවෙන අවසථාවෙ නෙවෙයි ගෙදරින් පිටවෙන අවසථාවේ - පාසැල්යන්න පිටවෙන අවසථාවේ - පවා පුළුවන්කමක් තියෙනවා නම් මේ ගාථා තුන සිහිපත් කරගෙන, එහෙම නැත්නම් යටත් පිරිසෙයින් **'බුද්ධං සරණං ගච්ඡාමි". ධම්මං සරණං ගච්ඡාමි සංඝ සරණං ගච්ඡාමි"** කියලා ආසන්න සිතෙන්ම පිටවෙන එක හොඳය කියලා. යටත් පිරිසෙයින් අර කියාපු විදියෙ අනතුරක් ආවත් හොඳ තැනක උත්පත්තියක්වත් ලබන්න පුළුවන් තුණුරුවන් සිහිපත් කරගෙන ගෙදරින් පිටඋනොත්. ඔන්න ඔය විධියයි දැන් තියෙන තත්ත්වය.

ඉතිං ඒ වගේම අපට පෙනෙනවා ඒ තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, සරණයාම, එක්කම ශීල සමාදානයත් අරතරම්ම බලසම්පන්න දෙයක්. පඤ්චසීලය උනත් සුලුපටු දෙයක් නොවෙයි, ගිහියාගේ නිත්‍ය ශීලය වශයෙන් තිබෙන. ඒ ශීලය පමණක් සමාදන් වෙලා ඒ සුලු වෙලාවක් තුළ දැඩි අධිෂ්ඨානයක් ඇති කරගන්න ඇති ඡත්ත මානවකයා. මගේ ජීවිතයේ ඉතිරි කාලය තුළ මම කිසිම සතෙක් මරන්නෙ නෑ, සොරකමක් කරන්නෙ නෑ කාමයෙහිවරදවා හැසිරෙන්නෙ නෑ, බොරු කියන්නෙ නෑ, සුරාපානය කරන්නේ නෑ කියල. ඒ ගත්තු අධිෂ්ඨාන ශක්තියයි - වැඩි කලක් රැක්කෙ - නෑ සුලු මොහොතක් තුළ ඇතිකර ගත්තු ශක්තිය තුළින් අර තරම් දිව්‍ය

සම්පත් ලැබුවෙ. එතකොට ඊටත් වඩා ආනිශංස සම්පන්නයි මේ පිංවතුන් අහල තියෙනවා උපෝසථ අටඨංග ශීලය. දැන් මේ බොහෝ දෙනෙක් සමාදන්වෙලා තියෙන්නෙ පෙහෙවස් වශයෙන් උපෝසථ අටඨංග ශීලය. ඒ අෂ්ඨාංග ශීලයේත් ආනිශංස දක්වන ධර්ම කථාවකුත් තිබෙනවා. අවම වශයෙන් අඩ දවසක් එක ශික්ෂා පදයක් ප්‍රබලව රැකීමේ ආනිශංස දක්වන පුදුම විදියේ කථාන්තරයකුත් ධර්ම සාහිත්‍යයේ සඳහන් වෙනවා. දැන් මේ පිංවතුන් මේ කාලයේ ඇතැම් විට ලොකු හැටියට සළකන්නෙ නැති විකාල භෝජන ශික්ෂාපදය හරියාකාර දැඩි අධිෂ්ඨානයකින් ජීවිත පරිත්‍යාගයකින් රැකි එක්තරා දුගී මනුෂ්‍යයෙක් වෘක්ෂ දේවතාවෙක් වුන කථාන්තරයක් ධර්ම සාහිත්‍යයේ සඳහන් වෙනවා. ඒක මේ විදියටයි කියවෙන්නෙ.

හිමාලයේ ඉඳලා අවුරුද්දක් පාසා කොසඹෑ නුවරට පැමිණෙන පන්සීයක තාපස පිරිසක් හිටියා. කොසඹෑ නුවරට එන්නෙ කොසඹෑ නුවර ඒ කාලයේ හිටිය ඝෝෂිත සිටාණන් පාවාරිය සිටාණන් කුක්කුට සිටාණන් කියල කියන සිටුවරුන් තුන්දෙනෙක් ඒ තාපස වරුන්ට ආරාධනා කරලා තිබුනා වැසි හාර මස තුළ හැම අවුරුද්දකම අපෙන් උපස්ථාන ලබන්න එන්න කියලා. ඒ ආරාධනාව අනුව පිටත්වෙලා එන තාපසයින් එක්තරා අවස්ථාවක කැලේ කෙළවර තිබුනු මහා විශාල නුග ගසක් මුල ටිකකට නැවතුනා, විවේක ගන්න. තාපසයින් අතර ප්‍රධාන තාපසයා කල්පනා කළා මේ නුගගහට අධිගෘහිත දේවතාවා එසේ මෙසේ කෙනෙක් වෙන්න බෑ. මහා බල සම්පන්න කෙනෙක් වෙන්න ඕනෑ කියලා නිකමට වගේ හිතුවා මේ අපේ පිරිසට පැන් ලබා දෙනවානම් මේ දෙවතාවගෙ අනුහසින් අපට බොහොම වටිනවා. මේ වෙලාවේ ප්‍රයෝජනවත් දෙයක් කියලා. හිත නවත් එක්කම ඒ හැම දෙනාටම පැන් පහළ වුනා එතන. ඊට පස්සේ කල්පනා කළා අපට නාන්න පැන් ලැබෙනවා නම් හොඳයි කියල. ඒ කත් එහෙමම ලැබුනා. ඊට පස්සෙ කල්පනා කරා අපට ආහාරයත් ලැබෙනවානම් හොඳයි කියලා. පන්සිය දෙනාටම ආහාරයත් ඒ විදියටම ලැබුනා. ඊළඟට අර තාපසයා හිතනවා මේ තරම් අපි හිතන හිතන දේවල් දෙන්න ශක්තියක් තියෙන මේ දේවතාව අපිට දකින්න ඇත්නම් හොඳයි කියලා. එතකොට අර නුග ගහේ මුල් අතරින් මේ දේවතාවා මහානුභාව සම්පන්න ස්වභාවයකින් පෙනී සිටියා. ඊළඟට මේ තාපසය අහනවා ඔබ කොයි විදියේ පිනක් කරලද මේ තත්ත්වය ලැබුවේ කියලා. ඔන්න එතකොට අර දේවතාවා ලැජ්ජයි කියන්න, පින බොහොම සුලු දෙයක් නිසා ලැජ්ජයි කියන්න. අදි මදිකළා. නැවත නැවත ඇවිටිලි කළහම ඔන්න කියන්න පටන් ගත්තා. ඒ සම්පූර්ණ ප්‍රවෘත්තිය මේ විදියටයි ධර්මයේ දැක්වෙන්නෙ.





සැවැත් නුවර අනේපිඬු සිටාණන්ගේ ගෙදර චාරිත්‍රයක් තිබුනා හැම පොහොය දවසකම ගෙදර කවුරුත් සිල් රකිනවා. කොයිතරම් ද කියතොත් කිරිබොන දරුවන්ගේ පවා කට සෝදලා දවසේ ඉර අවරට යන අවස්ථාවේදී කටසෝදලා චතුමධුර කටේ තබල ඒ කුඩා අවදියේ පටන්ම විකාල භෝජන ශික්ෂාපදය පවා රකින්න පුරුදු කරන සිරිතක් තිබුණා. ඒ තරමටම දැඩිව හැම දෙනෙක්ම පොහොය අටසිල් රැකීමේ සිරිතක් තිබුණා. එතකොට එක දිනක් ඒ ගෙදරට කුලී වැඩ සොයාගෙන ආව ඉතාම දුප්පත් මනුෂ්‍යයෙක්. ඒ මනුෂ්‍යයා ඇවිල්ල වැඩි කලක් උනෙ නෑ ඊළඟ පෝයදවසේ සිටාණන් විහාරයේ ඉඳල ඇවිල්ල ගෙදර අයගෙන් අහනවා අහවල් අර කුලී කරුවට කිව්වද, අද පෝය දවස බව කියලා. කියන්න බැරිවුනා කියල කිව්ව. එහෙනම් එයාට විතරක් කෑම ටිකක් තියන්න හවස් වරුවට කියල වෙනම කෑම ටිකක් එයාට සූදානම් කරලා තියලා අනිත් අය අර කියාපු පිළිවෙතේ හිටියා, කුඩා දරුවා පවා ආහාර නොගෙන. ඉතින් ඔය අතරෙ හවස් වෙලා අර මනුෂ්‍යයා ආව ඉතාමත්ම මහන්සිවෙලා වැඩ කටයුතු කරලා. ඇවිල්ලා ඒ ආහාර ටික දුන්නාම ටිකක් කල්පනාවෙ වැටුනා. කොතෙක් කුසගින්න තිබුනත් එකපාරටම කෑවෙ නෑ, කල්පනා කළා මොකද වෙනදානම් මේ ගෙදර කොතෙකුත් බත් දෙන්න ව්‍යංජන දෙන්න කියලා එහෙම කෑගහනවා පොඩි දරුවෝ හේම. අද කිසිම සද්දයක් නැහැ. ඊළඟට ඇහුවා මේ කට්ටිය කෑම කාලද ඉන්නෙ කියලා. නෑ කිව්වා. මොකද? කියල ඇහුවාම කියනවා මේ වගෙ පෝය දවස් වල අපේ සිරිතක් තියෙනවා. සිටාණන් මේ කුඩා දරුවන්ට පවා මෙන්න මේ විදියට විකාල භෝජන පිළිබඳ ශික්ෂාපදය රකින්න සලස්වනවා" කියල. කිව්වහම මේ මනුෂ්‍යයා අහනවා මටත් පුළුවන්ද මේ පොහොය අටසිල් සමාදන් වෙන්න කියලා. ඒකනං අපි දන්නෙ නෑ සිටාණන්ගෙන් අහන්න ඕනෙයි කිව්වා. එහෙනං ගිහිල්ල අහන්නෙයි කිව්ව. ඉතිං සිටාණන්ට ගිහිං කිව්වාම කිව්ව එහෙම නං කරන්න තියෙන්නෙ දැන් පෝයෙන් අඩ දවසක් පෙහෙවස් රකින්න තාම ඉඩතියෙනවා එයාට කියන්න කටසෝදගෙන අධිෂ්ඨාන කර ගන්නෙයි කියල. මේ විකාල භෝජනය පිළිබඳ ඒ ශික්ෂාපදයත් මුල් කරගෙන ඒ පොහොය අටසිල්.

ඉතින් මේ මනුෂ්‍යයත් ඒ විදියට කළා. රෑවෙනකොට අර කුසගින්න නිසාත් වෙහෙස නිසාත් දරා ගන්න බැරි වේදනාවල් ආවා. එතකොට මේ මනුෂ්‍යයා කළේ මොකක්ද? කඹයකින් කාමරයක යම්කිසි දෙයක් බැඳලා කෙළවරක් අල්ලා ගෙන පෙරලෙන්න පටන් ගත්තා වේදනාව උහුලගන්න බැරිව. ඒ මනුෂයින් ගිහිල්ල සිටාණන්ට කිව්වහම සිටාණන් චතුමධුරත් අරගෙන ඇවිල්ලා බොහොම පෙරැත්ත කළා "මොකද මේ අසහනයෙන්?"

කියල ඇහුවම මට වාතරෝගයක් මතුවෙලා තියෙනවා වෙහෙස නිසා" කියල කිව්වා. එහෙනම් මේ චතුමධුර ගන්න කියල කිව්වා. ස්වාමීන් වහන්සේත් ගන්නවාද කියලා ඇහුවා. නෑ මට නම් අපහසුවක් නෑ ගන්නෙයි කිව්වා. අනේ මට අවසර දෙන්න මේ පොහොය අටසිල් රැකීමෙදි මට මුළු දවස කරන්නත් බැරිවුනා, මේ ටිකවත් මට පිරිසිදුව කරන්න මට ඉඩ දෙන්න කියල චතුමධුරත් ප්‍රතික්ෂේප කලා. ඉතින් එහෙම පිටින්ම කුසගින්නෙන්. ඒ හින්දා එළිවෙන ජාමෙට ඉවසන්න බැරිව අන්තිමට ඒ මනුෂ්‍යයා කාලක්‍රියා කරල අර කියාපු නුගගහේ වෘක්ෂදේවතාව වෙලා උපන්නා. ඔන්න ඕකයි ප්‍රවෘත්තිය. එහෙම කියලා ඊළඟට වෘක්ෂදේවතාව කියනවා ඒ සිටාණන් බුද්ධ මාමකයි, ධම්ම මාමකයි, සංඝ මාමකයි. ඒ සිටාණන් ඇසුරු කිරීම නිසයි මට මේ වෘක්ෂදේවතා සම්පත්තිය ලැබුණේ කියල. ඕක අහනවත් එක්කම අර තාපසයින් - ඒ වෙනකොට ඒ ගොල්ලො දන්නෙවත් නෑ බුදු කෙනෙක් පහල වෙච්ච බව මේ කොසඹෑනුවර නිසා. එතකොට ඒ තාපසයින් ඔක්කොම නැගිටලා බුද්ධ කියලාද කියන්නේ? එසේය. බුද්ධ කියලා ද කියන්නේ කියල තුන් සැරයක්ම ඇහුව. බුදුකෙනෙක් පහළවුන බවත් දන්නෙ නෑ. ඉතින් ඒ විදියට බුදු කෙනෙක් උපන්නා කියන ඒ ප්‍රවෘත්තිය දැන ගත්තට පස්සේ ඒ තාපසවරුනුත් අර සිටාණන් තුන්දෙනාටත් ඒ කාරණය දන්වලා සැවැත් නුවරට ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් බණ අහල රහත්වෙලා පැවිදි භූමියට පත් වුනා.

එතකොට අන්න අර කතන්තරය තුළින් අපට පෙනෙනවා අඩ දවසක් රැක්ක උපෝසථ සීලයෙන් අර තරම් ආනිසංස ලැබුණා. මේ කාලේනම් දැන් අපේ තර්ක කාරයින් බොහෝවිට කියන දෙයක් තමයි අනිත් ශික්ෂාපද කෙසේ වෙතත් විකාල භෝජනය ගැන. ඒ ආහාර ගැනීමෙන් කාටවත් හිංසාවක් වෙන්නෙ නෑ නේ. ඉතින් සමහරවිට අහනවා බත් කාල අපායේ ගියේ කවුද කියල. ඒ විදියට අහන අයත් ඉන්නව. එතන බත් කෑම නො කෑම නෙවෙයි ප්‍රශ්නය තියෙන්නෙ. මේ කියාපු තමන් ප්‍රතිඥා කරගත්තු සමාදන් ශීලය දැඩි අධිෂ්ඨානයකින් රැකීම තුළින් සිත පිරිසිදු කර ගත්තා. සිත කෙලින්කර ගත්තා. තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, ඒ ශීල සමාදානයෙන්, අවංක භාවයෙන් සිත කෙලින් කරගත්තා. ඒකේ ආනිශංසයයි අර දුගියාට ලැබුනේ. එතකොට අපි කල්පනා කරන්න ඕනෑ අන්න ඒ විදියටයි. සුලුකොට තැකිය යුතු දෙයක් නොවෙයි විකාල භෝජන ශික්ෂාපදය පවා. කවර ශික්ෂාපදයක් වුනත් මේ බුද්ධ ශාසනයේ හරියට රැක්කොත් ඒක ආනිශංස සම්පන්න බව මේක තුළින් අපට පැහැදිලිව පේනවා.





ඊළඟට මේකටම අදළ තවත් කොතෙකුත් ධර්ම කථාන්තර තිබෙනවා. ශීලාදී ගුණධර්ම පිළිබඳව විශේෂයෙන් සඳහන් කළයුතු තවත් කාරණයක් තමයි, තවත් වටිනා දේශනාවක් තමයි, බුද්ධ කාලයේම හිටියා කූටදන්ත කියල එක්තරා බ්‍රාහ්මණයෙක්, ඒ බ්‍රාහ්මණයා බොහොම ධනවත් කෙනෙක්. එයාට විශාල යාගයක් පවත්වන්න ඕනෑකමක් තිබුණා. ඒ යාගය පවත්වන්න කල් ඇතුවම ගවයින්, වසුපැටවුන්, එළුවන්, බැටළුවන් ආදී ඒ සතුන් හත්සීය, හත්සීය, සුදනම් කරගෙන ඒ සතුන් ගස්වල බැඳලා ඊළඟට කල්පනා කරනවා. අහන්න ලැබුනා මේ බ්‍රාහ්මණයට ශ්‍රමණ භවත් ගෞතමයන් මහත්ඵල මහානිශංස වන විදියට යාග පවත්වන ක්‍රමයක් දන්නවා කියල. ගිහිල්ල බුදුපියාණන් වහන්සේ එක්ක සාකච්ඡාවක් ආරම්භ කළා. ඉතාමත්ම මහත්ඵල මහානිශංස වන විදියට යාගයක් පවත්වන්නෙ කොහොමද කියන මාතෘකාව උඩ.

බුදුපියාණන් වහන්සේ අතීත ප්‍රවෘත්තියක් ආශ්‍රයෙන් - අතීත ජාතියක භාග්‍යවතුන් වහන්සේ පුරෝහිත කෙනෙක් හැටියට ඉපදිලා මහා විජිත කියන රජුට - මහා විජිත රජ්ජුරුවන්ට විශාල වස්තු සම්භාරයක් තිබුන - මුළු රටම සම්බන්ධ කර ගෙන මහා පරිමාණයෙන් විශාල යාගයක් පැවැත්වුවාය. ඒ යාගයේදී කිසිම සතෙකුට හිංසාවක් කළේ නැහැ. ඒ යාගයට සම්බන්ධ වූ මනුෂ්‍යයින්ටත් බලකිරීමක් නොකර ඉතාමත් ධාර්මික අන්දමින් විශාල යාගයක් පැවැත් වුවා කියල ඒ කාරණය සවිස්තරව බුදුපියාණන් වහන්සේ වදාළා. ඒ අවස්ථාවේ බ්‍රාහ්මණ පිරිසත් සාධුකාර දුන්නා. අර බමුණාත් අන්තිමට ඒක ගැන පැහැදිලා ඉස්සෙල්ලම ඇහුවේ 'ඔය භාග්‍යවතුන් වහන්සේ විස්තර කළ ආකාරයට අර පුරෝහිතයා භාග්‍යවතුන් වහන්සේම වෙන්න ඕන කියල මට හිතෙනවයි කියල. එසේමයි කියල බුදුපියාණන් වහන්සේ ඒක පිළිගත්තට පස්සේ ඊළඟට අහනවා මහානිශංස වන, හැබැයි ඒ තරම්ම සූදනම් වීම්නැති, වැඩ කටයුතු නැති, තවත් යාගයක් තියෙනවද කියලා. එහෙම ඇහුවම බුදු පියාණන් වහන්සේ කියනව එසේය බමුණ. මෙන්න මෙහෙම යාගයක් තිබෙනවා. මොකක්ද, යම්කිසි කුල පරම්පරාවක සිල්වත් පැවිද්දන් වෙනුවෙන් නිතිපතා දන්දීමේ ක්‍රමයක් තිබෙනවා නම් අන්න ඒ යාගය අර කියපු මහා විජිත රජ්ජුරුවන්ගේ යාගයටත් වඩා ශ්‍රේෂ්ඨයි කියල. ඊළඟට අහනවා ඊටත් වඩා වැඩකටයුතු සුදනම් වීම් අඩු නමුත් ආනිශංස වැඩි යාගයක් තියෙනවාද? කියල. එතකොට බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. "තියෙනවා." මොකක්ද ඒ යාගය? සතර දිගින් පැමිණෙන සංඝයා වහන්සේලා වෙනුවෙන් විහාරයක් තැනීම. ඒක ඊට වැඩිය ආනිශංස සම්පන්නයි. අච්චර වෙහෙස මහන්සි

නොවී කරන්න පුළුවන් එකක්. ඊළඟට අහනවා ඊටත් වඩා වැඩකටයුතු අඩු නමුත් ආනිශංස වැඩි යාගයක් තියෙනවද කියල.

ඔන්න ඒ අවස්ථාවේ බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. යම් කෙනෙක් පහන් සිතින් යුක්තව බුදුන් සරණ යනවාද දහම් සරණ යනවද සහ සරණ යනවාද ඒ යාගය අර කියාපු හැම යාගයකටම වඩා - මහා විජිත රජ්ජරුවෝ පැවැත්වූ අර මහා පරිමාණ යාගයටත් වඩා, ඊළඟට අර කුල ගෙවල්වල දෙන නිත්‍ය දානයටත් වඩා, විහාර දනයටත් වඩා, ශ්‍රේෂ්ඨ යාගයක් කියල. ඊළඟට එතැනින් නැවතුනේ නෑ. බ්‍රාහ්මණයා අහනවා ඊටත් වැඩිය වටිනා යාගයක් තියෙනවද මහත්ඵල මහානිශංස වන ඒ අවසථාවේ තමයි ප්‍රකාශ කළේ. බුදු පියාණන් වහන්සේ, "තියෙනවා. යම් කෙනෙක් අර කියපු ප්‍රාණසාතයෙන් වෙන්වෙනවා නම්, අදින්නාදානයෙන් වෙන්වෙනවා නම් කාම මිච්ඡාචාරයෙන් වෙන්වෙනවා නම්, මුසාවාදයෙන් වෙන්වෙනවානම් සුරාපානයෙන් වෙන්වෙනවානම් ඒ යාගය අරිටත් වඩා ආනිශංස සම්පන්නයි. ඊළඟට ඇසූ ප්‍රශ්නය ඔයිටත් වැඩිය ආනිශංස සම්පන්න යාගයක් තියෙනවාද කියල. ඒකෙදි බුදු පියාණන් වහන්සේ මුළු මහත් ශීල, සමාධි, ප්‍රඥා ප්‍රතිපදාව දක්වා වදාළා - කෙනෙක් මේ ශාසනයේ පැවිදිවෙලා රහත්බව දක්වා යන.

ඉතින් ඒ මුළු දේශනාවම අහලා කුටදන්ත බ්‍රාහ්මණයා තුණුරුවන් සරණ ගිහිල්ලා උපාසකයෙක් බවට පත්වුනා. අර ඒ ඒ තැන බැඳලා හිටපු, මරන්න හිටපු, 700 ක් ගවයින්ට, වස්සන්ට, වැස්සියන්ට ඔක්කොටම අහය දානය දුන්නා. ඒ සතුන් නිදැල්ලේ තණ කත්වා, සීතල වතුර බොත්වා කියලා උන්ට අහය දානය දුන්නා.

ඉතින් මේ කථාන්තරය ආශ්‍රයෙනුත් අපට පේනවා මේ ශාසනය ආමිසයෙන් නිරාමිසයට යනබව සාමාන්‍යලෝකයේ ආමිස දානයයි ලොකු හැටියට සළකන්නෙ. ඊට වඩා නිරාමිස වශයෙන්, ඒ වගේම සිතට චේතනාවට වඩා ළංව යන අන්දමින් අර තුණුරුවන් සරණයාම, සීල සමාදනය ආදී වශයෙන් බුදුපියාණන් වහන්සේ අමුතුම වටිනාකම් රාශියක් මේ ලෝකයට දක්වා වදළා. ඒ ශීල සමාදනයේ ආනිශංස ඒ විදියේ නොයෙකුත් කථාන්තර ආශ්‍රයෙන් ධර්මයේ දැක්වෙනවා. සාමාන්‍යයෙන් පංච ශීලය රකින ගිහි පින්වතුන්ට මෙලොව වශයෙන් පැමිණෙන ආනිශංස ඇතැම්විට දක්වනවා පහක් හැටියට. යම් කිසි කෙනෙක් ශීල සම්පන්න නම්, ශීල සම්පන්න කෙනෙකුට, ඒ අප්‍රමාදය හේතු කොට ගෙන - එතැන අප්‍රමාදය කියල කියන්නේ දැන් පව්කම් කිරීම, අපි හිතමු ශික්ෂාපද පහට අදළ වැරදි





ප්‍රාණසාතය අදින්නාදනය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, සුරාපානය කියන දේවල් යම් කෙනෙක් කරනවා නම් ව්‍යාපාරික මට්ටමින් හෝ පෞද්ගලික මට්ටමින් හෝ ධර්මයේ හඳුන්වන්නේ ප්‍රමාදයක් හැටියටයි. ප්‍රමාදයට වැටුනා. ඇත්ත වශයෙන්ම මත්පැන් වලින් පමණක් නොවෙයි අර කියාපු දේවල් කරන තැනැත්තා අන්තිමට ඒවා සිතට එන එන අවසථාවේ පිස්සෙක් බවට පත්වෙනවා. නොසන්සුන් බවට පත්වෙනවා. ඒක ප්‍රමාදයට හේතුවක්. අන්න ඒ ප්‍රමාදය නිසා මතුපිටට පෙනුනට සාමාන්‍ය ලෝකයාට පෙනෙන පෙනුමෙන්, සාමාන්‍ය කෙනාගේ අවබෝධයේ හැටියට දියුණුවෙන හැටියට පෙනුනත් ඒ තැනැත්තා යම්කිසි අවසථාවක බලවත් පරිහානියකට පත්වෙනවා. ඒක අනුව බුදු පියාණන් වහන්සේ දක්වන්නේ යම් කෙනෙක් ශීල සම්පන්න නම් පංචශීලය හරියට ආරක්ෂා කරනවා නම් ඒ තැනැත්තාට අප්‍රමාද ප්‍රතිපත්තිය පිහිට කරගෙන විශාල ධනයක් රැස් කරගන්න පුළුවන්ය කියල. සාමාන්‍යයෙන් කෙනෙක් හිතන්න පෙළඹෙන්නෙ විශේෂයෙන් මේ කාලයේ පංච ශීලය රකින කෙනෙකුට, දැහැමි කෙනෙකුට, තැනක් නෑ. ධනයක් ලබාගන්න හැකියාවක් නෑ කියලා ඒ විදියට. නමුත් බුදු පියාණන් වහන්සේ නම් පෙන්නුම් කරන්නේ පංච ශීලය රකින කෙනාටයි ධනය රැස්කරගන්න පුළුවන් වෙන්නේ.

ඇතැම් අවස්ථාවල ධනය කියල කියන්නේ වස්තුවේ තහවුරු බවයි. එතන ප්‍රකාශ කරන්නේ යම් කෙනෙක් කොච්චර හම්බුකළත් මත්පැන් බොමින් අර අනෙකුත් දුරාචාරවල එහෙම යෙදෙනවා නම් ඒ ධනය ඉක්මණින්ම කාබාසිනියා කරලා නැති කර ගන්නවා. අර ශීලවන්තයා ඒ විදියට නොවේ. සමහර විට බුදු පියාණන් වහන්සේ දක්වනව උපමා වශයෙන් මී මැස්සන් මී වදයක් බඳින්නා වගේ, වේයන් වේතුඹයක් බඳින්න වගේ බොහොම වෙහෙස මහන්සිවෙලා ධාර්මිකව උපයාගන්නා ධනය සථාවරයි කියල, තහවුරුයි කියල. අන්න ඒ අර්ථයෙන් තමයි එතකොට පළවෙනි ආනිශංසය වශයෙන් දක්වන්නේ කවුරුත් මේ ගිහි පින්වතුන් බලාපොරොත්තුවන හෝගස්කන්ධය ලබනවා. දෙවෙනි ආනිශංසය හැටියට දක්වනවා සිල්වත් කෙනා පිළිබඳව යහපත් කීර්ති රාවයක් ඇතිවෙනවා කියල. යහපත් කීර්ති රාවයක්, නුවණැත්තන් අතර යම්කිසි යශෝසෝෂයක්, කීර්ති රාවයක්, හෙම්හිට පැතිරෙනවා. ඒක දෙවෙනි ආනිශංසය. සමාජයේ ජීවතයක් ගත කරන කෙනෙකුට ඒකත් එක්තරා ආනිශංසයක්. වටින ආනිශංසයක්. තුන්වෙනුව දක්වනවා ඒ විදියේ ශීලසම්පන්න පුද්ගලයා යම්කිසි සහාවකට එළඹෙනවා නම්, රජවරුන් සිටින සහාවක් හෝ වේවා, බ්‍රහ්මණයින් සිටින සහාවක් හෝ වේවා,

ගෘහපතියන් සිටින සභාවක් හෝ වේවා, ශ්‍රමණයන් සිටින සභාවක් හෝ වේවා, ඒ කොයි සභාවකට පිවිසෙතත් විශාරදව පිවිසෙනවා කියලා හිත මකු කරගන්නේ නැතිව.

මකු කර ගන්නවා කියලා කියන්නේ ඔලුව පහතට හෙළාගෙන බොහොම ලජ්ජාවෙන් වගේ මූණ හංගගෙන ඉන්න එක. කෙලින් භයනැතුව විශාරදව සභාවකට ඇවිල්ලා කතා කරන්න පුළුවන් ශක්තියක් ලැබෙනව තමන්ගෙ අර ශීලය පිරිසිදු වීම නිසා. ඒ තුන්වෙනි ආනිශංසය. හතරවෙනි ආනිශංසය හැටියට දක්වනවා මරණ අවස්ථාවේ සිහිනුවණින් කාලක්‍රියා කිරීම. මුළා නොවී හොඳ සිහියෙන්.

දැන් අර ඇතැම් කථාන්තරවල පිංවතුන් අහලා ඇති චුන්ද සූකරිකයා, ඒ ඌරන් මරමින් හිටපු මනුෂ්‍යයා, අවසාන අවස්ථාවේ ඌරෙක් හැටියට- මනුෂ්‍යහිත නැතිවෙලා - අන්තිමට ඌරෙක් වගේ එහාට මෙහාට දුවමින් ඉඳලා දුක් විඳලා, අපාගත උනා. ශීලවන්ත පුද්ගලයාට තමා ඒ කරපු හොඳ ක්‍රියාවක් සිහිපත් කරමින් සතුටුවෙමින් අවසාන මොහොත සිහිනුවණින් ගතකරල අර පොතේ කියවෙන්නා වගේ නිදා පිබිදියාක් වගේ, දිව්‍ය ලෝකයේ උත්පත්තිය ලබන්න පුලුවන්. පස් වන කාරණය දක්වන්නෙ ඇත්ත වශයෙන්ම සුගතිගාමී වෙන්න හැකි බව. ශීලවන්ත පුද්ගලයා ඒ ශීලය හරියාකාර ආරක්ෂා කළා නම් අර ඡත්ත මානවකයා වගේ, අන්න අර දුගී මනුෂ්‍යයා වගේ, සුගතිගාමී වෙනවා. ඒක පස්වෙනි ආනිශංසය.

තවත් අවසථාවක ආනන්ද හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේගෙන් අහනවා "භාග්‍යවතුන් වහන්ස මේ ලෝකයේ සුවඳ වර්ග තුනක් තිබෙනවා. සමහර ගස්වල මුල් සුවඳයි, සමහර ඒවයි අරටුව සුවඳයි, සමහර ගස්වල මල් සුවඳයි, එතකොට මුල් සුවඳ, හර සුවඳ, මල් සුවඳ කියලා තුන්ආකාර සුගන්ධයක් තිබෙනවා ලෝකයේ. ඒ හැම සුවඳක්ම උඩු සුළඟට යන්නේ නෑ යටි සුළඟට මිසක්. භාග්‍යවතුන් වහන්ස, උඩු සුළඟටත් යන යටි සුළඟටත් යන උඩු සුළඟට යටි සුළඟට කියන දෙපැත්තටම යන සුවඳකුත් ලෝකෙ තිබෙනවාද?" කියල. එතකොටත් බුදු පියාණන් වහන්සේ ඔන්න ප්‍රකාශකරනවා. යම්කිසි ගමක හෝ නියම් ගමක හෝ නගරයක හෝ යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ බුදුන් සරණ ගිහිං තිබෙනවා නම්, දහම් සරණ ගිහිං තිබෙනවා නම්, සඟුන් සරණ ගිහිං තිබෙනවා නම්, ඒ වගේම සතුන් මැරීම සොරකම් කිරීම, කාම මිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය කියන ඒ පංච දුශ්චරිතයෙන් ඉවත්වෙලා ඒ ශික්ෂාපද රකීනම් පරිත්‍යාග ශීලී නම් ඒ පුද්ගලයා පිළිබඳව ඒ ස්ත්‍රිය හෝ පුරුෂයා පිළිබඳව ගුණරාවයක් මනුෂ්‍යයින් අතරත් දෙවියන් අතරත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් අතරත් පැතිරෙනවා කියල. ගුණ සුවඳ පැතිරෙනවා කියල





ඒ විදියටත් දක්වලා තිබෙනවා සමහර අවස්ථාවල ශීලානිශංස වශයෙන්.

එතකොට මෙලොව වශයෙනුත් අර ශීලවන්තයාට තමාගේ ජීවිතය යහතින් ගතකරන්න පුළුවන්. ඒ වගේම මේ පින්වතුන් අහල තියෙනවා ශීලාදී ගුණධර්ම රකින කෙනාට අර විපිළිසරබව කියල අතීත පොත්වල කියන පසුතැවිල්ල නැතිව නිරන්තරයෙන්ම ලොකු සතුටකින් ඉන්න පුළුවන්. නිරාමිස ප්‍රීතියකින් ඉන්න පුළුවන්. ඒකට කියනවා නිරවද්‍ය සුඛය කියල. අනවජ්ජ සුඛය කියල කියනවා. වැරදි නොකර මම වැරැද්දක් කරල නෑ කියන ඒ සිතුවිල්ල ලොකු සතුටක්. ඒක තුළින් සතුටක් ඇති කරගන්න පුළුවන් වෙනවා. එතකොට ඒ සතුටම තමයි ඊළඟට ඒ ශීලයෙ මෙලොව වශයෙන් දක්වන ආනිශංසය ආරම්භක වශයෙන් කිව්වොත්. නමුත් මේ ශාසනික ගුණධර්ම අතරින් අපි කවුරුත් දන්නවා, ශීලය තමයි පදනම මේ ගුණධර්ම වගාවට. සංසාරදුක කෙළවර කිරීම පිළිබඳ කථාවේදි ශීල, සමාධි, ප්‍රඥා කියන පුණ්‍යස්කන්ධ තුනක් දක්වනවා. ශීලය පිහිට කරගෙනයි සමාධිය වඩන්නේ, සමාධිය උපකාර කරගෙනයි ප්‍රඥාව දියුණු කරගන්නේ, ඒක නිසා තමයි ත්‍රිවිධ පුණ්‍යස්කන්ධයක් ධර්මයේ දැක්වෙන්නේ, ශීල, සමාධි, ප්‍රඥා නමින්.

එතකොට ඒ ශීලය විවිධයි. මේ පින්වතුන් දන්නවා දැන් සාමාන්‍ය නිත්‍ය ශීලය වශයෙන් පංච ශීලය තිබෙනවා. තවත් පුළුවන් නම් ආජීව අෂ්ටමක ශීලය කියලා මේ අවස්ථාවේදී ඇතැම් කෙනෙක් සමාදන් වුනා වගේ වචනයත් රැකගැනීම. කොටින්ම කියතොත් කයත්, වචනයත් හික්මවා ගැනීම පිළිබඳ අදහසයි ශීලය තුළ තිබෙන්නේ. ඒක හිතේ උපකාරය ඇතිවයි කරන්නේ. හිතේ තියෙන අධිෂ්ඨාන ශක්තිය පෙරදැරි කරගෙන. එතකොට ශීලයේ වටිනාම දේ තමයි සමාදන් වෙනවා කියල කියන්නේ. අධිෂ්ඨාන කරගැනීම. මේ අධිෂ්ඨානය තුළින් යම්කිසි ස්ථාවර බවක් ඇති කරගන්නවා. ඒ තහවුරු බවක් නැතිව සමාධියක් ගොඩනගා ගන්න බෑ. චෛත්‍යයක් ගොඩනගන්න බැරුව වගේ හරි පදනමක් නැතුව මේ සිත සමාධියකට ගොඩනගා ගන්න බෑ, අවම මට්ටමෙන් පංචශීලයවත් නැතුව. පොතේ එන උපමාවක් නොවෙතත් මේක තේරුම් කරගන්න ගත්තු උපමාවක් වශයෙන් කියන්න පුළුවන්.

අපි මේ සංසාරයේ විවිධාකාර ජීවිත අනන්ත කාලයක් මේ විදියට ගත කරලා තියෙනවා. යක්ෂයින් ප්‍රේතයින් තිරිසනුන් හැටියට වැඩි වශයෙන්, ඉඳහිටලා දෙවිවරුන් බ්‍රහ්මයින් හැටියට මනුෂ්‍යයින් හැටියට. එතකොට අපේ මේ විඥාණයේ, අපේ හිතේ, තැන්පත් වෙලා තිබෙන හොඳ නරක ගොඩක් තිබෙනවා. බොහෝවිට නරක පැත්තයි වැඩිපුර තියෙන්නේ. මේවා කර්ම විපාක වශයෙන් නිරන්තරයෙන් අපේ සිත්වල මතුවෙනවා.

අර ලිප උඩ තියෙන වළඳක ඇති ඒවා පැසෙන කොට විටින් විට එක එක දේවල් උඩට එන්න වගේ කර්ම උඩට එනවා. මේවා යටට දමලා තමන්ගෙ හිත තහවුරු මට්ටමකට ගේන්න උපකාර වෙන්නෙ මේ ශීල අධිෂ්ඨානයයි.

දැඩි අධිෂ්ඨානයක් යම් අවස්ථාවක් ගත්ත නම් - මෙතෙක් සතුන් මරමින් හිටපු, සතුන් මැරීම රක්ෂාවක් හැටියට කරමින් හිටපු, විනෝදයට හෝ රැකියාවක් හෝ හැටියට කරමින් හිටපු, කෙනෙක් දැඩි අධිෂ්ඨානයක් ගත්තා නම්, අද මේ මෙහොතෙ හිට මම කිසිම කෙනෙකුට හිංසාවක් කරන්නෙ නෑ කියලා - ඒ අධිෂ්ඨාන ශක්තිය තුළින්ම අර ඒකට අදාල අතීත කර්ම වේග බොහෝ දුරට යටපත් වෙනවා. ඒවාට මතුවෙන්න ඉඩ දෙන්නෙ නෑ අර හිත, ඒවා මතුවෙනකොට. මේකයි ඒ ධර්මතාව. හොරකම පිළිබඳවත් එහෙමයි. ඇතැම් කෙනෙකුට උත්පත්තියෙන්ම හොරකම පුරුද්දක්වෙලා තියෙනවා. ඒකෙන් පෙන්නුම් කරනවා අතීත චරිත ලක්ෂණ. නමුත් දැඩිව අධිෂ්ඨාන කළොත්, ඒ අධිෂ්ඨානය පෙරමුණේ තබා ගන්නේ අන්න අර සරණ ගමනයයි, තුණුරුවන් සරණ යාමයි. ඒක ඒ අධිෂ්ඨාන ශක්තිය. හොරකම පිළිබඳවත් අනිකුත් ඒව පිළිබඳවත්. කොටින්ම කියතොත් මේ පංචශීලයට අදාලව තිබෙන්නෙ අපි මේ අනන්ත කාලයක් සංසාරයේ ධර්මය මුණනොගැසුන අවස්ථාවල කරපු වැරදි ටිකයි. පංච ශීලය කියලා බුදුරජාණන් වහන්සේ ගොනු කරල දැක්වුවෙ. මේවාට අදාලවයි අපි අනන්තකාලයක් මේ සංසාරයේ වැරදි කරලා තියෙන්නෙ.

එතකොට දැන් නිවන් බලාගෙන යනවා නම්, ආරම්භක වශයෙන් මෙන්න මේ පහවත් නිත්‍ය ශීලය හැටියට රකින්න ඕනෑ. ඕකයි පංච ශීලයේ වටිනාකම, සුලුපටු දෙයක් නොවෙයි එතනත්. ඒවා ආවට ගියාට නෙවෙයි, දැඩිව අධිෂ්ඨාන කරගෙන. ඊට අමතරව තමයි ඔය පොහොය අටසිල් ආදි වශයෙන් තව තවත් තියෙන්නෙ. ඊළඟට භික්ෂුශීලය ඊටත් වඩා පුළුල්. යම් ප්‍රමාණයකට පදනම ශක්තිමත් නම් - දැන් මේ පින්වතුන් දන්නවා ඔය අහස්මාලිගා වගේ හදන ගොඩනැගිලිවල ගොඩනැගිල්ලෙ උඩහරිය විතරක් ගොඩ නගනව නොවෙයි. ඊට කලින් කොච්චර - මේ ඉංජිනේරු මහත්තුරු දන්නවා ඇති - අර පදනම දමාගන්න කොයි තරම් වෙහෙස වෙනවාද? වැලිගොඩක හැදුවොත් කඩාගෙන වැටෙනවා නේ. අන්න ඒක නිසා තමයි අර සංඝයා වහන්සේලාට ඒ ඉහල මට්ටමකින් ඉහල ඉලක්කයන් තබාගෙන නිවන් දකින්න බලාපොරොත්තුවෙන් වැඩ කරන සංඝයා වහන්සේලාට බුදුපියාණන් වහන්සේ ඊටත් වඩා සියුම් අන්දමින් විශාලවූ ප්‍රාතිමෝක්ෂසංවර ශීලයක් වදළා.





දැන් සංඝයා වහන්සේලාට අයිති සිවු පිරිසිදු ශීලය කියල කියන ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලය කියන ශීලයක් දක්වලා තියෙනවා. ඒ විදියට ක්‍රම ක්‍රමයෙන් වැඩෙන ශීලයක් මේ ශාසනයේ තියෙනවා. ඉතිං හිතාගන්න තියෙන්නේ මේ සංසාරය කියන්නේ එහෙම පිටින්ම මඩ ගොහොරුවක්. මේ මඩ ගොහොරුව මත අපි භාවනාවට ඉඳගන්නව නම් ඉඳගන්න ඕනෙ යම්කිසි වේදිකාවක් හදාගෙන. පොඩි වේදිකාවක් හදාගන්න වෙනවා. ඒ වේදිකාව කණු පහක් හිටවලත් හදාගන්නත් පුළුවන් පංච ශීලය හැටියට. කණු අටක් හිටවලත් හදාගන්න පුළුවන්, පොහොය අටසිල් හැටියට. දහයක් හිටවල දසසිල් හැටියට. අන්න ඒ විදියටයි, හිතා ගන්න තියෙන්නේ. ඒකයි බුදුපියාණන් වහන්සේ මේ ශීලයේ පිහිටලා සමාධිය වඩන්නෙයි කියන්නේ. සිත යම්කිසි අරමුණක නොසෙල්වෙන අන්දමින් පවත්වා ගන්න පුළුවන් වෙන්නේ පසු තැවිලි ආදිය නැති තත්ත්වයක් හිතේ ඇති කරගත්තොත් තමයි. ඒකට උපකාර වෙන්නේ යම්කිසි විශේෂ කාල සීමාවක් තුළ රැක්ක සීලයයි. ඒ කාල සීමාව දික්වුන පමණට ඒ ශීලය ශක්තිමත්. නමුත් අවම මට්ටමින් හරි යම් කිසි අවස්ථාවක අධිෂ්ඨාන කරගන්නවා. අද ඉඳලා, මේ මොහොතේ ඉඳලා මම වෙන මනුෂ්‍යයෙක්, මගේ චරිතය, මගේ ජීවිතය, පූර්ණ පරිවර්තනයකට හැරවීමේ ආරම්භක අවස්ථාවටයි මේ මුල්ගල තැබුවේ, කියල අර ඡත්ත මානවකයා වගේ ශීලයක් අධිෂ්ඨාන කර ගත්ත නම් එදා ඉඳල අන්න ඒ තැනැත්තාට නිරවද්‍ය සුඛය - අර නිරාමිස සැපය - ඇතිවෙනවා. එතන ආවර්ජනා කිරීමෙනුයි ඒ සැපය ලැබෙන්නේ.

ශීලයේ තියෙනවා අධිෂ්ඨානයත් ආවර්ජනාවත් කියලා දෙපැත්තක්. අධිෂ්ඨානය ඉබේටම අර සමාදානය තුළ තිබෙනවා. කවුරුවත් කිව්වට බයේ නොවෙයි. 'සමාදන්වෙමි' කියලා තමන්ම ඒක මුළු හිතින්ම පිළිගෙන ඒ ප්‍රතිපත්තිය අධිෂ්ඨාන කරගන්නවා. ඊළඟට එහෙම අධිෂ්ඨාන කරගෙන ඒක රැකීම තුළින්, ඒ රැක්ක බව ආපසු හැරිලා බලන කොට - ආවර්ජනය කළා කියල කියන්නේ නැවත සලකා බලනවා ආපසු හැරිලා - උදේ අධිෂ්ඨාන කරගත්තු ශීලය රෑ ආපසු හැරිලා බලන කොට ඒක හරියට රැකිලා තියෙනවා නම්, දවසේ නොයෙකුත් එදිනෙදා ජීවිතයේ කරදර මධ්‍යයේත් මේවා මම රැකගත්තා කියල ඒ තැනැත්තාට ලොකු සතුටක් දැනෙනවා. සතියකට පස්සෙ ආවර්ජනය කරලා බැලුවත් මේක නොකඩවා රැක්ක කියල ඊටත් වඩා ලොකු සතුටක් ඇති වෙනවා. මාසෙකට පස්සෙ, අවුරුද්දකට පස්සේ, අවුරුදු විසිතිස් ගණනක් තිස්සේ යම්කිසි ශික්ෂාපදයක් හරියට රැක්කා නම්, ඒක තුළින් විශාල චිත්ත ශක්තියක් සතුටක් ඇතිවෙනවා.

ඒ සතුටම තමයි සමාධියට උපකාර වෙන්නේ කියලා ධර්මයේ දක්වල තියෙනවා. සිල්වත් කෙනාට අමුතුවෙන් උත්සාහයක් කරන්න ඕනේ නෑ. 'මට ප්‍රමෝදයක් ඇති වේවා' කියලා සතුටක් ඇති වේවා' කියලා. ඒක ධර්මතාවමයි ශීලවන්තයාට අර පසු තැවිල්ලක් ඇති නොවීම නිසා ප්‍රමෝදයක් ඇතිවෙනවා. ඒ ප්‍රමෝදය ඇතිවුනාම ඒක ප්‍රීතියට හරවා ගෙන ඒ ප්‍රීතිය තුළින් ඊළගට සිත තැන්පත් වෙලා කායික මානසික සුවය තුලින් සමාධියක් එනවා ගත්තු කර්මස්ථානය අනුව. ඕකයි ධර්මතාව. එතකොට ශීලයේ වටිනාකම එහෙමයි.

ඉතින් ඒවගේම තමයි ඒ ශීලය පිහිට කරගෙන ඊළහට සමාධිය. සමාධිය කියල කියන්නේ සිත එකඟකර ගැනීම. එකඟ කරගත්තු සිතේ තත්ත්ව තමයි ධ්‍යාන සමාපත්ති වශයෙන් දැක්වෙන්නේ. ඒවා උපකාර කරගෙන අර බුදු පියාණන් වහන්සේ මේ දක්වා වදළ ඉතාම ගැඹුරු දේ වන ජීවිතයක යථාර්ථය, චරිතයත් හිතත් පිළිබඳ යථාතත්ත්වය ඒ ගැඹුරු ධර්මය අවබෝධ කරගන්න ශක්තිය ලැබෙනවා.

ඉතිං මේ ඔක්කොම කරන්නෙ - පළමුවෙන්ම හිතා ගන්න තියෙන්නෙ- සරණ සමාදනය පිහිට කරගෙනයි. මේ තුණුරුවන් කියල කියන්නෙ මොනවාද? කියල අපි හිතලා බලන්ට ඕනෑ. ත්‍රිවිධ රත්නය - ඇයි මේවාට රත්න කියලා කියන්නේ? දැන් ඔය ධර්මයේත් සඳහන් වෙනවා.

**යං කිඤ්චි රතනං ලොකෙ - විජ්ජති විවිධා පුථු**
**රතනං බුද්ධ සමං නත්ථි - තස්මා සොත්ථි භවන්තු තෙ**
**රතනං ධම්ම සමං නත්ථි - ..................................**
**රතනං සංඝ සමං නත්ථි - ..................................**

කියලා ඒ විදියට ඔය ආශීර්වාද ගාථාවල එහෙම සඳහන් වෙනවා ලෝකයේ යම්තාක් රත්නයන් විද්‍යමාන වෙනවානම්, දකින්න ලබෙනවානම්, ඒ හැම රත්නයකටම වඩා බුද්ධ රතනය ශ්‍රේෂ්ඨයි. ධර්ම රත්නය ශ්‍රේෂ්ඨයි, සංඝ රත්නය ශ්‍රේෂ්ඨයි කියලා. ඉතින් ඒ විදියටයි ඒ රත්න උපමාව අතීතයේ ඉඳලා එන්නේ. ඒ රත්නය කියලා කියන්නේ, මෙතනින් හිතාගන්න තියෙන්නේ යම් කෙනෙකුගේ වටිනාකමක් එන්නේ තමන්ගෙ හදවතේ තැන්පත් කරගත්තු මේ ත්‍රිවිධ රත්නය නිසයි.

අතීතයේ කොයි කොයි විදියේ ජීවන තත්ත්ව තිබුනත් ලෝකයේ ඉතාමත්ම දුර්ලභ වශයෙන් පහළවන බුද්ධ, ධම්ම සංඝ කියන ඒ ත්‍රිවිධ වස්තූන් හැඳින්වුයේ රත්න වශයෙන්. රත්න වලටයි උපමා කළේ. නමුත් මේ මෑත





යුගයේ නොයෙකුත් සමාජ විපර්යාස නිසා අපේ බෞද්ධ උපාසකයින් තමන්ගේ සරණ ගමනය කෙලෙසගන්නව. දෙරුවන් පිළිබඳ සංකල්පයක් ඇතිකරගෙන එක රත්නයකට රත්න තත්ත්වය දෙන්නේ නැති සංකල්පයක් දැන් රටේ යනවා. එතකොට ඒක තමන්ගේ සරණ ගමනය කෙලෙසා ගැනීමක්. ත්‍රිවිධ රත්නය මිසක් රත්න දෙකක් පිළිබඳ සරණ යාමක් මේ ශාසනයේ නැහැ. ඒක නිසා අපි අර අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝරත්නය කියන ඒ රත්න සංඥාව නිතර ඇති කරගන්ට ඕන. රත්න සංඥාව උඩයි අපි මේ ශීලය රකින්නෙ. ඒක අර ඡත්ත මානවක කථාවෙන් පෙනෙනවා. ඒ දෙන වටිනාකම අනුව තමයි බුදුරජාණන් වහන්සේ ශාස්තෲන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය ප්‍රතිපදවයි. ඒ ප්‍රතිපදවේ නෛර්‍යාණිකත්වය, සාර්ථකත්වය පිළිබිඹු කරන පිරිස තමයි සංඝයා වහන්සේ. ඉතින් ඒකම තමයි ඔය අග්ගප්පසාද ආදී සූත්‍රවල ඉතාමත්ම අලංකාර අන්දමින් බුදුරජාණන් වහන්සේ දක්වල තියෙන්නේ, ඒ ශ්‍රද්ධාවන්තයාට ඉතාමත්ම අර්ථවත්වන අන්දමින්. යම්තාක් සත්ත්වයින් සිටිනවනම් අපා දෙපා, සිව්පා බුහුපා, රූපී, අරූපී, සඤ්ඤී, අසඤ්ඤී, නෙවසඤ්ඤී, නාසඤ්ඤී ඒ සියලුම සත්ත්ව කොට්ඨාශ අතර තථාගත අර්හත් සම්මා සම්බුද්ධ කෙනෙක්ම ශ්‍රේෂ්ඨය අග්‍රය. යම් කෙනෙක් අග්‍ර වූ ඒ බුදුකෙනෙක් පිළිබඳව ප්‍රසාදයක් ඇතිකර ගත්ත නම් ඒ ඇතිකර ගත්තෙ ලෝකයේ අග්‍රමවූ කෙනකු පිළිබඳවයි. යම් කෙනෙක් අග්‍රවූ පුද්ගලයකු පිළිබඳව ප්‍රසාදයක් ඇති කරගත්ත නම්, ඒකෙ විපාකයත් අග්‍රයි. අන්න ඒ විදියට බුද්ධ රත්නය ගැන කියවෙනව.

ඒ වගේම ඊළහට කියනවා යම්තාක් හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්මයන් තිබෙනවා නම් ඒ සියලු ධර්මයන් අතර ආර්ය අෂ්ටාංගික මාර්ගය කියල කියන ඒ ප්‍රතිපදාවම, ඒ ධර්මයම, තමයි ශ්‍රේෂ්ඨ. ධර්මය කෙරෙහි යම්කෙනෙක් ප්‍රසාදයක් ඇති කර ගත්තා නම් ඒ ප්‍රසාදයෙහි ආනිශංසත් ඒ වගේම අග්‍රයි. ඊළහට දක්වනවා යම්තාක් සංඛත අසංඛත ධර්මයත් තියෙනවානම් ඒ අසංඛත නම් වූ හේතු ප්‍රත්‍යයන්ගෙන් හටනොගත් ඒ නිර්වාණය කියල කියන උතුම් ධර්මයම ඒවා අතර ශ්‍රේෂ්ඨයි. යම් කෙනෙක් නිර්වාණ ධර්මය පිළිබඳව ප්‍රසාදයක් ඇති කර ගත්තා නම් එහි ආනිශංසයත් වගේමයි. ඊළහට කියනවා යම්තාක් ලෝකයේ සමූහයන්, පිරිස්, සිටිනවානම් ලෝකයේ යම්තාක් සමූහපිරිස් වශයෙන් කොටස් දකින්න ලැබෙනවා නම් ඒ පිරිස් අතර තථාගත සංඝයා, අෂ්ඨාර්‍ය පුදගල සංඝ රත්නයම ශ්‍රේෂ්ඨයි. ඒ නිසා යම්කෙනෙක් සංඝරත්නය පිළිබඳව ප්‍රසාදයක් ඇතිකර ගන්නවා නම් එහි ආනිශංසයත් ඒවගෙයි.

ඔන්න ඔය විදියට බුදුපියාණන් වහන්සේ බොහෝ අවස්ථාවල මේ ත්‍රිවිධරත්නයේ සරණයාම, ඒ රත්න සංඥාවේ වටිනාකම, ලෝකයාට

හඳුන්වල දීල තියෙනවා. එතකොට අපි ඒ ගැන නිතර කල්පනා කරන්න ඕන. මෙන්න මේ අපි කරන ක්‍රියාවල්වල, ඒ හැම එකකම, වටිනා කමක් ඇති වෙන්නේ අපේ හදවත තුළ ඇතිකර ගත්තු, අර ශ්‍රද්ධාව තුළින් ඇතිකරගත්තු, ඒ ශක්තියයි. ඒකම තමයි කියන්නේ,

**'සද්ධාය තරතී ඔඝං කියලා'**

මේ සංසාර සැඩ වතුරේ - සංසාරය කියල කියන්නේ, කාම, භව, දිට්ඨි අවිජ්ජා කියන මහා භයානක සැඩ වතුරු හතරක් - මේකෙන් එහාට එතරවෙනවා කියා හිතන්නවත් බැහැ. ඒ තරම් පුදුම විදියේ මේ අපි අනන්ත කාලයක් මේවායේම ගැලිල මේවා ඔස්සේම ගසාගෙන යන සැඩ වතුරු හතරකින් එතරවීමයි, සසරින් එතෙරවීම කියලා කියන්නේ. එතකොට මේ කාර්යයට අපි මුහුණ දෙන්නනම් ඒකට සෑහෙන ශ්‍රද්ධා ශක්තියක් තියෙන්න ඕන. ඒ ශාස්තෘන් වහන්සේ බොරුවක් කියන්නේ නෑ කියල තථාගතයන් වහන්සේගේ සම්බෝධිය පිළිබඳව ශ්‍රද්ධාව ඇති කර ගන්නවා. **"සද්දහති තථාගතස්ස බොධිං"** තථාගතයන් වහන්සේ සම්මා සම්බුද්ධ යයි කියල පිළිගැනීම, ඊළඟට උන්වහන්සේගේ ප්‍රතිපදාව නෛර්යාණිකයි කියලා පිළිගැනීම. ඊළඟට ඒ නෛර්යාණික ප්‍රතිපදාවේ නෛර්යාණිකත්වය ඔප්පු කළ පිරිසකුත් සිටියා කියන ඒ හැඟීම ඇතිකර ගැනීම.

ඕක තුළින් තමයි අන්න අර කෙනෙක් ශ්‍රද්ධාවෙන් අර **'සද්ධාය තරතී ඔඝං'** කිව්ව විදියට සැඩවතුරෙන් එතෙර වෙන්නෙ. ඒ වගේම තවත් අවස්ථාවල මේ පින්වතුන් කොතෙකුත් අහල තියෙනවා - මේ ශාසනික ගුණ ධර්ම ගොවිතැනක් හැටියට ගත්තොත්, ශ්‍රද්ධාව බීජය හැටියට දැක්වෙනවා. ඊළඟට ගුණධර්ම පිළිබඳව දැක්වෙන හැම තැනකම වගේ ශ්‍රද්ධාව ඉන්ද්‍රිය හැටියට බල හැටියට මුලින්ම මතුකරලා දක්වන්නෙ. මේ සත්ත්වයා තුළ තිබෙන ශක්තිය-කායික, මානසික ශක්තිය-යම්කිසි අරමුණක් කෙරෙහි යොමුකරන්න නම් ඇත්ත වශයෙන් ඒ තැනැත්තා තුළ විශාල කැපවීමක් තියෙන්න ඕන. ඒ කැපවීමයි මේ සරණ ගමනය තුළ තිබෙන්නේ. ඇතැම් කෙනෙකුට මේක දැන් තේරුම් ගන්නත් බෑ. ඇතැම් පණ්ඩිතයින්ට තේරුම් කරලා දෙන්න වෙනවා. මොකක්ද මේ සරණයාම?

ඇතැම් කෙනෙකුට හිතාගන්නත් බෑ. මොකටද මේ අපි බුදුන් සරණ යන්නේ? සඟුන් සරණ යන්නේ? ඇයි කියලා තියනවානේ තමන්ට තමන්මය කියලා. ඒකෙ අදහස එහෙම පිටින්ම වරද්දගෙන. තමන්ම තමයි මේ එතෙර වෙන්ට ඕනෑ. බුදුරජාණන් වහන්සේට අරගෙන යන්න බෑ මේ එක එක්කෙනා මෙගොඩ ඉඳලා එගොඩට. නමුත් තමන් යන්නෙ - අන්න අර





කෙනෙක් ඉන්නවා මේ කියන පාර හරි. මේ කියන විදියට උත්සාහ කළොත් හරි මේ විදියට ක්‍රියා කළොත් හරි. ඒ ටිකටයි අපි සරණ යන්නේ. බුදුන් සරණ යනවා දහම් සරණ යනවා සඟුන් සරණ යනවා කියල කියන්නෙ කෙනෙකු අර විදියට සමහර ආගම්වල තියෙන්නා වගේ වෙන කෙනෙක් ඇදගෙන යනවා නෙවෙයි, මෙතන. ඒ, එපමණකට තමන්ගේ ඇතුළත තිබෙන වීර්යය මතුකර ගැනීමට. ඒකයි ශ්‍රද්ධාව අනුව ඊළඟට තියෙන්නෙ, විරිය සති සමාධි පඤ්ඤා. ශ්‍රද්ධාව ළඟම වීර්යය එන්නෙ ඒකයි.

**සද්ධාය තරතී ඔඝං - අප්පමාදෙන අණ්ණවං**
**විරියෙන දුක්ඛං අච්චෙති - පඤ්ඤාය පරිසුජ්ඣති**

ඔය විදියට ඇතැම්විට දක්වලා තිබෙනවා. ශ්‍රද්ධාවෙන් තමයි එතෙර වෙන්නෙ. අප්‍රමාදයෙන් ඒ වගේම. අප්‍රමාදීව සසර සයුරෙන් එතෙරවන්ට ඕනෑ. ඊළඟට වීර්යයෙන් - වීර්යය මතුවෙන්නෙ අන්න අර ශ්‍රද්ධාව පිහිටකර ගෙනයි. ඒ නිසා ශ්‍රද්ධාව යම් පමණකට දැඩි වන්නේ ඒ වස්තූන්ට දුන්න වටිනාකම අනුවයි. එතකොට අපි මේ රත්නවලට අඩු දේකට මේ එකක්වත් සමාන කළොත් ත්‍රිවිධ රත්නයෙන් - මේ කියාපු එතෙර වෙන්න පුළුවන් ශක්තිය අප තුළ ඇතිවෙනවද කියල සිතලා බලන්න ඕන.

එක්තරා කෙනෙක් බුදුපියාණන් වහන්සේගෙන් ඇසුවා. මේ ශාසනයේ උපාසකයෙන් වෙන්නෙ කොහොමද? කියලා බුදු පියාණන් වහන්සේ කිව්වා. **"බුදුන් සරණ යනවා දහම් සරණ යනවා, සඟ සරණ යනවා"**. කිව්ව පමණින් උපාසකයෙක් වෙනවා කියලා. කොයිතරම් ලේසිද බැලුවහම. අමුතුවෙන් අයදුම්පත්‍ර පුරවන්න වත්, ගාස්තු ගෙවන්නවත් මොකක්වත් ඕන නැහැ. බැලුවහම හරි ලේසි වගෙයි. බුදුන් සරණ යනවා, දහම් සරණ යනවා, සඟුන් සරණ යනවා. ඕක කිව්ව පමණින් උපාසකයෙක් වෙනවා. නියම උපාසකයෙක් වෙන්න නම් අන්න අර කියාපු විදියට **'නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මේ සරණං වරං - එතෙන සච්ච වජ්ජෙන හොතුමෙ ජයමංගලම්'** කියලා සත්‍යක්‍රියා කරන්න පුළුවන් තත්වයට සරණයාම. **නත්ථි මෙ සරණං අඤ්ඤං** මට වෙන පිහිටක් නැත බුදුන්ම මට උතුම් සරණයි ඒ සත්‍යයෙන්ම ජයමඟුල් වේවා! කියලා. ඒ ගාථාවෙන් කියන්නේ. අන්න ඒ මට්ටමටයි. ඒක ඇතිකර ගන්නයි අන්න ඒ සරණයාම උපකාර වෙන්නෙ. ඉතින් ඒ විදියට කල්පනා කරලා බලනකොට මේ තුණුරුවන් සරණයාම සුලුකොට තැකිය යුතු දෙයක් නෙවෙයි. තුන් සැරයක්ම ඒක කියන්නේ අර විදියට තමන්ගේ හිතට කාවද්දා ගැනීමටයි.

ඒ සරණයාම තුළින් ඇතිවන කුශල ශක්තිය අර විදියෙ දිව්‍ය ආත්මභාව ලබාදීම පමණක් නොවෙයි. ඒක පිහිට කරගෙන ඊළඟට ශීලය පුරනවා. ශීලය පිහිට කරගෙන සමාධිය පුරනවා. සමාධිය පුරලා යම් අවස්ථාවක ඒ සමාධිය පිහිට කරගෙන, අතීත කුශල ශක්තියත් උපකාර කරගෙන තමයි කෙනෙක් සෝවාන් සකදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ගඵල ප්‍රතිවේධයෙන් ඒ උතුම් නිර්වාණ ධර්මය පවා සාක්ෂාත් කරගන්නේ.

එතකොට අපිත් කල්පනා කරගන්න ඕනෑ අපේ මේ ජීවිතය ගැන. විශේෂයෙන්ම අපි අර කුඩා දරුවන් ගැන කිව්ව කාරණය වගේ කුඩා දරුවන් පමණක් නොවෙයි ලොකු දරුවන් උනත් හිතන්න තියෙන්නේ අපි මේ දවස ගතකරන්න ඕන මේ තුණුරුවන් සිහිපත් කරගෙනයි. මොකද ඒ තුණුරුවන් සිහිපත් කරගත් පමණින් අපට හැම උපද්‍රවයකින්ම මිදීමවත් මරණයෙන් මිදී සදාකාලිකව ජීවත්වීමවත් ලැබෙනවා නොවෙයි. නමුත් අර කියාපු 'ආසන්න සිතින්' අපි සිටිනවා නම් යම් අවස්ථාවක මරණය සිද්ධවුනොත් ඒ අවස්ථාවේදි දුගතියට නොගිහින් හොඳ තත්ත්වයක් ලබාගන්න පුළුවන්. මොකද, මේ අපේ නැවත උත්පත්තිය කියන්නේ කොටින්ම කියතොත් අපේ මේ හිතේම ඡායාරූපයක්. පිංතූරයක් ගන්න ලෑස්තිවෙලා ඉන්න වෙලාවෙ අපි නියෙව්වොත් මොකක්ද වෙන්නෙ? ඒ පින්තූරේ කොහොමද වැටෙන්නේ?

ඒවගේ තමයි එතකොට මරණ අවස්ථාවේ අපේ හිත දූෂිතවෙලා තිබුනොත් අන්න ඒ අවස්ථාවේ ඒ විදියටම ප්‍රේත, යක්ෂ තිරිසන් ආදී තත්ත්වයක උත්පත්තිය ලබනවා. එතකොට යම්කිසි විදියකින් අර සුගති තත්ත්වයක උත්පත්තිය ලැබුවොත් විශේෂයෙන්ම අර දැන් කියාපු දේවතාව වගේ, ආපසු ආවර්ජනය කරලා බලන කොට අපි මේ තරම් පොඩිදෙයක් හැටියට ලෝකයා හිතුව දෙයක් තුළින් මේ තරම් අපට ආනිශංසයක් ලැබුණොත්, මේ ධර්ම මාර්ගය සම්පූර්ණ කරනව නම්, කොයි විදියේ ආනිශංස ඇද්ද කියලා ඒ විදියට කල්පනා කරන්න පුරුදු වෙන්න ඕන.

එතකොට විශේෂයෙන්ම මේ අද මාතෘකාව වශයෙන් බැලුවහම අර ශාසනයේ ආරම්භක පියවර. නමුත් ඒක හරියාකාරව තේරුම් ගත්තෙ නැත්නම් මේ ශාසනයේ ගුණධර්ම පිරීම දුෂ්කර වෙනවා. ගැඹුරු දේවල්, ලොකු දේවල්, කියල බදාගත්ත දේවල් සමහරවිට තමන්ගේ ඇතුළට ඇතුල් වෙන්නේ නෑ මූලික කාරණා හරි ආකාරව තේරුම් ගත්තේ නැත්නම්. ඒ නිසා මේ ඡත්ත මාණවක කථාන්තරය ආදියෙන් අපි මේ ශාසනයේ අර කියාපු ත්‍රිවිධරත්නයේ වටිනාකම තේරුම් ගත්තා නම් ඒක උපකාර කරගෙන තමයි අපේ අනිකුත් ඒ ප්‍රතිපත්ති පිරීම් ආදිය කරගන්න පුළුවන්





වෙන්නෙ. එතකොට මේ පින්වතුන් කල්පනා කර ගන්න ඕන තමන්ගේ ජීවිතයේ දවසක් - එදිනෙදා කොයි තරම් වැඩ තිබුණත් - පොහොය දවස විරාමයක් හැටියට යොදාගෙන ඒ අවස්ථාව තුළ ආවර්ජනය කරලා තමන්ගේ ජීවිතයේ අඩුපාඩු කම් හරිගස්ස ගනිමින් ඉදිරියට මේ සංසාරයෙන් එතෙරවීම සඳහා තමන්ගෙන් ඉෂ්ටවිය යුතු, තමා විසින් කළ යුතු, දේවල් ගැන නිස්කලංකව කල්පනා කරලා මේ පොහොය දවසක, ඒක අනුවම ඒ ශීලයක පිහිටලා ඒ අනුව බණ භාවනා කරලා මේ කටයුතු කරගැනීමෙන් තමයි සංසාරදුක මේ බුද්ධෝත්පාද කාලයේදීම කෙළවර කරගන්න පුළුවන් වෙන්නේ. එතකොට කල්පනා කරගන්න ඕන. අද දවසේ මෙතෙක් මේ තමන් සීල සමාදානාදියෙන්, භාවනාදියෙන් රැස්කර ගත්තු පුණ්‍ය සම්භාරයත් මේ ධර්මශ්‍රවණයෙන් රැස්කරගත්තු පුණ්‍ය සම්භාරයත් උපකාර කරගෙන මේ ජීවිතය තුළදීම හැකිතාක් උත්සාහ කරලා අර සෝවාන් සකදාගාමි අනාගාමි අර්හත් යන මාර්ගඵල ප්‍රතිවේධයෙන් මේ ජාති ජරා ව්‍යාධි මරණාදි සංසාරදුක් කෙළවර කරගැනීමට මේ කුශල ශක්තියත් ඒකාන්තයෙන් උපනිශ්‍රය වේවා! කියල ප්‍රර්ථනා කර ගන්න.

ඒ වගේම ශාසනාරක්ෂක දිව්‍ය බ්‍රහමරාජයින් ඇතුළු යම්තාක් අවීචියේ සිට අකනිටා දක්වා සත්ත්ව කෙනෙක් ඇත්නම් අපේ ඥතීනුත් ඇතුළු, හැම කෙනෙක්ම මේ ධර්මදේශනාමය ධර්මශ්‍රවණමය කුශලය අනුමෝදන් වීමෙන් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමාමහ නිවන් සාක්ෂාත් කරගනිත්වා කියන ප්‍රාර්ථනාව ඇතිව මේ ගාථා කියන්න.

**"එත්තාවතාච අම්හෙහි......"**

# 27 වන දේශනය

# 27 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'**

**අප්පමාදරතො භික්ඛු**

**පමාදෙ භයදස්සිවා**

**සඤ්ඤොජනං අණුං ථූලං**

**ඩහං අග්ගීව ගච්ඡති**

**- අප්පමාදවග්ග - ධම්මපද**

සැදැහැවත් පින්වතුනි,

සම්බෝධිය ලබාගැනීමෙන් අද වාගේ වෙසක් පුර පසළොස්වක පෝය දවසක තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ සොයා ගත්තේ භවයෙන් එතෙරවීමේ මාර්ගයයි. ආර්ය පර්යේෂණයක් තුළින් ඒ කළ සොයාගැනීම තමයි ලෝකයේ ඉතාමත්ම උතුම්ම සොයාගැනීම- භවයෙන් එතෙරවීමේ මාර්ගය සොයාගැනීම. අනන්ත කාලයක් සංසාරයට බැඳිල හිටිය ලෝක සත්ත්වයාට ඒ සසර භවයට බැඳසිටි බැමි මොනවාද කියල තේරුම් ගැනීමටත් ඒ බැමි සිඳලා දලා විමුක්තිය ලබාගැනීමටත් උපකාරවන ඒ අවබෝධය බුදුපියාණන් වහන්සේ එදා ලබාගත්තා.

අද අපි මාතෘකාකරගත්තු ගාථාවෙනුත් ඊට අදාල කථාවෙනුත් කියවෙන්නේ අන්න ඒ සංයෝජන පිළිබඳ කථාන්තරයයි. ඒ බැමි පිළිබඳ කථාන්තරයයි.

බුදුපියාණන් වහන්සේගෙන් කමටහන් ලබාගෙන ඈත කැලෑවකට භාවනා කරන්න වැඩිය එක්තරා ස්වාමීන් වහන්සේ නමක් මුල්කරගෙනයි මේ ගාථාව දේශනාකරන්න යෙදුනෙ. ඒ ස්‍වාමීන් වහන්සේ අර්හත්වය දක්වාම කමටහන් ලබාගෙන කැලේකට ගිහිල්ලා භාවනා කළ නමුත් යම්කිසි අධිගමයක් ලබාගන්න බැරිවෙලා කල්පනා කළා "කමටහනේ මොකක් හරි අඩුවක් ඇති. මම ගිහිල්ලා කමටහන සුද්ද කරගන්න ඕනෑ නැවත භාග්‍යවතුන් වහන්සේ හමුවෙලා" කියලා හිතාගෙන එහෙම ජේතවනාරාමයට එන බලාපොරොත්තුවෙන් පිටත්වෙලා එන අතරමගදී ලැව්ගින්නක් දකින්න ලැබුණා. ඒ ලැව්ගින්න පැතිරෙනකොට මේ හාමුදුරුවෝ

ඉක්මණින්ම ඒ කිට්ටුව තිබුණ උස පර්වතයක් උඩට නැගල ඒ ගින්නෙන් බේරුනා. නමුත් බලාගෙන හිටිය මේ ලැව්ගින්න පැතිරෙන හැටි. ඒ බලාගෙන ඉන්න අතරෙ යම්කිසි ලොකු සංවේගයක් තුළින්, කල්පනාකරනවා දැන් මේ මම බලාපොරොත්තු වන අර්හත් මාර්ගඥානයෙන් ලෝකයෙන් එතරවීම සඳහා කරන උත්සාහයේදී මතුකරගතයුතු විදර්ශනා ඥානවලිනුත් කෙරෙන්නේ මෙන්න මේ වගේ උපාදානයන් - මේ ගින්න උපාදානයන් කියල කියන මේ දර එහෙම නැත්නම් අහුවෙන අහුවෙන ඒ හැම දෙයක්ම - දව දවා යන්නා වගේ අර්හත් මාර්ගඥානයෙනුත් ලෝකයට බැඳිල තියෙන ඒ බැමි ඒ ඥාන ගින්නෙන් දැවිල යනවා ඇතෙයි කියල ඒ විදියට යම්කිසි අදහසක් ඒ හාමුදුරුවන්ගේ සිත තුළ ඇතිවුනා.

බුදුපියාණන් වහන්සේ ජේතවනාරාමයේ ඉඳල මේ හාමුදුරුවන්ගේ සිතිවිලි පරම්පරාව දැකල ඒක නිවනට යොමුකිරීම සඳහා තමයි මෙන්න මේ ගාථාව - එතන කියවෙන හැටියට 'ඕභාස ගාථා" හැටියට හැඳින්වෙන ගාථාව - වදාළෙ. එබඳු සිද්ධි බොහෝ අවස්ථාවල කියවෙනවා. බුදුපියාණන් වහන්සේ ඍද්ධියෙන්ම තමන් වහන්සේ ඒ භික්ෂුන් වහන්සේ ඉදිරියේ පෙනීසිටින හැටියට පෙන්නුම් කරල උන්වහන්සේට ඇහෙන හැටියට මේ ගාථාව වදාළා.

**"අප්පමාදරතො භික්ඛු**
**පමාදෙ භයදස්සිවා**
**සංයොජනං අණුං ථූලං**
**ඩහං අග්ගීව ගච්ඡති. "**

අප්‍රමාදය ඇලුම්කරන්නා වූ, ප්‍රමාදයේ බිය දක්නාවූ, භික්ෂුව ලොකු කුඩා සියලු බැමි, සංයෝජන, හැකිළි, ඒ සියල්ල ගින්නක් මෙන් දවමින් ඉදිරියට යනව කියල. ඒ විදියෙ අර විදර්ශනා ඥනයන්ට තුඩු දෙන අන්දමේ, රුකුල්දෙන අන්දමේ ගාථාවක් වදාළ. බුදුපියාණන් වහන්සේ ඒ භික්ෂුන් වහන්සේගේ චිත්තාචාරය අනුමත කරමින් එසේය භික්ෂුව, ඔහොම තමයි ඒ ගින්න දැවෙන්නා වාගේ විදර්ශනා ඥාන ඒ සංයෝජන දවාගෙන යනවා කියල තමයි ඒ ගාථාව ප්‍රකාශ කළේ. ඒක අහල, එතැන කියවෙන හැටියට ඒ භික්ෂුන් වහන්සේ අර්හත්වයම ලබාගෙන බුදුරජාණන් වහන්සේ දකින්න වැඩම කරල ඒ තමාගේ විමුක්තිය ප්‍රකාශ කළා කියල කියවෙනවා.

ඉතින් මේ කථාන්තරය ගැන කල්පනා කරල බලනකොට අර භික්ෂුන් වහන්සේට ලැව්ගින්න දර්ශනයක් - දර්ශන මාත්‍රයක් - පමණක් වුනේ නැහැ. අපට ලැව්ගින්න දර්ශනයක් පමණයි. ඒක විදර්ශනාවට අරමුණක් වුනා. ලැව්ගින්න කියන එක - ඒ වචනය මේ හැමදෙනෙක්ම අහලත්





නැතුව ඇති සමහරවිට - ඒ කියන්නෙ ඔය කැලෑවල බොහෝවිට ලැව්ගින්න ඇතිවෙන්නෙ ස්වාභාවික වශයෙන් සිදුවෙනව නම් දැඩිව පායන කාලේ ඔක්කොම ගස් වේලිලා තියෙන අවස්ථාවක කුණාටුවක් ආවාම ගස් දෙකක් ඇතිල්ලෙනවා. ඇතිල්ලී, ඇතිල්ලී, ඇතිල්ලී ගිහිල්ලා ඔන්න ගිනි ගන්නවා. ගිනි අරගෙන අර ගස් දෙකත් දැවිලා යනවා. ඊළඟට ඒ අවට තියෙන ගස් කොළන් පඳුරු ඔක්කෝම ගින්නට අහුකරගෙන ක්‍රම ක්‍රමයෙන් භයානක අන්දමින් පැතිරිලා යනවා අහුවෙන අහුවෙන හැම දෙයක්ම ගොදුරු කර ගනිමින්. ඉතින් ඔන්න ඕක එක්තරා සංවේග ජනක දර්ශනයක්. ඒක නිවන් පැත්තට යොමු කරලයි අර භික්ෂුන් වහන්සේ අර විදියට විදර්ශනා ඥාන මතු කර ගත්තේ.

දැන් අපි ටිකක් කල්පනා කරලා බලනවා නම් බුදුපියාණන් වහන්සේට මුළු මහත් ලෝකයම පෙනුනේ ගිනි ගත්තු තැනක් හැටියටයි. සමහර සූත්‍ර දේශනා තියෙනවා, මහ පුදුම දේශනා. සංවේගය උපදවන විදියේ දේවල් ආදිත්ත පරියාය, කියන ඒ විදියේ සූත්‍ර තියෙනවා. සමහර ඒවා මහා ආශ්චර්යවත්.  බුදුරජාණන් වහන්සේ ගයා ශීර්ෂයේදී බුද්ධ ගයාවෙදිම භික්ෂුන් වහන්සේලා දහසක් නමකට දේශනා කළ සූත්‍රයක් තියෙනවා, සූත්‍රය නම් ඉතාම කෙටියි නමුත් ඒක අවසාන වෙන්නේ ඒ දහස් නමම රහත්වුනා කියලා. මහා බලසම්පන්න සූත්‍රයක්. ඒක පටන් ගන්නේ.

**''සබ්බං භික්ඛවෙ ආදිත්තං''**

"මහණෙනි සියල්ල ගිනි අරගෙනයි තියෙන්නේ." හැම එකක්ම ගිනි අරගෙන දැවෙනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරනවා "මොකක්ද? මහණෙනි ඒ සියල්ල කියලා කියන්නේ?" ඔන්න ඊළඟට සියල්ල කියන එක - එතැන 'සබ්බං' කියලා කියන්නේ - සියල්ල කියන එක විග්‍රහ කරනවා.

**ඇසයි - රූපයයි**
**කණයි - ශබ්දයි**
**නැහැයයි - ගඳ සුවඳයි**
**දිවයි - රසයි**
**කයයි - ස්පර්ශයයි**
**සිතයි - සිතුවිල්ලයි**

ධම්ම කියන වචනය එතන යෙදෙන්නේ සිතට එන දේ. මේ හැම එකක්ම ගිනි අරගෙන තියෙන්නේ. ගිනි අරගෙන දැවෙනවා. මොනවායින්ද මහණෙනි ගිනි අරගෙන තියෙන්නේ? ඔන්න ඊළඟට කියනවා මේ පින්වතුන්

අහලා ඇති. එකොලොස් ගින්න පිළිබඳවයි ඊළඟට කියවෙන්නේ. රාග දෝස මෝහ කියන ගිනි වලින්. ඒ තුන පමණක් නොවෙයි. ඊළඟට එතැන කියවෙනවා ජාති, ජරා, මරණ, සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස කියලා කියන මේ දුක් ගිනි රාශියක් කියවෙනවා. මේ ගිනි වලිනුයි මේ ඇසත් - රූපයත්, කණත් - ශබ්දයත් ආදී වශයෙන් අවසාන වශයෙන් සිතත් - සිතුවිලිත් කියන මේ හැම එකක්ම. ලෝක සත්ත්වයා තුළ මහා ගින්නක් තියෙනවා කියලා. හැම තැනම ගිනි අරගත්තු හැටියටයි බුදුපියාණන් වහන්සේට පෙනුනේ.

ඉතින් මේ මුලු මහත් භවයම ගින්නක් කියලා කියන කියමන සමහර විට කෙනෙකුට තේරුම් ගන්න අමාරු වෙන්න පුළුවන්. ඊළඟට අපි මෙන්න මේ ගින්න ගැන ටිකක් කල්පනා කරලා බලනවා නම් එදිනෙදා අවබෝධය අනුව දැන් අපි ගින්දර කියලා වචනයක් පාවිච්චි කරනවා. ගින්න දර අල්ලා ගන්නවා. දර ගිනි ගන්නවා. ඉතින් අපි ගින්දර කියන ඒ වචනය තුළ ඒ දෙකම තියෙනවා. අපි ටිකක් කල්පනා කරලා බැලුවොත් මේ දර කියන එකට පාලි භාෂාවේ යෙදෙන්නේ 'උපාදන' කියන වචනය. උපාදන කියන වචනය ඔය ධර්ම විග්‍රහවල අපට කියන්න පුලුවන් අර්ථ දෙකකින් යෙදෙනවා කියලා. අල්ල ගැනීම කියන අර්ථයත් තියෙනවා. අල්ලා ගත්තු දේ කියන අර්ථයත් තියෙනවා. අල්ලා ගැනීම කියන එකයි මූලික අර්ථය. එතකොට දැන් පංච උපාදනස්කන්ධය උපාදන ගොඩක්. උපාදන ගොඩක් තමයි මේ බුදුපියාණන් වහන්සේ හඳුන්වන හැටියට මේ අපි මමය මාගේය කියලා කියන්නේ. රූප ගොඩක් රූප උපාදනස්කන්ධය කියලා කියනවා. වේදනා ගොඩක් - මේ හැම එකක්ම උපාදන නමින් හඳුන්වනවා. එතකොට උපාදන කියන කොට අර විදියට අල්ලා ගැනීම වාගේම අල්ලා ගන්න දේ. අල්ලා ගන්න දේ කියන අර්ථයෙන් තමයි දර, දර හෝ යම් කිසි ඉන්ධන ද්‍රව්‍යයක්. එතකොට ගින්නකට උපාදනයන් අල්ලගෙන. අල්ල ගත්තට පස්සේ මොකද වෙන්නේ? ඒකෙ අන්තිමට ගින්නයි දරයි අතරෙ වෙනසක් නැහැ.

ඉතින් අර දුක්ගිනිවලින් දැවෙන මේ සත්ත්වයා පිළිබඳ කථාන්තරය අපට තේරෙන සරල කවියකින් මේ අපේ රටේ ඒ අතීතයේ හිටිය ඒ වීදගම මහා ස්වාමීන් වහන්සේ ලෝවැඩ සඟරාවේ දක්වලා තියෙනවා. බොහොම සරල කවියකින්.

**දර රුස ගිනි ඇවිලුනු කල නිබඳේ**
**ගිනි මිස දර යයි යන නම නොයෙදේ**
**එම ලෙස එක්කොට වදහල මුනිදේ**
**දුක මිස කයකැයි යන නම නොයෙදේ**





දර රුස ගිනි ඇවිලුනාට පස්සේ ඒකට ගිනි මිසක් දර කියන නමක් ගැලපෙන්නේ නැහැ. 'නොයෙදේ'. එම ලෙස ඒ විදියටම අර බුදුපියාණන් වහන්සේ ගින්නයි ගින්නට අහුවෙන දරයි එකතු කරලා අරගෙන තමයි 'දුක මිස කය යැයි යන නම නොයෙදේ' මේකට කයක් කියලා කියන්න වටින්නේ නැහැ. දැන් අර ඇස කණ නාසය ආදිය තියෙන්නේ මේ ශරීරයේ නේ. ඔය ආයතන - ආයතන කියලා ධර්මයේ සඳහන් වෙන්නේ- ඔය ආයතන හයම තියෙන්නේ මේ ශරීරය තුළයි. එතකොට මේ ආයතන හයම ගිනි ගන්නවා කියලා කියන්නේ අන්න අරකයි. මුළු කයම ගිනි අරගෙන. ඒකයි එතකොට බුදුරජාණන් වහන්සේගේ චතුරාර්ය සත්‍යය ගැන අපි කවුරුත් කථා කරනවා. 'දුක්ඛ සත්‍යය' 'දුක්ඛ සත්‍යය' කියලා කියනවා සමහරු කියනවා මට දැනටම තේරිලයි කියලා. නමුත් දුක්ඛ සත්‍යය සම්පූර්ණයෙන්ම තේරිලා නැහැ. දුක්ඛ සත්‍යය තේරුන අවස්ථාවේදී තමයි අන්න අර දරයි ගිනියි දෙක එකතු වෙන්නේ. එතෙක් දර ගොඩක් කියලා වෙන්කරගත්තු එක සම්පූර්ණයෙන්ම දැවෙනවා කියලා අවබෝධ කරගත්තට පස්සේ එතන තියෙන්නේ ගිනි විතරමයි. ඒකට දරෙයි කියලා කියන්න බැහැ. නමුත් මේ ලෝකයේ නොයෙකුත් කරදර අරව මේවා දැකල මට දුක තේරුනා කියලා සමහර කෙනෙක් කියනවා. සම්පූර්ණ අවබෝධය එනකොට ඒක වෙන් කරලා ගන්න බැරි තත්ත්වයටම තනිකර දුකක්. තනිකර දුකක්. කේවල දුඃඛ ස්කන්ධය කියලා බුදු පියාණන් වහන්සේ දක්වන්නේ ඔය දුක ගැන විග්‍රහ කරන කොට. සැකෙවින් කියතොත් මුළු මහත් පංච උපාදනස්කන්ධයම, මේ බදගත්තු ගොඩවල් පහම, දුකක් කියලා කියන්නේ අන්න අර දර්ශනයට අනුවයි.

ගින්න දර අල්ලගත්තට පස්සේ යම් අවස්ථාවක් එනවා දර වෙන්කරලා ගන්න බෑ. තනිකර ගිනි ගොඩක් විතරමයි තියෙන්නේ. ඉතින් ඔන්න ඕකයි. එතෙන්ට යන මාර්ගය තමයි විදර්ශනා මාර්ගය. මේක පිළිබඳව ඔය අවබෝධය ලබා ගන්නේ කොහොමද එතකොට? මේ අවබෝධය කරා යන මාර්ගය මොකක්ද? ඒකටත් ඉඟියක් අපට ලැබෙනවා බුදුපියාණන් වහන්සේම දක්වන තවත් සූත්‍ර වලින්. අර කියාපු ආයතන හය පිළිබඳව ප්‍රකාශ කරනවා.

භික්ෂූන් වහන්සේ නමක් අහනවා භාග්‍යවතුන් වහන්සේ ගෙන්, කමටහනක් වශයෙන් ඉල්ලනවා කොහොමද මේ දුක නැති කරගන්නේ කියලා - මේ සසර දුක කෙළවර කර ගන්නේ කියලා. එතකොට බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. "මේ අනිත්‍යතාව තේරුම් ගන්න ඕන."

**ඇසත් අනිත්‍යයි - රූපයනුත් අනිත්‍යයි.**

**කණත් අනිත්‍යයි - ශබ්දත් අනිත්‍යයි**. මේ හැම එකක්ම අනිත්‍යයි. නමුත් අනිත්‍ය සංඥාව සාමාන්‍ය ලෝකයා තුළ නැහැ. ඒ වෙනුවට තියෙන්නේ නිත්‍ය සංඥාව

**ඇස වෙන්කරලා ගන්නවා**
**රූපය වෙන් කරලා ගන්නවා**

මේවා ඇත්ත වශයෙන්ම තියෙන දේවල් හැටියට. බුදුපියාණන් වහන්සේගේ දර්ශනයට අනුව මේ හැම එකක්ම මොහොතක් මොහොතක් පාසා වෙනස් වෙනවා. ඒ වචනේ නොයෙකුත් විදියට යොදල තියෙනවා. ඒක සලිත වෙනවා 'චලං' - 'වයං' ගෙවීයනවා. හැම එකක්ම සලිත වෙනවා ගෙවී යනවා සැලෙනවා. අන්‍ය ආකාරයකට පත්වෙමින් තියෙනවා. ශීඝ්‍රයෙන්. නමුත් ඒක ලෝකයාට දැනෙන්නේ නැහැ. ඒක නිසා ඒවා වෙන් කරලා ගන්නවා.

**ඇසයි - රූපයයි**

**කණයි - ශබ්දයයි** කියලා වෙන් කරලා අරගෙන ඔක තුළ තමයි ඔන්න බන්ධනය ඇතිවෙන්නේ. ඉතින් මේ බන්ධනය ගැනත් හොඳ වටිනා උපමා කතාන්තරයක් එනවා. ශාරිපුත්‍ර අග්‍රශ්‍රාවක මහ රහතන් වහන්සේත් මහා කොට්ඨිත මහ රහතන් වහන්සේත් අතර සංවාදයක්. මහා කොට්ඨිත ස්වාමීන් අහනවා ශාරිපුත්‍ර ස්වාමීන් වහන්සේගෙන්, ඇසට රූපයද බන්ධනය? එහෙම නැත්නම් රූපයට ඇසද බන්ධනය? කණට ශබ්දයද බන්ධනය, එහෙම නැත්නම් ශබ්දයට කණද බන්ධනය? බන්ධනයක්, සංයෝජනයක් ගැන කියවෙනවා නේ? එතකොට මොකක් ද මෙතන සංයෝජනය? ඇහැට රූප බන්ධනයක් වෙනවද රූපවලට ඇහැ බන්ධනයක් වෙනවද? කණට ශබ්ද බන්ධනය වෙනවද? එහෙම නැත්නම් ශබ්දවලට කණ බන්ධනය වෙනවාද? ඔය විදියට අර හය ගැනම අහනවා. අන්තිමට සිතට සිතිවිලි බන්ධනයක් වෙනවද එහෙම නැත්නම් සිතිවිලිවලට සිත බන්ධනයක් වෙනවාද? එතකොට ශාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා නැහැ, ඇවැත්නි, කොට්ඨිත. ඇසට රූප බන්ධනයකුත් නොවේ. රූපවලට ඇස බන්ධනයකුත් නොවේ. කණට ශබ්ද බන්ධනයකුත් නොවේ. ශබ්දවලට කණ බන්ධනයකුත් නොවේ. ඒ දෙක අතර, ඒ දෙක හේතු කරගෙන, ප්‍රත්‍ය කරගෙන, ඇතිවෙන ඡන්දරාග කියලා කියන කැමැත්ත අනුව ගිය ඇල්මයි මෙතන බන්ධනය. එතකොට අපි සාමාන්‍යයෙන් බන්ධනය හැටියට සළකන්නේ ඒ ඇහැට පෙනෙන රූපය. නමුත් මෙතන දක්වනවා ඒ දෙක නිසා ඇතිවෙන ඡන්දරාග කියලා කියන කැමැත්ත අනුව ගිය ඇල්මයි මෙතන බන්ධනය. එතකොට ඒක පෙන්නුම් කරන්න ඔන්න හොඳ උපමාවක් දෙනවා.





ඇවැත්නි, කොට්ඨිත, දැන් කළු ගොනකුයි සුදු ගොනකුයි යම් කිසි යොතකින් හෝ දම්වැලකින් හෝ බැඳලා ඉන්නවා නම්, ඔය බානක් වගේ බැඳලා ඉන්නවා නම්, යමෙක් කිව්වොත් කළු ගොනාට සුදු ගොනා බන්ධනයක්ය කියලා. එහෙම නැත්නම් සුදු ගොනාට කළු ගොනා බන්ධනයක් කියල - ඒ කියමන හරිද? එතකොට කොට්ඨිත හාමුදුරුවෝ කියනවා "නැහැ, එය වැරදියි, මොකද?" කළු ගොනාට සුදු ගොනා බන්ධනයකුත් නොවෙයි. සුදු ගොනාට කළු ගොනා බන්ධනයකුත් නොවෙයි. නමුත් ඒ දෙන්නා බැඳල තියෙන යොතයි, ඒ බැම්මයි, එතන තියෙන නියම බන්ධනය.

අන්න ඒ වාගේ ඇසට රූපය බන්ධනයකුත් නොවෙයි රූපයට ඇස බන්ධනයක් නොවෙයි. ඒ දෙක නිසා ඇතිවෙන ඡන්ද රාග කියලා කියන ඇල්ම, තණ්හාව, එතනයි ඒකේ බන්ධනය. අන්න ඒක නිසා තමයි දුක කෙළවර කිරීමට තණ්හාව නැති කරන්න, ඡන්ද රාගය නැති කරන්න කියලා බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ. සාමාන්‍යයෙන් ඔය ගැඹුරු හැටියට අපි හිතුවට මොකද ඇතැම් අයට වැටහීම් - භාවනා කරන කෙනෙකුට - මේ තුළින් එනවා. මොකද? මේ මුළු මහත් ලෝකයෙන් එතෙර වීමේ අවබෝධය ලබා ගන්නේ අපි මෙතෙක් මේ ලෝකය හැටියට ගත්තු මෙන්න මේ සළායතන ලෝකයෙන්. බුදුරජාණන් වහන්සේ ලෝකය හැටියට හඳුන්වන්නේ මේ ආයතන හය. සළායතනය කියලා කියන්නේ. ඇස, කණ නාසය දිව කය මන කියන ආයතන හයයි අපට තියෙන්නේ. එතකොට දැන් ආයතන කියන එකේ මේ කාලේ නොයෙකුත් අර්ථ තියෙන්න පුළුවන්. ඇත්ත වශයෙන් කියනවා නම් කියන්න තියෙන්නේ, අපට කරන්න තියෙන්නේ, මෙන්න මේ ආයතන හය පිළිබඳ **කළමනාකරණයයි**. නමුත් බොහෝවිට කෙරෙන්නේ **නොකළමනාකරණයක්**. ඒක නිසයි මේ සසරට බැදිලා ඉන්නේ. **කළමනාකරණය** මොකක්ද? මේ ආයතනයන්ගේ අනිත්‍යතාව වටහා ගැනීම, අර බුද්ධ වචනයට අනුව. ඇස අනිත්‍යයි. මොහොතක් පාසා වෙනස් වෙනවා. වෙනස් ස්වභාවයට පත්වෙනවා. රූපයනුත් එහෙමයි කියන එක, ඒ ගැඹුරු අවබෝධය, සතිය යෙදීම තුළින් මේ ශරීරයේ අර භාවනා කරන යෝගාවචර පිංවතුන් එහෙම දන්නවා සති සම්පජඤ්ඤය කියලා කියන සිහිය නුවණ යෙදීමෙන් ක්‍රම ක්‍රමයෙන් ගැඹුරින් තේරුම් ගන්නවා. මේ හැම එකක්ම මොහොතක් පාසා වෙනස්වන බව. එතකොට ඒක තුළින් තමයි අර තණ්හාව, එහෙම නැත්නම් ඡන්දරාග බන්ධනය, ක්‍රම ක්‍රමයෙන් ලිහිලා යන්නේ. යම් ප්‍රමාණයකට ඒ අනිත්‍යතාව හිතේ තැන්පත් වෙනවා නම්, හිතට වැටහෙනවා නම්, ඒ ප්‍රමාණයට අවබෝධය එනවා මෙතන ඇලීමට හෝ ගැටීමට

දෙයක් නෑ කියලා. ඡන්දරාග කියලා කියන්නේ කැමැත්ත අනුව ඇති කර ගන්නා ඇලීම.

ඉතින් ඔන්න ඔය විදියේ තත්ත්වයක් තියෙන්නේ. මේ ආයතන හය ගැන බුදුරජාණන් වහන්සේ දක්වන ධර්ම දේශනා රාශියක් තියෙනවා. දැන් මේ කාලෙ පවා යෝගාවචර පින්වතුන්ට නුවණ යොදනවා නම්, මේ ආයතන කළමනාකරණය හරියට කරනවා නම්, මේවාට ගොදුරු වශයෙන් එන අරමුණුවල යථා තත්ත්වය අවබෝධකර ගැනීමට යම් උත්සාහයක් දරනවා නම්, අන්න ඒවායේ චලන ස්වභාවය අවබෝධ වෙනවා. දැන් ඔය චලන චිත්‍ර ආදියෙදි කෙරෙන්නේත් සේයා රූ පටක් වේගයෙන් යැවීම තුළින් යම් කිසි මෝහනයක් ඇති වෙනවා. නිත්‍ය සංඥාවක් ඇතිවෙනවා. ඒ දර්ශන කෙරෙහි, රූප කෙරෙහි. සමහර විට යාන්ත්‍රික දෝෂයකින් හරි ප්‍රමාදයකින් හරි, හිටි ගමන් අවබෝධ වෙනවා මෙතන මේ රූප සමූහයක්ය යන්නේ කියලා. නමුත් අර ඝන සංඥාව ඇති කරවන මායාවක් මේ විඤ්ඤාණයේ තැන්පත් වෙලා තියෙනවා. මායාකාරී ස්වභාවයක්

ඒකයි බුදුපියාණන් වහන්සේ සමහර අවස්ථාවල දක්වන්නේ ඇසත් අනිත්‍යයි, රූපයනුත් අනිත්‍යයි. ඊළඟට ඒ දෙක නිසා ඇතිවෙන චක්ඛු විඤ්ඤාණය කියලා කියන ඇස පිළිබඳ විඤ්ඤාණයත් අනිත්‍යයි. ඇස තිබුන පමණටම කෙනෙක් දකිනවා නොවෙයි. රූප තිබුන පමණටම දකිනවා නොවෙයි. ඇසත් රූපයත් මෙනෙහි කිරීම තුළින් එකතු වුන අවස්ථාවේ ඇස පිළිබඳ විඤ්ඤාණයක් ඇතිවෙනවා. ඊළඟට බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඇස පිළිබඳ විඤ්ඤාණයත් අනිත්‍යයයි. ඊළගට ඇස පිළිබඳ විඤ්ඤාණයක් ඇතිවෙලා ඒක තුළින් ස්පර්ශයක් මතුවෙනවා. යම් කිසි ගැටීමක් ඇතිවෙනවා. ඒකත් අනිත්‍යයයි. ඊළඟට ඒ ගැටීම නිසා යම් වේදනාවක් ඇතිවෙනවා. ඒකත් ඒ වගේම අනිත්‍යයි. ඔන්න ඔහොම ඔය විදියට බුදුපියාණන් වහන්සේ මතක් කරල දෙනවා. ඒ සිදුවන ක්‍රියා දාමයම, ඇසත් රූපයත් ගැටීම නිසා ඇතිවෙන ක්‍රියාදාමය තුළම, තියෙන්නේ අනිත්‍යතාව. සසලවෙන, වෙනස්වෙන, අන් ආකාරයට පත්වෙන විපරීතභාවයට පත්වෙන, තත්ත්වයක් තියෙන්නේ. එතකොට ඒවා නිසා ඇතිවෙන වේදනාවන් කොහොමද නිත්‍ය වෙන්නේ? අවසානයේ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා නිදසුනක් වශයෙන් කියනවා නම් ඇසත් රූපයත් ගැටීමෙන් ඇතිවෙන විඤ්ඤාණයත් අනිත්‍යයි. ඒ විඤ්ඤාණය නිසා ඇතිවන ස්පර්ශයත් අනිත්‍යයි. ඒ ස්පර්ශය මුල් කරගෙන ඇතිවෙන වේදනා ආදිය කොහොමද නිත්‍ය වෙන්නේ. සැප දුක් හෝ මධ්‍යස්ථ හෝ වේදනාවක් වේවා හැම එකකම අර විදියටම වෙනස් වන ස්වභාවයක් තියෙනවා. ඒ විදිහට ඒ අවබෝධය එනකොට තමයි අන්තිමට අන්න අර ඇල්ම ගිලිහිලා යන්නේ.





පොත පතේ නම් සාමාන්‍යයෙන් සංයෝජන කියන එක තෝරන්නේ බොහොම සරල හැටියට. නිවන් දකින්න ඕන නම් දස සංයෝජනයක් කඩා ගන්න ඕන කියලා එක පාරට ඔය දහය කියාගෙන යන්න පුළුවන්. මොනවද දහය ? සමහර විට මේ පින්වතුන් අහලත් ඇති. නිවන කරා යන ඒ ලෝකෝත්තර මාර්ග තුළින් සසරට බැඳිලා තියෙන බැම් දහයක් කඩන්න තියෙනවා.

| | | | |
|---|---|---|---|
| 1. | **සක්කාය දිට්ඨිය** | 6. | **රූප රාගය** |
| 2. | **විචිකිච්ඡාව** | 7. | **අරූප රාගය** |
| 3. | **සීලබ්බත පරාමාසය** | 8. | **මානය** |
| 4. | **කාමරාගය** | 9. | **උද්ධච්චය** |
| 5. | **ව්‍යාපාදය** | 10. | **අවිජ්ජා** |

කියලා සංයෝජන වශයෙන් ඒවා දක්වනවා. සක්කාය දිට්ඨි කියලා කියන්නේ අර කියාපු රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ කියන ඒ පංචස්කන්ධය ආත්ම වශයෙන් ගැනීම. එක එකක් හතර ආකාරයකින් ආත්ම හැටියට සළකනවා. එතනත් තියෙන්නේ ඒ ඝන සංඥාව. ඊළඟට ඒවගේම විචිකිච්ඡාව. 'මා' කියන එක දැඩිව ගන්නවා. මේ තමන්ගේ ශරීරය අනුව 'මා' කියලා කෙනෙක් ඉන්නවා. කියලා හිතා ගෙන මම අතීතයේ හිටියාද? අනාගතයේ ඉන්නවාද? ඔය ආදි වශයෙන් විචිකිච්ඡා දෙගිඩියා ගොඩක පෙරළි පෙරළි ඉන්නවා. ඒක තුළින් දෘෂ්ටි මවාගන්නවා. ඒකත් සසරට බැඳෙන බැම්මක්. ඊළඟට, සීලබ්බත පරාමාස කියලා කියන්නේ ඔය ඇතැම් කෙනෙක් කල්පනා කරනවා ඔය දුෂ්කර ව්‍රත ආදිය තුළින් - සමහර බමුණෝ එහෙම ශීතල වතුරෙ ගැලිලා ඉන්නවා. එහෙම නැත්නම් නිගණ්ඨයෝ නානාප්‍රකාර කයට දුක් දීම් ආදිය තුළින් ඒවා දැඩිව ගැනීම තුළින් විමුක්තිය ලැබෙනවා කියලා. ඒකත් බන්ධනයක් අන්තිමට.

ඊළඟට. කාමරාග කියලා කියන එක කවුරුත් දන්නවා අන්න අර කියාපු භවයට, පහලට, අදින බලවේගයක්. ඒවගේම ව්‍යාපාදය කියලා කියන්නේ ද්වේශය. ඇලීම් ගැටීම් දෙක.

ඊළඟට කියන්නේ වඩාත් සියුම් වූ ඒ තණ්හාවෙම ස්වරූපයන් තමයි. රූප රාග, අරූප රාග, වශයෙන් කියවෙන්නේ. දීර්ඝ කාලයක් සංසාරයේ

ගතකිරීම නිසා සත්ත්වයාගේ සිත්තුළ නොයෙකුත් විදියේ චිත්තජ රූප මවන ශක්තියක් තියෙනවා. ඒවා අන්තිමට අල්ලන්නේ, අර බාහිර දේවල් අතහැරියත්. ඒක නිසා තමයි දැන් ඒ ලොකු ධ්‍යාන තත්ත්ව ලැබුවත් ඒ අයට තියෙනවා යම් කිසි ඇතුළතින්ම එන ආශාවල්, සියුම් ආශාවල් වගයක්. ඒවට අනුරූප හැටියට තමයි ඔය බ්‍රහ්ම ලෝක ආදිය මැවෙන්නෙ. ඔන්න ඔය වගේ මහා භයානක තත්ත්වයක් මේ භවය තුළ තියෙන්නේ. ලේසියෙන් මිදෙන්න බෑ. සමහරු ඒවායේ ගිහිල්ලා හිරවෙනවා. රූප, අරූප ආදි වශයෙන් සියුම් තණ්හාවන්. ඊළඟට ඒ සියල්ලේම ප්‍රතිඵලයක් වශයෙන් මානය උද්ධච්චය අර දෙකක් කියලා ගන්න මානය, දරයි ගින්නයි වෙන්කරලා ගත්ත වගේ. ඒ නිසාම ඇතිවෙන උද්ධච්චය නොසන්සුන්තාව. අවසානයේ අවිද්‍යාව කියන එක. ඒක තුළම තමයි තියෙන්නේ, සක්කාය දිට්ඨියෙන් පටන් ගන්න නිත්‍ය සංඥාවේ අවසාන කෙළවර. ඒ නිත්‍ය සංඥාව සම්පූර්ණයෙන්ම ඉවත් කළ අවස්ථාවේ තමයි ලෝකයේ ශූන්‍යත්වය, හිස්බව, වැටහෙන්නේ.

ඉතින් අන්න ඒ විදියට සංයෝජන දහය ගැන කථා කරනවා නම් ඒක අර මාර්ගඥාන වලදී නැතිවෙන දෙයක් හැටියට පෙන්නුම් කරන්නේ. නමුත් ඊට වඩා යෝගාවචරයාට ප්‍රත්‍යක්ෂ වශයෙන් භාවනාවට උපකාර වන වචනයක් හැටියට ගත්තොත් මේ සංයෝජනය කියන එක අන්න දැන් අර බුදුපියාණන් වහන්සේ කිව්ව ආකාරයට මෙතෙන්දි මේ සූත්‍රවල

**ඇසයි - රූපයයි**

**කණයි - ශබ්දයයි**

**නැහැයයි - ගඳ සුවඳයි**

**දිවයි - රසයි**

**කයයි - ස්පර්ශයයි**

**සිතයි - සිතුවිලියි**

කියන ඒ දෙකක් අතර තියෙන බන්ධනයයි. තවත් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා ප්‍රකාශ කරනවා.

"මහණෙනි, මම නුඹලට දෙකක් කියනවා". මේ දෙකක් කියනවා කියලා කිව්වහම නොයෙකුත් විදියේ දේවල් හිතන්න පුළුවන්. නමුත් මෙතනත් ඒ විදියටයි බුදුපියාණන් වහන්සේ මේ දේශනාව ඉදිරිපත් කරන්නෙ. 'මහණෙනි, මම නුඹලාට දෙකක් කියනවා "මොකක්ද දෙක?'' ඇසයි





රූපයයි - කණයි - ශබ්දයයි, නැහැයයි - ගඳ සුවඳයි, දිවයි - රසයි, කයයි - ස්පර්ශයයි, මනසයි - සිතුවිලියි.

එහෙම කියලා නවත්වන්නේ නැහැ. මහණෙනි, ඔය දෙක හැර වෙන දෙකක් ඇතෙයි කියල යම් කිසි කෙනෙක් ලෝකයේ කියනවා නම් ඒ කෙනාගේ ඒ කතාව එහෙම පිටින්ම නිෂ්ඵල කථාවක්. ඒකට සාධක දක්වන්නත් එයාට බැහැ. එයින් පෙන්නුම් කරන්නේ බුදුපියාණන් වහන්සේ නියම දෙක මෙච්චරයි. ද්වයතාවක් හැටියට දෙකක් කියලා ගත්තොත් ඔන්න ඔය දෙකකට බෙදීමයි.

ඇස - රූපයෙන් වෙන්කර ගත්ත

කණ - ශබ්දයෙන් වෙන්කර ගත්ත

නැහැය - ගඳ සුවඳින් වෙන්කර ගත්ත

ඒ එක එකක් 'දේවල්' හැටියට ගත්තා. ඔන්න ඔය 'දේවල්' කියන හැඟීම - දැන් මේ කියන ටික මේ පින්වතුන්ගේ ඉගෙනීමේ මට්ටම් කොච්චර හෝ වේවා, අර කියාපු දස සංයෝජන කථාව සමහර විට පොතපත කියවපු අයට තේරෙන්න පුළුවන්. නමුත් මේ කථාව - මේ හැම කෙනාම අර කියාපු ආයතනවල කළමනාකරණය කරන අය නේ. එතකොට ඒ අර නොකළමනාකරණය අතහැරලා කළමනාකරණය කරන්න නම් මෙන්න මේ අවබෝධය ප්‍රත්‍යක්ෂ කරගන්න බලන්න. ඒ කියන්නේ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ යම්තාක් කාලයක් අපි ඇසත් රූපයත් වෙන්කර ගන්නවා නම්, කණත් ශබ්දත් වෙන්කර ගන්නවා නම් ඒතාක් අර බන්ධනය, ඒතාක් අර ගැටීම පිළිබඳ අදහස තියෙනවා. ඉතින් ඒකයි අර 'දෙකක්' කියලා කිව්වේ. ලෝකයේ 'දෙකක්' කියලා කියනවා නම් ඔන්න ඔය විදියේ දෙකට බෙදීමක් තියෙන්නේ. ඉතින් ඒ බෙදීම තුළ තමයි දැන් අපි කිව්ව ලැව් ගින්නත් ඇතිවෙන්නෙ. වේලිච්ච ගස් දෙකක් ගැටීමෙන්. ගැටිලා ගැටිලා ගැටිලා ගැටිලා යම් අවස්ථාවක ගින්නක් පහළ වෙනවා.

ඒ විදියටමයි බුදුපියාණන් වහන්සේ මේ විඤ්ඤාණය කියන එක ගැන ප්‍රකාශ කළේ. නිකම්ම විඤ්ඤාණයක් කියලා දෙයක් නැත. විඤ්ඤාණය කියල අමුතුවෙන් වෙනම දෙයක් නැත. එක්කෝ ඒක චක්ඛු විඤ්ඤාණය වෙන්න ඕනෑ. ඇස පිළිබඳ විඤ්ඤාණය වෙන්න ඕන. එහෙම නැත්නම් සෝත විඤ්ඤාණය කියල කියන කණ පිළිබඳ විඤ්ඤාණය වෙන්න ඕන. එහෙම නැත්නම් ඝාණ විඤ්ඤානය කියලා කියන නැහැය පිළිබඳ

විඤ්ඤාණය වෙන්න ඕන. එහෙම නැත්නම් දිව පිළිබඳ විඤ්ඤාණය වෙන්න ඕනෑ. ජිව්හා විඤ්ඤාණය. එහෙම නැත්නම් කාය විඤ්ඤාණය කියලා කියන කය පිළිබඳ විඤ්ඤාණය වෙන්න ඕන. එහෙම නැත්නම් මනෝ විඤ්ඤාණය වෙන්න ඕනෑ.

ඔය විදියේ විඤ්ඤාණ හයක් තියෙනවා. නිකම් විඤ්ඤාණය කියලා එකක් නැහැ. ඒකත් එක අවස්ථාවක උපමාවකින් දක්වනවා. දැන් නිකම් ගින්න කියලා එකක් නැහැනේ. එක්කෝ ඒකට අපිට කඩදාසි ගින්නක් කියලා කියන්න පුළුවන්. දර ගින්නක් කියන්න පුළුවන්. ඒ විදියට යම් යම් උපාදානයක්, යම් යම් දර ආදි ඉන්ධනයක්, ආශ්‍රයෙන් ගින්නක් ඇතිවෙනවා නම් ඒකට ඒ නම ව්‍යවහාර වෙනවා. නිකම් ගින්නක් කියලා දෙයක් ලෝකයේ නැහැ. ගිනිකූර උනත් ගිනි ගත්තට පස්සේ ඒකට ගිනිකූරු ගින්නක් කියලා ඊළඟට ගන්න වෙන්නේ. ඔන්න ඔය විදියේ තත්ත්වයක් තියෙන්නේ. ඉතින් ඒ විඤ්ඤාණය කියලා කියන්නේ අන්න ඒ විදියටයි. ලෝකයා තුළ තියෙනවා ඔන්න ඔහොම වෙන්කර ගැනීමේ ස්වභාවයක්. ඒ වෙන් කර ගැනීම තුළින් තමයි ඔන්න ඊළඟට ගැටීම තියෙන්නේ. එතකොට යම් අවස්ථාවක තේරෙනවා නම්, අර ගස් දෙක ගැටිලා ගිනිගත්තට පස්සේ ගස් දෙකත් පිච්චිලා ඉවරයි ඊළඟට ඒකට අහුවෙන අහුවෙන දෙයක් ඉදිරියට යන්නේ පුළුස්සා පුළුස්සා. ඒ හැම එකක්ම පුළුස්ස පුළුස්සා යන්නෙ. ඊළඟට තනිකර ගිනි ජාලාවක්. හොඳ හොඳ ලස්සන මල් ගස් තියෙන්න ඇති. හොඳ පළතුරු තියෙන්න ඇති අර කැලේ. නමුත් ඒ ඔක්කෝම අන්තිමට දර. ගින්න ඉදිරියට ඒව ඔක්කෝම දර. ඒවගේ දව දවා, දව දවා, යනවා. ඕක දැකලා වෙන්න ඕන අර සංඝයා වහන්සේ ඊළඟට කල්පනාවෙ වැටුනේ.

මේ ගින්න වගේම තමයි මේ 'විදර්ශනා ඥාන' කියන එකත්. අහුවෙන අහුවෙන ඔක්කෝම 'සංස්කාර' පුළුස්ස පුළුස්සා යනවා. අහුවෙන අහුවෙන දේවල් ඉදිරියට පුළුස්ස පුළුස්සා යනවා. පුළුස්සන්නේ මොකකින්ද? අන්න අර අනිත්‍ය සංඥාවෙන්. අනිත්‍ය සංඥාව තුළින්. ඒක හරි ප්‍රබලයි. ඒ මේ හැම එකක්ම අනිත්‍යයි අනිත්‍යයි කියලා අපට හොඳට හිතට කාවැදුන අවස්ථාවේ ඔන්න අර දෙකක් කියලා ගන්නේ නැතුව මෙතන එහෙම පිටින්ම ගිනිගොඩක්. අර කවියෙ කියවුනා වගේ

**දර රැස ගිනි ඇවිලුනු කල නිබඳේ**
**ගිනි මිස දර යයි යන නම නොයෙදේ**
**එම ලෙස එක්කොට වදහළ මුනිඳේ**





**දුක මිස ..........**

මේක තනිකර දුකක් හැටියට තේරෙනවා. එතකොට වෙන් කරලා ගන්න තාක් අර දෙක, ඊළඟට ප්‍රිය මනාප ආදි වශයෙන් බෙදලා නොයෙකුත් විදියට ඇලුම් හෝ ගැටුම් ඇති කර ගන්නවා. ඒකෙම ප්‍රතිඵලයක් තමයි දීර්ඝ කාලයක් සංසාරයේ ඒ නිසා ඇති කර ගන්න කුසල් හෝ අකුසල් හෝ වේවා, පින් හෝ පව් හෝ වේවා, ඒවා තුළින් ලෝක මව මවා මේ සත්ත්වයා අනන්ත කාලයක් සංසාරයේ යනවා.

අර සංයෝජන දහයෙන්ම මුල් පහ දක්වන්නේ ඕරම්භාගිය සංයෝජන කියලා. පහලට අදින බලවේග ඔක්කොම. අපායවලට, ඒ විදියේ පහත් භවවලට අදින සංයෝජන ගොඩකුත් තියෙනවා. ඉහලට, බ්‍රහ්ම ලෝකවලට, අදින විදියේ නූල් සූත්තරයකුත් තියෙනවා. ඉතින් මේවාට ඇදි ඇදි දීර්ඝ කාලයක් සත්ත්වයා සංසාරයේ ගත කරනවා.

බුදුපියාණන් වහන්සේ මෙන්න මේ ගින්න පිළිබඳ දර්ශනය ඉදිරිපත් කළා. එතකොට මේ ගින්න පිළිබඳ දර්ශනයෙන් සාමාන්‍ය ලෝකයා භයවෙනවා. දැන් අර ලැව්ගින්නෙන් බේරුනා කියලා ඒ භික්ෂූන් වහන්සේ එතනින් සතුටු වුනේ නැහැ. අර ගල උඩට නැගල දැන් මං ලැව් ගින්නෙන් බේරුනා කියල එතනින් සතුටු වුනේ නැහැ. තමන් ආව වැඩේ කල්පනා කළා. මේක තුළින් ප්‍රයෝජනයක් ගන්න **අර දර්ශනය විදර්ශනාවක් බවට හරවා ගත්තා.** දැන් මේ ගින්න අහුවෙන අහුවෙන හැම දෙයක්ම දවා දවා යන්න වගේ තමයි විදර්ශනා ඥානය ඒකට අහුවෙන අහුවෙන හැම සංස්කාර කොටසක්ම අනිත්‍යයි, වෙනස්වන සුළුයි, සැලෙන සුළුයි අන්‍ය ආකාරයට පත්වෙන සුළුයි, කියන ඒ අවබෝධයෙ ගැඹුරට යන්න යන්න, අන්න අර 'ගැම්ම' නැතිවෙනවා. අර බන්ධනය නැතිවෙනවා.

ඉතින් මෙන්න මේ අවබෝධයට උපකාර වෙන භාවනා මාර්ගය මොකක්ද? ඊළඟට ප්‍රශ්නය තියෙන්නේ - විවිධ භාවනා මාර්ගත් තියෙනවා. ඇතැම් කෙනෙක් කල්පනා කරනවා දැන් මේ හිත යන යන හැටියට අපි බලාගෙන හිටියාම අපට මේ හිතේ තත්ත්වය අවබෝධ කර ගන්න පුළුවන් කියලා. හිත දුවන හැටියට හිතට ඕහේ දුවන්න අරිනවා. දුවන්න ඇරලා ඒක අපිට කවදාහරි අවබෝධ වෙයි කියලා. ඒක හරි ක්‍රමය නෙවෙයි. ඒකටත් කදිම උපමාවක් බුදුපියාණන් වහන්සේ දක්වලා තියෙනවා. ඉතාම වටිනා උපමාවක්. ඇත්ත වශයෙන්ම හිතන්න හිතන්න ගැඹුරුයි ඒක. බුදුපියාණන් වහන්සේ උපමාවක් දෙනවා මෙහෙම:

මහණෙනි, යම් කෙනෙක්, යම් මනුෂ්‍යයෙක්, බොහෝම හයිය ඇති රැහැනකින් බඳිනවා නයෙක්. නයෙක් බඳිනවා දැඩිව රැහැනකින්. ඊළඟට කිඹුලෙකුත් බඳිනවා. ඒ වාගේම ඊළඟට පක්ෂියෙකුත් රැහැනකින් බඳිනවා බල්ලෙකුත් ඒ වගේ රැහැනකින් බඳිනවා. හිවලෙකුත් ඒ වගෙ රැහැනකින් බඳිනවා. ඊළඟට වඳුරෙකුත් අර වගේම රැහැනකින් බැඳල ඒ හය දෙනාගෙම අර රැහැන් හය එකතු කරලා ගැටයක් ගහනවා. මැදින් ගැටයක් ගහලා ඔහේ අතහරිනවා. අතෑරියාට පස්සේ මොකද්ද වෙන්නේ? අර හය දෙනා හය පැත්තකට අදිනවා.

**නයා හුඹහට අදිනවා**
**කිඹුලා වතුරට අදිනවා**
**පක්ෂියා අහසට අදිනවා**
**බල්ලා ගමට අදිනවා**
**හිවලා අමු සොහොනට අදිනවා**
**වඳුරා කැලයට අදිනවා**

හය පැත්තකට අදිනවා, දැන් මේ රැහැන් හයෙන් බැඳලා ඉන්න සත්තු, ටිකකට හිතාගන්න, මේ හය දෙනා අදිනවා. ඊළඟට බුදුපියාණන් වහන්සේ කියනවා ඔහොම ඇදලා ඇදලා වෙහෙස වෙලා - එක එක පැත්තට ඉතින් ඇදි ඇදී යනවා ඇති. ඔහොම වෙහෙස වුනාට පස්සේ ඔය හය දෙනාගෙන් යම් සතෙක් වඩා ශක්තිමත් නම් ඒ සතාට අනුව අර ඔක්කෝම ටික ඇදිලා යනවා. අපි හිතමු කිඹුලගේ ශක්තියට අර ඔක්කෝම යටවුනා කියලා. ඔන්න කිඹුලා අර ඔක්කොම වතුරට ඇදගෙන යනවා. ඔන්න ඔහොම උපමාවක් මේ දෙන්නෙ. ඉතින් ඊළඟට අන්න ඒවගේ තමයි දැන් එතැන කියන්නේ ඒ සත්ත්වයින් හය දෙනාට අයිති වෙනම ගොදුරු බිම් තියෙනවා. ගෝචර විසය කියලා කියන්නේ. ඒ ගොල්ලන්ගේ ගොදුරුබිම් වෙනයි. ගොදුරු බිම් හෝ වේවා ඒ ගොල්ලන්ගේ වාසස්ථාන වෙනස්. ඒ නිසා ඒ පැතිවලට අදිනවා. මේ දීපු උපමාව මොකක්ද? අර ආයතන හය ගැනයි මේ කියන්නේ. ඇස කණ, නාසය, දිව, කය, මන. ඒවට උපමා හැටියට මේ දෙන්නෙ. ඉතින් ඔන්න උපමාව එතනින් ඉවර වෙන්නේ නැහැ. එහෙම ඇදගෙන ගිහාම ඔය තත්ත්වයයි ඇති වෙන්නේ.

කොටින්ම කියතොත් ඉන්ද්‍රිය අසංවරයේත් ඉන්ද්‍රිය සංවරයේත් වෙනස දැක්වීමටයි ඒ උපමාව පෙන්නුම් කරන්නේ. ඉන්ද්‍රිය අසංවරය පිළිබඳව තමයි අන්න අර කියාපු උපමාව. ඔහේ යන්න ඇරියොත් මැදින් ගැටයක් ගහලා මේ හයම බැඳලා, අන්තිමට ඒ අතට මේ අතට ඇදල එක්කෙනෙක් කවුරුහරි දිනනවා. ඒ ඔස්සේ ඇදිලා යනවා. අර හිත දිහා බලන්





හිටියොත් වෙන්නේ ඔන්න ඕකයි. එතන ඊළඟට බුදුපියාණන් වහන්සේ කියන්නේ අන්න කායගතාසතිය නොවැඩූ කෙනාගෙ තත්ත්වයයි. කායගතා සතිය යම් කෙනෙක් නොවැඩුවා නම් ඒ තැනැත්තාගේ අර ආයතන හයේ ක්‍රියාකාරිත්වයයි අර කියාපු උපමාවෙන් දක්වන්නේ.

ඔන්න ඊළඟට දක්වනවා කායගතාසතිය වැඩූ කෙනා ඒ තුළින් ඇති කරගන්න සංවරය පිළිබඳ උපමාව. ඒත් තරමක් දුරට අර උපමාවම තමයි ගෙනියන්නේ. යම්කිසි කෙනෙක් අර වගේම නයෙක් රැහැනකින් බඳිනවා. කිඹුලෙක් පක්ෂියෙක්, බල්ලෙක්, හිවලෙක් ඊළඟට වඳුරෙක් ඔය හයදෙනා රැහැන් වලින් බැඳලා මැදින් ගැටයක් ගහනවා වෙනුවට මොකක්ද කරන්නේ? හොඳට හයිය ඇති කණුවක බඳිනවා. හොඳ හයිය ඇති කණුවක බඳිනවා. ඉතින් අර හය දෙනා අදිනවා අදිනවා අදිනවා. මහන්සි වෙනකම් අදිනවා. ඇදලා ඉවරවෙලා මොකක්ද කරන්නේ? හයදෙනාම ඇවිල්ලා ලගිනවා කණුවට හේත්තු වෙලා. එතන ලස්සන වචන කීපයක් දක්වනවා. ඒ කියන්නේ කණුවට ඇවිල්ලා හේත්තු වෙලා ඒ ළඟ හයදෙනාම ලගිනවා, මහන්සි වෙලා ඇවිල්ලා. ඔන්න වෙනස හිතාගන්න එතකොට. එතන කියන්නේ අන්න ඉන්ද්‍රිය සංවරය.

එතකොට ඊළඟට බුදුපියාණන් වහන්සේ දක්වනවා. ඔය දෙවන උපමාව අනුව කායගතා සතිය වැඩූ පුද්ගලයාගේ තත්ත්වයයි. අර ඉන්ද්‍රිය කොයි පැත්තට ඇද්දත් අන්තිමට ඇවිල්ලා කමටහන් කණුව ළඟට ඇවිල්ලා නවතිනවා.

අන්න ඒකයි පින්වතුනි, දැන් ඔය ඇතැම් කෙනෙක් අර කියාපු විදියට හිත යන්න ඇරලා ඔහේ එන එන සිතුවිලිවලට ඉඩදීලා මේක කවදාහරි අපට අවබෝධයක් එයි කියලා හිතාගන්න ඒ පිළිවෙල තමයි මුලදී කිව්වෙ. ඒ වෙනුවට බුදුපියාණන් වහන්සේ දක්වන්නේ මේ කායගතා සතිය - කොටින්ම කියතොත් කායගතා සතියට අහුවෙන භාවනා රාශියක් තියෙනවා. සාමාන්‍යයෙන් අපි දෙතිස් කුණප කොට්ඨාස ගැන කියනවා. ඒ ඇරෙන්න සමහර තැන්වල ඒ කායගතා සතියට ඇතුල් කරන්න පුළුවන් ඔය කයේ ස්වභාවය දැක්වෙන දස අසුභ ආදි කොයිවත්. මේ කුමක් හෝ වේවා යම්කිසි ස්ථාවරයක්. ඔන්න ඔතැන වෙනස හිතාගන්න. යම් කිසි ස්ථාවරයක් තියෙන්න ඕන.

මේ විසිරෙන සිත, ඉන්ද්‍රියයන් ආශ්‍රයෙන් විසිරෙන්න බලන සිත රඳවා ගන්න යම් කිසි කමටහනක් අවශ්‍යයයි. 'කමටහන' කියන වචනය පවා - දැන් මේ කාලයේ පැරණි වචනවල අර්ථය ඒ තරම් නොතේරෙන නිසා

අපි ඒක කාලනුරූපව ඇතැම් අවස්ථාවල සිංහල කරලා දක්වලා තියෙනවා. 'කර්ම' කියන්නේ වැඩ නම්, 'ඨාන' කියන්නේ තැන නම් - තැන හෝ පොළෙයි කියලා කියමු - එතකොට කමටහන කියල කියන්නේ, කම්මට්ඨාන කියලා කියන්නේ - වැඩපොළ, **ආධ්‍යාත්මික වැඩපොළ**.

වැඩපොළක්, වැඩක්, රක්‍ෂාවක්, නැති කෙනා අයාලේ යන පුද්ගලයෙක් නේ. ඒ වෙනුවට වැඩ පොළ තියෙන කෙනා වැඩපොළ ගැන නේ හිතන්නේ. වැඩපොළට නේ හිත යොදන්නේ. වැඩපොළට නේ යන්නේ. අන්න ඒ වාගේ එතකොට අපේ නිවන් සඳහා වැඩ කරන යෝගාවචරයට අයිති වැඩපොළ තමයි කර්මස්ථානය, කායගතාසතිය. එතකොට කායගතා සතිය වැඩූ කෙනාට අන්න අර කියාපු ඉන්ද්‍රිය සංවරය ඇති කරගන්න පුළුවන් බවයි මෙතන බුදුපියාණන් වහන්සේ මේ සංකීර්ණ උපමාවෙන් දක්වන්නේ. සංකීර්ණ කියල කිව්වේ ඒකෙ අර්ථය ගැඹුරු නිසයි. නමුත් බැලුවහම සරලයි. ඒ සතුන් හය දෙනාගෙ උපමාවෙන් දක්වන්නේ ඇස කණ නාසය දිව කය මන. අපි දැන් පංච ඉන්ද්‍රිය ගැන නේ බොහෝදෙනා කථා කරන්නේ. සමහරු පහකට පමණක් සීමා කරලා ලේසි කරගන්න බලනවා. සාමාන්‍ය ලෝකයා ඇතැම් රටවල්වල ඉන්ද්‍රිය කියලා ගන්නේ මේ පංච ඉන්ද්‍රියයි. ඉන්ද්‍රිය පහයි. බෞද්ධ දර්ශනයේ තියෙන විශේෂත්වය තමයි ඉන්ද්‍රිය හයක් ගැන කථාව. පහක් නොවෙයි හයක්. එතකොට මනස අතහරින්න බැහැ. මනස තුළ තමයි ඔක්කොම තැන්පත් වෙලා තියෙන්නේ. කොයිතරම්ද කියලා කිව්වොත් එතනදිත් යම් කිසි අවස්ථාවක බුදුරජාණන් වහන්සේ උපමාවක් දෙනවා. ඒකට ගැලපෙන අන්දමේ උපමාවක් දෙනවා.

ඇස, කණ, නාසය, දිව කය කියන ඉන්ද්‍රිය පහ ඒවාට අනුරූප වූ ගොදුරු අනුභව කරනවා.

**ඇස - රූප අනුභව කරනවා**
**කණ - ශබ්ද අනුභව කරනවා.**

ඇස ශබ්ද අනුභව කරන්නේ නැහැ නේ. එක එකකට අදාල ආවේණික ගොදුරු බිම් තියෙනවා. නැහැය ගඳ-සුවඳ අනුභව කරනවා. නමුත් ඔක්කොම අනුභව කරපු ඒවා ගෙනල්ලා තැන්පත් කරන්නේ මැදින් තියෙන මනින්ද්‍රියෙයි. මනසට ඔක්කොම එකතු වෙලා එනවා. එතකොට අනන්ත කාලයක් අපි මේ සංසාරයේ ගතකළා නම් ඒ හැම අත්දැකීමකම සංඥාවල්, සියුම් සංඥාවල්, ආසව අනුසය ආදි නොයෙකුත් සියුම් වචනවලින් දක්වන ඒ ටික, අපේ මේ විඤ්ඤාණය තුළ ගැබ් වෙලා තියෙනවා. අපේ





සිත තුළ ගැබ්වෙලා තියෙනවා. මනස තුළ ගැබ් වෙලා තියෙනවා. ඉතින් අන්න ඒක ඉතාමත්ම සියුම් බන්ධනය

**මනසයි - ධර්මයයි**

**සිතයි - සිතිවිල්ලයි** අතරේ පෙරලෙනවා එතකොට ඉන්ද්‍රිය වශයෙන් බලනකොට, ආයතන වශයෙන් බලනකොට, හයක් තියෙනවා මෙතන බෞද්ධ දර්ශනයට අනුව. ඒක නිසා පහට විතරක් සීමා කරලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඇතැම් කෙනෙක් මේ ලෝකයේ තිබෙන ඒ පහ විතරක් අරගෙන පහෙන් බේරාගන්න බලනවා. එහෙම ලේසි නැහැ මේක. සියුම්ම එක තමයි මේ මනස. අනන්ත කාලයක් තිස්සේ අතික්වායින් ලබාගත්තු දේවල්, ඒ ඒ ගොදුරු අනුභව කරලා ඇවිල්ලා ඒවායින් ලබාගත්තු සංඥා මට්ටම් ඔක්කොම, 'අනුසය' ආදිය, ඇවිල්ලා හිතේ තැන්පත් වෙලා තියෙනවා. මනස ඒ අතින් ඉතාමත්ම සියුම්. ඒක තමයි මනස හැම එකකටම මුලෙයි කියලා කියන්නේ.

**"මනො පුබ්බංගමා ධම්මා"**

අවසාන වශයෙන් ඒ අර මනසත් - සිතිවිල්ලත් අතර පුදුම පෙරළියක් තියෙනවා. මේ හැම එකක්ම අවබෝධ කරගන්න නම් අන්න අර අනිත්‍ය සංඥාව මෙතෙන්ට ගෙනෙන්න ඕන ශරීරයේ අර කියාපු විදිහට.

**ඇසත් - රූපයත්**
**කණත් - ශබ්දයත්**

හැම එකකම මෙතෙක් ගත්තු නිත්‍ය සංඥාව වෙනුවට අනිත්‍ය සංඥාව වැඩෙන හැටියට තමන්ගේ මනසිකාරය යොමු කරන්න ඕන. අර නොකළමනාකරණය තුළින් තමයි අසංවරය එන්නේ. නියම කළමනාකරණය කරනවානම් මේ ආයතන පිළිබඳව, එතකොට ක්‍රම ක්‍රමයෙන් - අර විදර්ශනා ඥාන ආදිය ගැන කියන කොට මේ පින්වතුන් අහලත් ඇති මේ අනිත්‍යතාව කියන එක ඊට වඩා සවිස්තරව කියනවා නම් එතන තියෙන්නේ ඇතිවීමයි නැතිවීමයි. 'උදයබ්බය' කියලා කියනවා. ඇතිවීම් නැතිවීම් රාශියක්. මුලු මහත් ලෝකයේම තියෙන්නේ ඇතිවීම් නැතිවීම් විතරයි. ඒක පෙනෙන්නෙ නැහැ අර ඝන සංඥව නිසා. ඝන සංඥව කියලා කියන්නේ නිත්‍ය සංඥව. හැම දෙයක්ම නිත්‍යයි කියලා කියන හැඟීම අනුව ලෝකය දිහා බලන අවිද්‍යාවෙන් වැසුනු මුළාවූ පුද්ගලයාට මේවා හැම එකක්ම තියෙනවා කියන හැඟීම එනවා. මේ ශරීර කූඩුවත් තියෙනවා කියනවා. රූපය තියෙනවා ශබ්දය තියෙනවා. ඒ විදිහේ හැඟීමක් තියෙනවා. නමුත් ගැඹුරින් සතියත් සම්පජඤ්ඤයත් යොදලා සමාධිමත්ව ඒ එක එකක් ගැන

මෙනෙහි කිරීම තුළින් යම් අවස්ථාවක අවබෝධ වෙනවා මෙතන තියෙන්නේ චලන රාශියක්. අර චලන චිත්‍රය ගැන කිව්වා වාගේ චලන රාශියක්. සියුම් චලන රාශියක්. එක තැනකවත් මේකේ නිත්‍ය හැටියට ගන්න දෙයක් නැහැ. ඇතුළත තියෙන්නේත් චලන රාශියක්. පිටත තියෙන්නෙත් චලන රාශියක්. අපේ අවිද්‍යාව නිසා ඒවා වෙන්කර ගන්නේ. ඇසෙයි කියලා රූපයෙයි කියල. ඒ හැම එකක්ම මොහොතක් පාසා වෙනස් වෙනවා. බුදුපියාණන් වහන්සේ මිරිඟුව ආදී නොයෙකුත් උපමා දෙන්නේ ඒකයි. ඒ හැම එකක්ම මොහොතක් පාසා වෙනස් වෙනවා. නමුත් අවිද්‍යාව නිසා - ලෝක සත්ත්වයා දීර්ඝ කාලයක් තුළ බැඳුනු අවිද්‍යාව නිසා - මේ හැම එකක්ම ඝන සංඥවෙන් දැඩිව ගන්නවා. ඒක තුළින් අන්න ඊළඟට තමයි ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් අර විදියට ගැටිලා ගිනිගන්න පටන් ගන්නවා. මේ අවබෝධය එනකොට ඔන්න යම්කිසි අකාරයකින් තේරෙනවා මෙතන තනිකර ගිනිගොඩක් මිසක් වෙන්කර ගන්න දෙයක් නැහැ.

ඉතින් ඒක කරා යන මාර්ගයයි ඔය කමටහන කියලා අපි කිව්වේ. යම්කිසි, හිත තැන්පත් කර ගැනීමට මහක්. දැන් අර කණුවක් කියලා කිව්වේ. හරකෙක් කණුවක බැඳලා කුඹුරක්, කෙතක්, ළඟ ඉන්න කොට හරකා කොච්චර ඇද්දත් එහා කුඹුරට ඇදෙන්න බැහැ නේ. ආයෙත් ඇවිල්ලා එතන ලගිනව. දැන් කමටහන ගැන පොත්පත්වල තියෙන්නෙත් ඒකයි. කමටහන කියන එක කණුව හැටියට ඇතැම්විට දක්වනවා. ඒ කණුව උපකාර වෙනවා ස්ථාවරයක් වශයෙන් අර දුවන හිත මෙල්ල කරගන්න. කුළු ගොනෙක් දුවන කොට ඒ රැනේ එල්ලුනොත් කිසි ගැම්මක් නැතිව ඒ තැනැත්තාට මහ විපත්තියකට පත්වෙන්න සිද්ධ වෙනවා. යම් කිසි ගැම්මක් අවශ්‍යයි. අන්න ඒ ගැම්ම තමයි අර සමාධිය. හිත සමාධිමත් කරගන්න උත්සාහයක් දරන්න ඕන. ඒකට උපකාර වෙනවා යම් කිසි කමටහනක්.

අර කයේ යම් කිසි කොටසක්- කෙස්, ලොම්, නිය, දත් ආදී යම්කිසි කොටසක් හෝ වේවා එහෙම නැත්නම් අසුභ , ඔය ඉදිමුනු ආදී ශරීරය පිළිබඳ යම් කිසි තත්ත්වයක් හෝ වේවා, - කමටහනක්, කර්මස්ථානයක් හැටියට ඒකට හිත ගේන්න බලන්න ඕන දුවන හැම වෙලාවකම. එතකොටයි අන්න අර කියාපු දෙවන උපමාවේ කිව්ව ආකාරයට අර හය දෙනා ඒ අතට දුවනවා, මේ අතට දුවනවා, දුවල දුවල වෙහෙසවෙලා අන්තිමට කොහොම හරි කණුව මුලටම ඇවිල්ලා ලැගලා තැන්පත් වෙනවා. එහෙම නැත්නම් වෙන්නේ අන්න අරවිදියට නිකන් ගැටයක් ගහල අත හැරියොත් ඒ අතට මේ අතට දුවල ඒ ශක්තිමත් කෙනා - ඇහැ ශක්තිමත්





නම් අන්තිමට ඒකට ඇදිලා යනවා. ඒ පෙළඹුම් රාශියක් තිබෙද්දී යම්කිසි කෙනෙක් තමන්ගේ චරිතානුකූලව යම් කිසි පෙළඹවීමකට යටවෙලා අන්තිමට තමන්ගේ බණ භාවනාත් විනාශ කරගන්නවා. ඒ වෙනුවට බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඔන්න මේකයි ක්‍රමය. සමාධිය සඳහා යම්කිසි කර්මස්ථානයක් අවශ්‍යයි. එතකොට ප්‍රායෝගික වශයෙන් මෙන්න මේ අපි ඉදිරිපත් කළ කථාව තුළින් තේරුම් ගන්න ඕන බුදුපියාණන් වහන්සේගේ දර්ශනයට අනුව මෙතන නිත්‍ය කිසිවක් නෑ. නිත්‍ය හැටියට ගතයුතු දෙයක් නෑ. නිත්‍ය සංඥව ලෝකයා තුළ තියෙන්නෙ අර අවිද්‍යාව නිසයි. මහ භයානක අන්දමින් ලෝකයේ මේතාක් කාලයක් මේ ඉන්ද්‍රියයන්ගේ සීමා සහිත ක්‍රියාකාරීත්වය නිසා ලෝකයා මේ විදියට දෙකක් හැටියට වෙන් කර ගෙන තියෙනවා. නමුත් මෙතන හැම පැත්තෙන්ම බලන කොට ඇතුළතින් බැලුවත් තියෙන්නේ ධාතු හතරක්.

බුදු පියාණන් වහන්සේ පමණක් නොවෙයි ශාරිපුත්‍ර මහා ස්වාමීන් වහන්සේත් දක්වනවා - ඇතුළෙ තියෙන්නේත් පඨවි ධාතුව. ඇහැ, කණ නාසය ආදි දේවල්වල තියෙන්නෙත් පඨවි ධාතුවයි. බාහිර ලෝකයේ තියෙන්නෙත් පඨවි ධාතුවයි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතු හතරෙන් නිර්මිත එකක් තමයි මේ ශරීරය කියන එක. ඒ වාගේම බාහිරව තියෙන්නේත් ඒ හතරයි. නමුත් මේක තුළින් අර ගත්තු අවිද්‍යාව නිසා, ඒ තණ්හාව නිසා, ඒකට තමයි 'තණ්හා උපාදාන' කියලා කියන්නේ. තණ්හාව නිසා ගත්තු 'ගැම්මයි' මෙතන තියෙන්නේ. තණ්හාව නිසා අනන්ත කාලයක් මේ සංසාරයේ ඇති කරගත්තු තෘෂ්ණා වේගය නිසා සත්ත්වයා යම් කිසි ගැම්මක් ගන්නවා. මේ ආධ්‍යාත්මික වශයෙන් ඇතුළත තිබෙන මේ ශරීරය පිළිබඳව දැඩිව ගත්තේ ඒකයි. මේ ශරීරය ජීවත් කරගන්න තමයි මේ හැම එකක්ම අපි උපකාර කරගන්නේ.

දැන් තිරිසන් සතුන්ගේ ජීවිතය ගැන බලනකොට හැම සතාම ගොදුරු සොයාගෙන යනවා. ඒ ගොදුර පණ පිටින් හරි ඇතුළට යනවා ශරීරය ඇතුළට. දැන් ඒක ඉතින් තිරිසන් සතුන් පමණක් නොවෙයි මනුෂ්‍යයින්ට උනත් ඒක සමානයි කියලා කියන්න පුළුවන්. පණපිටින්ම උනත් ඇතුළට දාගන්නවා. මොකද, මේ 'උපාදින්න' කියලා දැඩිව ගත්තු මෙන්න මේ ශරීරයට තියෙන ඇල්ම නිසා. මේකයි අපි දීර්ඝ කාලයක් සංසාරයට ගෙනියන්නේ. ඉතින් බුදුපියාණන් වහන්සේ කියන්නේ ඔන්න ඕකයි කඩා ගන්න තියෙන්නේ. තණ්හාවෙන් ගත්තු මේ ගැම්ම. ඒ ගැම්මෙ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අපට එක් එක් භවයක් මැවෙන්නේ. අපේ සිතිවිල්ල තුළින් භවයක් මවනවා කියන්නේ ඕකයි.

දැන් අපි දුඃඛ සත්‍යය ගැන කිව්වා උපමා කරලා තනිකර ගින්නක් කියලා. ඒක යට තියෙන්නේ තණ්හාව බව අපට එතකොට පැහැදිලි වෙනවා. තණ්හාවටම තමයි අර 'ඡන්දරාග' කියලා කිව්වේ. කැමැත්ත අනුව ගිය ඇල්ම. ඒක වෙන වචනයකින් කියනවා නම් තණ්හාව. එතකොට ඒ තණ්හාව ඇතිතාක් අර දැඩි උපාදානයක් නිසා අර ධාතු හතරෙ යම්කිසි කොටසක් ලෝක සත්ත්වයා දැඩිව ගන්නවා. දැන් අපි අපේ මනුෂ්‍ය ශරීරය ලොකු දෙයක් හැටියට සළකාගෙන මේක නොයෙකුත් විදියට වාත්තු කරගෙන, ප්‍රතිසංස්කරණය කරගෙන, කැලි පුරුද්දගෙන, මේක දීර්ඝ කාලයක් ජීවත් කරගන්න බලනවා. නොමැරී තබාගන්න බලනවා. ඒ වගේම තමයි අනිත් සත්ත්වයින් තමන්ගේ දැඩිව ගත්තු ශරීරය පවත්වා ගැනීම සඳහා ගොදුරු කරගන්නවා. නමුත් ඒ තුළින් ඇති කරගන්න චිත්ත වේග රාශිය නිසා, ඒකෙ ප්‍රතිඵලයක් වශයෙන්, තව තව භව මැවෙනවා. ඕකයි සංසාර තත්ත්වය.

ඉතින් මෙන්න මේ භයානක තත්ත්වයෙන් අත්මිදෙන්න තියෙන එකම ක්‍රමය නම් අන්න අර ගින්නට උපකාර උන ගස්දෙක විදර්ශනා ඥාණයෙන්ම දවලා දාන එකයි. අර ගස්දෙක ගැටීම නිසා නේ මේ ඔක්කොම වුනේ. ඒක ගැටුනේ නිත්‍ය සංඥාව ගැනීම නිසයි. ඒකට විදර්ශනාවේ ව්‍යවහාර වෙන්නේ 'ඝන සඤ්ඤාව' කියලයි ඊළඟට යෝගවචරයා තුළ තිබිය යුත්තේ 'රාසි සඤ්ඤාව'. ඝන සඤ්ඤාව කියල තියෙන්නේ අර තණ්හා ලාටුවෙන් අලවලා මඩගොඩක් ගුලියක් කරලා ගන්නවා වාගේ එකක් හැටියට ගැනීම. 'රාසි සඤ්ඤාව' කියලා කියන්නේ - අපි හිතමු දැන් කාන්තාරයක තත්ත්වය. දැන් ඔන්න මඩ ගොඩකින් අපට පුළුවන් අතට මඩගුලියක් අරගෙන බෝලයක් වගේ හදන්න. නමුත් කාන්තාරයේ නම් කාන්තාරයේ වැල්ල හොඳටම වේලිලා වේලිලා තියනවා නම් - අර අතීත පොත්වල තියෙනවා 'මිටින් ගත් වැලි මිට නොසිටිනේය' කියල. වැලිමිටක් ගත්තට ඒක හිටින්නේ නැහැ. ඔහේ ගලාගෙන යනවා, මොකද? අන්න රාශිය. එතන සමූහයක් හැටියට තියෙනවා. ඉතින් අපි ලෝකයේ අර තණ්හාව නිසා හැම එකක්ම අර විදිහට ගුලිකරලා එකක් හැටියට, ඝන හැටියට, ගන්නවා. ඔන්න ඕකයි ඝන සඤ්ඤාව කියන්නේ. රාසි සඤ්ඤාව කියන්නේ විදර්ශකයාට වැටහෙන්න පටන් ගන්නවා බලන බලන හැම දෙයක්ම සියුම් අන්දමින්. 'පැදුරක්' කියන්නේ අපි එකක් කියලා ගන්නවා. ඒකෙ රටාවේ හිත බැඳෙනවා. නමුත් විදර්ශකයාට අමුතු විදිහේ වැටහීමක් එනවා. මෙතන පැදුරක් නෙවෙයි මෙතන තියෙන්නේ රටාවෙන් මුළා කරලා ගන්නක්. එකක් හැටියට ගන්වන එකක් මේ රටාව. ඇත්ත වශයෙන්ම මෙතන තියෙන්නේ එක මට්ටමකින් බලනවා නම් ඒ අතට මේ





අතට දුවන මේ පන්ගොඩක්. මේ පන් ගොඩක් විතරයි මෙතන තියෙන්නේ. රාශියක්. මේ රාශිය අපි යම් ආකෘතියක් අනුව, රටාවක් අනුව, හැදූ අවස්ථාවේ අපි මේක පැදුරෙයි කියලා ගන්නවා. පැදුරෙයි කියලා ගන්නවා විතරක් නෙවෙයි. ඒ පැදුර හොරකම් කළොත් එහෙම, ඒක ගැන, ඒක නැතිවුන එක ගැන, තණ්හාවෙන් ක්‍රෝධය පවා ඇතිකර ගන්නවා. එකක් හැටියට ගැනීම නිසා දැඩිව තණ්හාව ඇති කර ගන්නවා. විදර්ශකයාට වැටහෙන්න පටන් ගන්නවා මෙතන එකක් නැහැ. මෙතන රාශියක්. ඒ පැදුර ගැන කිව්වා වාගේ තමයි තම තමන්ගේ ඇතුළතත් - ඇතුළතත් අර විදියමයි. වෙන එකක් තියා එතන දක්වනවා ඒ සන්තතිය සමූහයක් හැටියට පෙනීම නිසා සමහර විට ඒකට ගන්න අරමුණ එකක් හැටියට පේනවා. ඊළඟට ඒ ක්‍රියාවලිය පවා එකක් හැටියට පේනවා. ලෝකයා ඒ හැම එකක්ම එකක් හැටියටයි ගන්නේ. 'යනවා' 'එනවා' ඒ හැම එකක්ම. නමුත් සතිසම්පජඤ්ඤය අනුව සතිය පවත්වන යෝගාවචරයාට ක්‍රමක්‍රමයෙන් වැටහෙනවා - වෙන එකක් තියා මේ ආශ්වාසය ප්‍රාශ්වාසය කියල අපි දෙකක් හැටියට ගන්න එකේ පවා ආශ්වාසය කියලා කියන්නේ එතනත් මහා ක්‍රියාවලියක්. ක්‍රියාදාමයක් එතන තියෙන්නේ. හුස්ම රැලි ගොඩක්. හුස්ම රැලි ගොඩක් උඩට යන්නේ. හුස්ම රැලිගොඩක් පහලට යන්නේ. දැන් ඔය මහලු කෙනෙක් මොකක් හරි බර දෙයක් ඔසවනකොට වෙවුල වෙවුලා නේ ඒක කරන්නේ. එතන අර චලන රාශියක් නේ තියෙන්නේ. අන්න ඒ වගේ හිතාගන්න. එතකොට ඒ වගේ තමයි මේ අපේ ක්‍රියාවලිය තුළත් ඒ විදියෙ ඝන සඤ්ඤාවක් බලපවත්වනවා. 'මා ගියා' 'මා ආවා' ඒ හැම එකක්ම අපි එකක් හැටියට ගන්නවා.

නමුත් අර විදර්ශකයාට ක්‍රම ක්‍රමයෙන් වැටහෙනවා මේ හැම එකක් තුළම තියෙන්නේ සංස්කාර. ඒවාට තමයි 'සංස්කාර' කියලා කියන්නේ. සංස්කාර ගොඩක්. සකස් කිරීම් ගොඩක්. සකස්කිරීම් ගොඩක් තුළිනුයි දැන් අර චලන චිත්‍රයක් උනත් ඇති වෙන්නෙ. සකස් කිරීම් ගොඩක් තුළින් නේ. ඒ චලන චිත්‍රය දැකලා මුළාවෙන පුද්ගලයාට ඒ අවබෝධයක් නැහැ. මෙතන හොඳ ලස්සන නළු නිළියන්ගේ රූහුම්. ඒවා තුළ අපේ හිත පෙළඹෙනවා. නමුත් අන්තිමට බලන කොට අර යන්ත්‍රය තුළින් වෙන්නෙ යම්කිසි මෝහනයක් ඇති කිරීම. යම්කිසි මෝහනයක් ඇති කරනවා, චිත්‍ර රාශියක් ශීඝ්‍රයෙන් ධාවනය කරලා. අන්න ඝනසඤ්ඤාව ගන්නව නම් එතනත්, අර ක්‍රියාවලිය තුළ. ඔය විදිහට අපේ ක්‍රියාවන් තුළත් අපට අරමුණුවන දේවල් තුළත් ඝන වශයෙන් ගැනීමේ සිරිතක් තියෙනවා, තණ්හාව නිසා, ආශාව නිසා, අපට මේක එකක් හැටියට පේනවා වැටහෙනවා. අර මුවා අර පොපියන දර්ශණය වතුරෙයි කියලා ගත්තා වගේ.

ඒකයි බුදුපියාණන් වහන්සේ මේ හැම එකක්ම මිරිඟුවක්ය කිව්වේ. ඇසින් දකින සංඥාව හෝ වේවා! කණින් ගන්න සංඥාව, ශබ්දය, සංගීතය, මේ අපි සංගීතය කියල ගන්න එක, සමහර විට ඔය ඉතාමත්ම මිහිරි සංගීතයක් වෙන්න පුළුවන්. ඕක අර යන්ත්‍රයේ යම්කිසි දෝෂයකින් හරි එහෙම නැත්නම් දැන් අලුත් ක්‍රම තියෙනවා - ඒක හෙමිහිට ධාවනය කරනවා නම් - ඒ පටියක්, ලෝකයේ ඉතාමත්ම දක්ෂම ගායකයගෙ ඉතාමත්ම ප්‍රියජනක සංගීතය පවා අන්තිමට වැළපීමක්, ඇඬීමක්. ඒකයි බුදුපියාණන් වහන්සේ ගීතයත් ඇඬීමක් කියල කිව්වේ. ඇත්ත වශයෙන්ම ඇඬීමක් එතන තියෙන්නේ. ඒ වගේම තමයි නැටීමත්. නැටීම පවා, නෘත්‍යය පවා, උමතු වීමක්. උමතුවෙලා දඟලනවා වගේ කියලා කියන්නේ. හැම එකකම චලන රාශියක් මෙතන තියෙන්නේ. නමුත් ඒ දකින කෙනා, රාගය ද්වේශය ඇතිව මේව බලන කෙනාට මේව, 'එකක්' 'දෙයක්' වෙනවා. ඉතින් අරක නෘත්‍යයක් කියලා හිතින් මවාගන්නවා. හිතතුළ ඇතිවන මෝහය නිසයි මේ හැම එකක්ම එකක් හැටියට පේන්නෙ. එතකොට ක්‍රමක්‍රමයෙන් අන්න ඒ අවබෝධය කරා යන එකයි මෙතන බුදුරජාණන් වහන්සේ දක්වන්නේ.

යම් අවස්ථාවක අර අනිත්‍ය සංඥාව ගැඹුරට ගියොත් එතන සියල්ලම ඉවරයි. කාම රාගයත් ඉවරයි. භව රාගයත් ඉවරයි. අවිද්‍යාවත් ඉවරයි. ඔය විදියට බුදුරජාණන් වහන්සේ අනිත්‍ය සංඥාවේ වටිනාකම දක්වලා තියෙනවා මහා බල සම්පන්න අන්දමින්.

මහණෙනි, මේ අනිත්‍ය සංඥාව ගැඹුරින් වැඩූ කෙනාට වැඩූ අවස්ථාවේදි සියලුම කාම රාගය මුලසුන් කරනවා ඊළඟට භව රාගය, අන්තිමට අවිද්‍යාව සම්පූර්ණයෙන්ම විනාශ කරනවා කියලා. ඒ විදියට අනිත්‍ය සංඥාව පිළිබඳ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා. එතකොට ඒ අනිත්‍ය සංඥාවේ ප්‍රතිඵලයක් හැටියට තමයි දුඃඛ සංඥාව ඇතිවන්නේ.

**'යදනිච්චං තං දුක්ඛං'**

යමක් අනිත්‍යද එය දුකක්. මේක සංස්කාර, සකස් කිරීම් ගොඩක් නම් හැම තිස්සෙම පිළිසකර කර කර යන්න තියෙන දෙයක් නම්, මේ ශරීර කුඩුව ගැන හිතනකොටත් ඒකයි යෝගාවචරයට දැනෙන්නේ. මේක රැක බලාගන්න ගන්න වෙහෙස තුළ සිත යොදන්න යොදන්න, මේ හැම එකක්ම, ගන්න ආහාරයට යන කල දසාව, බොන වතුර ටිකට යන කල දසාව - මේ හැම එකක්ම ගෙවි ගෙවී යන ආකාරය, අර කියාපු සැලෙන, ගෙවෙන ආකාරය ප්‍රකට වෙන්න පටන් ගන්නවා. බාහිර ලෝකයේ





තියෙන ඒ තමන් ඇලුම් කරන දේවල් පිළිබඳවත් ඒ තත්ත්වය දකිනවා. එතකොට තමයි අන්න අර 'දර රස ගිනි ඇවිලුනු කල' කිව්වා වාගේ මේක තනිකර දුක් ගොඩක් කියන අවබෝධය එන්නේ. එතෙන්දියි චතුරාර්ය සත්‍යයේ පළවෙනි සත්‍යය හරියට අවබෝධ වෙන්නේ. විදර්ශනා ඥාන මේරූ අවස්ථාවේදී ඇතිවීම් නැතිවීම් වලින් පටන්ගෙන භංග, භය, ආදීනව වශයෙන් ඔය විදර්ශනා ඥාන පද්ධතියක් දක්වනවා. ඒ විදිහට ඇතිවීම් නැතිවීම් සමූහයක් පෙනෙමින් තිබිලා ඊළඟට බිඳෙනවා පේනවා. දැඩිව පේනවා. භංග ඥානය කියල හැම තැනම බිඳෙනවා පේනවා. බිඳි බිඳි යනවා. ඒක නිසා භයක් ඇතිවෙනවා. පුදුම අන්දමේ භයක්. මේ හැම එකකම අල්ලන්න දෙයක් නැහැ. හැම එකක්ම අල්ලන තැන බිඳෙනවා. ඒ භය නිසා ඊළඟට ආදීනවයත් වැටහෙනවා. මේක මොකක්ද? මේක මහා භයානක තැනක්, මේ සංසාරය කියන එක. ආදීනව ඤාණය කියල කියනවා. ඊළඟට ආදීනවය නිසා නිබ්බිද කියල කියන සසර කල කිරීමක් ඇතිවෙනවා. මේකෙන් කොහොම හරි බේරෙන්න ඕන කියලා. බොහොම ශීඝ්‍රයෙන් මේවා ඇතිවෙන්නේ. ඒ නිබ්බිදව නිසා ඊළඟට බලනවා කොහෙන්ද මම බේරෙන්නේ? කොයි පැත්තටද බේරෙන්නේ?

ඔන්න ඊළඟට ඒකට උපකාර වෙන්නේ බුදුරජාණන් වහන්සේ දුන්න අනිත්‍ය දුඃඛ අනාත්ම සංඥවන් තවදුරටත් ගැඹුරින් වැඩීම. ඉතින් ඔන්න ඔය විදිහට ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට යන විදර්ශනා ඥාන පද්ධතියක් තුළින් තමයි කෙනෙකුට අර මුලින් අපි කියාපු භවයෙන් එතරවීමේ හැකියාව ලැබෙන්නේ. එතකොට සංයෝජන පිළිබඳ කතාවයි මුල ඉඳල අගටම තියෙන්නේ. සංයෝජන කියන එක - අර කියාපු දස සංයෝජන කැඩෙන්නෙ පහුවෙලයි. ඒකේ ප්‍රතිඵලයක් වශයෙන්, නමුත් අපට මූලික වශයෙන් කරන්න තියෙන්නේ අර කියාපු ආයතන පිළිබඳව, අපේ මේ ආයතන හයට අදාළව තියෙන සංයෝජන ටික තේරුම් අරගෙන මේ කියාපු උපමා ආශ්‍රයෙන් - ඒකට අර ඉන්ද්‍රිය සංවරය ආදිය උපකාර කරගෙන, කර්මස්ථාන උපකාර කරගෙන, අපේ බණ භාවනා දියුණු කර ගත්තොත් අර කියාපු බුදුරජාණන් වහන්සේ මේ වගේ වෙසක් පෝය දවසක මේ භවයෙන් එතරවීම පිළිබඳ දීපු පණිවිඩය ඔන්න අවබෝධ කරගන්න පුළුවන්.

සාමාන්‍යයෙන් අපි වෙසක් පෝය දවසක බුද්ධ චරිතය විතරක් කියලා සද්ධාව විතරක් වඩවන දේශනායි බොහෝවිට අහන්න පුරුදු වෙලා තියෙන්නේ. නමුත් අපි මේ අවස්ථාවේ කල්පනා කළා, දැන් එන්න එන්නම නිවනයි හංගෙන්නේ. මේ බුද්ධ ශාසනයේ ගැඹුරුම කොටස එන්න එන්නම ගිලිහිලා යනවා. එබඳු අවස්ථාවක අපි මේ වටිනා පොහොය දවසෙ අර බුදුරජාණන් වහන්සේ සම්බෝධි ඤාණයෙන් මතුකර

ගත්තු මෙන්න මේ භවයෙන් එතරවීමේ පණිවුඩයයි මේ අවස්ථාවේ මේ පිංවතුන්ට දෙන්නෙ මේ වචන කීපයකින්. එතකොට මෙතෙක් මේ ධම් ශ්‍රවණය කිරීමෙන් මේ පිංවතුන් ඒ වගේම උසස් ශීලයක පිහිටලා බණ භාවනා කිරීමෙන් මෙතෙක් රැස්කරගත්තු කුසල සම්භාරය, තමතමන්ගේ ඒ සංසාරිකව දියුණු කරගත්තු විදර්ශනා ශක්තීන් තව දියුණු කරගැනීමටත්, හැකිතාක් ඉක්මණින් සෝවාන් සකදාගාමී, අනාගාමී, අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමාමහ නිවන් සාක්‍ෂාත් කරගැනීමටත් උපනිශ්‍රය වේවායි ප්‍රාර්ථනා කරගන්න.

එසේම ධම් ශ්‍රවණය කිරීමට හෝ ඒ වගේම ධර්ම දේශනා පිළිබඳ ඒ පින් අනුමෝදන් වීමට හෝ බලාපොරොත්තු වන අවීචියේ පටන් අකනිටා දක්වා යම්තාක් සත්ත්වයින් ඇතොත් මේ පින්වතුන්ගේඥාතීන් ඇතුළු, ඒ හැම දෙනෙක්මත් මේ පින් අනුමෝදන් වීමෙන් හැකිතාක් ඉක්මණින් තමන්ගේ ප්‍රාර්ථනා පරිදි උතුම් අමාමහ නිවනින් සැනසෙත්වා කියල ප්‍රාර්ථනා කරන්න. දැන් මේ විදියට ගාථා කියල පින් අනුමෝදන් කරමු.

**"එත්තාවතාව අමෙහහි ........."**

# 28 වන දේශනය

# 28 වන දේශනය

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

**යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති**

**සුද්ධස්ස පොසස්ස අනඞ්ගනස්ස**

**තමෙව බාලං පච්චෙති පාපං**

**සුඛුමො රජො පටිවාතංව ඛිත්තො**

**- පාපවග්ග, ධම්මපද**

සැදැහැවත් පින්වතුනි,

වර්තමාන ලෝකයේ ව්‍යවහාර වර්ෂ ක්‍රමය අනුව අලුත් අවුරුද්දක් ආරම්භ කරපු මේ පින්වතුන්ට දුරුතු පෝය දවසත් සිත් අලුත් කරගැනීමේ අවස්ථාවක් කරගන්න පුළුවන්. පුදුමාකාර විද්‍යාත්මක නිෂ්පාදන නිසා අප අවට පරිසරය දිනෙන් දිනම අලුත් වෙනව පේනවා. අලුත් අලුත් උපභෝග පරිභෝග ද්‍රව්‍ය භාණ්ඩ පරිහරණය කිරීමේ අවස්ථාව අපට සැලසෙනවා. භෞතික දියුණුව අතින් දිනෙන් දිනම නවීන යුගයක් උදාවෙන බවක් පේන්න තිබුණට මොකද ආධ්‍යාත්මික අතින් ඉතාමත්ම වේගයෙන් ආපස්සට ම්ලේච්ඡ යුගය කරා යන බව මේ පින්වතුන්ට නුවණැසින් මේ රට, ලෝකය, දිහා බලන කොට පේනව ඇති. ඉතාමත්ම කෲර අන්දමින් කරන මනුෂ්‍ය ඝාතනය, සත්ත්ව ඝාතනය සුලු දෙයක් හැටියට සැළකෙන යුගයක් මේක. අන්න එබදු යුගයකට හොඳ ධර්ම දේශනාවක් හැටියට අපි අද මේ මාතෘකා කරගත්තු ගාථාවෙනුත් ඒ නිදාන කථාවෙනුත් පෙන්නුම් කෙරෙන්නෙ අර ම්ලේච්ඡ ප්‍රතිපත්තියේ ආදීනව පක්ෂයයි.

බුදු පියාණන් වහන්සේ ජේතවනාරාමයේදී මේ මාතෘකා කළ ගාථා ධර්මය දේශනා කර වදළේ කෝක කියන නම ඇති බලු වැද්දකු සම්බන්ධ සිද්ධියක් නිසයි. මේ කෝක කියන නම ඇති වැද්දා බලු රැළක් එක්ක එකදවසක්දා උදෑසන දඩයමේ පිටත්වෙලා ගියා කැලේට. ඒ යන අතරමගදි සංඝයා වහන්සේ නමක්, භික්ෂුන් වහන්සේ නමක්, පිණ්ඩපාතෙ වඩිනවා හමුඋනා. මේ වැද්ද කල්පනා කළා, කාලකණ්ණියෙක් දකින්න ලැබුණා, දැන් ඉතින් අද මට දඩයමක් අහුවෙන්නෙ නෑ කියල හිතේ කෝපය

ඇතිකරගෙන, ද්වේෂය ඇතිකර ගෙන, කැලේට ඇතුල් උනා. ඊළඟට ඒ සංඝයා වහන්සේ පිණ්ඩපාත කරගෙන දානෙ වළඳලා ආපසු විහාරයට වඩින අවස්ථාව වෙන කොට මේ වැද්දා කැලේ පුරා ඇවිදලා දඩයමක් ලැබුණෙ නැතුව එලියට එනවා. එන අතරෙ මේ සංඝයා වහන්සෙ, මේ හාමුදුරුවො, දැකලා තවත් කිපිලා මේ කාලකණ්ණි පුද්ගලයා මට හමුවුණා. ඒක නිසා යමක් ලැබුණෙ නෑ අද. ආයිත් හමුවුණා. බල්ලන් ලවා කවන්න ඕන කියලා බල්ලන් උසිගන්වන්න සූදානම් උනා. භික්ෂූන් වහන්සේ කිව්වා, උපාසකය ඒක කරන්න එපා කියලා. ඒ උනාට එහෙම කිව්වට මොකද. මේ මනුෂ්‍යයා කියනවා "මට අද මේ පිටත්වෙන වෙලාවෙත් නුඹ මූණ ගැහුනා. දැනුත් මූණ ගැහුනා. කාළකණ්ණිකම නිසා මේ කාළකණ්ණියෙක් නිසා මට අද යමක් ලැබුණෙත් නෑ. මං මේ බල්ලන් ලවා කවනවා" කියල බල්ලන් උසි ගැන්නුවා.

මේ භික්ෂූන් වහන්සේ, ළඟ තිබුණු ගසකට නැග්ගා. ඒ නැග්ගට මොකද බුදුපියාණන් වහන්සේගේ විනය නීතියකට අනුව සංඝයා වහන්සේලාට ගස් නැගීම සුදුසු නෑ කියල දේශනා කරල තියෙනවා. ඇවැතක් හැටියට. නමුත් චණ්ඩමෘගයන් එළවා ගෙන එන වෙලාවෙ මනුෂ්‍යයෙකුගේ උසට ප්‍රමාණයට ගහට නගින්න අවසර දීල තියෙනවා. අන්න ඒ අනුව මේ සංඝයා වහන්සෙත් ගහේ ඉහළටම නැග්ගෙ නෑ. මනුෂ්‍යයෙකුගේ උස ප්‍රමාණයට නැගලා අත්තක් උඩ ඉන්න අතරේ අර බලු වැද්දා ඇවිල්ලා, ඔහොම බේරෙන්න හම්බවෙන්නෙ නෑ නුඹට කියලා. වටේට බල්ලො පිරිවරාගෙන ඉන්නවා. මේ මනුෂ්‍යයා ඊතලෙන් මේ ස්වාමීන් වහන්සෙගෙ පයට පතුළට අනිනවා. ස්වාමීන් වහන්සේ ඒ කකුල උඩට අරගෙන අනික් කකුල පහත් කරන කොට ඒකට අනිනවා. ඔය විදියට අනින්න පටන් ගත්තා. මේ ස්වාමීන් වහන්සේට කියන්න බැරි තරම් බොහොම වේදනා ඇතිවෙලා ඒ නිසාම තේරුණෙ නෑ සිවුර ගැලවිල වැටුනා. සිවුර වැටුනෙ අර බලු වැද්දගෙ හිසත් වහගෙන බලු වැද්ද උඩට. මේ බල්ලන් හිතුවා මේ භික්ෂූන් වහන්සේ වැටුනා කියලා සිවුර ඇතුළට රිංගල අර තමන්ගෙම ස්වාමියා කාල දැම්මා. කාලා ඇට විතරක් ඉතුරු කරල බල්ලො ටික එළියට එනකොට අර ඒ භික්ෂූන් වහන්සේ ගහේ වේලිච්ච අතු කැල්ලක් කඩලා බල්ලන් දිහාවට විසිකළා. ඒ බල්ලන් උඩ බලනකොට මේ සංඝයා වහන්සේ ඉන්නවා. ඉතින් හිතුවා මේ අපි අපේම ස්වාමියා තමයි කා දැම්මෙ කියල කැළේට වැදුනා.

මේ ස්වාමීන් වහන්සේට සැකයක් ඇතිවුණා 'දැන් මගේ සිවුර වැටීම නිසා නේද මේ තැනැත්තට ජීවිත හානිය සිද්ධ වුණේ? මගේ ශීලය අපිරිසිදු වුණාද? මගේ මහණකම තවම තියෙනවද?' කියලා විනය කුකුසක්





ඇතිවෙලා ඒ ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ හමුවට ගිහිල්ලා මේ සිද්ධිය ප්‍රකාශ කළා මුල හිටලම. මගේ ශීලය මෙයින් අපිරිසිදු වුණාද? මගේ සිවුර නිසා නේද මේ මනුෂ්‍යයාට මේ හිංසාවක් වුනේ කියලා. බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කළා "නෑ මහණ, නුඹගේ ශීලයට මොකක්වත් වුණේ නෑ. මහණකමත් පිරිසුදුයි, ඒ මනුෂ්‍යයා ද්වේෂ නොකරන කෙනෙකුට ද්වේෂ කරලා ඒ විදියට ඒකෙ විපාකය වින්දා. දැන් පමණක් නෙවෙයි අතීතයෙත් ඒ විදියෙ සිද්ධියක් මේ පුද්ගලයාට මේ වගේ උනා" කියලා අතීත කථාවකුත් ඇදලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළා.

අතීතයේ එක්තරා වෙද මහත්මයෙක් මේ තැනැත්තා. ඒ වෙද කෙනෙක් වෙලා ඉපදිලා ගමින් ගමට ගමට යනවා ලෙඩුන් ඉන්නවනම් සුව කරන්න. සුව කරල යමක් හම්බුකරගන්න. එහෙම ගිය දවසක කිසිම ලෙඩෙක් ඉදිරිපත් වුනේ නෑ. ඉතින් මේ මනුෂ්‍යයාට රස්සාව නැතුව බඩගින්නෙම ගමින් එලියට එන අතරෙ ගම් දොරටුව ළඟ ළමයි වගයක් සෙල්ලම් කරනවා. ඒ කිට්ටුව ගහක බිලයක සර්පයෙක් ඔලුව එලියට දාගෙන ඉන්නවා. මේ මනුෂ්‍යයා කල්පනා කරනවා - මේ වෙද මහත්තයා කල්පනා කරනවා - දැන් ඉතින් පොඩි රස්සාවක් හැටියට කරන්න තියෙන්නෙ මේ ළමයින්ට සර්පයා දෂ්ට කරන්න සළස්සලා ඒකට වෙදකම් කිරීමෙන් කීයක් හරි හම්බ කරගන්න එකයි කියල අර ළමයින්ට කියනවා, "ළමයිනේ මෙන්න සැළලිහිණි පැටියෙක් ඉන්නව මේ ගස් බෙනේ. අල්ල ගන්න" කියලා. එයින් එක ළමයෙක් ගිහිල්ල අර සර්පයාගේ බෙල්ලෙන් අල්ලලා සර්පයා බව දැනගත්තහම දුවගෙන ඇවිල්ලා අර වෙද මහත්තයගෙ ඇඟ පිටම දැම්මා. ඒ සර්පයා දෂ්ට කරල වෙද මහත්මයා මරණයට පැමිණියා. ඔන්න ඕකයි කතන්තරේ. බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළා අතීතයෙත් මේ මනුෂ්‍යයා ඒ විදියට අහිංසක කට්ටියට හිංසා කරන්න ගිහිල්ල අමාරුවෙ වැටුණා කියලා. ඊළඟට අර අපි මාතෘකා කළ ගාථා ධර්මය වදාළා.

**"යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති**

**සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස**

**තමෙව බාලං පච්චෙති පාපං**

**සුඛුමො රජො පටිවාතංව ඛිත්තො"**

යම් කිසි කෙනෙක් ද්වේෂයක් නොමැති පිරිසිදු නිකෙලෙස් - එහෙම නැත්නම් වරදක් නැති - කෙනෙකුට, මනුෂ්‍යයෙකුට, ද්වේෂ කරයිද ඒ තැනැත්තා කරා ඒ පාපය ආපස්සට එනවා. කොහොමද? උඩුසුළඟට

වීසිකළ සියුම් දූවිල්ලක් තමා කරාම එන්නා වගේ. උඩුසුළඟට දූවිල්ලක් විසි කළාම තමන්ගෙම ඇස්වලට වදින්නා වගේ තමා කළ ඒ පාපකර්මයේ විපාකය තමා කරාම එනවා කියල ඒ උපමාවකින් බුදුපියාණන් වහන්සේ පාපකර්මවල ආදීනව පක්‍ෂය ඒ අවස්ථාවෙ කෙටියෙන් හෙළිකර වදාළා. ඒ ධර්මදේශනාව අහල අර සංඝයා වහන්සෙත් රහත් උනා කියල සඳහන් වෙනවා.

කථා ප්‍රවෘත්තිය මේකයි. මේ පොඩි කතා ප්‍රවෘත්තිය තුළිනුත් අපට යම් යම් දේවල් මතුකරගන්න පුළුවන්. දැන් අර බලු බැද්දට පිණ්ඩපාතෙ වඩින සංඝයා වහන්සේ කෙනෙකුගෙ දර්ශනය කාලකණ්ණියෙකුගෙ දර්ශනයක් හැටියටයි පෙනුනෙ. ඒ විදියට ඒ ම්ලේච්ඡ ජීවිතයක් ගතකරන නිසා වෙන්ට ඕන. නමුත් එදා පමණක් නොවෙයි අදත් සමහර බෞද්ධයින් අතර මිථ්‍යා දෘෂ්ටියක් තියෙනවා, උදෑසන සංඝයා වහන්සේ කෙනෙක් දකින්ට ලැබීම අසුභ දර්ශනයක් හැටියට. ඉතින් ඒ විදියටයි අතන අර ඒ බලු වැද්ද ද්වේශය ඇතිකර ගත්තු නිසා, ඊ ළඟට දෙවනිවර හමුඋනාම පලිගැනීම් හැටියට වගේ තමයි අර නිර්දෝෂී සංඝයා වහන්සේ බල්ලන් ලවා කවන්න උසිගැන්වුවෙ. ඊ ළඟට අර බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළ උපමාවෙ හැටියටම තමා උසිගැන්වූ බල්ලන් විසින් තමාම කා දමනු ලැබුවා. ඒ සිද්ධිය එක්තරා විදියක නාට්‍යාකාරයෙන් වගේ අපට පෙන්වනවා මේ කර්මය ආපස්සට කැරකිල එන ආකාරය. සමහර කෘෘර ක්‍රියාවල විපාකය පුදුම විදියට නාට්‍යාකාරයෙන් ආපස්සට හැරිල එනවා. දැන් මෙතනත් ඒ විදියෙ දෙයක් සිද්ධ උනේ. අන්තිමට තමාම උසිගැන්වුව බල්ලන් විසින් තමාව කා දමනු ලැබුවා. වැද්දාගේ ප්‍රවෘත්තිය එහෙමයි.

අනික් පැත්තට හැරිල ගහ දිහා බලනකොට මේ සංඝයා වහන්සේගේ ශ්‍රේෂ්ඨ ප්‍රතිපත්ති ඒ තුළින් අපට පේනවා. අනතුරක් වෙලත් බුද්ධ වචනය අනුව විනය නීතිය කැඩුවෙ නෑ. ගහේ උඩටම නැග්ගෙ නෑ. ඒ වගේම අර තමන්ගෙ පතුල හිල්කරන මනුෂ්‍යයා කෙරෙහි ද්වේෂයක් ඇතිකර ගත්තෙ නෑ. එහෙම ද්වේෂයක් ඇතිකර ගත්තනම් ඒ මනුෂ්‍යයාට විපත්තිය වෙනකොට, දැන් මේ කාලෙ සමහර කෙනෙක් කරන්න වගේ "හොඳ වැඩේ, අනුන්ට කළ දේ තමන්ට පලදේ" කියල සතුටු වෙනවා.

ඒ වෙනුවට මේ සංඝයා වහන්සේ කුකුසක් ඇති කරගත්තා. "අනේ මගේ සිවුර නිසානෙ මේ මනුෂ්‍යයාට වරදක් වුනේ මගෙන්. ඒක නිසා සමහරවිට මගේ ශීලයත් අපිරිසිදු වෙන්න ඇති" යි කියලා. මේ කාලේ අපි කාටත් ඒක හොඳ ආදර්ශයක්. බුදුපියාණන් වහන්සේ මේ අර්හත් ධජය හැටියට දක්වල තිබෙන මේ චීවරය අවිහිංසාවේ සංකේතයක්. හිංසාවේ





කොඩියක් නෙවෙයි. ඉතින් ඒ සංඝයා වහන්සේ ඒ ගුණධර්මය ආරක්‍ෂා කිරීම් වශයෙන් තමන්ගෙන් ගැලවිල වැටුන සිවුරෙන්වත් කෙනෙකුට හිංසාවක් නොවෙච්චා කියන ඒ මෛත්‍රී සිත ඇතිව ජීවත් වුනු බව අපට පේනවා මේ කථාන්තරය තුළින්. ඉතින් ඒ ගුණ සම්පත්තිය නිසා වෙන්න ඇති ඒ වගේම තමන් වින්ද වේදනාව තුළින් ඒ සංසාර තත්ත්වය තේරුම් අරගෙන හෝ - ඒ දේශනාව අවසන් වෙන්කොට රහත් උනා කියලත් සඳහන් වෙනවා. කොයි අත්දැකීම් තුළත් තියෙන්නෙ මේ සංසාර දුක පිළිබඳ කථාන්තරය අඩංගු වෙලා - නුවණින් ඒ ගැන විමසල බලන කොට.

කථාන්තරය තුළින් අපි ඒ කාරණා මතුකරගත්තා වගේම ඊ ළඟට අපි බලමු බුදුපියාණන් වහන්සේ ගාථාවෙන් දෙන ඉඟිය. ඇත්ත වශයෙන්ම කර්මය පිළිබඳ අදහසක් එතන කියන්නෙ. මේ යුගය දැන් අපි අර කලින් කියාපු ම්ලේච්ඡ යුගයක් කරා ආපස්සට හැරිල යන්නෙ මොකද? ප්‍රධාන කාරණයක් තමයි, බෞද්ධයින් අතර පවා කර්මය කියන ඒ ධර්මතාව පිළිබඳ හරි අවබෝධයක් නැති කම. ඒ ගැන විශ්වාසයක් නැතිකම. ශ්‍රද්ධාවක් නැතිකම. විදේශිකයින්, අවරදිගුන් පවා, ඒ කියන්නෙ ඊශ්වර නිර්මාණවාදය කියල කියන දෙවියන් විසින් මවන ලද ලෝකයක් ගැන කතා කරන අය පවා - නොයෙකුත් මනෝවිද්‍යාත්මක සාධක ආශ්‍රයෙන් කර්මවාදයට අවදිවන යුගයක අපේ බෞද්ධයින් මේ කර්මය ගැන අවිශ්වාස කිරීම එක්තරා මෝස්තරයක් කරගෙන තිබෙනවා. මේක ගැන සැකකිරීම. මේ විපාක තමා කරා කොහොමද එන්නෙ? ඔය විදියට. නමුත් මේ බුදුපියාණන් වහන්සේ නොයෙකුත් අවස්ථාවල්වල මේ කර්මය පිළිබඳ ධර්මතාව විග්‍රහ කරල තියෙනවා. විශේෂයෙන්ම කර්මවිපාක කියන එක. දැන් මෙතන නම් ඒ අවස්ථාවෙම - දිට්ඨධම්ම වේදනීය කියල කියනවා. එහෙම නැත්නම් මෙලොව වශයෙන් විඳින්න සිද්ධ උනා. මේ කාලෙත් අපට අප්‍රකට නමුත් ඉඳහිටල අහන්න ලැබෙනව සිද්ධි. ඉතාමත්ම කෲර අන්දමින් සත්ත්ව ඝාතනය, එහෙම නැත්නම් මනුෂ්‍යඝාතනය, කරන අයට යම් යම් නාට්‍යාකාරයෙන් පුදුම අන්දමේ විපාක මොන හේතුවකින් හරි එන බව. නමුත් එතනින් කෙළවර වෙන්නෙ නෑ. ඈතට විහිදිල යනවා. ජාති ගණන්, ආත්ම ගණන්, ඒ විපාක විඳින්න සිද්ධ වෙනවා.

මේක පිළිබඳ සාමාන්‍ය ධර්මතාවන් හැටියට බුදුපියාණන් වහන්සේ මේ කර්මය කාල වශයෙන් විපාක දෙන ආකාරය කෙටියෙන් දක්වල තිබෙනවා. මේ පින්වතුනුත් සමහරවිට අහල ඇති. දිට්ඨධම්ම වේදනීය, උපපජ්ජ වේදනීය, අපරාපරිය වේදනීය කියල තුන් ආකාරයකින් කාල වශයෙන් කර්මය පැහෙනව කියලා. කර්මයක් විපාකයක් කියල කියනකොට විපාකය කියන එක තුළ තියෙන්නෙ පැසීම කියන අර්ථයයි. කර්මය

කාලයත් එක්කමත් පැසෙනවා. ඔය ගහක් මෝරලා පලදාව හටගන්නව වගේ. ඒ වගේ පැසීමක් සිද්ධ වෙනවා. ඒක පිළිබඳ මූලික ධර්මතාවල් කෙටියෙන් දක්වලා තිබෙනවා. මෙතන දිට්ඨධම්ම වේදනීය කියන්නෙ මෙලොවම විපාක දෙනවා, ඇතැම් කර්ම. තවත් කර්ම තිබෙනවා ඊළඟ ජීවිතයක එහෙම නැත්නම් නැවත ප්‍රතිසන්ධියක් ලබා දෙනවා. ඊළඟ ආත්මභාවයේ. තවත් කර්ම තිබෙනවා, ඊළඟ ආත්මභාවයේ නෙවෙයි ඊට මතු ඊට පස්සෙ ආත්මභාව රාශියක කවර හෝ ආත්මභාවයක විපාක දෙනවා. ඉතින් ඔය විදියට දිට්ඨධම්ම වේදනීය, උපපජ්ජ වේදනීය, අපරාපරිය වේදනීය, කියලා ඒවා විපාක දෙන, ඒවා විඳින්න වෙන - ආකාරය ගැන බුදු පියාණන් වහන්සේ මේ විදියට කෙටියෙන් දක්වල තිබෙනවා. මේ ගැන තවත් සියුම් අන්දමින්, එහෙම නැත්නම් ගැඹුරු අන්දමින්, අවබෝධයක් ලබා ගන්න උපකාරවත් වන සූත්‍ර දේශනා ඒ ඒ තැන්වල තිබෙනවා. එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ සංඝයා වහන්සේලාට ප්‍රකාශකරනවා මේ කර්මය කියන එක නියතිවාදයක් නොවේය කියන අදහස දෙන විදියේ දේශනාවක්. මහණෙනි, යම් කිසි කෙනෙක් කිව්වොත්, යම් පුරුෂයෙක් යම් යම් ආකාරයකට කර්ම කරනවනම් ඒ ඒ ආකාරයටම විපාක විඳිය යුතුයි කියලා, ඒකාන්ත වශයෙන් එහෙම කිව්වොත් මේ නිවන් සඳහා දරන ප්‍රතිපත්ති මාර්ගය, ඒ බ්‍රහ්මචරිය වාසය, සාර්ථක කරගන්න බැරි වෙනවය, දුක් කෙළවරකරගන්න බැරිවෙනවය කවදාවත්. ඒ කියන්නෙ, ඒ තරමට අපි සංසාරයේ පාපකර්ම ආදිය කරල ඇති. මේ හැම එකකටම ඒ විදියටම විපාක ගෙවල නිවන් දකින්න හිතුවොත් කවදාවත් ඒක කරන්න බැරි දෙයක්. ඒකයි මෙතන බුදු පියාණන් වහන්සෙ දක්වන්නෙ. කර්මයක, දැන් ප්‍රාණඝාත අකුසලයක් අපායගාමී කර්මයක් කියල කියනවා මිසක් ප්‍රාණඝාත අකුසලය කරන හැම කෙනෙක්ම අපායට යනවා කියල ඒකාන්ත වශයෙන් කියන්න බෑ. ඒ විදියෙ සියුම් තත්ත්වයක් තිබෙනවා.

ඒ කාරණය බුදු පියාණන් වහන්සේ මෙන්න මේ විදියට හෙළි කරනවා. ඉස්සෙල්ල ප්‍රහේලිකාවක් වගේ බුදු පියාණන් වහන්සේ ඉදිරිපත් කරන්නෙ. මෙලොව ඇතැම් කෙනෙක් සුළු පාපකර්මයක් කරල, අල්පමාත්‍ර පාප කර්මයක් කරල, නිරයට යනවා. තවත් කෙනෙක් ඒ ප්‍රමාණයේම අල්පමාත්‍ර පාපකර්මයක් කරලා මෙලොවම සුළු වශයෙන් විපාක විඳල එතනින් බේරෙනවා. ඊට එහාට යන්නෙ නෑ ඒ පාපකර්මය. මොකද මෙහෙම වෙන්නෙ කියල ඊළඟට බුදු පියාණන් වහන්සේම ප්‍රකාශ කරනවා. අර මුලින් කියාපු පුද්ගලයා - ඒ කියන්නෙ සුළු පාප කර්මයක් කරල නිරයට යන පුද්ගලයා - ගතකරන ජීවිතය ගැන මෙන්න මෙහෙමයි දක්වන්නෙ.ඒ තැනැත්තා සීල, සමාධි, ප්‍රඥ  වඩන්නෙ නෑ. හිත දියුණු කරන්නෙ නෑ.





ප්‍රඥව වඩන්නෙ නෑ. ඒ වගේම ඒ තැනැත්තාගේ සිත බොහොම පටුයි. අල්පාත්මයක් හැටියට හඳුන්වනවා, ඒ තැනැත්තාගේ ඒ  ජීවිතය බොහොම පටු අදහස් වලින් පෝෂණය වෙච්ච එකක්. ඒක නිසා ඒ තැනැත්තාට අර සුළු පාප කර්මයක් කළත් නිරයට යන්න සිද්ධ වෙනවා. සුළු පාපකර්මය ඒ ජීවිතයේම යන්තමින් ගෙවල බේරෙන තැනැත්තා ගැන කියනවා ඒ තැනැත්තා නම් ශීල, සමාධි, ප්‍රඥාව වඩන මහාත්ම ගුණ ඇති පුද්ගලයෙක්. එබඳු පුද්ගලයාට අර කර්ම වේගය බරපතල අන්දමින් බලපාන්නෙ නෑ. ඊළඟටයි ඔන්න බුදු පියාණන් වහන්සේ උපමාව ඉදිරිපත් කරන්නෙ. කාටත් ඒක මතක තියාගන්න පහසු වටිනා උපමාවක්.

"මහණෙනි" - ඒක සංඝයා වහන්සේලාගෙන් උත්තර ලබාගන්නයි අහන්නෙ "දැන් යම්කිසි ලුණු කැටයක් යම් කෙනෙක් කුඩා දිය බඳුනක, තලියක, දියකළාම ඒ දිය ලුණුරස ගැන්වෙනවද? බොන්න බැරිතරමට" කියල අහනවා. සංඝයා වහන්සේලා කියනවා, "එසේය ස්වාමීනි" මොකද ඒකට හේතුව? අර ඒ පොඩි භාජනයේ දිය ටිකයි. ඊළඟට ඒ ලුණු කැටයම ගංගානම් ගඟේ දියකරල ඉවරවෙලා ඒ වතුර රස බැලුවහම ඒකෙ ලුණුරස තිබෙනවද ? නැත ස්වාමීනි. මොකද ඒකට හේතුව? ඒ ගඟේ දිය වැඩියි. දිය ප්‍රමාණය වැඩියි. අන්න ඒ උපමාව අනුව දක්වනව අර කලින් කියාපු විදියට සුළු පාපකර්මයක් කළ, හිත නොදියුණු, පටු සිතක් ඇති, සීල, සමාධි, ප්‍රඥා, නොවඩන පුද්ගලයාට අර පාප කර්මයේ විපාක බරපතල අන්දමින් විඳින්න සිද්ධ වෙනවා නිරයෙදි. හොඳ ජීවිතයක් ගතකරන සීල, සමාධි, ප්‍රඥා, වඩන මහාත්ම පුද්ගලයෙකුට එම පාපකර්මය මෙලොවම සුළු වශයෙන් විපාක විඳලා එතනින් කෙළවර කර ගන්න පුළුවන්. එතකොට පුද්ගල විශේෂයක් මෙතන තිබෙනවා. විපාක දීමේ නානත්වයක් තිබෙනවා එතකොට එයින් තමයි බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ යම් යම් ආකාරයකට කර්ම කළාම ඒ විදියටම විඳිය යුතුයි කියල නෑ. ඒවා විඳින ආකාරය, විඳීම පිළිබඳව යම් විශේෂ ධර්මතාවක් තිබෙනවා. පුද්ගලයින් පිළිබඳව වෙනස් වෙන්න පුළුවන් තවත් වෙනස් හේතූන් නිසා.

දැන් ඒක අපි කෙටියෙන් කිව්වොත් - අර ගඟේ උපමාව ගත්තොත් දැන් යම්කිසි බීජයක් පැලකරාම ගහක් වැඩෙනවා. නමුත් ඒ ගහේ පලදාව එන්න කලින් ඒකට හොඳට පොහොර දැම්මොත් ඔන්න පලදාව හුඟක් තිබෙනවා. පොහොර අඩු කළොත්, පෝර නොලැබෙන ආකාරයක් සැලැස්සුවොත්, පලදාව අඩුවෙනවා. අරකෙ පලදාව වැඩිවෙනව පෝර දැම්මොත් පෝර අඩුකළොත් පලදාව අඩුවෙනවා. ඒ වගේ මෙතනත් ඒ පාපකර්මය කළාට මොකද හොඳ ජීවිතයක් ගතකරන නිසා පාපකර්මයේ

විපාක ගෙවිල යනවා. ඒ තුළින් යම්කිසි සහනයක්, ලෝකයාට මේ කර්මයෙන් බේරීම පිළිබඳ සහනයක්, බුදුපියාණන් වහන්සේ මතුකරල දෙනවා. ඊළඟට එතනින් නැවැත්වුවෙ නෑ. තවත් උපමා දෙකක් බුදුපියාණන් වහන්සේ දෙනවා මේ කාරණය වඩාත් ඒත්තු ගන්වන්න. දැන් ඇතැම් කෙනෙක් කහවණු භාගයක්, කහවණුවක්, කහවණු සීයක් ගෙවාගන්න බැරුව - තමන්ට දඩ ගැහුවහම කහවණුවක් හෝ කහවණු සීයක් හෝ - එය ගෙවා ගන්න බැරුව, සුලු මුදලක් දඩ ගැහුවහම ඒක ගෙවා ගන්න බැරුව හිර බත් කන්න වෙනවා. හිරේට යන්න වෙනවා. ඇතැම් කෙනෙක් ඒ විදියෙ දඩ ගැහුවහම හිරේට යන්නෙ නෑ. එයින් බේරෙනවා. ඒකට හේතුව දක්වන්නෙ, බුදුපියාණන් වහන්සේ පළමු කී පුද්ගලයා දිළින්දෙක් යමක් කමක් නැති. වත්කමක් නැති පුද්ගලයට දඩයක් ගැහුවහම ඒක ගෙවාගන්න බැරුව හිරේට යනවා. ධනවත් කෙනාට බේරෙන්න පුළුවන් හිර ගෙයින්. අන්න ඒ වගේ එතනත්. ඒ දෙවෙනි උපමාව. තුන්වැනි උපමාවකුත් දෙනවා.

බැටළු රැළක් අයිති කාරයකුගේ බැටළුවෙක් යම්කිසි කෙනෙක් හොරකම් කරනවා. ඇතැම්විට ඒ විදියේ හොරකම් කළ කෙනෙකුට ගහල බැනල උදුරගන්න පුළුවන්. මරන්න උනත් පුළුවන් අර ඒ බැටළු අයිති කාරයාට. තවත් සමහර කෙනෙක් හොරකම් කළාම ඒ විදියට දැඩි ප්‍රතිපත්තියක් අරගෙන ඒ බැටළුවා ආපහු හිමිකරගන්න ලැබෙන්නෙ නෑ. එතෙන්දිත් ඒ හේතුව දක්වන්නෙ ඒ බැටළුවා හොරකම් කළ තැනැත්තා දිළින්දෙක් නම්, සාමාන්‍ය පුද්ගලයෙක් නම්, ගහල බැනල නඩු කියල හරි බන්ධනාගාරයට යවල හරි ඒ තමන්ගේ නැතිවුනු බැටළුව ලබාගන්න පුළුවන්. නමුත් රාජ රාජමහාමාත්‍ය කෙනෙක් වගේ ධනවත් කෙනෙක් නම් ඇඳිලි බැඳගෙන වැඳගෙන "අනේ, මට මේ බැටළුව හරි බැටළුවාගේ වටිනාකම හරි දෙන්න" කියල යාඥා කරන්න වෙනවා. එතෙන්දිත් පෙන්නුම් කරන්නෙ අර මහේශාක්‍ය බව. අල්පේශාක්‍ය පුද්ගලයට - අපි මේ අල්පේශාක්‍ය කියන්නෙ ලෞකික අර්ථයෙන් නෙවෙයි. එහෙම නැත්නම් සාමාන්‍ය ලෝකයා හිතන අර්ථයෙන් නෙවෙයි. අර පින්දහම් පිළිබඳව - සීල, සමාධි, ප්‍රඥා ආදියෙන් අල්පේශාක්‍ය පුද්ගලයට පාපකර්මයේ විපාක දැඩිව විඳින්න වෙනවා. මහේශාක්‍ය පුද්ගලයට, නියම මහාත්මයට - දැන් අපි මේ කාලෙ නම් හැමෝටම 'මහත්තය' කියල කියනවා. බුදුරජාණන් වහන්සේ නම් මහත්තය කියල කිව්වෙ අර සීල සමාධි ප්‍රඥා වඩන කෙනාට. 'මහත්තා' කියන වචනය එතන යෙදෙනවා. අපි අර 'මහාත්මයා' කියල කිව්වෙ. එතකොට නියම මහත්මයෙක් නම් සීල, සමාධි ප්‍රඥා වඩන්න ඕන. අන්න, ඒ විදියෙ මහත්වරුන්ට අර පාපකර්මය සුලු වශයෙන් ගෙවිල යන්නෙ. මොකද අර ගංගානම් ගඟේ දියවගේ'.





ඒක තුළින් අර ලෝකයාට දෙන පණිවිඩය මොකක්ද? මේ කර්මය කියන එක නියතිවාදයක් නොවෙයි. ඒ කර්මයත් විපාකයත් අතර පරතරයෙදි තමන්ට යමක් කරල එයින් බේරෙන්න පුළුවන්. ඒක නිසා තමයි මේ සසරින් ගැලවීමක් තිබෙන්නෙ. ඒක ඉතාමත්ම වටිනා කාරණයකි. බුදු පියාණන් වහන්සේ එහෙම දක්වන්නෙ මොකද? ඒ කාලෙ හිටියා ඇතැම් ශාස්තෘවරුන් අර විදියේ නියතිවාදී අදහස් ප්‍රකාශ කළා. ඒ වගේම ඇතැම් කෙනෙක් පාප කර්මයක් කළොත් ඒක අවශ්‍යයෙන්ම ඒ විදියටම ගෙවන්න ඕන කියල දැඩිව ප්‍රකාශ කළා. ඒකට හේතුව බුදු පියාණන් වහන්සේ දක්වනවා. සමහරවිට ඒ අයට දකින්න ලැබෙනවා මේ ජීවිතය නරක විදියට ගෙවාපු කෙනෙක් ගිහිල්ල උපදිනව දිව්‍යලෝකෙ. ඒවගේම හොඳ ජීවිතයක් ගතකරපු කෙනෙක් ගිහිල්ල අපායෙ උපදිනවා. ඕක දකිනව අර ශාස්තෘවරයා. යම් කිසි කෙනෙක් දිවැස - ඒ කියන්නෙ අභිඥලාභී- දිවැස දියුණු කරගත්තු කෙනෙකුට අර විදියෙ සිද්ධියක් දකින්න ලැබෙනවා. යම්කිසි කෙනෙක් මේ ජීවිතය ගතකරනව නරකට. නමුත් දිව්‍යලෝකෙට යනවා. ඒ කියන්නෙ 'නරකට' කියල දක්වන්නෙ, දස අකුසල් කරමින් ප්‍රාණඝාත අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්‍රලාප ඊළඟට අභිජ්ඣා කියල කියන්නෙ විසම ලෝභය, ව්‍යාපාදය කියල කියන්නෙ ද්වේෂය, මිථ්‍යාදෘෂ්ටිය ඔන්න ඔය නරක විදියට ජීවිතය ගෙවන පුද්ගලයා. නමුත් ගිහිල්ල උපදිනව හොඳ තැනක. ඒක නිකං ප්‍රහේලිකාවක් හැටියට බුදුපියාණන් වහන්සේ ඉදිරිපත් කරන්නෙ. ඇතැම් කෙනෙක් අර විදියට නරක විදියෙ ජීවිතයක් ගතකරල අපායට යනවා. ඇතැම් කෙනෙක් දිව්‍ය ලෝකයට යනවා. ඊළඟට හොඳ ජීවිතයක් ගෙවාපු කෙනාගෙත් දෙපැත්තක් තිබෙනවා. ඇතැම් කෙනෙක් හොඳ ජීවිතයක් ගෙවනවා. ලෝකයේ බලනකොට හොඳ ජීවිතයක් ගෙව්වෙ. නමුත් ගිහිල්ල අපායෙ උපදිනවා. ඔය කාරණය මේ කාලෙත් බොහොම දෙනෙක් තර්ක හැටියට ඉදිරිපත් කරනවා. අපි මේ හොඳ ජීවිතයක් ගතකරනවා, ඇයි අපට මෙහෙම වෙන්නෙ කියලා.

ඉතින් බුදුපියාණන් වහන්සේ පෙන්වනවා - බුද්ධ ඥානයට මේකෙ ගැඹුර තේරුණා. මේකෙ සියුම් පැත්ත තේරුනා. බුදු පියාණන් වහන්සේ දක්වනවා දැන් අර ඇතැම් අය ඒ විදියට තර්ක කළාට මොකද බුදුපියාණන් වහන්සේ දක්වනවා ඒ යම් කෙනෙක් දස අකුසල් කරමින් ඉඳලා ගිහිල්ලා ඊළඟ ආත්මෙ දිව්‍යලොකෙ උපදින්නෙ මොකද? ඒකට හේතුව දක්වනවා, එක්කො ඊට කලින් ඒ තැනැත්තා කුසල් කර්ම කරල තියෙනවා. එහෙම නැත්නම් ඊට පසුව කුසල් කරල තියෙනවා. නැත්නම් ආසන්න අවස්ථාවෙ මරණාසන්න අවස්ථාවෙ. දැන් ඔන්න අපි හිතමු නරකවිදියට ජීවත් වුනු

කෙනා කලින් හෝ කුසල් කරල තියෙනවා. පස්සෙ හෝ කුසල් කරනවා. එහෙම නැත්නම් මරණ වෙලාවෙ සම්‍යක් දෘෂ්ටියට අනුව හිත සකස් කර ගන්නවා. ඔය කියන ඒ වෙනස නිසයි එදිනෙදා ජීවිතය අර විදියට ගෙව්වත්, විශේෂයෙන්ම ආසන්න අවස්ථාවේ අර වෙනස නිසා ඒ තැනැත්තා ගිහිල්ල සුගතියේ උපදින්නෙ. ඒ වුනාට මොකද කවද හරි අරවයෙත් විපාක විඳින්න වෙනවා. මෙලොව හෝ ඊළඟ ආත්මයක හෝ ඉදිරි ආත්මයක හෝ. අන්න ඒ විදියට බුදුපියාණන් වහන්සේ විග්‍රහකරල දක්වනවා. ඒකාන්ත වශයෙන් නිගමනයක් ගන්න සුදුසු නෑ අර විදියෙ එක සිද්ධියක් දැකලා. ඒක තුළ තිබෙන ධර්මතාව බුදු ඇසටයි පෙනෙන්නෙ. ඉතින් ඒකෙම අනික් පැත්ත දක්වනවා. හොඳ ජීවිතයක් ගෙවන, ඒ කියන්නෙ දස අකුසල් වලින් වෙන්වෙලා ජීවත්වෙන, කෙනෙක් ඒ විදියට එහෙම හොඳ ජීවිතයක් ගෙවලත් නිරයට යන්නෙ මොකද? ඒ තැනැත්තා සමහරවිට ඊට කලින් නරක දේවල් කරල තියෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඊට පස්සෙ අකුසල් කරන්න පුළුවන්. එහෙමත් නැත්නම් අර අවසාන අවස්ථාවේ මිථ්‍යාදෘෂ්ටියට වැටෙනවා. ඔය විදියෙ හේතුන් නිසයි ඒ සාමාන්‍ය රීතියට වඩා වෙනස් දේවල් සිද්ධ වෙන්නෙ කර්මය පිළිබඳව.

මේ තුළින් අපට හිතාගන්න තියෙන්නෙ මේ කර්මසාගරයකයි අපි ජීවත් වෙන්නෙ. දීර්ඝ කාලයක් තිස්සේ සංසාරයේ එක්රැස් කරගත්තු කර්ම. මේවා ඔක්කොම ගෙවල නිම කරන්නත් බෑ. ඒ වෙනුවට බුදුපියාණන් වහන්සේ මේ කර්මවල විපාක මර්දනය කරන ක්‍රම පෙන්නුම් කරනවා. ඒ තමයි ශීල, සමාධි, ප්‍රඥා කියල කියන්නෙ. අන්න එතෙන්දියි අපට මේ කාරණය ඉතාමත්ම වැදගත් වෙන්නෙ. මේ කර්මය කියන එක පින්වතුනි, මේ අපේ විඤ්ඤාණයේ තැන්පත්වෙලා තියෙනවා. අපි මේ දීර්ඝ කාලයක් කරපු කර්ම. ඒවා විටින් විට මතුවෙලා එනවා මේ විඤ්ඤාණය තුළින්. ඔය කර්ම ආකර්ෂණය කියල කියන්නෙ. දැන් සමහරවිට මේ කාලෙ උනත් සමහර සිද්ධි තියෙනවා. ඇතැම් කෙනෙකුට හිත් දෙනවා යම්කිසි අනතුරක් සිදුවන තැනකට යන්න. හිත් දෙනවා, හිත කියනව යන්න කියලා. යවනවා එතෙන්ට. යම්කිසි කර්ම ආකර්ෂණයක් තියෙනවා. මේවා මේ විඤ්ඤාණය තුළින් කෙරෙන්නෙ. මේවා මතුවෙනවා. මේ එබඳු සිද්ධිවලින් විතරක් ප්‍රකටවන එකක් නෙවෙයි. එදිනෙදා ජීවිතයේ හැම අවස්ථාවකදිම, කොටින්ම මේ අපේ විඤ්ඤාණයේ කර්ම මතුවෙනවා මොහොතක් පාසා. එතකොට මේ මතුවෙන කර්ම සාමාන්‍ය පුද්ගලයා - පෘථග්ජන පුද්ගලයා - මමය, මාගේය කියලා ඒ ආත්මදිට්ඨිය ඒ සක්කායදිට්ඨිය දඩිව තිබෙන නිසා ඒ සිද්ධිය තුළින් තවතවත් කර්ම රැස්කරගන්නවා. නූල්බෝලෙ අවුල් කරගන්නවා. මේ සංසාරය අවුල් වුනු





නූල්බෝලයක් කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ ඒකයි. සාමාන්‍ය පුද්ගලයා දන්නෙ නෑ මේක මේ යම්කිසි අතීතයේ කරපු කර්මයක් කියලා. අපි හිතමු ප්‍රාණඝාත අකුසලයක් කියලා. සමහරවිට ඒ තමන් මැරූ පුද්ගලයාම මේ ආත්ම භාවයේදී ඉදිරිපත්වෙලා තමාව මරන්න එනවා. ඒක අපි හිතන්නෙ නෑ. ඊ ළඟට ඒක අලුත් දෙයක් හැටියට හිතල අර පුද්ගලය එක්ක ගැටිලා තව කර්ම රැස් කරගන්නවා. ඉතින් අන්න ඒ විදියෙ අවස්ථා වළක්වන්නයි බුදු පියාණන් වහන්සේ මෙතන මේ ශීලය හඳුන්වල දීල තියෙන්නෙ.

මේ ශීලය තුළ තිබෙන්නෙ කල්තබාම ස්වේච්ඡාවෙන්ම, සිය කැමැත්තෙන්ම, යම් අධිෂ්ඨානවල් ඇතිකර ගන්නවා. සතුන් මරන්නෙ නෑ, සොරකම් කරන්නෙ නෑ, කාමයෙහි වරදවා හැසිරෙන්නෙ නෑ බොරු කියන්නෙ නෑ, මත්පැන් බොන්නෙ නෑ ආදී වශයෙන්. ඉතින් මේවාට අදාළ කර්මවේග, කර්මාවේග, අපේ විඤ්ඤාණය තුළින් මතුවෙනවා. අපි නිදසුනක් ලෙස කියනවනම්, ප්‍රාණඝාතයේ යෙදිච්ච කෙනා සංසාර පුරුදු වශයෙන් ඒකට යොමු වීමක් තිබෙනවා. හිත කියනවා ඒක කරන්න කියලා. හොරකමට පුරුදු වෙච්ච පුද්ගලයා - සමහරු ඔය පොඩිකාලෙ ඉඳලම හොර කමට ලැදිවෙන්නෙ, ඒ අතීතයේ පුරුද්දක්. සංසාර පුරුද්දක් නමුත් බුදුපියාණන් වහන්සේ කියන්නෙ ඒකට යටවෙන්න නෙවෙයි.

කර්මය කියන එක බුදුපියාණන් වහන්සේ හඳුන්වන්නෙ චේතනාව හැටියට. ඒක අපි බොහෝ අවස්ථාවල දක්වල තිබෙනවා. 'චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි 'කියන එක හැමෝම දන්න කාරණයක්.' චේතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා' බුදුපියාණන් වහන්සේ කර්මය චේතනාව හැටියට හඳුන්වන්නෙ, සළකන්නෙ, මොකද, චේතනාව අනුව තමයි ඊළඟට කය, වචනය, මනස හසුරුවන්නෙ. කය, වචනය, මනස කියන තුන්දොරින් තමයි අපි කර්ම රැස් කරන්නෙ. ඒ අලුත් කර්ම රැස් කරන්න යටින් ඉඳගෙන උපකාරවත් වෙනවා අතීත කර්මාවේග. ඒවා සංසාර පුරුදු හැටියට මතු වෙනවා හැම කෙනෙකුගෙම. මොකද, අපට උත්පත්තිය ලබා දුන්නෙත් කර්මයක්. ඒක නිසා කොටින්ම කර්ම සාගරයක් වගේ මේවා උතුර උතුර මතුවෙනවා. මේ මතුවන ඒවා අර පුද්ගලයා සක්කායදිට්ඨිය නිසා අමුතුම සිදුවීම් හැටියට හිතලා 'මේ මගේ විරුද්ධකාරයා' එහෙම නැත්නම් 'මේ මට හොරකම් කරන්න දෙයක් හම්බුනා' ඔය ආදී වශයෙන් ඒවාට අනුව ක්‍රියා කරනවා. ඒ හිත ආවා. ඊළඟට හිතට අනුව වචනය යෙදුවා. ඊළඟට ඒ වගේම ක්‍රියාව කළා. ඒක තුළින් වෙන්නෙ තවත් කර්ම රැස්වීමක්. ඒ කර්මයට තව එකතු වීමක්. ඒ එකතුවෙලා ඒවත් විඤ්ඤාණයට කිඳා බහිනවා. ඕක තමයි මේ සංසාරෙ

කෙළවරක් පේන්නෙ නැත්තෙ. සාමාන්‍ය පුද්ගලයා මේ නුල් බෝලෙ අවුල් කරගන්නවා - කර්ම නුල්බෝලෙ.

එතකොට බුදුපියාණන් වහන්සේ ඕකට දෙන විසඳුම අන්න අර ශීල ශික්ෂාපදය. ඒක දැඩිව අධිෂ්ඨාන කරගත්ත නම් - මොන හේතුවකින්වත් මම සතෙක් මරන්නෙ නෑ. මොන හේතුවකින්වත් හොරකමක් කරන්නෙ නෑ කියල ඒ විදියට අධිෂ්ඨාන කරගන්නවා. තමන්ට පේන්නෙ නෑ මේ කර්මාවේග යට තියෙන බව. නමුත් දන්නව මේක. බුද්ධ වචනයට අනුව මේ ප්‍රතිපත්තිය රකිනවා. නමුත් දැන් කාලේ නම් තෝරන්නෙ සමාජය ගැන හිතල විතරක් කරන එකක් හැටියට. නමුත් ඊට වඩා ගැඹුරක් තියෙනව මෙතන. මේ ශීල සමාදානය කියන එකේ. මේ සමාජය කියල කියන්නෙ තමනුත් අයිති එකක් මේක. එතකොට බුදුපියාණන් වහන්සේ මෙතන මේ දක්වන ධර්මතාව ඊට වඩා ගැඹුරට යනවා. සමාජය වෙනුවෙන් පමණක් නෙවෙයි මේක මේ මුළුමහත් සංසාරයේ සත්ත්වයා විෂම ජීවිත ගෙවල තියෙන්නෙ මේ පඤ්චශීලය ගැන නොතකා හැරීම නිසා. මේක මතුකරල දෙන්නෙ බුදුපියාණන් වහන්සේ විශේෂයෙන්ම අන්න අර විදියේ කර්මාවේග ආපු අවස්ථාවල්වල තමන්ගෙ හිත පාලනය කර ගන්න ශක්තිය ලබා දෙන්න. ඒ අධිෂ්ඨානය තුළින්, ප්‍රඥාවට අණ කිරීම තුළින්, ඒ විදියට ශීල මට්ටමෙන් ඒක ජයගන්න පුළුවන්. ශීල මට්ටමෙන් මහේශාක්‍ය වෙන්න පුළුවන්. පොහොසත් වෙන්න පුළුවන්. ඒක නැති පුද්ගලයා තමයි අර කියාපු දිළින්දා. අර කියාපු උපමා දැන් මෙතෙන්ට කිට්ටු කරගන්න පුළුවන්. එහෙම නැත්නම් අර ලුණු කැටය මෙතෙන්ට කිට්ටුකරගන්න පුළුවන්. අර බුදු පියාණන් වහන්සේ දෙන උපමාවල අර්ථයයි අපි මේ ධර්ම විග්‍රහ තුළින් දක්වන්නෙ.

ඉතින් ඒක ඒ ශීල මට්ටමින් ඒ විදියට ජයගන්න පුළුවන්. ඊටත් වඩා ඉහළට ගිහිල්ලා සමාධි වශයෙන් යම්කිසි කෙනෙක් පංචේන්ද්‍රියයන්ගෙන් එන අරමුණු වලින් තාවකාලිකව හරි මිදිලා ඊ ළඟට සිත සමාධි කරගෙන සමාධි තත්ත්වයක ඉන්නවනම්, ඒ කෙලෙස් වලට යන්න නොදී, ඒ අවස්ථාවෙ අන්න කර්ම වේග බොහෝදුරට පාලනය වෙනවා. අරව මතු වෙවී ආවට ඒවාට අවනත වෙන්නෙ නෑ. ඒවාට යට වෙන්නෙ නෑ. ඒ සමාධි ශක්තිය උඩ. ඒවා යට ඔබාගෙන ඉන්නව වගේ. ඊටත් වඩා ගැඹුරින් දක්වන එක තමයි 'ප්‍රඥාව' කියන එක. මාර්ගඵල අවබෝධ ආදියෙන් මේවායේ යථා තත්ත්වය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකලා මෙනෙහි කිරීම තුළින් මේවා ජයගන්න ක්‍රමයයි අවසාන වශයෙන් බුදුපියාණන් වහන්සේ දක්වන්නෙ - ඒ නිවන් මාර්ගය හැටියටත්, මේ මුළුමහත් කර්ම ක්ෂය කිරීමේ මාර්ගය හැටියටත්. ඒ එන සිතිවිලි ඒවා ඒ ඒ





තැන්වලම මෙනෙහි කරල අනිත්‍ය හැටියට, ඒවා යන්න අරිනවා. කොටින්ම කියතොත් උපේක්ෂාවට ගේනව හිත. ඒ එන කාරණා පිළිබඳ උපේක්ෂාවට ගෙනෙමින් ඒවා පාලනය කිරීම. ඒක විදර්ශනා පැත්තට යනවා. ඔන්න ඕක නිසයි අර පොහොසත් පුද්ගලයා අර 'මහාත්මයා' අර කියාපු 'මහත්තයා' සීල සමාධි ප්‍රඥා වඩනවා කියල කිව්වෙ. ඒ මහත්මයා අර කර්මාවේගවලට යටවෙන්නෙ නෑ. ඉතින් ඔන්න ඒ පැත්තත් ඒකෙන් හිතා ගන්න පුළුවන්.

ඊළඟට තවත් පැත්තකින් බුදුපියාණන් වහන්සේ මේ කර්මය විග්‍රහ කරනවා ඉතාම සියුම් ආකාරයකින්. විග්‍රහය කෙටියෙන් දක්වනවනම්, දැන් අපි කිව්ව කර්ම රාශියක් අපේ මේ සන්තානයේ විඤ්ඤාණයේ ගැබ්වෙලා තියෙනවා කියලා. මේ කර්ම විපාක දීමේදී කර්ම එකිනෙකට නොයෙකුත් ආකාරයෙන් බලපානවා. සමහරවිට අනුබල දෙනවා. සමහරවිට බාධා කරනවා. සමහර විට එක කර්මයක ශක්තිය තව කර්මයකින් බිඳලනවා. ඔය කාරණා ප්‍රකාශකරන වචන තුනක් තිබෙනවා. කොටින්ම, පළමුවෙන්ම අපි කියනවනම් කෙනෙකුට උත්පත්තිය ලබා දෙන කර්ම හඳුන්වනවා ජනක කර්ම කියලා. මේ කර්මවල තිබෙනවා ප්‍රතිසන්ධියක් එහෙම නැත්නම් උත්පත්තියක් ලබාදෙන ශක්තියක්. යම් කෙනෙකුට ප්‍රතිසන්ධියක් එහෙම නැත්නම් උත්පත්තියක් ලබාදෙන්න සමහරවිට මනුෂ්‍ය ආත්ම භාවය ලබාදෙන්න හේතුවුනේ අපි සුලු හැටියට හිතන කුසල හිතක්. ඒක තුළින් ඒ උත්පත්තිය ලබා දෙනවා. නමුත් ඒ උත්පත්තිය ලබා දුන්නට මොකද ඒකට තවත් අදාළ කර්ම, අපි හිතමු සමහරවිට තවත් කර්මයක් ඇවිල්ල හේත්තු වෙනවා උපකාරක වශයෙන්. ඒකට කියනවා උපත්ථම්භක කර්ම කියලා. උපස්ථම්භනය කරනවා කියල කියන්නෙ තවත් දේකට උපකාර කරනවා. උදව් කරනවා. ඒක කුසල් අකුසල් දෙපැත්තටම තියෙනවා. ඒ කියන්නෙ කුසල් කර්මයකට හෝ අකුසල් කර්මයකට උදව් දෙන කර්ම වර්ගයකුත් තියෙනවා. ඉතින් උපමාවකට කියනවානම් දැන් ඔන්න යම්කිසි ජනක කර්මයක් කියල කියන ඒ ප්‍රතිසන්ධිය ලබාදෙන කර්මයකින් කෙනෙක් සමහරවිට පහළ නිරයක උපදින්න සුදුසුයි. නමුත් ඒකට තවත් කර්මයක් ඇවිල්ල හේත්තු උනොත් ඊට උදව් දුන්නොත් ඊට වඩා දුක් ඇති නිරයක උපදින්න වෙනවා. ඊ ළඟට අනික් පැත්තට කුසල කර්මයක් නම් සමහරවිට පහළ දෙව්ලොවක උපදින්න ඉඩදෙන ජනක කර්මයකට උපස්ථම්භක වශයෙන් තවත් කර්මයක් ඇවිල්ල හේත්තු උනොත් ඉහළ දිව්‍ය ලෝකෙ උපදින්න පුළුවන්. ඒ වගේම ඒ උත්පත්තිය ලැබුවට පස්සෙත් පැවැත්ම තුළදි ඒ ස්කන්ධ වලට ඒවායේ පැවැත්ම තුළදි විඳින්න වෙන සැප හෝ දුක් පිළිබඳවත් වෙනසක් කරන්න පුළුවන් අර උපස්ථම්භක කර්මයට. තවත් කර්මයක් ඇවිල්ල අපි හිතමු ඔන්න දැන් දිළිඳු පවුලක කෙනෙක්

උපන්නා යම්කිසි අකුසලයක් නිසා. නමුත් ඒකෙ සැප විපාක ගෙනදෙන සිද්ධීන් ඇවිල්ල තව කර්මයක් හේත්තු වීම නිසා සැප විපාක ගෙන දෙනවා. තිරිසන් සතෙක් තිරිසන් උත්පත්තිය ලැබුවානම් දුක් විඳින්න සිද්ධ වෙනවා. නමුත් යම් යම් ආකාරයෙන් සැප විපාක ගෙන දෙන්න උපකාර වෙනවා උපත්ථම්භක කර්මයක් ඒකට එකතු උනොත්. ඔය විදියට ඒ උපත්ථම්භක කර්මය ගැන දක්වනවා. මේ තුළින් පෙන්නුම් කරන්නෙ ඒ කර්ම අතරත් යම් යම් අන්‍යෝන්‍ය සම්බන්ධතාවල් තිබෙන බවයි.

ඊ ළඟට උපපීළක කර්මය කියල තවත් කර්ම තිබෙනවා අර ඒ උප්පත්තිය ලබාදෙන කර්මවල ශක්තිය හීන කරන, අඩුකරන. ඒකෙ අර හිතා ගන්න තියෙන්නෙ, සමහර විට උත්පත්තිය ලැබුවොත් රජකුලයක, ඒකට අර උපපීළක කර්මය ආවහම ඒ රජකුලයෙදි උනත් නොයෙකුත් විදියේ රෝග පීඩා, සතුරු උවදුරු, ආදිය නිසා දුක් විපාක විඳින්න වෙනවා. ඊ ළඟට ඒ වගේම සමහරවිට අනික් පැත්තට බැලුවොත් දුක් වැඩි නිරයක උපදින්න ඉන්න කෙනෙකුට ඒ කර්ම ශක්තිය හීනකරන තව කර්මයක් ආවොත් ඊට වඩා දුක් අඩු නිරයක උපදින්න පුළුවන්. ඔය විදියට කොහොමහරි හිතාගන්න තියෙන්නෙ මේ ඇතැම් කර්ම තිබෙනවා අනික් කර්මවලට උදව් දෙන. තවත් කර්ම තිබෙනවා ඒවාට බාධා කරන. තවත් කර්ම තිබෙනවා ඒ උත්පත්තිය ලබාදෙන කර්මය මුලින්ම සිඳලන. අර ජනක කර්මය කියල කියන උත්පත්තිය ලබාදෙන කර්මයේ ශක්තිය එහෙම පිටින්ම සිඳලන කර්ම තියෙනවා. ඒකට කියනවා උපඝාතක කියලා. උපඝාතක, උපච්ඡේදක කියල කියනවා. ඒ විග්‍රහවලදි දක්වනවා. ඇත්ත වශයෙන්ම ඔය අකාල මරණය කියල කියන්නෙ අන්න ඒ විදියට ඒ උපඝාතක කර්මය ඉදිරිපත් වෙලා කෙනෙකුගේ ජීවිත ප්‍රවෘත්තිය එහෙම පිටින්ම සිඳලන අවස්ථාව. අපි දැන් කාටත් ඔය අඩු වයසේ මැරුණාම කියනව අකාල මරණය කියලා. නමුත් ධර්මානුකූලව අකාල මරණය කියල කියන්නෙ අන්න අර කර්මයක් ඉදිරිපත් වෙලා උත්පත්තිය ලබා දුන්නු කර්මය එතනින්ම සිඳලන අවස්ථාවලුයි. ඒක සාමාන්‍ය පුද්ගලයාට විෂය වෙන්නෙ නෑ. අභිඥලාභීන් ආදීන් තමයි ඒකෙ තත්ත්වය දකින්නෙ. නමුත් ඒ විදියේ තත්ත්වයක් මේ කර්ම පිළිබඳව තිබෙනවා. අපට හිතාගන්න තියෙන්නෙ - කර්මවල මේ උපකාරක ස්වභාවයකුත්, උපපීළක නැත්නම් ඒවාට බාධාකරන ස්වභාවයකුත් තියෙන බව දැනගෙන අපි අපේ පැවැත්ම තුළදි දුක්විපාක දෙන අකුසල කර්මවල ඒ විපාක ශක්තිය බිඳෙන ආකාරයට ජීවත් විය යුතුයි. ඒකයි අපට මේකෙන් ඉගෙන ගන්න තියෙන්නෙ.





සමහර කෙනෙක් යම්කිසි අකුසලයක් කළා කියලා මුළු ජීවිතයම ඒ ගැන තැවෙමින් සිටිනවා. ඒක නෙවෙයි කළ යුත්තේ. ඒ පාපකර්මයේ විපාකය තුනී වෙන අන්දමට තමන් අර කියාපු විදියට ශීල සමාධි ප්‍රඥා වලින් ශක්තිමත් වෙන්න ඕන. මහාත්මයෙක් වෙන්න උත්සාහ කරන්න ඕන. ඒකයි එතන අපට බුදුපියාණන් වහන්සේ මතුකරල දෙන්නෙ මේ කර්මවාදය තුළින්. කර්මය පිළිබඳ ඉගැන්වීම් වලින්, යම්කිසි සහනයක් මතුකරල දෙනවා. ඇතැම් කෙනෙක් මේක නියතිවාදයක් හැටියට සළකනවා කෙනෙක් සතෙක් මැරුවොත් ඒකාන්තයෙන්ම අපායට යායුතුයි කියලා. බුදුපියාණන් වහන්සේ එහෙම කියන්නෙත් නෑ. බුදුපියාණන් වහන්සේ මධ්‍යස්ථ ප්‍රකාශයක් කරන්නෙ. ප්‍රාණඝාතය **අපායගාමී** අකුසලයක් නමුත් යම් කෙනෙක් කිව්වොත් ප්‍රාණඝාතය කරන හැම කෙනෙක්ම අවශ්‍යයෙන්ම, අනිවාර්යයෙන්ම, අපායට යායුතුයි කියල ඒක බුදුපියාණන් වහන්සේ පිළිගන්නෙ නෑ. අන්න අර කියාපු කාරණය නිසා. මොකද, ඇතැම්විට අනෙක් කර්ම ඇවිල්ල ඒ කර්මයේ ශක්තිය බිඳිනවා. මේක කිව්වට වරදවල තේරුම් ගන්න එපා. දැන් සමහරවිට හිතන්න පුළුවන් ඒක නිසා අපි කොයි විදියට පව් කළත් කමක් නෑ. ඉඳහිටල දානයක් මානයක් දීල එහෙම ඒකෙන් බේරෙන්න බලමු කියලා. මේක වරදවල ගන්න එපා. නමුත් බුදුපියාණන් වහන්සේ මෙතන මතුකරල දෙන්නෙ, යම්කිසි ධර්මතාවක්. මේ සංසාරයේ අනන්තකාලයක් කරපු කර්ම අපේ මේ විඤ්ඤාණයෙ ගැබ්වෙලා තිබෙනවා. ඒවා මතුවෙනවා. එතකොට ඒවායේ විපාක පක්ෂය අඩුකර ගැනීමේ ක්‍රමයි බුදුපියාණන් වහන්සේ මෙතෙන්දි මතුකරල දෙන්නෙ අර උපමා කීපයෙන්. මේ කියාපු මේ ධර්ම විග්‍රහය ආශ්‍රයෙනුත් අපට හිතාගන්න තියෙන්නෙ කර්ම අන්‍යෝන්‍ය වශයෙන් බලපවත්වනවා. කොටින්ම කර්මවාදය හේතුඵල ධර්මයට අදාළ දෙයක්. මේක නියතිවාදයක් නොවෙයි. ඒක නිසාමයි අපට මේකෙන් ගැලවිල්ලක් තිබෙන්නෙ.

අතීතයේ - ඒ කාලේ හිටිය ඔය නිගණ්ඨයින් එහෙම - ඒ අය කල්පනා කළා මේ ඔක්කොම කර්මයන්ගෙන් බේරීමට නම් ශරීරයට දුක්දීලා, දුක්පීඩා දෙන කර්ම අපේ විඤ්ඤාණයේ තිබෙනවා කියලා හිතාගෙන කෙළවරක් නැති දුක් පීඩා දීලා, ඒ කර්ම ගෙවා දමනවා. ගෙවා දමල අලුතින් අපි කර්ම රැස්කරන්නෙ නැතුව ඉන්නවා. ඒ විදියෙ පැවැත්මකින් පුළුවන්ය මේ සංසාරයෙන් බේරෙන්න කියලා, නිවන් දකින්න කියලා, ඒ විදියටයි කල්පනා කළේ. බුදුපියාණන් වහන්සේ දැක්වුවා ඒක නිෂ්ඵල ප්‍රයත්නයක්. ඒ අය ගෙන්නවල ඇහුවොත් දැන් ඔය කරපු කායික පීඩා තුළින්, ඔය උල් උඩ නිදාගැනීම් තව නොයෙකුත් ශරීරයට දුන්න පීඩා වලින් කොච්චර ප්‍රමාණයක් තමන්ගෙ කර්ම, අතීත කර්ම, ගෙවිල

තියෙනවද කියලා ඒ පිළිබඳ ගණනයක් දෙන්න සංගණනයක් දෙන්න බෑ මේ අයට. උත්තරයක් දෙන්න බෑ. කොච්චර ගෙවිල තියෙනවද? ඊ ළඟට තව කොච්චර ගෙවන්න තියෙනවද කර්ම? ඒකටත් උත්තරයක් දෙන්න බෑ. කොච්චර ගෙවුවහමද මේකෙන් මිදෙන්නෙ ? ඒකටත් උත්තරයක් දෙන්න බෑ. ඒ විදියට තමන්ට මේ කර්මය පිළිබඳව ගණන් හිලව් දක්වන්න බැරිනම් අරවිදියට තමන්ගෙ ශරීරයට දුක් දීමෙන් කර්ම ගෙවාදැමීමට උත්සාහ කිරිම නිෂ්ඵල ප්‍රයත්නයක් කියල බුදු පියාණන් වහන්සේ නිගණ්ඨයින්ට එක් අවස්ථාවක ප්‍රකාශකර වදාළා.

ඒක නිසා අපට හිතාගන්න තියෙන්නෙ බුදු පියාණන් වහන්සේ මේ කර්ම චක්‍රයෙන් ගැලවීමේ ක්‍රමය දැක්වුවෙ ඉතාමත්ම පුදුම අන්දමේ ශීල සමාධි ප්‍රඥා කියන මේ ධර්ම මාර්ගය තුළින්. දැන් අර ශීලයෙන් එක මට්ටමකින් ඒ මතුවෙලා එන කර්ම ආවේගය කයට වචනයට යන්න නොදී සිත තුළින්ම ඒක උපේක්ෂාවට හරවල එතනින් බේරෙනවා. එහෙම නැත්නම් ඒක අර කයට, වචනයට යන්න නොදී එතන විරති සංකල්පය වෙන්වීමේ අධිෂ්ඨානය - තුළින් ඒක ජයගන්නවා. මොකද, කයත් වචනයත් සම්බන්ධ කරගත්තොත් ඒක අලුත් කර්මයක් වෙනවා. වෙන එකක් තබා මනසෙහි පවා ඒක හුහක් වෙලා වැඩ කරන්න ගියොත් ඒකත් කර්මයක් වෙනවා. ඒක නිසා යම් කිසි ඒ වගේ තත්ත්වයක් ආවහම ඒ ශික්ෂාපදය සිහිපත් කරල එයින් වෙන් වෙනවා - කය වචනය ක්‍රියා කිරීමෙන්. ඊ ළඟට සමාධියෙදි ඊටත් වඩා ඉහළ මට්ටමක්. ප්‍රඥාව වෙන කොට ඔන්න අන්තිමටම මේවායේ යථා තත්ත්වය දැකලා, මෙතන තියෙන්නෙ සංස්කාර ගොඩක්. මෙතන මමෙක් කියල දෙයක් නෑ. මමෙක් කියල කරපු දෙයක් නෙවෙයි තියෙන්නෙ. එතන සංස්කාර ගොඩක් හැටියට දැකල ඒ තුළින් ඒ පිළිබඳ උපේක්ෂාවක්, මැදිහත් බවක්, සිතේ ඇති කරගැනීමෙන් තමයි ඒ කර්ම පටලැවිල්ලෙන් බේරෙන්නෙ.

ඔය විදියටයි බුදු පියාණන් වහන්සේ මේ කර්මය පිළිබඳව විග්‍රහ දක්වලා තිබෙන්නෙ. ඒවා අපි හරියාකාරව තේරුම් අරගෙන, එදිනෙදා ජීවිතයෙදි දැන් යටත් පිරිසෙයින් පංචශීලයටවත් හිස නොනමන ගරු නොකරන විදියෙ සමාජයක් - අපි අර ම්ලේච්ඡ යුගය කියල කිව්වේ - ඒ විදියේ යුගයක් උදාවෙලා තියෙන නිසා අපි නුවණින් කල්පනා කරන්ට ඕන. මේවාට අපි වගකියන්න ඕන. ඇතැම් කෙනෙක් කියනවා මේ හැම එකක්ම අනාත්මයි. දැන් ඊළඟ උත්පත්තියෙ උපන්නට පස්සෙ මම දන්නවද? මේ මං කරපු කර්මවලට නේද මේ විඳින්නෙ කියලා. ඒ දැනගත්තා හෝ නොදැනගත්තා හෝ ඒ විපාක විඳින අවස්ථාවෙදි "අනේ කවුරු කරපු දෙයක්ද?" කියල ඒ විදියට තැවිල්ලට පත් වෙනවා. එතකොට අපි





ඇතැම්විට උපමාවට දක්වන්නෙ තමන් නොදැන වසක් විසක් පානය කළහම, ඒ වගේම ආහාර අරගත්තොත් ශරීර ගතඋනාම තමන් දන්නෙ නෑ ඒ ආහාරයත් එක්ක ගන්න ඇති විෂ දේ. ඒක වෛද්‍යවරයයි දන්නෙ. නමුත් ඒකට දුක් විඳින්න වෙනවා. ඒ වගේම තමයි තමන් පානය කරන ලිඳකට වස විස දැම්මොත් තමන් ඒකෙන් බොනකොට තමන්ටම දුක් විඳින්න වෙනවා. අපි හිතන්න ඕන මේ අපේ චිත්ත සන්තානයත් ඒ වගේ දෙයක් කියලා. අපේ චිත්ත සන්තානයට දමන දෙවල්වල විපාක පක්ෂයක් තිබෙනවා. ඒක පැසිල ආපහු කරකැවිල එනවා. විපාක වාර හැටියට හඳුන්වනව ඒක. විපාකවාර පුදුම විදියට මේ විඤ්ඤාණය තුළ කරකැවි කරකැවි යනවා දීර්ඝ කාලයක් සංසාරයේ. ඔය ඇතැම් ධර්ම කතාවල තිබෙනවා. සමහරවිට ඒකාකාරවම ඒ විපාකදීල තියෙනවා, සියක් වාරයක් පන්සිය වාරයක්. ඔහොම ඔහොම සිද්ධි තිබෙනවා. ඒ කර්මයේ බලගතුකම අනුව. ඇතැම් කර්ම - සම්පූර්ණයෙන්ම ඒ චේතනාව දැඩිවම ඒ පාප කර්මයට යෙදුන නම් - නිරයටම අරගෙන යනවා. ඊට අඩුවෙන් යෙදුන නම් ඒ ඒ අවස්ථාවලදි අර කියාපු විදියට ඒ ආත්මභාවයෙම එහෙම නැත්නම් ඊට පස්සෙ ආත්ම භාවයක යන්තමින් විපාක දීලා ගෙවිල යනවා.

කොයිහැටි හෝ වේවා, මේ කර්මවල විපාක පක්ෂය පාලනය කරන ක්‍රමයක් තිබෙන බව බුදුපියාණන් වහන්සේ දක්වා වදාළා ධර්මයට අනුව. ඒක තමයි අපි කිව්වෙ අර ධර්ම චක්‍රයෙන් කර්ම චක්‍රය බිඳින්න පුළුවන් කියලා. ඒක  බුදුපියාණන් වහන්සේලා පමණයි දක්වා වදාරන්නෙ. එතෙක් ලෝකයා  මේ කර්මචක්‍රයේම හිරවෙලා මේකෙන් බේරෙන්න බැරුව සංසාරයේ අනන්ත කාලයක් ගමන් කරනවා. මේ කර්මවල ස්වභාවය, විඤ්ඤාණයට ඇතුල් උනාට පස්සෙ ඒවා නැවත නැවත මතුවෙනවා. මේ සත්ත්වයාගේ ප්‍රවෘත්තිය කියල කියන්නෙ, පැවැත්ම කියල කියන්නෙ ලෝකයාත් එක්ක ගත කරන පැවැත්මක් මේක. ඒ ලෝකයා එක්ක හැසිරීමේදි පංචේන්ද්‍රියයන් තුළින් ඒ කර්ම නැවත නැවතත් මතුවෙලා ඊ ළඟට ඒවාට අවනත වීම නිසා බොහෝ විට අකුසල් රැස් කරගන්නව. කුසල් හෝ අකුසල් හෝ ඒවා රැස්කරගැනීම තුළින් නැවත නැවතත් උත්පත්තිය ලබනවා. කෙළවරක් නෑ ඒ ආත්මභාව වල කොයි විදියෙ උප්පත්තියක් ලැබුවත්. ඊළඟට ඒ ධර්මයේ ගැඹුරු හරියයි බුදු පියාණන් වහන්සේ දක්වන්නෙ. ඒ කර්මවල තියෙන ව්‍යාකූලත්වය නිසා, ඒ වගේම සත්ත්වයා තුළ තිබෙන කෙලෙස් ස්වභාවය නිසා, ලෝභ, ද්වේෂ, මෝහ නිසා, මේ කර්ම පටලැවිල්ල බොහෝ විට අකුසල පැත්තටමයි යන්නෙ. අපාය, තිරිසන් ලෝක, ප්‍රේත ලෝක ආදී ඒවායේ අනන්ත කාලයක් දුක්

විදින්න සිද්ධ වෙනවා. ඊ ළහට කුසල් පැත්ත බැලුවත් ඒකත් ඒ දිව්‍යලෝක, බ්‍රහ්මලෝක ආදී ඒවායේ කල්ප ගණන් අර කර්මවල විපාක විදින්න සිද්ධ වෙනවා. බුදු කෙනෙක් තමයි පෙන්නන්නෙ මේ සංසාර පැවැත්ම- අපාය ආදියේ පමණක් නෙවෙයි දිව්‍යලෝක බ්‍රහ්මලෝක ආදියේ පවා සංසාර පැවැත්ම - දුකක් කියලා.

මොකද ඒක දුකක් වෙන්නෙ? අන්න අර කියන සංස්කාරවල අනිත්‍යතාව නිසා. ඒ කිසිම පැවැත්මක ස්ථිර, නිත්‍ය, සුඛ ස්වභාවයක් නෑ. සදාකාලික තත්ත්වයක් නෑ. සැනසීමක් තෘප්තියක් නෑ. ඒක නිසා තමයි බුදු පියාණන් වහන්සේ මේ මුළු මහත් පැවැත්මම දුකක් හැටියට දැක්වුවෙ. පංච උපාදානස්කන්ධය කියල කියන රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියල අපි මේ හදුන්වන, අපි මේ පැවැත්මක් හැටියට ගන්න, හැම එකක් තුළම දුක ගැබ්වෙලා තියෙනවා කියල බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළේ මේවායේ අනිත්‍ය ස්වභාවය නිසයි. යමක් අනිත්‍යනම් ඒක ඒ නිසාම නිතර ප්‍රතිසංස්කරණය කරන්න වෙනවා. ගෙවී යනවා. තමන් බලාපොරොත්තු වෙන්නෙ මේක හැම කල්ම ඒ විදියට තියාගන්නයි. ගෙවී යනකොට, බිදිල යනකොට, ඒ එක්කම තමන්ගෙ හිතේ දුක, දොම්නස සන්තාපය ආදිය ඇති වෙනවා. ඊළහට ඒ ප්‍රයත්නය නිෂ්ඵල වෙනවා. ඒක නිසාම අර මමය, මාගේය කියන ඒ සංකල්පයට ගැලපෙන්නෙ නෑ. මමය මාගේය කියල අල්ල ගෙන හිටියට ඒවා දන්නෙම නැතුව ගෙවිල විනාශවෙලා යනවා. ඔය තත්ත්වය නිසයි බුදුපියාණන් වහන්සේ අර සැප-දුක් ගෙන දෙන දිව්‍ය ලෝක අපාය ආදිය සහිත මේ මුළුමහත් සංසාර පැවැත්මම දුකක් හැටියට දැක්වුවෙ.

එතකොට ඒක ගැඹුරින් තේරුම් ගත්තනම් - ඒක ගැඹුරින් තේරුම් ගන්න උපකාර වෙන්නෙ විදර්ශනාවයි - අර විදියට ශීලාදී ගුණධර්ම රැ කලා එයින් තැන්පත් කරගත්තු හිත විදර්ශනා වශයෙන්, මනසිකාර වශයෙන් යොමු කිරීමෙන් මේ පැවැත්ම තුළ ක්‍රියාත්මක වන සංස්කාරවල යථා ස්වභාවය තේරුම් ගන්නවා. ඒ හැම එකක්ම ඇවිත් පැවතිල නැතිවන දේවල් බව. ඒ තුළින් ඇති කරගන්න නොඇල්ම, විරාගය උපකාර වෙනවා මේ සංසාරයෙන් සිත මැත්කර ගැනීමට. මේ සිතේ තිබෙන කර්ම ඔක්කොම ගෙවීමෙන් නෙවෙයි කරන්නෙ. නමුත් මේ කර්මයන් සිද්ධ කරන, කර්මයන් සිදු කිරීමට හේතු වෙන, මිථ්‍යාදෘෂ්ටීන් එහෙම නැත්නම් වැරදි දෘෂ්ටිය, විශේෂයෙන් සක්කාය දිට්ඨි කියල කියන අර රූප, වේදනා ආදී පංචස්කන්ධය මමය, මාගේම කියල ගැනීම, ඒක ඉවත් කරනව පළමුවෙන්. ඊටත් වඩා ගැඹුරට ගිහිල්ල අන්තිමට මුළු මහත් පැවැත්ම තුළ අර මම ඉන්නවා, එහෙම නැත්නම් 'වෙමි' කියන මාන්නය





පවා ඉවත් කිරීමෙන් තමයි අන්තිමටම මේ කර්ම රැස් කිරීමේ බීජය නැති වෙන්නෙ. කර්ම රැස්කිරීමේ බීජය මමය මාගේය කියන හැඟීමයි. මට ඕන හැටියට පවත්වා ගැනීම කියන හැඟීමයි. ඒක තුළින් ලෝකයා බොහෝ විට අධර්ම මාර්ගයේ ගමන් කරමින් පාප කර්ම කරමින් තව තවත් කර්ම පටලැවිල්ලෙ බැදෙනවා. බුදු පියාණන් වහන්සේ පෙන්නුම් කරනවා, එතකොට මේක. පළමුවෙන්ම ශීල මට්ටමෙන් කය වචනය හසුරුව ගන්නවා. ඊ ළහට සමාධි මට්ටමකින් තාවකාලිකව හරි අර කර්මාවේග එක්ක බැදිල යන ගතිය අඩු කරනවා. ගැඹුරින්ම බලන කොට ප්‍රඥාවෙන් මේක විනිවිද දැකලා, මේකෙ යථා තත්ත්වය විනිවිද දැකල, උපේක්ෂාව ඇතිකරගෙන සිත මැත් කර ගන්නවා. ඔන්න ඔය විදියෙ ධර්ම මාර්ගයක් බුදුපියාණන් වහන්සේ දක්වල තිබෙන්නෙ.

ඒක නිසා අපි කල්පනා කරගන්න ඕන, මේ බුදුපියාණන් වහන්සේ දක්වපු ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ තියෙන්නෙත් ඒකයි. අපි සමහර අවස්ථාවල්වල මතක් කරල දීල ඇති බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මිථ්‍යාදෘෂ්ටිය තමයි ලෝකයේ තියෙන ලොකුම වැරැද්ද කියලා. මිථ්‍යාදෘෂ්ටිය ඇති පුද්ගලයා තුළ යම් සංකල්ප ඇති වෙනව නම්, සංකල්පනා අදහස් ඇති වෙනව නම්, ඒවත් මිථ්‍යා. ඒවත් වැරදි පැත්තටයි යන්නෙ. ඒ සිතුම් අනුව පාවිච්චි කරන වචනත් ඒ පැත්තටමයි යන්නෙ. ක්‍රියාවත් එහෙමයි. ජීවිකාවත් එහෙමයි. ඒ ගන්න උත්සාහය, ඒ සදහා හිත යෙදීම, සමාධියක් කියල සිත තැන්පත්කර ගැනීමක් - නැත්නම් එකහ කිරීමක් - තියෙනවනම් ඒ ඔක්කොම, වැරදි පැත්තටයි යන්නෙ. ඒකට දක්වන උපමාව කොහොඹ ඇටයක් හෝ තිත්ත ලබු ඇටයක් හෝ පැල කළොත් ඒකට ඇදගන්න පෘථිවිසාරය, දියසීරාව ඔක්කොම තිත්ත ඵලයක්ම ලබා දෙනවා. ඒ වගේම මිථ්‍යා දෘෂ්ටියෙන් පටන්ගත්තු ගමන මිථ්‍යා සමාධිය කියල කියන වැරදි සමාධියක් කරා යනවා. අපි මේ වැරදි සමාධිය කියල කියන්නෙ ඔය දැන් කෙනෙකුට ඔය ගිනි ආයුධයක් එහෙම එල්ල කරනකොට ඒත් එක්තරා සමාධියක් අවශ්‍ය වෙනවා. ඉතින් ඒවත් මිථ්‍යා සමාධි තමයි. ඒ විදියට අනික් පැත්තට පෙන්නුම්කරනවා. සම්‍යක් දෘෂ්ටිය ඇති කෙනා හරි දැක්ම ඇතිකර ගත්තනම් ඒ තැනැත්තාගේ සිතුම් පැතුම් හරි පැත්තට යනවා. ඒවගේම වචන, ක්‍රියාව, ජීවිකාව, උත්සාහය, ඊළහට සිහිය, එයින් ඇති කරගන්න සමාධි මේ හැම එකක්ම සම්මා - සම්‍යක් - පැත්තට යනවා. ඒකට දක්වන උපමාව තමයි අඹ ඇටයක් උක් බීජයක් එහෙම පැල කළොත් ඒකට ඇදගන්න දියසීරාව මිහිරි පලයක්ම ලබා දෙනවා. ඔය විදියෙ නොයෙකුත් උපමාවලින් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ අර කර්මයත් ඵලයත් අතර, කර්මයත්

විපාකයත් අතර ඒ සම්බන්ධතාවමයි. දැන් මෙතන ලුණු කැටෙන් දක්වපු, කෙටියෙන් දක්වපු, කාරණයමයි නොයෙකුත් විදියෙ ධර්ම විග්‍රහ වලින් පෙන්නුම් කරන්නෙ. අපට බුදු පියාණන් වහන්සේ මතුකරල දෙනවා, මේ කර්ම සාගරයෙන්, එහෙම නැත්නම් මේ සංසාර සාගරයෙන්, එතෙර වෙන ආකාරය. මේක, මේවා අතර මේවා එක්ක එකතුවෙලා පටලැවිලා, එහෙම නැත්නම් මේවා ගෙවා දැමීම සඳහා ශරීරයට දුක් දීලා, ඒ විදියට ගෙවා දමන්න බෑ. යථා තත්ත්වය අවබෝධ කරගන්ට ඕන. එතකොට ඒකට උපකාරවන දෙය තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය කියල කියන්නෙ. පළමුවෙන්ම හරි දැක්ම ඇතිකර ගත්තනම් ඒ හරි දැක්ම තුළින් කෙනෙකුට මතු කරගන්න පුළුවන් හරි සිතුම් පැතුම්. ඒ විදියට ක්‍රම ක්‍රමයෙන් තමන්ගේ චින්තන ක්‍රමය. දැන් ශීල සමාධි, ප්‍රඥා කියන තුනම තමයි මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙ ඇතුළත් වෙන්නෙ. ශීල, සමාධි, ප්‍රඥා වැඩීම කියන එකම තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීම කියල කියන්නෙ, එක පැත්තකින් බලනකොට. ඒ ධර්ම එකකට එකක් සම්බන්ධයි. ඒක තුළින් වෙන්නෙ අර පුද්ගලයා පිළිබඳ සම්පූර්ණ පරිවර්තනයක්.

ඊළඟට ඒ සම්මා සමාධිය කියන හරි සමාධිය පැමිණිය නම් ඒ තැනැත්තා එතන ඉඳල කරන්නෙ අන්න තමන්ගෙ පංචස්කන්ධයට ඒක යොමු කරල මේකෙ යථා තත්ත්වය දකිනවා. අනිත්‍ය, දුක්ඛ අනාත්ම වශයෙන්. ඒ දැකීමේ ප්‍රතිඵලය, යථාභූත හැටියට යමක් දකිනවනම් ඒක ඉබේටම කලකිරීමට හැරෙනවා. සංසාරය ගැන කලකිරීම. සංසාරය ගැන ප්‍රාර්ථනා තියාගෙන සසරින් මිදෙන්න බෑ. ඒ සංසාරය ගැන කලකිරෙන මාර්ගයයි බුදු පියාණන් වහන්සේ දක්වල තිබෙන්නෙ. ඒක හංගන්න බෑ. ඒක රහසක් කරගන්න බෑ. ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා යම් කෙනෙක් සංසාරයෙන් මිදෙන්න බලාපොරොත්තු වෙනව නම් තමන්ගෙ සිත ගේන්ට ඕන අන්න අර බුදුපියාණන් වහන්සේ දක්වා වදාළ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන ත්‍රිලක්ෂණය දකින්න පුළුවන් මට්ටමකට. ඒකටයි මේ ඇත්ත වශයෙන් ගැඹුරින් බලනවනම් ශීලාදී ගුණධර්ම උපකාර වෙන්නෙ. **සමාජය හැමදාම යහතින් පවත්වා ගැනීම නෙවෙයි.** ඇත්ත වශයෙන් මේක මධ්‍යම ප්‍රතිපදාවක් වෙන්නෙ අර ශීලාදී ගුණධර්ම තමාටත්, අනුන්ටත් දෙපක්ෂයටම හිතකර නිසා. තමාත් අනුනුත් අතර තියෙන භේදය සමහන් වෙනවා මේ බුදු පියාණන් වහන්සේ දක්වන පුදුම අන්දමේ මධ්‍යම ප්‍රතිපදාවෙන්. ප්‍රාණඝාතය තමන්ටත් අනුන්ටත් හිංසාකාරියි. අනුන්ට හිංසාකාරීබව අමුතුවෙන් කියන්න දෙයක් නෑ. තමාට හිංසාකාරී වෙන බව දැන් මේ කතාවෙන් පේනවා. අපි දේශනාවට මුල් කරගත්තු ඒ කථාන්තරයෙන් යටත් පිරිසෙයින් පේනවා. එබඳු සාධක බොහෝවිට





ලැබෙන්නෙ නෑ. නමුත් මේ කාලෙ අප්‍රකට සිද්ධි සමහරවිට අහන්න ලැබෙනවා. කෲර මනුෂ්‍යඝාතන, සත්ත්වඝාතන කරන අයට බලාපොරොත්තු නැති අන්දමට ආපස්සට කරකැවිල එනවා. අර සිහින් දූලියක් උඩු සුළඟට දැම්ම වගේ. මෙතන උනෙත් ඒකයි තමන්ම උසිගැන්වූ බල්ලන් ඇවිල්ල තමන්ම කා දැම්මා. එතකොට එයින් පේනවා ප්‍රාණඝාත අකුසලය අන්න එතන එතනමත් විපාක දෙනහැටි. එහෙම විපාක නොදී ඊ ළඟ ආත්ම භාවයේ විපාක දුන්නා හෝ වේවා, ඊට පසු ආත්මභාවයක විපාක දුන්නා හෝ වේවා, ඒවා පෙනුනා හෝ වේවා, නොපෙනුනා හෝ වේවා එහෙම විපාක - සංසාර තත්ත්වය ඕක බවයි බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ. බුදු ඇසට ඒ හැම එකක්ම පෙනුන නිසයි.

දැන් කාලෙ ඉන්න ඔය නොයෙකුත් විදියෙ මනෝ විද්‍යාඥයින්ට ඒවායින් ඉතාම සීමිත ප්‍රදේශයක් විතරයි පේන්නෙ. ඒක තුළින් නොයෙකුත් විදියේ තර්ක විතර්ක මතුකරගෙනයි ඇතැම් බෞද්ධයින් නොමග යන්නේ. නමුත් අපට බුද්ධ වචනය තිබෙනවා, ඒවා කියවල බලන කෙනාට. ඉතාමත් සියුම් ආකාරයෙන්, වෙන කිසිම, ඒ කාලෙ හිටපු කිසිම ශාස්තෘවරයෙකුට නොපෙනුන අන්දමින් මේ කර්මය පිළිබඳ ගැඹුරු ධර්මතාව බුදු පියාණන් වහන්සේ හෙළිකර දුන්නා පමණක් නෙවෙයි මේ මුළු මහත් කර්ම චක්‍රයෙන් මිදෙන මාර්ගයත් මතුකරල දුන්නා. එතකොට එයින් අපි තේරුම් ගන්න ඕන මේ කර්ම චක්‍රය කියන එක හැම කෙනාටම බලපානවා. ඒක නිසා බුදුපියාණන් වහන්සේ දැක්වූ මේ පංචශීලය තුළ තිබෙන්නෙ තමන්ටත් අනුන්ටත් දෙපක්ෂයටම හිතකර දේ. දැන් ඇතැම් කෙනෙකුට කියන්න පුළුවන් ඒවා කෙසේ වෙතත් මත්පැන්. අපි මත්පැන් පානය කරල නිදා ගත්තහම කාටවත් හිංසාවක් කරන්නෙ නැතුව මොකද කියලා, කාටද වරද, කියලා. නමුත් ඒකෙ හිංසාකාරීබව සමහරවිට මේ ආත්මභාවයෙදීම රෝගපීඩා ආදියෙන් දැනුනේ නැතත් ඊ ළඟ ආත්මභාවයකදි සමහරවිට මානසික දුර්වලතාවන් ඇතුව උපදිනවා. තවත් නොයෙකුත් විදියෙ නරක තැන්වල උපදිනවා. ඒ විදියෙ අපි අර හිංසාව කියන එකම නෙවෙයි එතන තියෙන්නෙ. ඒ පරහිංසාව පමණක් නොවෙයි. ආත්ම හිංසාව. ආත්ම වධය. ඒ මේ හැම ශික්ෂාපදයක් තුළම. ඒක ගැන හිතලා එතකොට බුදුපියාණන් වහන්සේ ලෝකය ගැන බලාවදාරල මේ මහාකරුණාවෙන් අර විදියෙ සමාජයෙ තිබෙන තමන් අනුන් කියල කියන ඒවා ඔක්කොම ඉක්මවල ගියා බුදුපියාණන් වහන්සේගෙ මේ මහා කරුණාව. මේ හැම සත්ත්වයින් ගැනම හිතලයි ඒ ශීල, සමාධි ප්‍රඥා කියන ඒවා පෙන්නුවෙ. ඒක නිසා අපි හිතන්න නරකයි මේක මේ සමාජය කියල වෙනම දෙයක් තියෙනවය, මම කියල වෙනම කෙනෙක්

ඉන්නවය කියල. මේ හැම දෙයක්ම අනික් පැත්තට හිතනකොට තමනුත් සමාජයට අයිතියි. ඉතින් ඔය කොයි හැටි හෝ වේවා කය, වචනය, පළමුවෙන් හික්මවා ගෙන එයින් හිත තැන්පත් කර ගැනීමෙන් තමයි අපට මේ සත්‍යය දකින්න පුළුවන් වෙන්නෙ. ඒකමයි අපට මේ ශීලාදී ගුණ ධර්ම ඕන වෙන්නෙ.

ඉතින් දැන් මේ පින්වතුන් මේ වටිනා දවසෙ ක්‍රම ක්‍රමයෙන් තමන් එදිනෙදා රකින පංචශීලයට අමතරව තවත් ඉහළ ශික්ෂාපද රැකීමට උත්සාහයක් දැරුවා. ඒ වගේම බණ භාවනා ආදියෙ යෙදුනා. මේ හැම එකකම ඉලක්කය මොකක්ද? මේ බුදු පියාණන් වහන්සේ දක්වන ජාති, ජරා ව්‍යාධි මරණ ආදී මේ සංසාරයෙන් මිදිමේ මාර්ගයට අවතීර්ණ වීමයි, ප්‍රතිපදාවට අවතීර්ණ වීමයි. අවසාන වශයෙන් මේ සංසාර ගමන කෙළවර කරන්නෙ අර කර්ම වේග බලපවත්වන ජීවිත ගණන ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීමෙන්. හතට බස්සනවා සෝවාන් වීමෙන්. ඊ ළඟට අර නැවත වරක් මෙලොවට එන ප්‍රමාණයටම ඒ කර්ම ශක්තිය බිඳිනවා සකදාගාමි වීමෙන්. අනාගාමී වීමෙන් ඒ ඉතුරු කර්ම ටික. ඒත් කල්ප ගණනක් බ්‍රහ්ම ලෝකවල ගෙවනවා, සුද්ධාවාසවල. මෙලොවම සියලුම කර්ම වලින් මිදිලා නැවත උත්පත්තියක් නොලැබෙන තත්ත්වයකට පැමිණෙන්න පුළුවන් රහත් උනොත්. අර බුදු පියාණන් වහන්සේ දක්වන උතුම්ම තත්ත්වය ඒකයි. ඒ අර්හත්වයයි.

අන්න එතකොට අපි කල්පනා කරන්න ඕන අපේ මේ ඉලක්කය බෞද්ධයෙකුගෙ - ගිහියෙකු හෝ වේවා පැවිද්දකු හෝ වේවා - හැම කෙනෙක්ම බලාපොරොත්තු වෙන්නෙ දුකින් මිදීමයි. එතකොට 'දුක' කියන එක විග්‍රහ කිරීමෙදි ඔය කියාපු සමාජ මට්ටමින් නවත්වන්න බෑ. හැම කෙනෙක්ම ඇතුළතින් විඳින්නෙ මහා දුකක් බව බුදු පියාණන් වහන්සේ දක්වනවා. ඊ ළඟට කොයි විදියෙ ජීවිත ගෙව්වත් ජාති, ජරා, ව්‍යාධි මරණ ආදී ඒ දුක්වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒකයි සංසාරයෙන් එතෙරවීම ගැන හිතන්න වෙන්නෙ. ඒ නිසා මේ පින්වත් පිරිස කල්පනා කරන්න ඕන අද වගේ වටිනා දවසක ශීලාදි ගුණධර්මවලට උපකාරවන ඒ කර්මය පිළිබඳ තමන් තුළ හොඳ අවබෝධයක් ඇතිකර ගැනීමට උපකාරවත් වන බුදුපියාණන් වහන්සේ දීපු උපමා ආදිය හිතේ තැන්පත් කරගන්න ලැබුනා. ඒ වගේම තමනුත් මේ ශීලාදී ගුණධර්ම රැකීමට උත්සාහයක් දැරුවා. ඒ වගේම බණ භාවනා කරමින් විදර්ශනා භාවනාව කරමින් විශේෂයෙන්ම අර කියාපු මාර්ගඵල තත්ත්වයට පැමිණෙන්ට උත්සාහවත් වෙන්ට.





එතකොට මේ ලැබූ අලුත් අවුරුද්දෙ තමන්ගෙ ලෞකික ඉලක්ක වෙනුවට ලෝකෝත්තර ඉලක්ක වලට වඩා තැනක් දෙන්න ඕන. මොකද මේ බුද්ධ ශාසනය පරිහානි යුගයට යන්නෙ. තව සමහරවිට ඊ ළඟ ආත්මභාවයෙ තව පරම්පරා කීපයක් යනකොට 'නිවන කියන්නෙ කන දෙයක්ද?' කියල අහන්න පුළුවන්. ඒ තරමට මේ නිවන හැංගෙන්න පුළුවන්. ඒ විදියෙ ආකල්පයක් ක්‍රමක්‍රමයෙන් මේ රට තුළ යන්නෙ. අන්න ඒක නිසා නුවණින් කල්පනා කරල මේ ශීලාදී ගුණධර්ම වැඩීමට වැඩියත් අධිෂ්ඨාන කරගෙන මේ පින්වතුන් මෙතෙක් මේ රැස් කරගත්තු ධර්මශ්‍රවණාදියෙන් උපදවා ගත් කුසල ශක්තිය තුළින්, ශීල, සමාධි, ප්‍රඥා වැඩීම තුළින්, ශ්‍රද්ධා, විරිය, සති, සමාධි ප්‍රඥා දියුණු කරගෙන හැකිතාක් ඉක්මණින් මේ අති භයානක සංසාරයෙන් මිදීම් වශයෙන් සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමාමහනිවනින් සැනසීමට මේ කුසල් ශක්තිය හේතු වාසනා වේවා කියල ප්‍රාර්ථනා කර ගන්න. ඒවාගේම තමන්ගේ නමින් නැසී මිය පරලොව ගියා වූ ඥාතීනුත් ඇතුළු ඒ වගේම දිව්‍ය, බ්‍රහ්ම මණ්ඩලයත් මේ ධර්ම දේශනාමය, ධර්මශ්‍රවණමය කුසලය අනුමෝදන් වීමෙන් තම තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහනිවන් සාක්ෂාත් කර ගනිත්වා කියලා ප්‍රාර්ථනා කරගෙන මේ විදියට ගාථා කියල පින් පමුණුවන්න.

**"එත්තාවතාව අමෙහි .........."**

# 29 වන දේශනය

# 29 වන දේශනය

**'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'**

**උට්ඨාන කාලම්හි අනුට්ඨහානො**

**යුවා බලී ආලසියං උපෙතො,**

**සංසන්න සංකප්ප මනො කුසීතො,**

**පඤ්ඤාය මග්ගං අලසො න වින්දතී ති**

**- මග්ගවග්ග, ධම්මපද**

සැදැහැවත් පින්වතුනි,

ජීවිතයක් සාර්ථක කරගැනීමට උට්ඨාන වීර්‍ය්‍යය අත්‍යවශ්‍ය බව තිලෝගුරු බුදුපියාණන් වහන්සේ නිතරම අපට මතක් කර දෙනවා. ගිහි හෝ වේවා! පැවිදි හෝ වේවා! අලසව කුසීතව ගෙවන ජීවිතයට උන් වහන්සේ බොහෝවිට නිග්‍රහ කළා. අලසකමින් සිත නැගිට්ටුවාගෙන අවදිමත්ව කටයුතු කිරීමේ අගය වර්ණනා කළා. දැන් අද අපි මාතෘකා කළ ගාථාවත්, ඊට අදාළ කථාවත්, කුසීතකමේ ආදීනව වගේම උට්ඨාන වීර්‍ය්‍යයේ අගය මතුකර දක්වනවා.

මේ ගාථා ධර්මය බුදු පියාණන් වහන්සේ ජේතවනාරාමයේදී දේශනා කොට වදාලේ 'තිස්ස' කියන එක්තරා භික්ෂුවක් සම්බන්ධයෙනුයි. සැවැත් නුවර කුලපුත්‍රයින් පන්සියයක් බුදුපියාණන් වහන්සේගෙන් ධර්මය අහලා පැහැදිලා ශාසනයේ මහණවුනා. මහණවෙලා ඒ මහණකමට අවශ්‍ය මූලික කටයුතු කරගෙන ඊළඟට ප්‍රධාන වශයෙන්ම පැවිදි පරමාර්ථය නිවන් පරමාර්ථය නිසා, ඒක ඉෂ්ට කරගැනීමට බුදුපියාණන් වහන්සේගෙන් කමටහන් අරගෙන ඈත ප්‍රදේශයකට ආරණ්‍ය ගතවෙලා භාවනා කරන්න පිටත් වෙලා ගියා. එහෙම යන අතරේ එක නමක් කල්පනා කළා 'මේ ආරණ්‍ය ජීවිතය බොහොම කරදර සහිතයි. මම නතර වෙන්න ඕනෑ, බුදු පියාණන් වහන්සේ ළඟම' කියල පසු බැස්සා.

එතකොට අනිත් හාරසිය අනූනව නමම ඈත ප්‍රදේශයක ආරණ්‍යගතව වස්කාලයක්ම මුළුල්ලේ බොහෝම උග්‍රව භාවනා කරලා, රහත් බව ලබාගෙන, තමන් ලබාගත්තු ඒ තත්ත්වය බුදු පියාණන් වහන්සේට ප්‍රකාශ කිරීමට ආපසු ජේතවනාරාමයට වැඩම කළා. වැඩම කරන අතරේ ඊට

යොදුනක් පමණ ඈත ගමක පිණ්ඩපාතයේ වඩින අතරේ එක් උපාසක මහත්මයෙක් ඒ සහ පිරිසට දානය පූජා කරලා, අනුමෝදනා බණ අහලා පැහැදිලා,' හෙට දවසෙත් ස්වාමීන් වහන්සේලා මෙහාට වඩින්න' කියලා ආරාධනා කළා.

ඉතින් මේ සංඝයා වහන්සේලා හැන්දෑ යාමයේ ජේතවනාරාමයට වැඩම කරලා බුදු පියාණන් වහන්සේ දකින්න ගිහින් වදිනකොට බුදු පියාණන් වහන්සේ බොහෝම සතුටින් මේ සංඝයා වහන්සේලා එක්ක පිළිසඳර කථා කරනවා. මේක දැක්කා අන්න අර නැවතුනු කුසීත භික්ෂුව. අලස භික්ෂුවට මේක දැකලා ඊර්ෂ්‍යාවක් වගේ දෙයක් සිතේ ඇතිවුනා "පේනවා නේද? බුදු පියාණන් වහන්සේ මේ අයත් එක්ක කථා කරලා කෙළවරක් නෑ. මට මාර්ග ඵලයක් නැති නිසා මා එක්ක කථා කරන්නේවත් නෑ. මම අදම රහත් වෙලා බුදු පියාණන් වහන්සේ මා එක්ක පිළිසඳර කථා කරන තත්ත්වයකට කටයුතු කරනවා" කියලා හිතාගත්තා.

අර සංඝයා වහන්සේලාත් බුදු පියාණන් වහන්සේට දැන්වුවා "අපට මෙන්න මෙහෙම මගදී ආරාධනාවක් ලැබුණා. අපට හෙට දවසේ ඒ ගමට පිණ්ඩපාතේ යන්න අවසර" කියලා අවසරත් ලබාගෙන ආවාස වලට වැඩම කළා. ඉතින් අර කියාපු තිස්ස භික්ෂුව මුළු රාත්‍රියේම දැඩිව භාවනා කරන්න හිතාගෙන සක්මනට ගිහිල්ලා - අන්තිමට මේ නුපුරුදු වැඩක් කරන්නේ, - නිදිමතේ සක්මනේ ගලක් උඩ වැටිලා කලවා ඇටය බිඳගත්තා. ඊළහට විලාප තියලා කෑගහනකොට අර සංඝයා වහන්සේලාට ඇවිල්ලා, මේ භික්ෂූන් වහන්සේට උපස්ථාන කරන්න, ප්‍රථමාධාර දෙන්න සිද්ධ උනා. ඒවා කරන අතරේ එළිවුනා. අරුණ නැංගා. ඉතින් මේ සංඝයා වහන්සේලා කල්පනා කරනවා. "දැන් පරක්කු වුනා වැඩියි අර ඈත ගමට පිණ්ඩපාතේ වඩින්න" කියලා ඒ ගමන එහෙමම අත්හිටවුනා.

ඊළහට බුදු පියාණන් වහන්සේට වන්දනා කරන්න ගිය අවස්ථාවේදී බුදුපියාණන් වහන්සේ අහනවා "ඇයි? මහණෙනි, ඊයේ කිවුවානේද මෙහෙම පිණ්ඩපාතෙට වඩිනවා කියා. ඇයි වැඩියේ නැද්ද?" එතකොට මේ සංඝයා වහන්සේලා ප්‍රකාශ කළා "අපට මෙහෙම පටලැවිල්ලක් වුනා අපේ අර අහවල් ආයුෂ්මතුන් වහන්සේ රෑ තිස්සේ භාවනා කරන්න ගිහිල්ල වැටිලා තුවාල කරගත්තා. අපට උපස්ථාන කරන්න ගිහින් එළිඋනා ඒක නිසා යන්න බැරි උනා", කියලා. එතකොට බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළා. "එහෙම තමයි මහණෙනි, දැන් පමණක් නෙවෙයි අතීතයේදීත් ඔන්න ඔය නම නිසා ඔය පිරිසට තමන්ට ලැබෙන යම්කිසි ලාභයක්, අවස්ථාවක්, නැතිවෙලා ගියා" කියලා ඒකට අදාළ ජාතක කථාව වදාළා.





අතීතයේ බෝධිසත්ත්වයන් වහන්සේ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් හැටියට හිටියා. ඒ දිසාපාමොක් ආචාර්යවරයාගේ ගෝල පිරිසක් හිටියා, පන්සියයක්. මේ ගෝල පිරිස දවසක් දර කඩන්න කැලයට ගියා. ඒ අතර හිටියා එක්තරා අලස මානවකයෙක්. ඒ කැලයට ඇතුළුවන තැන ලුණුවරණ ගහක් දැකලා හිතා ගත්තා. "මොකටද? මේ කැලේට රිංගන්නේ. මට දැන් දර ගහක්ම හම්බඋනා නේද?" කියලා "මේ කාණ්ඩෙ කැලේට ගිහින් දර එකතු කරගෙන එනකම් මට ටිකක් නිදාගන්න පුළුවන්" කියලා, උතුරු සළුව ගහයටම එළලා නිදාගත්තා. අර පිරිස, අර හාරසිය අනූනව දෙනාම දර මිටි එකතුකරගෙන එනකොට අර මානවකයා ගොරව ගොරවා බුදි. ඉතින් පිටිපල්ලෙන් ගහලා කුද්දවලා, ඒ මානවකයෝ ආශ්‍රමයට ගියා. ඉතින් කලබලේට නිදිගැට පිසිමින්ම අර මානවකයා, ලුණුවරණ ගහට නැගිලා අත්තක් කඩන කොටම, ඒක ඇවිල්ල ඇහේ ඇනිලා, ඇහැත් තුවාල වුනා. ඒ තුවාල වුනු ඇහැත් වහගෙනම, අර අමු ලුණුවරණ දඬු ටික එකතුකරගෙන දර මිටිය වගේ ඒක ගෙනිහින්, අර කුස්සියේ අනිත් අය ගෙනාපු දර ගොඩ උඩට දැම්මා. ඉතින් ඒ අතරේ අර දිසාපාමොක් ආචාරීන් වහන්සේ කියනවා මේ ගෝලයින්ට "අද මට ආරාධනාවක් ලැබුණා අසුවල් ගමෙන්. ටිකක් ඈත ගමේ මිනිස්සු ඇවිල්ලා ශාන්තිකර්ම කරවාගෙන දක්ෂිණාවක් දෙන්න එහෙම බලාපොරොත්තු වෙනවා. ඒක නිසා හෙට උදෑසනම එහේ යන්න. මගේ පංගුවත් අරගෙන එන්න." පංගුව කීවේ ලැබෙන පිරිකර ආදිය. ඉතින් උදේ හිස් බඩම පිටත් වෙන්න අපහසු නිසා කැඳ ටිකක් උයවාගෙන අනුභව කරලා යන්න කීවා.

මේ ගෝලයින් උදෑසනම දාසිය නැගිට්ටවලා අපට කැඳ පිසින්න කියල කිවා. මේ දාසියත් අර දර ගොඩේ උඩින්ම තිබුණු ලුණුවරණ දර ලිපට දාලා පිඹිනවා පිඹිනවා. ලිප දැල්වෙන්නේ නැහැ. ඔහොම ඔහොම ගිහිල්ලා අන්තිමට එළිවුනා. ඉතින් 'දැන් පරක්කු වැඩියි' කියලා අර මානවකයෝ ඒ යන්න තිබුණු ගමන නතර කළා. ඉතින් අර ආචාර්යයන් වහන්සේ ළහට ගියාම, "ඇයි? ගියේ නැද්ද?" කියලා ඇහුවාම ඔන්න කාරණය කීවා. "අපේ මේ අහවල් යාලු මානවකයා දර කඩන්න ගිහිල්ලා, කුසීත කම නිසා මේ විදියේ පටලැවිල්ලක් කර ගත්තා. අන්තිමට ඒකේ විපාකයක් හැටියට. අපට යන්න බැරිවුනා" කියලා කථාන්තරය කීවා. එතකොට ඒ දිසාපාමොක් ආචාරීන් වහන්සේ හැටියට හිටි බෝධි සත්ත්වයින් වහන්සේ ඒ අවස්ථාවේ, ගාථාවක් වදාළා:

**යො පුබ්බෙ කරණීයානි**
**පච්ඡා සො කාතුමිච්ඡති**
**වරුණ කට්ඨකභඤ්ජොව**
**ස පච්ඡා මනුතප්පති**

යම් කෙනෙක් කලින් කරන්න තියෙන දේ, පස්සෙ කරන්න බලාපොරොත්තු වෙනවා නම් ඒ තැනැත්තා හරියට අර ලුණුවරණ කෝටු කඩන්න ගිය මෙන්න මේ මානවකයා වගේ පසුතැවිල්ලට පත්වෙනවා කියලා. ඉතින් මේ ප්‍රවෘත්තිය ප්‍රකාශ කළ බුදු පියාණන් වහන්සේ ඒ අතීතයේ ආචාර්යයන් වහන්සේ මමයි. ඒ පන්සියයක් නම ඔය පිරිසයි. ඔය තිස්ස භික්ෂුව තමයි අන්න අර ලුණුවරණ ගහයට නිදාගත්තේ කියලා.

ඒ කථාන්තරය ප්‍රකාශ කරලා ඊළඟට ඒක අනුවම දැන් වර්තමානයට අදාළ හැටියට අන්න අර අපි කලින් ප්‍රකාශ කළ ගාථාවත් වදාළා.

**උට්ඨාන කාලම්හි අනුට්ඨහානො**
**යුවා බලී ආලසියං උපෙතො**
**සංසන්න සංකප්ප මනො කුසීතො**
**පඤ්ඤාය මග්ගං අලසො න වින්දති**

"නැගිටිය යුතු අවස්ථාවෙහි, නැගිටිය යුතු කාලයෙහි නොනැගිටින්නාවූ, තරුණ නමුත්, ශක්තිමත් නමුත්, අලස බවින් යුක්තවූ, කිඳා බැස්ස සිතුම් පැතුම් ඇත්තාවූ, කුසීත අලස තැනැත්තා ප්‍රඥාවේ මාර්ගයට නොවැටේ. ප්‍රඥාවේ මාර්ගය නොලබයි," කියන එකයි ඒ ගාථාවේ අදහස.

ඉතින් මේ කථාන්තර දෙකක්ම අපි දැන් කිවුවා. මේ කථාන්තරවල තියෙන සාරය අපි මේ මෙතන ඉන්න ඔය පුංචි උපාසක මහත්වරුන්ට තේරෙන ළමා කථාවකින් දැන් කියමු.

හා හාමි කෙනෙකුයි, ඉබිහාමි කෙනෙකුයි යාලු වෙලා හිටියා. එක දවසක් හා හාමි ඉබිහාමිට කියනවා, "යාලුවේ, අපි තරඟ දිවුමක් දුවමු," කියලා. ඉබිහාමිත් කිවුවා 'හා' කියලා. ඉතින් ඔන්න දෙන්නා ඊළඟට කියනවා 'අන්න අර ඈත පෙනෙන ඇහැළ කණුව තමයි දිනුම් කණුව. අපි මේ ගහ ළඟින් පිටත් වෙමු. හරිද ?... එකයි ..... දෙකයි..... තුනයි .... ඉබිහාමි දනි පනි ගාලා පිටත් උනා. පස්ස බලන්නෙත් නැතිව ඔහේ බොහෝම අමාරුවෙන් අර පොඩි කොට කකුල් වලින් දුවනවා .. දුවනවා... දුවල ගිහිල්ලා අර ඇහැළ කණුව ළඟට ගිහිල්ල ආපසු හැරිලා බලන





කොට, හා හාමි බුදි. මොකද ? හා හාමි කල්පනා කළා "මට පුළුවන් ඔය ඉබිහාමි ඔතෙන්ට යනකොට එක පිම්මට දෙකට යා ගන්න" කියලා. ඉතින් හා හාමි බුදි. ඉතින් ඔන්න ඔය විදිහේ කථාන්තරත් තියෙනවා.

මේක අනුව අපට හිතාගන්න තියෙන්නේ දැන් එතකොට අර සහ පිරිස අතුරින් හාරසිය අනූනව දෙනෙක්ම - පැවිදි බවේ කළයුතු ප්‍රධානම පරමාර්ථය මොකද? සියලු දුක් කෙළවර කිරීම සඳහා නේ පැවිදි වුනේ. නිවන් දැකීම සඳහා නේ. ඒකට මුල් තැන දීලා දුෂ්කර නමුත් කැලේ භාවනාවට පිටත් වෙලා ගියා. මොකද? බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තිබෙනවා, "මහණෙනි, මේ ශාසනයේ අලුතින් පැවිදිවන නවක භික්ෂූන් සතර සතිපට්ඨානය පුරුදු කිරීමට යෙදවිය යුතුයි. ඊට අනුශාසනා කළ යුතුයි" කියලා. ඒ විදිහට එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ වදාරලා තිබෙනවා.

ඒක අනුව පෙනෙන්නේ සතර සතිපට්ඨානයයි අලුතින් පැවිදිවුනු සංඝයා වහන්සේලාට දියයුතු ශික්ෂණය. ඉතින් සතර සතිපට්ඨානයට අදාළවම තමයි භාවනා කර්මස්ථානයක් බුදුරජාණන් වහන්සේගෙන් අරගෙන ඒ සතර සතිපට්ඨානය වැඩීමටයි අර සංඝයා වහන්සේලා පිටත් වෙලා ගියේ.

නමුත් සමහර විට අර තිස්ස භික්ෂුව කල්පනා කරන්න ඇති, "මේ කට්ටිය වගේ මේ කැලේට වැදිලා තේරුමක් නෑ. බුදුපියාණන් වහන්සේ මෙතනමයි ඉන්නේ. මට හිතුනු වෙලාවට රහත්ව ගන්න පුළුවනි." එහෙම හිතාගෙන තමයි, අර සංඝයා වහන්සේලා මාස තුනකින් කරපු දේ, එක රැයින් කරන්න ගිහිල්ලා වැටිලා උකුල් ඇටෙත් කඩා ගත්තේ. ඒ එතන.

ඉතින් ඒ වගේම තමයි, අර අනිත් තැන. අර කථාන්තරයේ, අර ජාතක කථාවේ, කුසීත මානවකයා කල්පනා කළා, කැලේට ගිහිල්ල දර කඩන්න වෙහෙසෙන්න ඕන නෑ. දැන් මේ දර ගහක් මට හම්බ වෙලා තියෙනවා. ඒ එනකොට මට නැගිටින්න පුළුවනි. එතකොට ගහට නැගලා ඒ කටයුතු කරගන්න පුළුවන් කියල තමයි අර නිදා ගත්තේ. ඒකේ විපාකයයි ඒ සිද්ධවුනේ.

ඉතින් ඔන්න ඔහොම අපට හිතාගන්න පුළුවන් අර උට්ඨාන වීර්යය අතහැරලා, කුසීත කමට ඉඩදීලා, අලසකමට ඉඩදීලා - අලසයාට දිවැස් තිබෙනවා කියලා කීමක් තිබෙනවා නේ. කල් දැමීම... ප්‍රමාදය. ඒවා අලසයාට අයිති දේවල්. අද වහිනවා. අද බැහැ. අද උණුසුම වැඩියි. අද බැහැ. ඔය විදිහට. ඒක අලසයාගේ ස්වභාවය. ඉතින් හැමදේකටම නිදහසට කරුණක් තියෙනවා. මොකක් හරි නිදහසට කරුණක් ඉදිරිපත්

කරලා අලසකමට තැන දීලා හිටියොත්, පසුතැවිල්ලට පත්වන බවයි මේ කථාන්තර තුනෙන්ම අපට පෙනෙන්නේ. ඉතින් ඒක අනුව දැන් තව ටිකක් මේ ගාථාවේ තියෙන වැදගත් වචන ගැන එහෙමත් හිත යොදලා බලමු.

අපි කිව්වා උට්ඨාන වීර්යය ගැන. දැන් මේ ගාථාවේ තිබෙනවා උට්ඨාන කාලයක් ගැන. උට්ඨාන කාලය ගැන කියනකොට, අපි දවසක් ගැන හිතලා බලනකොට, උට්ඨාන කාලය මොකක්ද? නැගිටින වෙලාව මොකක්ද? අතීතයේ ඒ නැගිටින වේලාව හැඳින්වුනේ 'බ්‍රහ්ම මුහුර්තය' කියලා. බඹ මොහොතින් නැගිටින්න කියලා. එලිවෙන්නත් කලින් අරුණ නැගෙන අවස්ථාවේ. දැන් සංඝයා වහන්සේලාට කියලා තියෙන්නේ, අරුණටත් කලින් නැගිටින්න කියල. හිමිදිරි පාන්දරින් නැගිටීම ජීවිතයේ වටිනා ප්‍රතිපත්තියක් විය යුතුව තිබෙනවා. මොකද? අර අතීතයේ ඉඳලාම කියන්නේ, බ්‍රහ්ම මුහුර්තයෙන්, බඹ මොහොතින්, නැගිටලා කරන කටයුතු සාර්ථක වෙනවා කියලා. ඉගෙන ගන්න කට පාඩම් කරන දේ හොඳට මතක හිටිනවා. ඒක නිසා විශේෂ නැකතක් වගේ වටිනා අවස්ථාවක්. ඒ වෙනුවට 'උස්සූර සෙය්‍යා" කියලා බුදු හාමුදුරුවෝ දැක්වුවා අර ඉර පායනකං නිදා ගැනීම. අන්න ඉතාමත්ම කුසීත ප්‍රතිපත්තියක්. ඒකෙ ආදීනව බුදු පියාණන් වහන්සේ බොහොම අවස්ථාවල දක්වලා තිබෙනවා. අරුණට කලින් නැගිටින්න ඕන.

ඒ වගේම - ගිහි හෝ වේවා! පැවිදි හෝ වේවා! - දැන් ගිහි ජීවිතය පිළිබඳව, මේ පින්වතුන් නිතර අහලා තිබෙනවා. ගිහි ජීවිතයක, මෙලෝ සැප යහපත සලසා ගැනීමට නොයෙකුත් කාරණා බුදු පියාණන් වහන්සේ දැක්වූ අවස්ථාවක්, ඔය දීඝජාණු කෝලිය පුත්‍රයාට ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ. ඒ කාරණා අතර පළමුවැනි කාරණය මොකක්ද? උට්ඨාන සම්පදා - උට්ඨාන සම්පත්තිය. අන්න අර තමන්ගේ රැකී රක්ෂාවල් ආදිය කල්දාන්නේ නැතිව දක්ෂව අනලස්ව වෙලාවට කිරීමයි. ඒ ගිහි ජීවිතය පිළිබඳව. ඊළඟට එපමණක් නොවෙයි. පරාභව සූත්‍රයේ කියලා තිබෙනවා, - පරාභව සූත්‍රයේ දැක්වෙන්නේ පරිහානියට හේතු. පිරිහීමට හේතු. 'නිද්දාසීලී' නිද්‍රාශීලී තැනැත්තා, 'අනුට්ඨාතා' වෙලාවට නැගිටින්නේ නැති තැනැත්තා, 'අලසො' අලසයා, ඔය විදිහට වචනවලින් දක්වනවා, එබඳු තැනැත්තා පරිහානියට පත්වෙනවයි කියලා. ඉතින් ඔය වගේ අර අලසකමේ, කුසීත කමේ ආදීනව බුදු පියාණන් වහන්සේ බොහෝ තැන්වල දක්වලා තිබෙනවා.

විශේෂයෙන්ම සංඝයා වහන්සේලාට කියා තිබෙනවා - දැන් සමහර විට ගිහි පින්වතුන් කල්පනා කරනවා ඇති, "අපට තමයි වැඩ තියෙන්නේ. සංඝයා වහන්සේලාට නම් ලැබෙන දානේ ටික වළඳලා කොහොම හරි





දවස ගෙවන එකයි තියෙන්නේ අලසව", කියලා. එහෙමයි සංකල්පය තියෙන්නේ. නමුත් බුදුපියාණන් වහන්සේ ගිහියන්ටත් කලින් නැගිටින්න ඕනෑ හැටියට, අරුණටත් කලින් නැගිටින්න ඕනෑ හැටියට සංඝයා වහන්සේලාට දක්වලා තිබෙනවා. එපමණක් නොවෙයි. විශේෂ සූත්‍රයක් තියෙනවා. 'උට්ඨාන සූත්‍රය' කියලා. ඒ සූත්‍රය කියනකොට බුදියගෙන ඉන්න කෙනාට උනත් අවදිවන්න තරම් ශක්තියක් එනව. ඒක කියන කොට හිතෙන්නේ බුදු පියාණන් වහන්සේ ඒ කාලේ තිබුණු පන්දමක්, අපි හිතමු, මොකක් හරි පන්දමක් අරගෙන, මේ නිදාගන්න හාමුදුරුවරු ළඟට ගිහින් 'නැගිටිව්' කියන්න වගේ,

**උට්ඨහථ නිසීදථ - කො අත්ථො සුපිතෙන වො**
**ආතුරානං හි කා නිද්දා - සල්ලවිද්ධාන රුප්පතං**

ඔන්න ඔය විදිහටයි කියවෙන්නේ 'උට්ඨහථ නිසීදථ' නැගිටිව් හිඳගනිව්. 'කො අත්ථො සුපිතෙන වො' තොපට නින්දෙන් කවර වැඩක්ද? 'ආතුරානං හි කා නිද්දා' - සල්ල විද්ධාන රුප්පතං' තණ්හා උල ඇනිල පීඩා විඳින නුඹලාට මොන නින්දක්ද? බුදු පියාණන් වහන්සේ නැගිට්ටවනවා සංඝයා වහන්සේලාව. තව ගාථා කීපයක් තිබෙනවා. ඒවා බොහොම ප්‍රාණවත්. යෝගාවචර සංඝයා වහන්සේල පුබුදුවන්නයි ඒ කියන්නේ. මොකද මේ යෝගාවචර සංඝයා වහන්සේලාට නින්ද කියන එක මහ බාධකයක්. අපි සංසාරේ වැඩි හරියක් කරලා තියෙන්නේ නිදාගැනීමයි. ඔය බල්ලන්, බූරුවන්, ගවයින්, දවසින් වැඩි කාලයක් බුදි. තිරිසන් ලෝකයේම සිරිත වැඩි හරිය බුදිය ගන්න එක. ඉතින් ඔය සිරිත අපට මතුවෙනවා මේ මනුෂ්‍ය ජීවිතයේදිත්. ඒක කඩන්න බුදු පියාණන් වහන්සේ බොහොම අවස්ථාවල්වල, ඒ කුසීත කමේ ආදීනව දක්වමින්, ඒකට හේතු දක්වමින්, ඒවා නැති කරගන්න උත්සාහවත් වෙන්න කියලා නිතර ප්‍රකාශ කළා.

එක තැනක කුසීත කමට, නින්දට, තුඩුදෙන කාරණා දක්වලා තියෙනවා. එහෙම නැත්නම් අපි කියමු වීර්යය අඩුවෙන්න, උට්ඨාන වීර්යය අඩුවෙන්න හේතු:

**නිද්දා තන්දි විජම්භිකා**
**අරති භත්තසම්මදො**
**එතෙන නප්පකාසති**
**අරියමග්ගොධ පාණිනං**

ඒ කියන්නේ මේ ආර්ය මාර්ගය - ප්‍රඥාවට උපකාරීවන ආර්ය

මාර්ගීය- සම්පූර්ණ කරන්න බැරිවෙන්නේ මේ සත්ත්වයින්ට මෙන්න මේ මේ කාරණා නිසාය කියලා. නින්ද, අලසකම, විජම්භිකා කියන්නේ ඇනවිලි අරිමින් සිටීම. ඊළඟට අරති කියලා කියන්නේ ශාසන පිළිවෙත පිළිබඳ නොඇල්ම, භත්ත සම්මදො කියන්නේ බත්මත. බත් මත කියලා කියන්නේ වැඩිපුර ආහාර ගත්තොත්, ඊළඟට අර ඌරා වාගේ පැත්තකට වෙලා නිදාගන්න සිද්ධ වෙනවා.

අර කොසොල් රජ්ජුරුවන්ගේ කථාන්තරය එහෙම අහලා ඇති නේ ඔය පින්වතුන්. ගිහි හෝ වේවා! පැවිදි හෝ වේවා! පමණට වැඩියෙන් ආහාර ගැනීම, කුසීත වීමට හේතුවිය හැකි බව. විශේෂයෙන් සංඝයා වහන්සේලාට ඒක නිසා බුදු පියාණන් වහන්සේ දක්වලා තිබෙනවා, දානය කොච්චර තිබුණත්, දායකයින් කොයිතරම් බෙදන්න ගියත්, බත් පිඩවල් හතරක් පහක් විතර නොවළඳා ඉතුරු හරියට වතුර ටිකක් වළඳන්න කියලා. අන්න අර යෝගාවචරයින්ට කියාපු විශේෂ පිළිවෙතක් ඒක. ඒකේ අදහස තමයි පමණ දැනගෙන වළඳන්න කියන එක. අර පමණට වැඩිය, සම්පූර්ණ සීමාවට, උගුරට එනකල්ම වළඳන්නේ නැතිව පිඩු කිපයක් අඩුකරල ඉතුරු හරියට වතුර වළඳන්නය කියලා. ඒ විදියට අන්න අර වීර්‍යය දරන්න බලාපොරොත්තු වන අයට බුදු පියාණන් වහන්සේ කියාපු "භත්ත සම්මද" කියන බත්මත ඉවත්කරන්න පිළිවෙතක් දක්වලා තියෙනවා.

ඉතින් ඒ වගේම කුසීත කමේ ආදීනව තවත් නොයෙකුත් අවස්ථාවල දක්වලා තිබෙනවා. එක උපමාවක, බුදු පියාණන් වහන්සේ කුසීතයන් ඇසුරු කිරීමේ ආදීනව පවා දක්වා තිබෙනවා.

එක උපමාවක තියෙන්නේ මෙහෙමයි. මහා සමුද්‍රයේ, මහමුහුදේ - අපි හිතමු කෙනෙක් මහ මුහුදට වැටුනා. ඉතින් මේකෙන් බේරෙන්න බලාපොරොත්තුවෙන් මේ පුද්ගලයා ලෑලි කෑල්ලක් උඩට නැගෙනවා. පොඩි ලෑලි කෑල්ලක් උඩට නැගෙනවා. අන්න ඒ වගේ ඒ උපමාවෙන් බුදු පියාණන් වහන්සේ දක්වන්නේ, මහ මුහුදේ පොඩි ලෑලි කෑල්ලක් උඩට නැංග මනුෂ්‍යයා එහෙමම කිඳා බහිනවා වගේ තමයි කුසීතයා ඇසුරු කිරීම. ඒ වගේ තමනුත් ඒ එක්කම ගිලා බහිනවා. ඒක නිසා අලසයින් ඇසුරු කරන්න එපාය. දුරින්ම දුරු කරන්නය. ඒ වෙනුවට උට්ඨාන වීර්‍යය ඇති, අරඹන ලද වීර්‍යය ඇති අයම, සත්පුරුෂයින්ම, ඇසුරු කරන්න කියලා. ඒ විදියටත් දක්වලා තිබෙනව.

බුදු පියාණන් වහන්සේ නොයෙකුත් ආකාරයෙන් උට්ඨානය, සතිය, අප්‍රමාදය ඔය කියන වචන මතු කරලා දක්වනවා. මේ දුර්ලභ මනුෂ්‍ය





ජීවිතයේ, දුර්ලභ අවස්ථාවේ. අර 'ඛණකිච්චො ලොකො", කියන්නේ. මේ ලෝකය කියන්නේ වෙලාවට වැඩකරන තැනක්. වෙලාවට වැඩ කරන එක ගිහියන් නම් හිතා ගන්නේ ගිහි කටයුතු පිළිබඳව. නමුත් ශාසනය ගැන හිතල බලන කොට වෙලාවට වැඩ කළේ නැත්නම් පසුතැවෙන්න සිද්ධ වෙනවා.

අතීතයේ ඉඳලම කියන දෙයක් තමයි අෂ්ට දුෂ්ටක්ෂණයෙන් විමුක්තවූ මේ ක්ෂණ සම්පත්තිය ලබලා තියෙනවා කියලා. ඔය නොයෙකුත් ආකාරයෙන් කියනවා. ඒක ඉතින් කවුරුත් අහලා තියෙනවා. නමුත් ඒකට අමතරව අපට කියන්න වෙන්නේ දැන් මේ "ශාසන පහන" කියන එකේ අන්තිම තෙල් බිංදුවයි කියලා හිතාගන්නයි කියලා. මේ පින්වතුන්ට කියන්න වෙනවා මේ ශාසන පහනේ අන්තිම තෙල් බිංදුවයි දැන් ඉතුරු වෙලා තියෙන්නේ. මේ තෙල් බිංදුවෙන් ප්‍රයෝජන නොගත්තොත් ඉදිරියට එන්නේ මහා විපර්‍යාස සහිත, මහා අන්ධකාර යුගයක්. මහා අන්ධකාර යුගයක් ඉදිරියට එන්නේ. ඊට කලින් ඔය කියාපු අර අවසාන තෙල් බිංදුවෙන් ප්‍රයෝජන ගත්තේ නැත්නම් පසුතැවිලි වෙන්න සිද්ධ වෙනවා. අර කියාපු තිස්ස භික්ෂුවට වගේ .... අර මානවකයාට වගේ .... අර හාවට වගේ.

ඉතින් ඔය විදියේ තත්ත්වයක් තිබෙනවා. කාරණේ ඇත්ත තමයි. නිදිමත කියන එක හැමෝටම බලපාන දෙයක්. කොයි තරම්ද කියතොත්, මුගලන් මහ රහතන් වහන්සේටත් බලවත් බාධකයක් හැටියට ඉදිරිපත් වුනා. උන්වහන්සේගේ අතීත කර්ම ප්‍රබලයි. අහල තියෙනව නේ, මවුපියන් මැරීම ආදී දේවල් තිබුණා නේ. බොහොම අමාරුවෙන්. සැරියුත් ස්වාමීන් වහන්සේ තරම් පහසුවෙන් නෙවෙයි ඒ තත්ත්වය ලැබුවේ. නමුත් උන්වහන්සේගේ පාරමී ශක්තිය කොයි තරම් දියුණුද කියතොත්, බුදු පියාණන් වහන්සේ නිරන්තරයෙන්ම මුගලන් ස්වාමීන් වහන්සේ පිළිබඳව නිරීක්ෂණය කලා. නිතරම නිරීක්ෂණය කළා ඈත ඉඳගෙනම. මොකද හේතුව? ඉදිරියට බරපතල වගකීමක් පැවරෙන කෙනෙක්. ඒ ප්‍රාර්ථනාව අනුව අග්‍රශ්‍රාවක වෙනවා. එපමණක් නොවෙයි ඍද්ධිමතුන් අතර අග්‍ර තනතුර ලබන්න සුදුසුයි. එතකොට ඒ සුදුසුකම්වලට ගැලපෙන හැටියට බුදු පියාණන් වහන්සේ මේ ගෝලයා සකස් කළා. ඈත ඉඳලම නිරීක්ෂණය කළා.

එබඳු අවස්ථාවක් මෙහෙම සඳහන් වෙනවා. මේ මුගලන් ස්වාමීන් වහන්සේ මගධ රටේ කියන ගමේ එක් වනයක භාවනා කරනවා. බුදු පියාණන් වහන්සේ ඈත "භග්ග" රටේ "භේසකලා' වනයේ ඉඳගෙන බලාගෙන ඉන්නවා, දිවැසින් මේ ගෝලයා භාවනා කරන හැටි. මුගලන්

ස්වාමීන් වහන්සේ නිදි කිරනවා. මේක දැක්ක හැටියේ බුදුපියාණන් වහන්සේ අර දික්කල අතක් වක් කළ සැණින් කියන්නා වගේ සෘද්ධියෙන්ම එතෙන්ට වැඩම කළා. මුගලන් ස්වාමීන් වහන්සේ ආසනය පැනෙවුවාම ඒකේ වැඩ ඉඳලා බුදු පියාණන් වහන්සේ අහනවා "මොග්ගල්ලාන, නිදි කිරනව නේද?"

"එසේය, ස්වාමීනී", කීව්වා

"හොඳයි එහෙනම් මොග්ගල්ලාන මෙන්න මම කියන්නම් ප්‍රතිකර්ම කීපයක්. මේවා කරලා බලන්න".

දැන් මේ පින්වතුන්ට නිතර අහන්න ලැබෙනවා නිදි පෙති ගැන. නිදි පෙති. මේ කියන්නේ නිදිපෙති නෙවෙයි. '**අවදි පෙති**' බුදු පියාණන් වහන්සේ මෙතෙන්දි මුගලන් ස්වාමීන් වහන්සේට දෙන්නෙ **අවදි පෙති 7 ක්**. ඔන්න එකින් එක අහගන්න. මතක තියා ගන්න උත්සාහ කරන්න විශේෂයෙන්ම යෝගාවචර පින්වතුන්. අනිත් අයට පවා මෙන්න මේ කියාපු පියවර වල් වලින් කීපයක් වත් යටත් පිරිසෙයින් ප්‍රායෝගිකව අත්හදා බලලා, බුදු පියාණන් වහන්සේගේ ඒ බුද්ධ ඥානයේ අගය තේරුම් ගන්න. මේ කාලයේ ඔය මනෝ වෛද්‍ය විද්‍යාඥයින්ට පවා අධ්‍යයනය කරන්න, ගැඹුරින් හිතන්න පුළුවන් විදියේ, පුදුම විදියේ පියවරවල් හතක් මේ බුදු පියාණන් වහන්සේ දක්වන්නේ.

පළමුවැනි පියවර මේකයි, "මොග්ගල්ලාන දැන් ඔය නිදිමත එන වෙලාවේ යම් සිතිවිල්ලක් තිබුන නම්, යම් සංඥාවක් තිබුනා නම්, ඒ සංඥාවට හිත යොදන්න එපා. ඒ සංඥාව ගැන වැඩිය හිතන්න යන්න එපා". ඒක පළමුවැනි පියවර. එතනින් පෙන්නුම් කරන්නේ, අන්න සිහි නුවණ යෙදුවා. මෙනෙහි කිරීම යෙදුවා. "මොකක්ද මම මේ හිත හිත ඉන්නේ. ඒ සිතිවිල්ල නිසා නේ මට මේ නිදිමත ආවේ," අන්න ඒක ඉවත් කරනවා. එහෙම කළාම සමහර විට නිදිමත යන්න පුළුවන්. නිදිමත යන්නත් පුළුවන්, හැබැයි සමහර විට නොයන්නත් පුළුවනි. නිදිමත ඒ තරමට බලවත් නම්, ඔන්න එතකොට දෙවෙනි පියවර. දැන් දොස්තරලත් දෙනවා නේ මේ පෙත්ත අහන්නේ නැත්නම්, ඊළඟ පෙත්ත ගන්න කියලා. ඒ වගේ මේ දෙවැනි පෙත්ත දෙනවා. මොකක්ද?

එහෙම නම් මොග්ගල්ලාන තමන් ඉගෙන ගෙන තියෙන, අහල තියෙන ධර්ම කොට්ඨාශයකට හිත යොදන්න. ඒකේ හිත පවත්වන්න ඒ පිළිබඳව විතර්ක වශයෙන්. මොකද? හිත අවදි කරගන්න පුළුවන්. දැන් සිතිවිලි යනකොට අන්න අර නිදිමත කඩාගෙන යනවා. ඉතින් ඒක නිසා යම්කිසි





ධර්ම කොට්ඨාශයකට සිත යොදවන්න. එතකොට එයින් නිදිමත යයි. නිදිමත යන්නත් පුළුවන් නොයන්නත් පුළුවන්. නොගියොත් ඔන්න තුන්වැනි පෙත්ත දෙනවා. මොකක්ද තුන්වෙනි පෙත්ත?

ඒ ධර්ම කොට්ඨාශය සජ්ඣායනා කරන්න. මොකක්ද එතන අදහස? සජ්ඣායනා කරනවා කියන්නේ හඬ නගා කියන එක. කන් දෙකත් අවදිවෙනවා. තමන්ගේ කටහඬට සවන් දෙනකොට හිත අවදි වෙනවා. ඔන්න තුන්වැනි මනෝ විද්‍යාත්මක ක්‍රමය, හිත අවදි කරන්න. තමන් කැලේක හිටියත් කමක් නැහැ. ගාථා කොටසක් හරි, මොකක් හරි හයියෙන් කියනවා. සජ්ඣායනා කරන්න. එතකොට නිදිමත යන්න පුළුවනි. නොයන්නත් පුළුවනි. එහෙම නොයනවා නම් ඔන්න ඊළඟට හතරවැනි පියවර කියනවා. ඒ පියවර නම් මේ පින්වතුන්ට, මේ පොඩි ළමයින්ට පවා, දැන් කාලේ ඉස්කෝලෙන් ඒක ලැබෙන්නේ නැති නිසා තම තමන්වත් කරගන්න බලන්න ඕනෑ. මොකක්ද?

"එහෙනම් මොග්ගල්ලාන, කන් දෙකෙන් අදින්න. කන් පෙති දෙක අදින්න." ඉස්සර හොඳට රත්වෙලා එන්න කන්පෙත්ත අදින කොට ගණනේ උත්තරේ එනවා නේද? දැන් ඒවා කරන්න බැහැ ගුරුවරුන්ට. ඒක නිසා මේ ළමයි තම තමන්වත් කන්දෙක ඇදගන්න ඕනෑ. එතකොට ඔන්න අවදිවෙනවා. රත් වෙනවා. මේක මේ විහිළුවට කියන එකක් නොවෙයි. මෙතන මේ ගැඹුරු අදහසක් තියෙන්නේ. එතන කාරණා දෙකක් දක්වනවා. "කන් දෙක අදින්න, මොග්ගල්ලාන. ඒ වගේම අල්ලෙන් අහපසහ පිරිමදින්න".

ඒකෙන් කියන්නේ ඇඟ රත් කරන එක. ඇඟ රත්කර ගැනීම. කන්දෙක අදින කොට එතනත් රත්වෙනවා. ඊළඟට අල්ලෙන් ශරීරය පිරිමදිනවා. ඔන්න එතකොට නිදිමත යයි. යන්නත් පුළුවන්. නොයන්නත් පුළුවන්. ඒකටත් නිදිමත යන්නේ නැත්නම් ඔන්න ඊළඟට පස්වෙනි පෙත්ත දෙනවා. මොකක්ද එතෙන්දි කියන්නේ?

"එහෙනම් මොග්ගල්ලාන, ආසනෙන් නැගිටලා ගිහිල්ලා මුහුණේ වතුර ටිකක් ගා ගන්න". ඊළඟට ඒ එක්කම තව කීපයක් තියෙනවා. මුහුණේ වතුර ගාගන්න. ඔන්න දැන් ඊළඟට ඇස්දෙක අවදි කරගන්න බලනවා නිදිමත ගතිය යන්න. ඒක නම් කවුරුත් දන්නවා මුහුණේ වතුර ගාගන්න එක. තවත් ඒකට අදාළව දක්වනවා "දවල් කාලයේ නම් ඈත බලන්න. ඈත දිසාවක් දිහා බලන්න. මේ කියන්නේ ඇස් දෙකට ව්‍යායාමයක්. නිදිමත නිසා පියවෙන්න යන ඇහැ හොඳට ඇරලා ඈත බලන්න. රෑ කාලයේ නම් අහසේ තරු දිහා බලන්න. මේක තුළින් කරන්නේ ඇස්

දෙකට ව්‍යායාමයක් දෙනවා. එතකොට නිදිමත යයි. එහෙමත් නිදිමත යන්නේ නැත්නම්, ඊළඟට කියනවා - එතන විශේෂ දෙයක් කියනවා - භාවනාවක් හැටියට වගේ.

"එහෙනම් මොග්ගල්ලාන ආලෝක සංඥාව මෙනෙහි කරන්න". ඒක සාමාන්‍යයෙන් බොහෝ දෙනා අහලවත් නැතිව ඇති. ආලෝක සංඥාව කියන එක. භාවනානුයෝගීන්ට බුදු පියාණන් වහන්සේ දක්වපු එක්තරා උපක්‍රමයක්, හිත අවදිමත් කර ගැනීමට. අපි හිතමු දහවල් කාලයක හොඳට ඉර එළිය තියෙන වෙලාවක ජනේලයකින් හරි කවුළුවකින් හරි ඔන්න ටික වෙලාවක් බලාගෙන ඉඳලා ආලෝක සංඥාව හිතට දා ගන්නවා. මම අහවල් වෙලාවේ මෙහෙම බලන් හිටියා. එතකොට හොඳට හිතට ඒ ආලෝක සංඥාව රවුමක් හරි හතරැස් එකක් හරි හිතට වදිනවා. රාත්‍රි කාලයේ නම් පහනකින් උනත් ගන්න පුළුවනි ආලෝක සංඥාව. මේ ආලෝක සංඥාව හිතට දාගෙන තියෙන එක අර වෙලාවට මතුකර ගන්නවා, හිතෙන්. නිදිමත එනකොට අර කියාපු ආලෝක සංඥාවට හිත යොදන කොට හිත අවදිමත් වෙනවා. ඒක ඉතාම සියුම් ක්‍රමයක්. ඒ ආලෝක සංඥාව තුළින් - ඒක කොයිතරම් ගැඹුරු එකක්ද කියතොත්, සමහර තැන්වල දක්වනවා ඥාන දර්ශනය මතු කරගන්න උපකාරී වන සමාධි භාවනාවක් හැටියට මේ ආලෝක සංඥාව. ඒ ආලෝක සංඥාව හරි ආකාරයෙන් වැඩුවොත් මෙහෙමයි දක්වන්නේ.

**" යථා දිවා - තථා රත්තිං**
**යථා රත්තිං - තථා දිවා"**

රෑකාලයත් දවල්කාලය වගේ වෙනවා. දවල් කාලයත් රෑකාලය වගේ වෙනවා. රෑට අඳුර මැදින් පෙනෙනවා වගේ. එහෙම පිටින්ම ඝන අන්ධකාරය. නමුත් අර යෝගාවචරයාට ඇස් දෙකෙන් පේනව වගේ නිදිමතක් නෑ... පළාතකවත් නිදිමතක් නෑ. ඒ තරම් අවදිමත්. කොයි තරම් අවදිමත්ද කිවුවොත්, අඳුර මැදින් පෙනෙන තරමට. මේක මහ ප්‍රබල අවදි බවක්. එතන තියෙන්නේ, "රෑ කාලය යම් සේද දවල් කාලයද එසේය. දවල් කාලය යම්සේද රෑ කාලයද එසේය." කියල. ඒකට තවත් වචන දක්වනවා. "විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාස චිත්තං භාවෙති" විවෘත සිතකින්.... විවෘත අවුල් ස්වභාවයක් නැත්තාවූ, ප්‍රභාස්වර සිතක්. ඒ වචනෙ ඉතාමත් වටිනවා - "සප්පභාසං චිත්තං" ප්‍රභාස්වර සිතක් ගොඩ නගා ගන්න, මොග්ගලාන". ඔන්න ඒක තමයි හයවෙනි පියවර. ඉතින් එහෙම කරලත් ඒත් තවදුරටත් නිදිමත එනවා නම් ඔන්න හත්වැනි පියවර දෙනවා.





"එහෙමනම් මොග්ගලාන, සක්මනට යන්න. "ඔන්න ඊළඟට අවසර දෙනවා ඉරියව්ව මාරු කරන්න. එහෙනං සක්මනට යන්න. සක්මනට ගිහිල්ලා ඒ කරන ටික. ඒකත් මහ පුදුම විදියෙ වචන කීපයකින් තෝරනවා. ඇතැම් කෙනෙක් ඒක දැන් නා නා විදියට විවරණය කරනවා. අපට වැටහෙන ආකාරය අපි කියමු. සක්මනට ගිහිල්ලා 'පච්ඡා පුරෙසඤ්ඤී' කියන වචන යොදනවා. 'පසු පෙර සංඥාව' ඇතිව සක්මන් කරන්න අධිෂ්ඨාන කරගන්න. 'පසු පෙර සංඥාව' කියන එක නා නා විදියට තේරුවත් අපට නම් හැඟෙන හැටියට, දැන්, සක්මන් කිරීමේදී පතුල් දෙක ඉස්සරහ අඩියයි පස්සේ අඩියයි, යන දෙක නේ තියෙන්නේ. අර පසු පෙර සංඥාව කියන්නේ, හිත යොදන්නේ පිටිපස්සේ තියන අඩියටත් ඉස්සරහින් තියන්න බලාපොරොත්තුවන අඩියටත්. එච්චරයි හිත යොදන්නේ. ඒ විධියට හිත හොඳට පිටට යන්න නොදී පවත්වනවා. එපමණක් නොවෙයි. තව වචන යොදනවා. "අන්තොගතෙහි, ඉන්ද්‍රියෙහි" කියලා කියනවා. ඉන්ද්‍රියයන් ඇතුළට හරවාගෙන. සක්මනට ගිය පලියට වටපිට බල බලා, සතුන් දිහා බලබලා එහෙම යාමක් නොවෙයි මේ කියන්නේ. ඉන්ද්‍රියයන් ඇතුළට හරවනවා. පූර්ණ අවධානය යොමු කරගෙන සක්මන් කරන්න කියන එකයි මේ කියන්නේ. 'අබහිගතෙන මානසෙන' "හිතට පිටට යාමට, බැහැරට යාමට, නොදී. 'එතකොට මේ කියන්නේ:

"පසු පෙර සංඥාවෙන් යුක්තව
ඉන්ද්‍රියයන් ඇතුළට හරවාගෙන
බැහැරට නොගියාවූ සිතකින් යුක්තව සක්මන් කරන්න."

ඉතින් ඔන්න හත්වැනි පියවර. ඔය විදියට පියවර හතක්ම දුන්නා. පෙති7 ක් දුන්නා. ඒ පෙති හත දීලත් අපි හිතමු ඒත් දැඩිවම නිදිමත එනවා කියලා. අන්න ඒ අවස්ථාවේදී බුදු පියාණන් ඒකටත් විසඳුමක් දුන්නා.

"එහෙම නම් මොග්ගලාන සති සම්පජඤ්ඤයෙන් යුක්තව, සිහියෙන් සහ නුවණින් යුක්තව, සිංහ සෙය්‍යාවෙන් සැතපෙන්න". ගිහිල්ලා ඇඳේ වැටෙන එක නොවෙයි මේ කියන්නේ. සිංහ සෙය්‍යාව කියන්නේ මේ පින්වතුන් දන්නවා, සැතපෙන පිළිමයක් දිහා බැලුවාම පෙනෙනවා, බුදු පියාණන් වහන්සේ සැතපෙන ආකාරය. දකුණු අත්ල උඩ හිස තියෙනවා. දකුණු පාදය උඩ වම් පාදය තිබෙනවා. ඉතාම සන්සුන් ඉරියව්වක්. ඒක තමයි සංඝයා වහන්සේලාට, යෝගාවචරයින්ට, කියලා තිබෙන්නේ, දකුණු ඇලයෙන් සිංහ සෙය්‍යාවෙන් සැතපෙන්න කියා. එතකොට බුදු පියාණන්

වහන්සේ මුගලන් හාමුදුරුවන්ට කියනවා. "එහෙනම්, මොග්ගල්ලාන මම අවසර දෙනවා මේ පෙති අහන්නේ නැත්නම් සැතපෙන්න". ඒකත් හැබැයි මේ විදිහට. ඒකටත් තියෙනවා නීති රාශියක්, ඔය කියාපු විදිහට සිහි නුවණින් යුක්තව සිංහ සෙය්‍යාවෙන් පාදයක් උඩ පාදයක් තබාගෙන සැතපෙන්නෙ නිකම්ම නොවෙයි. "උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා" නැගිටින වෙලාව හිතට දාගෙන. දැන් මේ කාලේ නම් ඔය එලාම් ඔරලෝසුවක් තියලා නිදාගන්නේ. හැබැයි ඒක වදින කොට නම් දන්නේම නැතිව ඒක වහනවා. ඒ කාලේ ඒවා තිබුනේ නැහැ. මොකක් නමුත් ක්‍රමේකින් හිතට දාගන්නවා "අරුණට කලින් මම නැගිටිනවා", එහෙම නැත්නම් "කුකුළා අඬලන වෙලාවට නැගිටිනවා", කියලා හරි මොකක් හරි තියෙන්න ඇති ඒ කාලෙත් සංඥාවක්. කොහොම නමුත් නැගිටීමේ සංඥාව අවසාන සිතිවිල්ල හැටියට තියාගෙන නින්දට යන්න. ඊළඟට ඒකේ ප්‍රතිඵල හැටියට තමයි කියන්නේ. එතනින් ඉවර කරන්නෙත් නෑ. මොග්ගල්ලාන, නැගිට්ටට - පස්සේ අපි මේ නැගිට්ටයි කියන එක තුළ කාරණා දෙකක් සිද්ධ වෙනවා. උදේට නැගිටිනවා කියලා අපි ලේසියට කියනවා. අර යෝගාවචරයනුයි ඒක අත්දකින්නේ හරියට. ඉස්සෙල්ලා කෙරෙන්නෙ හිත අවදි වෙනවා. හිත අවදිවුනාට පස්සෙයි ඇස් දෙක ඇරෙන්නේ. දැන් මෙතන අර හිතට අන්තිමට දැම්මේ මොකක්ද, 'හිත අවදිඋන හැටියේ මම හෙට දවසේ නැගිටින්න ඕනෑ' කියන එකයි. ඒකයි උට්ඨාන සංඥාව ඇතිව සැතපීමේ වටිනාකම.

ඉතින් ඔන්න, හිත අවදිවුන හැටියේ ඊළඟට කියනවා, "මොග්ගල්ලාන එහෙම අවදිවුන හැටියේ ඇඳේ පෙරළි පෙරළී ඉන්නේ නැතිව, එතන කියනවා "ඵස්ස සුඛං මිද්ධ සුඛං" කියලා කොතැනක හෝ ඇඳේ හෝ ස්පර්ශයේ ඇලිලා එහාට මෙහාට පෙරළි පෙරළි ඉන්නේ නැතිව, නිදිමතෙන් කෙඳිරිගගා එහාට මෙහාට හැරි හැරී ඉන්නේ නැතිව, වහාම නැගිටින්න ඕන. **වහාම නැගිටින්න ඕන.** ඔන්න ඒ විදිහට කාරණා රාශියක් ඇතිවයි, විශේෂ උපදෙස් සමූහයක් ඇතිවයි, නින්දට පවා බුදු පියාණන් වහන්සේ අවසර දුන්නේ. එහෙම ඒ කියාපු නිරීක්ෂණය, ඒ කියාපු උපදෙස් පිළිපැදල තමයි, මුගලන් ස්වාමීන් වහන්සේ අග්‍රශ්‍රාවක කෙනෙක් හැටියට අපට මේ අන්තිමට හමුවුණේ. ඒ තරමට අර 'ථීන මිද්ධ' කියලා කියන නිදිමත. දැන් ඒක ගැන කියන්න තියෙන්නේ මේ පින්වතුන් අහල ඇති මේ අපේ සමාධියටත්, ප්‍රඥාවටත් දෙකටම බාධා වෙන නීවරණ ධර්ම කියලා පහක් තියෙනවා. නීවරණ කියන්නේ ආවරණය කරන ස්වභාවයක්. අපේ හිතේ එකඟ වීමටත් බාධාවක් වන, අර ප්‍රඥාව කියන දැකීමටත්, අවබෝධයටත් බාධාවන කාරණා 5 ක් තිබෙනවා. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ,





උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා කියන ඒ පාලි වචන වලින් හඳුන් වන්නෙ. කාම සිතුවිලි, ද්වේෂ සිතිවිලි, නිදිමත, අලසගති, ථීනමිද්ධ කියන එකයි. ඔන්න දැන් අපේ මාතෘකාව: කයෙත්, කය හැකිළෙනවා වැඩට උනන්දු වෙන්නේ නෑ. හිතත් ඒවගේමයි. සිතෙත් අකර්මණ්‍ය බව. හිත බොහෝම අලසයි. නින්දට නැඹුරුයි. ඔය දෙක ථීනමිද්ධ කියල කියන්නේ. ඔය දෙක එකට යන්නේ - කයෙත් සිතෙත් අකර්මණ්‍ය බව. අනිත් එක ඉතින් උද්ධච්ච කුක්කුච්ච කියල කියන්නේ නොසන්සුන් බව හා පසුතැවිල්ල. විචිකිච්ඡා කියලා කියන්නේ දෙගිඩියාව. මේවායි නීවරණ පහ.

තුන්වැනි එක ගැනයි අපේ කථාව. මේ ථීනමිද්ධ නීවරණය විශේෂයෙන්ම සංඝයා වහන්සේට, භාවනානුයෝගීන්ට තියෙන බාධාව. ඒක ජයගන්නයි අර බුදු පියාණන් වහන්සේ, නොයෙකුත් විදියට- දැන් මෙතනදිත් මුගලන් ස්වාමීන් වහන්සේට කිවුවා වගෙ - උපක්‍රම දක්වලා තියෙන්නේ නිදිමත කඩාගන්න. මොකද? නිදිමත ආව හැටියේ ඒකට යටඋනොත් අර අවස්ථාව ගිලිහෙනවා. යන්තම් ඇස් දෙක පියවෙන කොට ගිහිල්ලා ඇඳේ වැටුනොත් කවදාවත්ම නිවන් දකින්න බැහැ. ඒක නිසා තමයි අර පෙති 7 ක්ම පාවිච්චි කරලා, ඒවා අහන්නේ නැතිවෙනකොට විතරක් ඔන්න සැතපෙන්න අවසර දුන්නෙ බුදු පියාණන් වහන්සේ. ඒතරම් පුදුමයි මේ ශාසනයෙ. උට්ඨාන වීර්‍ය්‍යය. මේ අලස සංඝයා වහන්සේලා කියලා හිතන ජාතිය දානේ වළඳමින් සෑහෙන පමණටත් වැඩිය දානේ වළඳලා පෙරළි පෙරළී නිදනවා කියලා හිතන සංඝයා වහන්සේලාගේ ජීවිතය නියම ජීවිතය නම් අන්න බුදුපියාණන් වහන්සේ අර උට්ඨාන සූත්‍රයේ කියාපු 'නැගිටිවු, ඉඳගනිවු' අන්න ඒ සටන් පාඨය අනුව හික්මෙන ඒ ජීවිතයයි. ඒකයි වටිනා ජීවිතය. එහෙම කරලයි සංසාරයෙන් මිදෙන්න පුළුවන් වෙන්නේ. අර ක්ෂණ සම්පත්තියෙන් ප්‍රයෝජන ගන්න පුළුවන් වෙන්නේ. ඉතින් ඒ විදිහට කළේ නැත්නම් වෙන්නේ මොකක්ද? අන්න වෙලාව ගිලිහිලා අර කියාපු තිස්ස හාමුදුරුවෝ වගේ, අර මානවකයා වගේ, අර භාවා වගේ, පසුතැවෙන්න සිද්ධ වෙනවා, කළයුත්ත වෙලාවට කරන්නේ නැතිව. ඉතින් ඔය තත්ත්වයයි තියෙන්නේ. ඉතින් ථීන මිද්ධ නීවරණය ජය ගැනීම, ගිහි හෝ වේවා! පැවිදි හෝ වේවා! හැම කෙනාගේම වීර්‍ය්‍යය මතු කරගෙන ජීවත් වීමට උපකාර වෙනවා.

ඊළඟට අපි දැන් කල්පනා කරමු, මේ ථීනමිද්ධ නීවරණය වගේම තමයි, දැන් අපි මුලින්ම ප්‍රකාශ කළා පැවිදි කෘත්‍යය ගැන - පැවිදිවුනාට පස්සේ බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නෙත්, පැවිදි වීමේ වාක්‍යය අනුව තියෙන්නේත් මේ සසර දුක් කෙළවර කිරීමයි. ඒ කෘත්‍යය සඳහා සතර සතිපට්ඨානයේ යෙදෙන්න කියලා. එපමණක් නොවෙයි බුදු

පියාණන් වහන්සේ පරිනිර්වාණ අවස්ථාවේ දක්වා වදාළා, මේ ශාසනය ආරක්ෂ කරගන්නා ක්‍රමය. දැන් හැමෝගේම වගේ කථාව මේ ශාසනය කොහොමද අපි ආරක්ෂා කරගන්නේ කියලා. නොයෙකුත් විදියේ උපද්‍රව තිබෙන බව අහන්න ලැබෙනවා. ඉතින් මේ ශාසනය ආරක්ෂා කර ගැනීම ගැනයි කාගෙත් කථාව දැන්.

ඉතින් බුදු පියාණන් වහන්සේත් ඕක ගැන හිත යොදලා තිබෙනවා. පරිනිර්වාණ අවස්ථාවේ හිත යොදලා මේ විදිහට ප්‍රකාශ කරනවා. "මහණෙනි, මවිසින් අභිඥාවෙන් දැන වදාළ යම් ධර්මයෝ වෙත්ද? මොනවද ඒ ධර්ම?

**සතර සතිපට්ඨාන**
**සතර සම්මප්පධාන**
**සතර ඉද්ධි පාද**
**පඤ්ච ඉන්ද්‍රිය**
**පඤ්ච බල**
**සත්ත බොජ්ඣංග**
**අරිය අට්ඨංගික මග්ග**

මෙන්න මේ කියන සත්තිස් බෝධි පාක්ෂික ධර්ම - මහණෙනි, ඒවායේ යෙදිය යුතුයි. ඒවා පුරුදු කළ යුතුයි. බහුල වශයෙන් කළ යුතුයි. කුමක් සඳහාද? මේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා එතකොට බුදු පියාණන් වහන්සේ දක්වා වදාළ ක්‍රමය නම් ඔන්න ඔය කියාපු සත්තිස් බෝධි පාක්ෂික ධර්ම පුහුණු කිරීමයි. මේක කිවුවට කවුරුවත් පිළිගන්න එකක් නම් නැහැ. නමුත් බුදු පියාණන් වහන්සේ අදහස් කළ ශාසනය ශීල, සමාධි, ප්‍රඥා ශාසනය නිසාත්, ඒක ඔය බාහිරව වෙන තැන්වල තියෙන, ප්‍රදර්ශණය කරන, විදේශිකයන්ට පෙන්වන, කැකෝ ගහලා මාන්නයෙන් කෑගහන දෙයක් නොවෙයි. චිත්ත සන්තානය තුළ තමා පැලපදියම් කරගන්න මෙන්න මේ ගුණ ධර්ම සමූහයයි. ඒක යම් අවස්ථාවක නැති වුනොත් බුද්ධ ශාසනය එතන නෑ.

හිතල බලන්න, ධාතු කරඬුවක් ගැන. ඒ තියෙන ධාතු කරඬුවක ලීය හොඳමදි කියලා සඳුන් ලී කරඬුවක ඒක දමන්න පුළුවනි. ඔය කරඬුවට තවත් කෙනෙක් රිදී කරඬුවක් දාන්න පුළුවනි. තව කෙනෙක් රන් කරඬුවක් දමයි. තව කෙනෙක් ඕකේ මැණික් ඔබ්බලා තබාවි. ඔක්කෝමත් කරලා ඉවර වෙලා, අපි හිතමු, ධාතු ප්‍රදර්ශණයක් තියලා විශාල පිරිසක් ඇවිල්ලා මේ කරඬුව අරින දවසේ ඇරලා බලන කොට - ධාතුන් වහන්සේලා නෑ. **අතුරු දහන් වෙලා. අතුරු දහන් වෙලා**. අර කරඬුව





ලස්සනට තියෙනවා. ඉතින් - "අපොයි, කරඬුවේ නෑ නේ ධාතුන් වහන්සේලා." කියලා මිනිස්සු යනවා. ඔය විදියේ දෙයක් මේ ශාසනයට වෙන්න පුළුවනි අන්න අර කියාපු බුදු පියාණන් වහන්සේ පිරිනිර්වාණ අවස්ථාවේ, බුද්ධ ඥානයෙන් දැන වදාළ අර කියාපු ගුණ ධර්ම අපේ චිත්ත සන්තානය තුළ දියුණු කර ගත්තේ නැත්නම්. ඉතින් කොච්චර කෑ කෝ ගැහුවත් ශාසන චිරස්ථිතිය බලාපොරොත්තු වෙනවා නම් - එතන **'චිරස්ථිතිය'** කියන වචනයමත් යොදලා තිබෙනවා - කෙනෙක් ඔන්න ඔය කියාපු ගුණ ධර්ම වඩන්න ඕනෑ. ඒකත් කලට වෙලාවට කරන්න ඕන. ඒකයි අපි කිවුවේ, දැන් මේ ශාසන පහනේ අන්තිම තෙල් බිංදුවයි යන්නේ. ඒ තෙල් බිංදුවේ ආලෝකයෙන් තමන්ගේ ජීවිත සාර්ථක කරගත්තේ නැත්නම්, මේ පින්වතුන්ට හිතා ගන්න තියෙන්නේ ඊළඟට මහා අන්ධකාර යුගයකටයි මුහුණ දෙන්න තියෙන්නේ.

ඉතින් දැන් මේ ගිහි පින්වතුන් කල්පනා කරන්න ඕනෑ - හිත දුර්වල වෙන්න පුළුවන්. අපට මේ තරම් මේ වැඩ රාජකාරි, දරුවන්ගේ වැඩ, නඩුහබ, ලෙඩ රෝග, මේ ඔක්කෝමත් තියාගෙනයි අද දවසේ මෙතෙන්ට ඇවිල්ල බොහොම දෙනා මේ සිල් සමාදන් වුනේ. බොහොම අමාරුයි. අමාරු වැඩක් මේ තිවන් දක්වා යන ගමන. නමුත් - **නමුත්** - අර **'ඉබිගමනින්'** හරි මේ ගමන යා යුතුයි - පස්ස බලන්නේ නැතිව. අන්තිමට ඒ තරඟ දිනුමේ වෙන කෙනෙක් පස්සෙන් ආවෙ නැතත් ජය කණුවට ළංවුනු තරමටයි තමන්ට සැනසීම.

එහෙම නැතිව, ධන සම්පත්, නිලතල, බලතල, උපාධි, ගරු නම්බු, කොයිවත් එකතු කරගෙන තිබුනත්, මාරයා ඇවිල්ලා දොරට තට්ටු කරන වෙලාවේ කඳුළු බිංදුවක් එක්කයි ලෝකෙට ඇහැ වැහෙන්නේ. "අපොයි, මේ ඔක්කොම හිස් නේද? මේ ඔක්කොම කළා. කරන්න ඕන ටික කළේ නෑ, මේ ඉතාම දුර්ලභ බුද්ධෝත්පාද කාලයක, ඉතාම දුර්ලභ මනුෂ්‍යාත්ම භාවයක් ලබා ගෙන සසර දුක් කෙළවර කිරීමේ අවස්ථාවෙන් මම ප්‍රයෝජන ගත්තේ නැහැ නේද? කල් දැම්ම නේද? අර කියාපු යුවා-බලී ශක්තිය තියෙනවා ශරීරයේ. ශක්තිය තියනවා, තරුණයි. නමුත් ඒ කාලේ වෙන වෙන දේවල් කර කර හිටියේ. ඒක කල් දැම්මා. මේක මට ඕනෑ වෙලාවක කරගන්න පුළුවනි. මම දන්නවා ඔක්කෝම. තුන් පිටකයම මම දන්නවා. ඉතින් එහෙම කල්දදා හිටියොත් අන්න අර පසුතැවිල්ලට පත්වෙනවා, කළයුතුදේ වෙලාවට කළේ නැත්නම්. "ඛණකිච්චො ලොකො" ගිහියන් නම් "ඛණකිච්චො ලොකො' කියන්නේ ගිහි ජීවිතය, ගිහි වැඩ, ගැන හිතලා ලෝකය කියන්නේ වෙලාවට වැඩ කරන තැනක්. මේ රටෙත් එහෙමයි. විශේෂයෙන් ඔය දියුණුය කියන රටවල්වල - මේ පින්වතුන්

අහල ඇති - වාහනයක වෙලාවට නැංගේ නැත්නම් ඒ අවස්ථාව ගිලිහිලා යනවා. ඉතින් කොහොම හරි දුවලා දුවලා ගිහිල්ලා - වාහනේ තුළට තල්ලු කරන්නත් කට්ටිය ඉන්නවා. ඒ තරං ගිහි ජීවිතේ පිළිබඳව 'වෙලාව' සංකල්පය කොයි තරම්ද කිවුවොත්, වෙලාව වරදිනවට බයයි. වැඩ කරන තැනට වෙලාවට යන්න ඕන. මේ තරම් රාජකාරි ගොඩක් තිබෙනවා. මේකට වෙලාව වැරදුනොත් ඉවරයි. ගිහියාගේ සංකල්පය එහෙමයි.

පැවිද්දට ඒ සංකල්පය අඩුයි. බුදිය ගන්නවා හාවා වගේ. අපට කවදා වුනත් පුළුවන් මේක.  ඔය ඉබි ගමන ගිහිල්ලා එනකොට අපට පුළුවන් මේක. අපි කල්දානවා. කල්දාන්න නිදහසට කාරණාත් තිබෙනවා. ඉතින් ඒ නිදහසට කාරණා කොයි හැටි උනත්, අන්න අර මාරයා ඇවිල්ලා දොරට තට්ටුකරන වෙලාවේ කල්පනා වෙනවා, අර තිස්ස භික්ෂුවට වගේ අපි මේ කළ යුතුදේ වෙලාවට කළේ නෑ නේද? මේ තරම් වටිනා අවස්ථාවක්, මේ තරම් වටිනා පරමාර්ථයකින් ගිහිච්ච ගමනක්. මේක හිස් දෙයක් නේද? කියලා.

ඒක නිසා කවුරු ආවත් නැතත් පිටිපස්ස බලන්නෙ නැතුව මේ පින්වතුන් අර කියාපු ඉබිගමනින් හරි දිනුම් කණුවට ළංවෙන්න උත්සාහ කරන්න. මේ වෙලාවත් වැරදුනොත් ඊළඟට එන ඒ අන්ධකාර යුගය ගැන අපට කියන්න දෙයක් නැහැ. ඒක කොයි විදියේ, කොයි තත්ත්වයකින් කෙළවර වෙයිද කියලා. ඒ තරම් භයානකයි ලෝක තත්ත්වය. ඉතින් මේකටම උපකාරීවෙනව දැන් අපි ටිකක් කිවුවා සත්තිස් බෝධි පාක්ෂික ධර්ම කියන වචන විතරක්. දැන් බොහෝ දෙනා ඒක දන්නෙත් නැහැ. 'බුද්ධ ධර්මය' කියන්නේ, බුදු පියාණන් වහන්සේ දේශනා කළේ මොකක්ද කියල ඇසූ හැටියේ, පොත් රාක්කයේ තිබෙන පොත්වල නම් ගොඩක් කියාගෙන කියාගෙන යනවා. නිකාය ග්‍රන්ථ අරවා මේවා. ඒ ලේඛනයක් කියාගෙන යනවා. බුදු පියාණන් වහන්සේ මොනවාද දේශනා කළ ධර්මය කියලා දන්නේ නැහැ.

නමුත් බුදු පියාණන් වහන්සේම පරිනිර්වාණ අවස්ථාවේදී ප්‍රකාශ කළේ, "මම දේශනා කරල තියෙන්නේ මෙච්චරයි. මෙන්න මේ කියාපු සත් තිස් බෝධි පාක්ෂික ධර්ම විතරයි මම දේශනා කරලා තියෙන්නේ". එතකොට අන්න ඒ ටිකයි අපි මතු කරල ගන්න ඕනෙ. ඒවා නිකම් අර කිය කියා ඉන්න දේවල් නොවෙයි, ප්‍රායෝගික දේවල්. සතර සතිපට්ඨානය කියල කියන්නේ පුරුදු කළ යුතු දෙයක්. සතර සම්‍යක් ප්‍රධානය කියන්නේ තමා තුළ දියුණු කර ගත යුතු දෙයක්. ඒ හැම එකක්ම එහෙමයි. ප්‍රායෝගික වශයෙන් අත් දකින්න ඕනෑ. කොයි තරම් වඩු උපකරණ තිබුණත් වඩුවැඩ





දන්නා කෙනෙක් නැත්නම්, උගන්වන්න කෙනෙක් නැත්නම්, ඒ වඩු පට්ටලෙන් ඇති වැඩක් නෑ ඒවා කරලා පළපුරුද්ද ඇති කෙනෙක් නැත්නම්. ඒ වගේ තමයි මෙන්න මේ කියාපු ධර්ම. ඒවා වඩන්නේ නැත්නම් අනිත් කෙනෙකුට කළ්‍යාණ මිත්‍ර ආශ්‍රයක් දෙන්න බැහැ. මේ අවස්ථාවේදී මේක කළ යුතුයි කියන්න තරම් ශක්තියක් නැහැ. **ශීල, සමාධි. ප්‍රඥා කියල කියන ශාසනය එතනම ඉවරයි.**

ඉතින් අපි කෙටියෙන් මෙතන කිවුවොත් සතර සතිපට්ඨානයම තමයි මූලික ශික්ෂණය. ඇත්ත වශයෙන්ම දැන් කෙලෙස් සටන මාර සටනක් කියල කිවුවොත්, එහෙම නැත්නම් මේ ශාසනයේ තිබෙන නිවන් සඳහා දරණ ප්‍රයත්නය මාර සංග්‍රාමයක් කියලා කිවුවොත්, මාර සංග්‍රාමයට යෝගාවචර සෙබලා මූලික ශික්ෂණය ලබන්නේ සතර සතිපට්ඨාන භූමියෙයි කියලා හිතාගත්තට වරදක් නෑ.

ඒක තුළ තියෙන්නේ 'සති සම්පජඤ්ඤය' කියල කියන සිහිය සහ මනා නුවණ, එහෙම නැත්නම් දැනුවත් බව. සිහියත් දැනුවත් බවත් ඇතිව, කය පිළිබඳව - තමන්ගේ කයත් අනුන්ගේ කයත් - වේදනාව පිළිබඳව, සිත පිළිබඳව, සිතට එන සිතිවිලි පිළිබඳව, ඔය සතර සතිපට්ඨානය කියන්නේ ඒකයි. ඉතින් ඒක ඒ ඒ එන එන හැටියට දකිනකොට සිහි නුවණ යොදාගෙන ඒවායේ ඇතිවීම් නැතිවීම් දෙකත් පෙනෙනවා. මෙතන ආත්මයක් නෑ කියන එක ප්‍රත්‍යක්ෂ වෙනවා. කොච්චර කෑ ගහල කිවුවත් මේක අනාත්මයි අනාත්මයි කියලා ඒක කීම විදර්ශනාව නොවෙයි. අපි කලිනුත් අවස්ථාවක කියල ඇති විදර්ශනාව කියන්නේ දැකීමක් මිසක් කීමක් නොවෙයි. දැකීමක් නම් ඒකේ යෙදෙන්න ඕනෑ. ඒකේ යෙදෙනකොට පෙනෙනවා," අපොයි, මේ රූපය මෙහෙම දෙයක් නේද? වේදනාව මෙහෙම දෙයක් නේද?මේක පෙණ පිඩක් නේද? වේදනාව දිය බුබුලක් නේද? සංඥාව මිරිඟුවක් නේද? සංස්කාර කෙසෙල් කඳක් නේද? විඤ්ඤාණය මායාවක් නේද? කියන ඔය උපමා බුදු පියාණන් වහන්සේ ලස්සනට කියාපු කාව්‍ය උපමා නොවෙයි. ඕව යෝගාවචරයාට වැටහෙන සත්‍ය දේවල්. ප්‍රත්‍යක්ෂ වශයෙන් එන දේවල්. නිකං බුදු පියාණන් වහන්සේ ලස්සනට කියාපු උපමාවල් නොවෙයි මේ. මේ එක එකක්ම බොහෝම අර්ථවත්. ඒවා ගැඹුරට හිතන්න හිතන්න මේ සද්ධර්මය ප්‍රත්‍යක්ෂ වෙනවා කියලා බුදු පියාණන් ඒ එක්කම කියලා තිබෙනවා. මේ රූපය පෙණ පිඩක්, වේදනාව දිය බුබුලක්. මේක වැටහෙන්නේ අන්න අර කියාපු යෝගාවචරයා සිහි නුවණ යොදලා සමාධිමත් සිතින් ඒ කය දිහා, වේදනා දිහා බලනකොට. මෙතෙක් මමය, මාගේය කියල ඝන සංඥාවෙන් ගත්තු දේ පෙනෙන්න පටන් ගන්නවා ඇතිවීම් නැතිවීම් රාශියක් හැටියට.

ඇතිවීම් නැතිවීම් ස්වභාවය. ඒ තුළින් තමයි මේ කියාපු විදර්ශනා ප්‍රඥාව මෝරලා යන්නෙ. ඒ එක්කම, සමාධියත් වැඩෙනව.

ඉතින් මේක කරගෙන යනකොට තමයි අර සමයක් ප්‍රධාන කියලා කියන්නේ. කොතෙකුත් අවස්ථාවල අපි මේවා සවිස්තරව විග්‍රහ කරල තියෙන නිසා මේ සුලු වෙලාවේ ඔක්කෝම කියන්න බැහැ. කෙටියෙන් කියතොත් සතර සතිපට්ඨාන භූමියේ, ඒ භූමියට මේ යෝගාවචරයා යන්නේ, කර්මස්ථාන ආයුධයත් අරගෙන. කර්මස්ථානය ආයුධය කරගෙන ඒ ආයුධය තුළින් තමයි මේ ශික්ෂණය ලබන්නේ. ඒ ආයුධය හැසිරවීම තුළින් ඊළඟට සම්මප්පධාන කියන සතර ආකාර වීර්‍ය්‍ය,

**"නුපන් කෙලෙස් නුපදවීම සඳහා**
**"උපන් කෙලෙස් නෙරපීම සඳහා**
**"නුපන් කුසල් මතුකර ගැනීම සඳහා**
**"උපන් කුසල් රැක ගැනීම සඳහා**

කියල කියන සතර සම්‍යක් ප්‍රධානය ඊළඟට. ඒක කෙරෙන අතරේ සතර ඉද්ධි පාද කියලා කියන තමා තුළ තිබෙන ඡන්ද, විරිය, චිත්ත වීමංසා - මේ "ඡන්ද" කියන වචනය වැරදියට තේරුම් ගන්න එපා. මේ කාලානුරූපව කියන අදහස නොවෙයි, ශාසනයේ නම් "ඡන්දය" කියලා කියන්නේ "කුසල ඡන්දය". නිවන් දැකීමට යොදා ගන්නා ඡන්දය. ඒක විශේෂයෙන් කියන්න වෙනවා. ඉතින් ඡන්ද චිත්ත විරිය වීමංසා. ඔන්න ඔය "ඡන්දය." තමා තුළ බලවත් කැමැත්තක් තිබෙනවා මේ සසරින් මිදෙන්න. ඒකයි මෙතන ඡන්දය. ඊළඟට ඒ අනුව යෙදෙන වීර්යය. ඊළඟට චිත්ත කියල කියන්නේ ඒකට අධිෂ්ඨාන ශක්තිය. වීමංසා කියන්නේ ඒකට අවශ්‍ය ප්‍රඥාව. විමංසන බුද්ධිය. ඔන්න ඕවා පිළිබඳව අවබෝධයක් එනවා. සතර ඉද්ධිපාද.

ඔන්න ඕවා තුළින් ඊළඟට තමා තුළ මෙතෙක් නොතිබුණු අමුතු විදිහේ ඉන්ද්‍රිය පහක් මතු වෙනවා. සද්ධාව වීර්‍ය්‍ය, සතිය, සමාධිය, ප්‍රඥාව. යෝගාවචරයා අර පිටින් තියෙන පංචේන්ද්‍රිය වහගෙන ඔය ඉන්ද්‍රිය පහයි මතු කරගන්නේ. මේ පංචේන්ද්‍රියයන්ට අසුවන මේ ගොදුරු - සොයන දේවල් - සංසාරේ කොතෙකුත් අපි බලලා තියෙනවා. රස බලලා තියෙනවා. මේ ඉන්ද්‍රිය පහයි දැන් දියුණු කරගන්න බලන්නෙ. ශ්‍රද්ධාව වීර්‍ය්‍ය සතිය සමාධිය ප්‍රඥාව. ආධ්‍යාත්මික ඉන්ද්‍රිය කියලා ඕන නම් කිව්වට කමක්





නෑ. ඉතින් ඒ ඉන්ද්‍රිය දියුණු කරගන්නකොට ඒ ඉන්ද්‍රියම යොදාගෙන, ඒ එන එන බාධක ජය ගන්න පුළුවන් ශක්තියක් එනවා. ඒක තමයි ඒ ඉන්ද්‍රිය පහම බල හැටියට දක්වල තියෙන්නේ. සද්ධා බලය, වීරිය බලය, සති බලය, සමාධි බලය, පඤ්ඤා බලය කියලා.

ඉතින් ඔය විදිහට ශක්තීන් දියුණු කරගෙන යනකොට ඔන්න ඊළඟ පෙළගැස්ම තමයි බොජ්ඣඞ්ග. 'බෝධි' කියලා කියන්නේ. පින්වතුනි, 'අවදිවීම', අවබෝධය කියන අදහසත් තිබෙනවා. මූලික වශයෙන් කියතොත් අවදිවීම. මොකද? සංසාරේ තියෙන්නේ නින්දක්. මහා අවිද්‍යා අන්ධකාරයේ සංසාරයේ අපි මෙච්චර කාලයක් නිදාගත්තා. එතකොට ප්‍රඥා ආලෝකය තුළිනුයි අපි අවදි විය යුත්තේ. ඒ ආලෝක සංඥාවයි අපි මතුකර ගන්න ඕනෑ. ඒ ප්‍රඥා ආලෝකය මතුකර ගැනීමටයි මේ උත්සාහය. බෝධි පාක්ෂික ධර්ම කියලා කියන්නේත් ඒකයි.

**එතකොට බෞද්ධයාට අයිති 'පක්ෂය' මෙන්න මේ බෝධි පක්ෂයයි.** බෝධි පක්ෂයට අයිති ධර්ම ගැනයි හිත යොදන්න ඕනෙ. බෝධි පාක්ෂික ධර්ම තිස් හතක් (37) තියෙනවා. ඉතින් මේ පින්වතුන්ට නිතර හිතන්න තියෙන්නේ ඔන්න ඔය බෝධි පාක්ෂික ධර්ම ගැන, අනික් ඒවා කෙසේ වෙතත්. ඒකෙ සම්බොජ්ඣංග කියලා විශේෂ හතක් තිබෙනවා. "සති, ධම්ම, විචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා," කියලා ක්‍රම ක්‍රමයෙන් තමාගේ චිත්ත සන්තානයේ සිහියෙන් පටන්ගෙන, ඔන්න පෙළගැස්මක් එනවා. සිතේ මහ ප්‍රබුද්ධ අවස්ථාවක් එනවා. ඒ ප්‍රබුද්ධ අවස්ථාවත් ඇවිල්ල අවසාන පෙළ ගැස්ම තමයි, අන්න හරියට ඒ සෙබලා අර පරීක්ෂණ ඔක්කොම පාස් කරලා සම්පූර්ණ ඇඳුම් ආයිත්තම් ඇතිව එළියට බහින අවස්ථාව වගේ තමයි ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය. ඒක තුළිනුයි අර ඔක්කෝම කුළු ගැන්වෙන්නේ. මෙතෙක් සතර සතිපට්ඨාන භූමියෙ සම්‍යක් ප්‍රධාන ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග, ඕවා ඔක්කෝම සම්පූර්ණ කරගෙන අන්තිමට කුළු ගැන්වෙන්නේ ලෝකෝත්තර තත්ත්වයෙන් මතුවන එක සිතක අර කියාපු අංග අටම පහළ වෙන අවස්ථාවක් තිබෙනවා. ප්‍රබල විදියට මාර්ග සමාධියක් හැටියට ලෝකයේ වෙන කිසිම සමාධියකට, වෙන කිසිම ලෞකික සමාධියකට සමකරන්න බැරි, පුදුම අන්දමේ සමාධියක් තුළින් තමයි මේ කෙලෙස් මට්ටම් කඩාගෙන ගිහිල්ලා මේ අපි කවුරුත් බලාපොරොත්තු වෙන, වචන හැටියට පමණක් දැන් කියාගෙන යනකොට සාධුකාර දෙන, සෝවාන්, සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් අර කියාපු පැවිදිවීමේ හෝ ගිහි බෞද්ධ ජීවිතයේ අවසාන ඉලක්කය හැටියට අපි හැමදාම මේ ප්‍රාර්ථනා කරන නිවන, සසරින් මිදීම ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් වෙන්නේ.

එතකොට පින්වතුනි, වැඩි විස්තර නැතත්, මේ ටිකෙන් කල්පනා කර ගන්න ඕනෑ තමන් කළයුත්තේ මොකක්ද? මේ අවස්ථාවේ කළ යුත්තේ මොකක්ද? කියන එක, "බණකිච්චො ලොකො" කියන න්‍යාය අනුව ශාසනය කියන එක මේ වගේ දෙයක් නම්, අපගේ චිත්ත සනතානයේ ඇතිකර ගත යුතු දෙයක් නම්, මේක හිස් ගෙඩි ගැනලා, ඒක අනුව ලෝකයාට කියාපාන දෙයක් නොවෙයි නම්, මේ ප්‍රතිපත්ති රකින අතලොස්සක් හරි මේ රටේ ඉන්නකම් බුද්ධ ශාසනය පවතිනව. එහෙමයි හිතාගන්න තියෙන්නේ. මේ ප්‍රතිපත්ති මොකක්වත් නැති, හිස් ගොඩක් පමණක්, කොයිතරම් විදියේ බාහිර ආටෝපවලින් ශාසනයක් පවතිනවයි කියලා කෑගැහුවත්, එතන ශාසනයක් නෑ. අන්න ඒකටයි අපි කිවුවේ අර ධාතු ප්‍රදර්ශන උපමාව. ධාතු කරඬුව ඇරිය දවසට පෙනෙනවා  ධාතුන් වහන්සේලා නෑ එතන. ඒ වගේ තමයි අපේ චිත්ත සන්තානයේ ඔය කියාපු, බුදු පියාණන් වහන්සේ පරිනිර්වාණ අවස්ථාවේ කියාපු, සත්තිස් බෝධි පාක්ෂික ධර්ම නැත්නම් - එතන ශාසනයක් නෑ.

ඉතින් ඔය කාරණා හොඳට ධාරණය කරගෙන මේ පින්වතුන් මේ කියාපු ඉබිගමන බොහෝම දුක් කරදර මධ්‍යයේ නමුත් ගියොත්, දිනුම් කණුවට ළංවූ පමණටයි, අවසාන අවස්ථාවේ තමන්ට සැනසීම තියෙන්නේ. ඒක නිසා වෙනදා වගේම මේ විශාල පිරිසක් තමන්ගේ එදිනෙදා ජීවිතයට යෙදෙන ශීලයටත් වඩා උසස් ශීලයක් සමාදන් වෙලා, නොයෙකුත් කරදර පීඩා මධ්‍යයේ මේ වටිනා දවසේ ශීල කියන ප්‍රතිපත්තියේ පිහිටලා  තමන් කරගෙන යන බණ භාවනාවලට අනුව සමාධි ශක්තියක් මතුකරගෙන, ඊළඟට ප්‍රඥාවට අදාළවන, විදර්ශනාවට අදාළවන, ඒ සිතුම් පැතුම්, එහෙම නැත්නම් තම තමන්ගේ කමටහන් වැඩුවා. දැන් ඒ වගේම අපි මේ කියන බණත් - හැම තිස්සේම අපි මේ බණ කියන්නේ වෙන එහෙකට නොවෙයි, සංසාරය වඩන්න නොවෙයි, සංසාරයෙන් මිදෙන්නයි අපි මේ බණ කියන්නේ. එතකොට අන්න ඒ බණ ඇසීම තුළින් මේ පින්වතුන් අර කියාපු ශ්‍රද්ධාව වීර්යය. සති, සමාධි ප්‍රඥා ආදී ඉන්ද්‍රියයන්ට උපකාර වන දේවලුත් මේ චිත්ත සන්තානයේ වැඩුනා. ඒක මේ ජීවිතයේදීම, හැකිතාක් ඉක්මණින් මේ ශාසන පහන නිවෙන්න කලින් අර කියාපු බලාපොරොත්තුවන සෝවාන්, සකදාගාමි අනාගාමී අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් නිර්වාණ ධර්මය සාක්ෂාත් කර ගැනීමට ඒකාන්තයෙන් උපනිඃශ්‍රය සම්පත්තියක්ම වේවා කියලා ප්‍රාර්ථනාකරගන්න. ඒ වගේම අපේ මේ ධර්ම දේශනාවෙන් ධර්ම ශ්‍රවණමය කුශලය අනුමෝදන් වීමට කැමති තම තමන්ගේ ඥාතීනුත් ඇතුළු අවීචියේ පටන් අකනිටාව දක්වාවූ යම්තාක් සත්ත්ව කෙනෙක් ඇතොත් ඒ හැම කෙනෙක්ම මේ කුසල්





අනුමෝදන් වීමෙන් තමතමන් බලාපොරොත්තුව වන උත්තමාර්ථයන් සාක්ෂාත් කර ගනිත්වා!

අපටත්, මේ හැමදෙනාටමත්, මේ බුද්ධ ශාසනයෙන් වැඩ ගැනීමට ශක්තිය බලය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියලා පින් අනුමෝදන් කරන්න.

**"එත්තාවතාච අමෙහහි ....."**

# 30 වන දේශනය

# 30 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

පණ්ඩුපලාසොව දානිසි
යම පුරිසාපිච තමුපට්ඨිතා
උය්‍යොගමුඛෙච තිට්ඨසි
පාථෙය්‍යම්පිච තෙ න විජ්ජති

සො කරොහි දීපමත්තනො
ඛිප්පං වායම පණ්ඩිතො භව
නිද්ධන්තමලො අනඞ්ගණො
දිබ්බං අරියභූමිමෙහිසි

\- මලවග්ග, ධම්මපද

සැදැහැවත් පින්වතුනි,

සසර පැවැත්ම තුළ ක්‍රියාත්මක වන කර්ම චක්‍රයේ බලය බිඳින්න උපකාර වන්නේ ධර්ම චක්‍රයයි. කර්ම චක්‍රයටම යටත්වෙලා දුකෙන් දුකට පත්වන ලෝක සත්ත්වයාට විමුක්තියක් උදාවුනේ බුදුරජාණන් වහන්සේ මතුකරලා දුන්න ධර්ම චක්‍රයෙනුයි. කර්ම විපාකවල භයානක තත්ත්වය මෙනෙහි කිරීම තුළින් ධර්ම මාර්ගයට එළඹෙන්න අවශ්‍ය සංවේගය මතුකරගන්න පුළුවන්. දැන් අද මේ මාතෘකා කරගත්තු ගාථාවලට අදාළ නිදාන කථාවෙනුත් බරපතල කර්මවිපාක මෙලොව පඩිසන් දෙන හැටි, විපාක විඳින්න වෙන හැටි, පෙන්නුම් කෙරෙනවා.

සැවැත්නුවර හිටියා ගවඝාතකයෙක්. අවුරුදු පණස් ගණනක්ම ගවඝාතක රක්ෂාව කරමින් මරණ ගවයින්ගේ හොඳ මස් කොටස උයවාගෙන අඹුදරුවන් එක්ක අනුභව කරමින් ඉතිරිහරිය විකුණමින් ජීවත්වුනේ. එක දවසක්දා මේ මනුෂ්‍යයා ගව මස් විකුණලා ඉවර වෙලා නාන්න යන්න ලෑස්තිවෙලා භාර්යාවට කිව්වා අර හොඳ මස් කෑල්ල මට උයලා තියන්න කියලා ඒක දීලා ගියා. ඉතින් නාන්න ගිය අතරේ මේ මනුෂ්‍යයාගේ යාලුවෙක් ඇවිල්ලා මේ භාර්යාවට කියනවා අපේ ගෙදරට කෙනෙක් ඇවිත් ඉන්නවා, විකුණන මස් ටිකක් ගන්න පුළුවන්ද කියලා. ඔබේ මිත්‍රයා මස් විකුණලා ඉවර වෙලා නාන්න ගියා. දැන් විකුණන්න මස්

නැතෙයි කිව්වා. ටිකක්වත් නැද්ද කියලා ඇහුවාම ඔන්න අර උයන්න දීපු මස් කෑල්ල විතරයි තියෙන්නේ කිව්වා. මේ පුද්ගලයා කල්පනා කළා කවදාවත් මේ මස් කෑල්ල නම් දෙන්නේ නෑ කියලා බලහත්කාරයෙන් ඒක අරගෙන ගියා. ඊළඟට අර ගව ඝාතකයා ඇවිල්ලා ආහාර ගන්න සූදානම් වෙන කොට මේ භාර්යාව පළා කොළ එක්ක බතක් ඉස්සරයින් තිබ්බා. මේ මනුෂ්‍යයා ඇහුවා "කෝ මස්" කියලා. ඇය එතකොට මස් නෑ කිව්වා. "ඇයි මම දුන්නා නේද මස් කෑල්ලක්?" එතකොට ඔන්න භාර්යාව කිව්වා කතාන්තරය. ඔබේ යාලුවෙක් ඇවිල්ලා මස් ඉල්ලුවා මම එපැයි කියද්දී බලහත්කාරයෙන් අරන් ගියයි කියලා. "මට බත් කන්න බෑ" කිව්වා. නෑ නෑ දැන් වෙන කරන්න දෙයක් නෑ. ඔය තියන හැටියට කන්නෙයි කිව්වා.

ඉතින් ඊළඟට තරහෙන්ම ඒ බත්පිඟාන ආපසු ඇරලා මේ මනුෂ්‍යයා පිහියක් අරගෙන ගේ පිටිපස්සට ගිහිල්ලා ගේ පිටිපස්සේ හිටිය හරකාගේ කටේ අත දාලා දිව එළියට ඇදලා මුලින්ම කපලා අරගෙන ඇවිල්ලා අර ගිනි අඟුරුවල දාලා පුළුස්සලා කන්න ලෑස්තිවුනා. ඉස්සෙල්ල බත් කටක් කාලා අර බැදපු මස් කෑල්ල කටේ තියනවාත් එක්කම මේ මනුෂ්‍යයාගේ දිව එහෙමම කර්ම විපාක වශයෙන් කැපිලා - දිව කැඩිලා - බත් පිඟානට වැටුනා. ඉතින් ලේ පෙර පෙරා හතර ගාතෙන් මේ පුද්ගලයා ගේ එහා මෙහා දුවනවා. මේක දැකලා භාර්යාව, ළඟ හිටිය පුතාට කිවුවා "පුතේ පේනවා නේද මේ කර්ම විපාකය. මේක නුඹ මත්තෙත් වැටේවි. ඒක නිසා මං ගැනවත් සොයන්නේ නැතුව පණ බේරගෙන යන්න කියලා." ඉතින් මේ ළමයත් මවට වැඳලා ගෙදරින් පිටත් වෙලා ගියා. ඒ අතරේ අර ගවයත් මළා. අර මනුෂ්‍යයා විලාප කියමින් හරකෙක් වගේ හැසිරිලා මැරිලා නිරයේ උපන්නා.

එතකොට ඒ ගවඝාතකයගෙ කතාව එතනින් ඉවරයි. ඔතන ඉඳලා කියන්නේ ගවඝාතක පුත්‍රයා පිළිබඳ ප්‍රවෘත්තියයි. ඉතින් මේ තරුණයා තක්සලාවට ගිහිල්ල - එතන කියැවෙන හැටියට- ස්වර්ණාභරණ හදන ගුරුවරයෙක් ළඟ ඒක පුහුණු වුනා. ඉතින් ඒක හොඳට පුහුණු වෙලා එක දවසක් රන්කරු ගුරුවරයා - ආචාර්යවරයා - ගමට යන්න අවශ්‍යතාවක් ඇති වෙලා යම්කිසි ආභරණයක් හදන්න මෙයාට පැවරුවා. ගිහිල්ලා එනකොට ඉතාමත් හොඳින් ඒක හදලා තියෙනවා දැකලා සතුටු වෙලා "දැන් ඉතින් මෙයාට තමාගේ ජීවිකාව කරගෙන ඉන්න පුළුවන්" කියලා ඒ කාලේ ඔය දිසාපාමොක් ආචාර්යවරුන්ගේ සිරිතක් තිබුනා උපාධිය දෙනවා වගේ හොඳම ගෝලයට දෙන්නේ තමන්ගෙ දියණියයි. ඉතින් තමන්ගේ දියණියත් පාවා දුන්නා. ඒ ගවඝාතක පුත්‍ර රන්කරුවා මේ කාලේ කියන





හැටියට "සාර්ථක ජීවිතයක්" ගත කළා දූ දරුවන් ඇතිව. කල්යාමේදී මේ මනුෂ්‍යයාගේ පුතුන් නැවත සැවැත් නුවරට ගිහිල්ලා පදිංචි වුනා. නමුත් පියා තක්සලාවෙමයි හිටියෙ.

සැවැත් නුවරට ගිය ගවඝාතක පුත්‍රයාගේ දරුවෝ බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය එහෙම අහලා හොඳට ශ්‍රද්ධාවන්ත වෙලා කල්පනා කළා "අපේ පියා, අපේ තාත්තා, දැන් බොහොම වයස් ගත වෙලා. පිනක් දහමක් නොකර ඉන්නවා. ඒ වෙනුවෙන් අපි පිනක් කර න්න ඕන කියලා ඒ තමන්ගේ පියා ගෙදරට ගෙන්වලා බුද්ධ ප්‍රමුඛ සංඝයාට දානයක් පූජා කරන්න සූදානම් වුනා. ඒ දානයට බුදුපියාණන් වහන්සේත් සංඝයාවහන්සේලාත් වැඩම කළාම හොඳ හැටි ඒ දානය පූජා කළා. ඒ විදියෙ දානවලට කියන්නේ - දැන් මේ පින්වතුන්ට නිතර අහන්න ලැබෙන්නේ "මතක භත්ත - මළබත" ගැනයි. මව්පියාදීන් මැරුණට පස්සේ දෙන දාන. නමුත් මෙතන කියන්නේ විශේෂ දානයක්. ඒකට කියනවා 'ජීවභත්ත' කියලා. තමන්ගේ ජීවත්වන පියා වෙනුවෙනුයි මේ දානය දෙන්නේ. එතකොට අපි හිතමු ඒ වයස්ගත මනුෂ්‍යයා ඉන්නවා. අර ඒ දාන කළමනාදිය ඒ පියාණන්ට අත ගස්සවලා හරි මොකක් හරි ක්‍රමයකින් හිතට ඒක තමන්ගේ දානයක්ය කියන අවබෝධය දීලා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට දානය පූජා කළා.

දාන පිංකමෙන් පස්සේ මේ පුත්‍රයෝ බුදුරජාණන්වහන්සේට ආරාධනා කළා මේ අපේ පියාණන් වෙනුවෙන් මේ දානය දුන්නේ, පියාණන්ට අනුමෝදනාවක් කරන්න කියලා. අන්න ඒ අවස්ථාවේ බුදුරජාණන්වහන්සේ යම්කිසි දේශනාවක් පැවැත්වූවා. සමහර විට බුදුරජාණන් වහන්සේට පේන්න ඇති මේ ගවඝාතක පුත්‍රයා තුළ යම්කිසි කුශල ශක්තියක් තියනවා කියලා. ඒකට එල්ල කරලා යම් දේශනාවක් පැවැත්වූවා. ඒ දේශනාවෙ අවසානයට එන - අපට හිතාගන්න තියෙන්නේ - දේශනා සාරය හකුළුවල දක්වන විදියෙ ගාථා දෙකක් තමයි අපි දැන් මේ දේශනාවේ මාතෘකාව හැටියට දක්වූවේ.

ඒ ගාථාවල සාමාන්‍ය අර්ථය මතුකරගන්න බලමු. 'පණ්ඩුපලාසොව දානිසි,- පණ්ඩුපලාස කියන්නේ, දැන් ඔය ගස්වල කොළ වැටෙන්න ළංවුනාම පඬු පාටට හැරෙනව නේ. දුඹුරු පාටට වගේ පඬු පාටට හැරෙනවා නේ. අන්න එතකොට බුදුරජාණන් වහන්සේ ඒ උපමාවයි මෙතන මේ මහලු උපාසක උන්නැහෙට දෙන්නේ. ඔබ දැන් අර ගහකින් වැටෙන්න සූදානම් වෙන පඬු පාටට හැරුණ කොළයක් වගෙයි. ඊළඟට - 'යම පුරිසා පිච තමුපට්ඨිතා'- යම පුරුෂයෝ ඔබ පිළිගන්න ලෑස්තිවෙලා

ඉන්නවා. 'උය්‍යොගමුඛෙච තිට්ඨසි'- උය්‍යොගමුඛෙ කියලා කියන්නේ ගමනක් යන්න පිටත්වෙලා දොරකඩට ඇවිල්ලා ඉන්නවා වගේ පරලොවට පිටත්ව යන්න සූදානම් තැනට ඔබ දැන් ඇවිත් ඉන්නවා. 'පාථෙය්‍යම්පිච තෙ නවිජ්ජති'- ඔබට මහට බතක්, මහවියදමක් නැහැ. 'පාථෙය්‍ය' කියලා කියන්නේ මග වියදම. එහෙම නැත්නම් මහට බත. බත් මුලක් නෑ. ඔන්න ඒ මහලු මනුෂ්‍යයාට සංවේගයක් ඇතිවෙන විදියට මුල් ගාථාව.

ඔන්න ඊළඟ ගාථාව. - 'සො කරොහි දීපමත්තනො' - ඒක නිසා ඔබ තමාට දිවයිනක් හරිගස්සා ගන්න. පිහිටක් සකස් කර ගන්න. 'ඛිප්පං වායම පණ්ඩිතො භව' - ඉක්මණින් උත්සාහකරලා පණ්ඩිතයෙක් වෙන්න. 'නිද්ධන්තමලො අනඞ්ගණො' මළකඩ ඉවත්කරලා නික්ලේශීවන්න. නිකෙල්ශී වෙලා - 'දිබ්බං අරියභූමිමෙහිසි' - දිව්‍යමය ආර්‍ය භූමියට පැමිණෙන්න. දිව්‍යමය ආර්‍යභූමිය කියන එක පොත්වල තෝරන්නේ නිකම් දිව්‍ය ලෝක නොවෙයි. ඔය අනාගාමී අය යන ඒ සුද්ධාවාස නමින් හඳුන්වන ඒ බ්‍රහ්මලෝකයි. අන්න ඒ ලෝකවලට යන්න කියලා ඔය විදියට ඒ ගාථාව වදාළ බව සඳහන් වෙනවා.

ඒ ගාථාව අහලා මේ මහලු මනුෂ්‍යයා - ගව ඝාතක පුත්‍රය - සෝවාන් වුනා කියලා කියනවා. නමුත් එතන ඉඳලා තව ඉදිරියට කියනවා. ඉදිරි දවසටත් දානයට ආරාධනා කරනවා අර දරුවන් පියා වෙනුවෙන්. දෙවැනි දවසේත් අර වාගේම බුද්ධ පුමුඛ සංඝයා වහන්සේලාට දානය පූජා කරලා බුදුරජාණන් වහන්සේට ආරාධනා කළා අනුමෝදනාවක් කරන්න කියලා. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ වදාළ ගාථා දෙක තරමක් දුරට අර කලින් කියාපු ගාථාවලට සමානයි. විශේෂ වෙනස් කමක් වශයෙන් අපට කියන්න තියෙන්නේ - ඒ මුළු ගාථාව නැතත් - දෙවැනි ගාථාව අවසාන වෙන්නේ - අර මුල් එකේ කිව්වේ "දිබ්බං අරියභූමිමෙහිසි" කියලා. මේකේ කිව්වේ "න පුන ජාති ජරං උපෙහිසි" කියලා. මේ කියන විදියට වීර්‍යය කරලා ඉක්මණින් පණ්ඩිතයෙක් උනොත් ඔබ නැවතත් උපතකට ජරාවකට පැමිණෙන්නේ නැත. ඒක ඊට වඩා ගැඹුරු විදියට, හිත් කාවදින විදියට, ඒ ගාථාව. ඒ ගාථා සහිත දේශනාව අහලා - ඒ ගාථා දෙක පමණක් නොවේ, අපට හිතාගන්න තියෙන්නේ, ඒ ගාථා ගැන සඳහන් වුනාට, ඊට කලින් බුදු පියාණන් වහන්සේගේ දේශනා විලාශය අනුව "ආනුපුබ්බී කථා" කියලා කියන අනුපිළිවෙල කථා නමැති දාන කථා, සීල කථා සගග කථා ආදී අනුපිළිවෙල කථාවකින් පස්සේ සාමාන්‍යයෙන් බුදුපියාණන්වහන්සේ මේ විදියෙ අවස්ථාවල දේශනා කරන්නේ. ඒ දේශනාව අහල අර මනුෂ්‍යයා අනාගාමී වුනා කියලත් කියනවා. මේ අර ගවඝාතක පුත්‍රයා.





ඔන්න කතාවෙ දෙපැත්ත. ඉතින් අපි අර පටන් ගත්තෙත් කර්ම චක්‍රයයි, ධර්ම චක්‍රයයි කියලනේ. අර කර්ම චක්‍රයටම ඉඩ ලැබුන නම් ගවඝාතක පුත්‍රයා අපාගාමී වෙන්නයි තිබුනේ. දැන් බුදුපියාණන් වහන්සේගේ ධර්ම චක්‍රය පිහිට කරගෙන අන්තිමට අනාගාමී වුනා. ඔන්න වෙනස. ඒක තුළමත් ගැඹුරු අදහසක් තියෙනවා. දැන් ඔතන ඉඳලා අපි ටික ටික විග්‍රහ කරන්න බලමු මේ කථාව. දැන් මේ කථාවෙ මුල හරියෙන් හොඳටම පේනවා අර ගවඝාතකයා ඉතාමත් කෲර අන්දමින් තමාගේ ආහාරයට මස් රසය නැති නිසා තමාගෙ දිව පිනවන්න අර ගවයාගෙ දිව කැපුවා. ඒක කොයි තරම් කෲර දෙයක්ද? එතකොට අන්න ඒ කෲරත්වය නිසා ඒකේ විපාකය එතනම ලැබුණා. එබඳු විපාක සමහර ධර්ම කථාවල කොතෙකුත් සඳහන් වෙනවා. මේ කාලයේ පවා එබඳු දේවල් මේ පින්වතුන්ට අහන්න ලැබෙනවත් ඇති. ඒකට කියන්නෙ "කම්මසරික්ඛක විපාක" කියලා - කර්මය හා සමාන වන විපාක. ගේ පිටි පස්සේ අර ගවයා දිව නැතිව එහාට මෙහාට දුවනවා. ගේ ඇතුළේ මේ ගවඝාතකයා දිව නැතිව එහාට මෙහාට දුවනවා ගවයා වගේ බෙරිහන් දිදී. ඔන්න කොහොමද එතකොට කර්මය? හරියට ගැලපෙනව නේ. ඒ ගිහිල්ල ඊළඟට අන්තිමට නිරයෙ. එතකොට නිරාදුක පිළිබඳ පූර්ව දර්ශනයක්, පෙර හුරුවක්, සංදර්ශනයක් තමාගේ භාර්යාවටත් පුතාටත් පෙන්නුවා.

එතකොට ඒ සංදර්ශනයෙන් හයවෙලා ඇතිවුන සංවේගය නිසා තමයි අර දරුවා අම්මාට වැඳලා පිටත්ව ගියේ සදහටම. ගිහිල්ලා තක්සලා නුවරටම ගියා. කොයිතරම් සංවේගයක් ඇතිවෙන්න ඇද්ද තමාගේ මවත් අතහැරලා යන්න. ඉතින් කොහොම හරි ඒක ඒ පැත්තෙන් පේනවා. ඒක අනුව හුඟක් හිතාගන්න පුළුවන් මේ පින්වතුන්ට. සමහර විට මේ කාලයේ ඊටත් වඩා කෲර අන්දමේ සත්ත්ව ඝාතන වෙන බව මේ පින්වතුන්ට සිහියට නැගෙනවා ඇති. ඒ හැම එකකටම මේ විදියට විපාක නොවුනට. අපට හිතාගන්න තියෙන්නේ ඇතැම් විට ඒ මනුෂ්‍යාත්ම භාවය ලබා දුන්න කර්ම ශක්තියේ දැඩි බව නිසාම, ශක්තිය නිසාම, තාම ඔරොත්තු දෙනවා ඒ පාපකර්ම ඇතැම් අයට. නමුත් වැටෙන වෙලාවට වැටෙනවා. වැටෙන්නේ නිරයට. එහෙම නැත්නම් තිරිසන් යෝනි ආදියේ විපාක විඳින්න සිද්ධ වෙනවා. ඒවා අපි කවුරුත් දන්නවා නේ ධර්ම කතාවල් ආශ්‍රයෙන්. එතකොට ඒකයි කතාවෙ මුල හරියෙන් අපට ගන්න තියෙන්නෙ.

කොයි තරම් හයානක තත්ත්වයක්ද මේ ගවඝාතක කර්මය වගේම මස්රසයට ලෝභවීම? ඒකෙ ආදීනව අපට පේනව. ඒ දෙක එකට යන්නේ. ගවඝාතනය කරන්නෙත් මාංශ සඳහායි. ඒවා කොච්චර කෑවත් මදි නිසා තමයි මස් රස නැතිව කන්න බැරි තත්ත්වයකට අර ගවඝාතකයා පත්වෙලා

මස් නැතිව බතක් කන්න බැරුව අර ගවයාගේ දිව කැපුවෙ. ඉතින් කාල ඇතිවෙන දෙයක් නොවෙයි මස් කියන එක. එහෙම නම් එපාවෙන්න ඕන ඉස්සෙල්ලම ගවඝාතකයටයි. ඉතින් ඔන්න ඕවා ගැන මේ පින්වතුන්ට ඒ ආශ්‍රයෙනුත් හිතා ගන්න පුළුවන්. අපි එතනින් නවත්තලා ඊළඟට යමු මේ කතාවෙ අනිත් කොටසට, එයිනුත් යම් යම් දේවල් ගන්න තියෙන නිසා මේ කෙටි කාලය තුළ.

දැන් ඊළඟට බලමු අපි, අර පුතා අන්තිමට රන්කරුවෙක් වුනා. වැඩි විස්තර නැතත් දක්ෂ විදියට උපාධි ලත් රන්කරුවෙක් වෙන්න ඇති. ඊ ළඟට ඒ දරුවන් ගැන හිතල බලන කොට අන්න ඒ දරුවන්ගේ - අමුතුවෙන් සඳහන් නැතත් - ගුණවත් බව පියා වෙනුවෙන් කළ ඒ පින්කමෙන්ම අපට තේරෙනවා. කොයිතරම් වටින දෙයක්ද කියලා. දැන් මේ කාලෙ ඇත්ත වශයෙන්ම මව් පියන්ට ජීවත්ව ඉන්න කාලෙත් හොඳට සළකලා මිය පරලොව ගියාම අවුරුදු ගණනක් තිස්සේ අනුමෙවෙනි බණකින් පින් අනුමෝදන් කරවීමේ අදහසින් දන්දීමේ චාරිත්‍රයක් තියෙනවා. සමහර අය ඇතැම්විට ජීවත්ව ඉන්දෙද්දි මව් පියන් ගැන නොකතා තම තමන්ට කැමති හැටියට විදේශ ගතවෙලා හොඳට සැප විඳලා මිය පරලොව ගියා කියලා අහන්න ලැබුනාට පස්සේ ඇවිල්ලා ලෝකෙට පෙන්නන්න එහෙම දානෙ දෙනවා. නමුත් ඊටත් වඩා දුර්ලභ සංකල්පයක් තමයි - තමන්ගේ ජීවමාන මව් පියන් වෙනුවෙන් කරන්න පුළුවන් ඉහළම උපස්ථානය බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තියනවා. මීට කලින් අවස්ථාවල මේ පින්වතුන්ට ඒ දේශනා කොතෙකුත් අහන්න ලැබිල ඇති.

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක ප්‍රකාශ කරලා තියෙනවා ලෝකයේ දෙන්නෙක් ඉන්නවාය, පහසුවෙන් උපකාර කරලා, උපස්ථාන කරල නිම කරන්න බැරි. ඒ කියන්නේ ප්‍රතිඋපකාර කරලා, කළගුණ සලකලා ඉවරකරන්න බැරි, දෙන්නෙක් ලෝකයේ ඉන්නවා, ඒ කවුද? මවයි, පියයි. ඊළඟට ඒක සවිස්තරව බුදුරජාණන්වහන්සේ දේශනා කරනව බොහොම පුදුම අන්දමට. යම් දරුවෙක්, යම් පුතෙක්, අවුරුදු සීයක් ආයුෂ ඇති පුත්‍රයෙක්, තමාගේ මවත් පියත් දෙවුරේ හිඳුවාගෙන ඒ අයගේ සියලුම ඇඟ ඉලීම් මල මූත්‍රා ඇදීම් ආදී හැම එකක්ම කරමින් උපස්ථාන කරගෙන අරගෙන ගියත් ඒත් අර මවටත් පියාටත් ණය ගෙවලා නිම කරන්න බැරිය. ඒ වගේම යම් පුත්‍රයෙක් තමාගේ මවත් පියාත් සත්රුවනින් පිරුණු මේ මහ පොළොවේ අධිපතිකමට, රජඉසුරු ලබා දුන්නත් ඒත් ගෙවන්න බැරිය ණය. නමුත් යම් පුත්‍රයෙක් සද්ධාව නැති මව් පියන්ව සද්ධාවේ පිහිටෙව්වොත් - සදධාගුණයේ - ශීල ගුණය නැති දුශ්ශීල මව් පියන් ශීලයේ පිහිටෙව්වොත්, පරිත්‍යාග ගුණය නැති මව්පියන් ත්‍යාග





ගුණයේ පිහිටෙව්වොත්, ප්‍රඥාව නැති මව්පියන් ප්‍රඥාගුණයේ පිහිටෙව්වොත්, ඒ පුත්‍රයා අර මව් පියන්ට උපකාර කළා පමණක් නොවෙයි, සෑහෙන පමණ උපකාර කළා පමණක් නොවෙයි, පමණටත් වඩා උපකාර කළා වෙනවා කියලා බුදු පියාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා.

ඇත්ත වශයෙන්ම බොහෝවිට ඕක සඳහන් වෙන්නේ ඔය පුත්‍රයෙක් ශාරිපුත්‍ර මහරහතන්වහන්සෙ වගේ පැවිදි භූමියට පත්වෙලා අර කියපු ගුණ ධර්මවලින් සම්පූර්ණ වෙලා මවටත් පියාටත් ඔය කියපු ආකාරයෙන් උපකාර වීම තමයි උත්කෘෂ්ටම මට්ටම. දැන් මෙතන මේ දරුවන් කළේ මොකක්ද? බුදු පියාණන්වහන්සේ හඳුනාගත්තා. තුණුරුවන් හඳුනාගත්තා. එතකොට ඒ සද්ධාව වගේම මව්පිය උපස්ථානය පිළිබඳ යම්කිසි ගැඹුරු සංකල්පයක් ඇතිවෙන්න ඇති. කෘතඥතා වශයෙන් එහෙම සිහිපත් කරගෙන තමයි පියාණන් ගෙන්වලා ඒ වෙනුවෙන් අර ජීව භත්තයක් දුන්නේ. මතක භත්තයක් නොවෙයි. මැරෙනකං හිටියෙ නෑ. ජීව භත්තයක් වශයෙන්. ඒකෙ ආනිසංස වශයෙන් ශ්‍රද්ධාව නැති ඒ ගවඝාතක පුත්‍රයා ශ්‍රද්ධාවෙන් වැඩුනා. ශීලය නැති තැනැත්තා ශීලයෙන් වැඩුනා. පරිත්‍යාග ගුණය නැති තැනැත්තා පරිත්‍යාග ගුණයෙන් වැඩුනා. ඊ ළඟට ප්‍රඥා සම්පත්තියේ කෙළවර තමයි අර අනාගාමී වුනේ.

ඉතින් ඔන්න ඔය ධර්මචක්‍රයේ ක්‍රියාකාරීත්වයත් අර දරුවන්ගේ මව්පිය උපස්ථානයත් - අපට හිතාගන්න පුළුවන් ඒවයි වටිනාකම. ඊළඟට අපි මේ ගාථාවල ගැඹුර ගැන කල්පනා කරලා බලමු. අපට පෙනෙන තරමින්. බුද්ධ ඥානයට ගෝචරවන දේවල් එක පාරට අපට කියන්න බෑ. බුදුරජාණන් වහන්සේට පේන්න ඇති මේ ගවඝාතක පුත්‍රයා තුළ ඇති යම් උපනිශ්‍රය සම්පත්තියක්, කර්ම ශක්තියක්. මේ විදියේ පරිසරයක ඇති දැඩි වුනත් මෙහෙම එකක් තියෙනව කියල. අපට මේ ගාථාව ආශ්‍රයෙන් පේන්න තියන ටික විතරක් විවරණය කරන්න පුළුවන්. ඇත්ත වශයෙන් ගාථා යුගල දෙකක් බුදුරජාණන්වහන්සේ දේශනා කළ බවයි පේන්නෙ මේ දවස් දෙක ඇතුළත. පළමුවෙනි දවසේ දේශනා කළ ගාථාවේ මුල් පදය මොකක්ද? ඒ උපමාව ඉතාම ගැඹුරු උපමාවක්. මේ මහලු උපාසක උන්නැහෙ අමතල කියනවා "ඔබ දැන් පඬු පාටට හැරුණු කොළයක් වගෙයි. දැන් ගහකින් වැටෙන්න ළඟ විදියට පඬු පාටට හැරුණු කොළේ පොඩ්ඩක් හුළඟක් ආව හැටියේ ගැලවිලා වැටෙනවා නේ. අන්න එතකොට ඒක අනුව තමන්ගේ මහලු වයසෙ තත්ත්වය තේරුම් කරලා දුන්නා. ඊළඟට එහෙම වැටුනට පස්සේ මොකද වෙන්නේ? එහෙම නැතිනම් යන තැන මතක් කරන්න තමයි "යමපුරිසාපිච තං උපට්ඨිතා" කියන දෙවෙනි පදය "යම පුරුෂයෝ ඔබ පිළිගන්න බලාපොරොත්තුව ඉන්නවා." අන්න

යන තැන පිළිබඳ යම් සංඥාවක් දුන්නා. අපට හිතන්න තියෙන්නේ අර ගවඝාතක පුත්‍රයා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ පියාගේ රස්සාවට උදව්වෙන්න ඇති. ඒ වගේම ගව මාංශ කමින් ඒ විදියටම ගත කරන්න ඇති. ජීවිතය ඒ විදියටම කෙළවර වුනානම් යන තැනයි අර කිව්වේ. යම දූතයෝ දැන් ලෑස්තිවෙලා ඉන්නවා ඔබ පිළිගන්න.

ඊ ළඟට ඒ වගේම "උය්‍යොගමුඛෙච තිට්ඨසි". දැන් හරියට ගමනක් යන්න පිටත් වෙලා ගේ දොරකඩට ඇවිල්ලා ඉන්නවා වගේ දැන් ඔන්න යන්න වේලාවත් ඇවිල්ලා. හරියටම ඔබ සූදානම්වයි ඉන්නෙ. ඊළඟට "පාථෙය්‍යම්පිච තෙ න විජ්ජති" ඔබට මඟට බතක් නෑ මේ යන්න ලෑස්ති වුනාට මොකද? සංවේගය ඇති කළා ඒ මුල් ගාථාවෙන්, බුදුපියාණන් වහන්සේ. ධර්ම සංවේගය ඇති වුනා තමාගෙ තත්ත්වය ගැන. තමන් තුළ කුසලයක් නැති බව මතක් කරලා දුන්නා. ඒ එක්කම අර ගවඝාතක පුත්‍රයාට අතීතය මතක් වෙන්න ඇති. සංවේගවත්ව ගෙදරින් දිව්ව අවස්ථාව, පියාණන් කළ රක්ෂාව. ඒ ඔක්කොම මතක් වෙන්න ඇති, අර යමපුරිස කතන්දරය තුළින්. ඔන්න එතකොට යම් සංවේගයක් ඇතිකළා. සංවේගය තුළින් තමයි ධර්මයට නැඹුරුවෙන්න ලැබෙන්නේ.

ඔන්න දෙවැනි ගාථාව- "සො කරොහි දීපමත්තනො". දෙවැනි ගාථාවෙන් අන්න උත්සාහවත් කළා. මුල් ගාථාවෙන් තමන්ගෙ තත්ත්වය පෙන්නුම් කරල දුන්න. සංවේගය ඇති කළා. දෙවැනි ගාථාවෙන් උත්සාහවත් කළා. "සො කරොහි දීපමත්තනො" ඒක නිසා ඔබ තමාට දිවයිනක් කර ගන්න. ඔබේ ජීවිත ඔරුව පෙරළෙන්න ළඟයි. දිවයිනක් සොයාගන්න. පිහිටක් හොයාගන්න කියන එකයි. "ඛිප්පං වායම පණ්ඩිතො භව" ඉක්මණින් උත්සාහ කරලා පණ්ඩිතයෙක් වෙන්න. ඊළඟට - "නිද්ධන්තමලො අනඞ්ගණො" මලකඩ ඉවත්කරලා නොකිලිටිව එතකොට මේ මහලු මනුෂ්‍යයත් එක්තරා විදියක පණ්ඩිතයෙක්, රන්කරු උපාධිය ලබාගත්තු කෙනෙක්. ඉතින් ඒ පණ්ඩිතකම් උපකාර කරගෙන ඊළඟට මොකක්ද කරන්න තියෙන්නේ? නිද්ධන්තමලො අනඞ්ගණො - රන්කරුවෙකුට තියෙන තියෙන මලකඩ ඉවත් කරලා ආභරණ හැදීමේ දක්ෂතාව මේ පුද්ගලයා තුළ තියනවා. දැන් කරන්න තියෙන්නේ ඒක නොවෙයි. සිතේ තියන මලකඩ ඉවත් කරලා නික්ලේශී වෙන්න. ඊළඟට "දිබ්බං අරියභූමිමෙහිසි' එහෙම කළොත් නම් ඔන්න අර දිව්‍යමය ආර්ය භූමියකට යන්න පුළුවන්" කියන එක බුදුපියාණන් වහන්සේ මතුකරලා දුන්නා. ඒක අහලා, ඒ තුළට හිත යවලා වෙන්ට ඕන අර මනුෂ්‍යයා සෝවාන් වුනා කියලා කියන්නේ. අපට එහෙමයි හිතාගන්න තියෙන්නේ.





ඉතින් ඊළඟට දෙවැනි අවස්ථාව. ඒ දවස ගතකළ ආකාරය අපි දන්නේ නෑ. ඒ මනුෂ්‍යයත් ඉතින් අර බුදුපියාණන් වහන්සේ දේශනා කළ ආකාරයට උත්සාහවන්තව "දැන් තියෙන්නේ මගේ හිත තනාගන්නයි" කියලා අර ගුරුවරයා සතුටුවන විදියේ රන් ආභරණයක් සාදා ගත්තා. ඒ හපන්කම සමහර විට මෙතෙන්ටත් යොදාගන්න ඇති. ඇත්ත වශයෙන්ම බුදු පියාණන්වහන්සේ හිත තැනීම පිළිබඳ කතාන්තරය කියන ඇතැම් සූත්‍රවල සඳහන් කරන්නේ රන්කරු උපමාවමයි. රන්කරුවෙක් යම්සේ ගින්නක් දල්වලා - ස්වර්ණාභරණ කර්මාන්තය ගැන දන්නා අය දැකල ඇති නේ - අමුරන් කැල්ලක් ගින්නට අල්ලලා පිඹලා ඒක රත්කරමින් විටින් විට පොහවමින් වතුරේ දමමින්, විටින් විට ඒක නිවෙන්න අරිමින් ඔය විදියට ක්‍රමානුකූල උත්සාහයකිනුයි  රත්රන් ආභරණ හදන්නෙ. ඒ වගේ ඒ උපමාව ආශ්‍රයෙන් බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, යම් කෙනෙක් හිත තනාගන්නවානම් නිවනට, විදර්ශනා ආදී ඒ භාවනා කටයුතුවලට සිත යොදනවානම්, ඒකට අවශ්‍යවන දේවල් තමයි සමාධිය, වීර්යය, උපේක්ෂාව. අන්න ඒ කරණාවලට උපමා හැටියට දක්වන්නේ, දිගටම සමාධිය වඩනවා නොවෙයි. දැන් අර රන්කරුවා කඩින් කඩ, සැරෙන් සැරේට රත්කරනවා. සැරෙන් සැරේට වතුරෙන් පොහවනවා, සැරෙන් සැරේට අරක ටික වේලාවක් නිවෙන්න හරිනවා. ඒ වගේ විටින් විට ක්‍රමානුකූලව සමාධිය වඩන්න. ක්‍රමානුකූලව වීර්යය වඩන්න. ක්‍රමානුකූලව විටින් විට උපේක්ෂාව වඩන්න. ඔන්න ඔය රන්කරු උපමාව ආශ්‍රයෙන්මත් බුදුපියාණන් වහන්සේ හිත තැනීම ගැන කියලා තියනවා.

අපි මේක අමතර කාරණාවක් හැටියටයි දක්වූවේ. නමුත් මේක ආශ්‍රයෙන් හිතා ගන්න පුළුවන් අර ඥානවන්ත ගවඝාතක පුත්‍රයා, එහෙම නැත්නම් රන්කරුවා තුළ දැන් සංවේගයක් ඇතිවෙලා තියෙනවා, සෝවාන් ඵලයටත් පිවිසිලා තියනවා. ඉතිරි හරියට එදා දවසේ කොහොම ගත කළාද අපි දන්නේ නෑ. දෙවෙනි දවසේ බණ අහලා අනාගාමී වුනා කියලා තියෙනවා. ඉතින් මෙන්න මේක ආශ්‍රයෙන් අපට හිතාගන්න තියෙන්නෙ අන්න අර ධර්ම චක්‍රය ගැන කල්පනා කරලා බලනකොට මෙහෙම ආශ්චර්යවත් දෙයක් මේ ධර්ම චක්‍රයේ තියෙන්නේ. මේ ධර්මයේ ගුණ ගැන මෙනෙහි කරනකොට නිතර යොදන පද හයක් තියනවා, මේ පින්වතුන් කවදත් දිනපතාම වාගේ කියන. ස්වාක්ඛාත, සන්දිට්ඨික, අකාලික, එහිපස්සික, ඔපනයික, පච්චත්තං වෙදිතබ්බ. මේ ධර්මයේ තියන මහ පුදුම ගුණ එතකොට කර්ම චක්‍රය අරෙහෙම පෙරළෙන අතරෙ බුදුරජාණන් වහන්සේ පෙරලූ ධර්ම චක්‍රය කොතරම් ප්‍රබලද කියතොත් දැන් කොතෙකුත් ධර්ම කථාන්තරවල මේ පින්වතුන් දන්නවා - සමහර විට බුදුරජාණන් වහන්සේ

පොඩි උපදෙසක් දීලා, ගාථාවක් කියලා සෝවාන් විතරක් නොවේ රහත්වුන අවස්ථාවලුත් සඳහන් වෙනවා.

අන්න ඒ ධර්ම චක්‍රයෙ ආශ්චර්යය. මොකද, ඒක ස්වාක්ඛාතයි. බුදුරජාණන් වහන්සේගේ මුවින්ම ගිලිහෙනකොට ධර්මය හරියටම ස්වාක්ඛාතයි. ආයි අඩුවක් පාඩුවක් නෑ. ප්‍රත්‍යක්ෂ ඥානය තුළින් ඒ ඒ පුද්ගලයාගේ ආසයානුසය දැනගන්නවා. බුදුපියාණන් වහන්සේ ඒ බුද්ධ ඥානය යොමු කරන කොට ඒ හැම කෙනාගේම අතීත ප්‍රවෘත්ති ඔක්කොම පෙනිල ඉවරයි. අතීත කර්ම වේග, කර්ම ශක්තීන්, හොඳ නරක, ඔක්කොම පෙනිලා ඉවරයි.ආසයානුසය ඥානය. ඒ වගේම ඒ ඒ ජාතිවල භාවනා වැඩුවා නම් ඒවාට උපකාර කරගත්තු කමටහන් පවා බුදුන් වහන්සේට පේනවා. ඒ අවබෝධය තුළිනුයි බුදුපියාණන්වහන්සේ කෙනෙකුට බණ පදයක් දේශනා කරන්නේ. ඒකයි ඒ ස්වාක්ඛාත ගුණය.

ධර්මය ස්වාක්ඛාත නිසාම බුදුපියාණන් වහන්සේ ස්වාක්ඛාත වශයෙන් දේශනා කරන ධර්මයේ සන්දිට්ඨික වශයෙන් මෙලොවම, ඇස්පනාපිටම, එහි ප්‍රතිඵල දකිය හැකි තත්ත්වයක් තියෙනවා. මහ පුදුම දෙයක් ඒක මේ ධර්මය පිළිබඳව, ඒ වගේම අකාලික - කල්නොයවාම එතන එතනම විපාක දෙනවා. ආයි පරලොව ගිහිල්ලා බලන්න දෙයක් නෑ. මෙතනමයි. එතකොට සන්දිට්ඨික අකාලික. එහිපස්සික කියලා කියන්නේ මේ ධර්මයේ තියෙනවා "එව බලව" කියලා කියන ගතියක්. ධර්මය ක්‍රියාවට නඟනවත් එක්කම එහි ප්‍රතිඵල තමන්ට අත්දකින්න පුළුවන්. "ඔපනයික" කියලා කියන්නේ ධර්මයේ තියෙනවා එකිනෙකට තල්ලු කරගෙන යන ගතියක්. එකකට එකක් සම්බන්ධවෙලා යනවා. එක ගුණයක් පුරන කොට ඒකෙන් ගිහිල්ලා අනෙක් එකට සම්බන්ධ වෙනව. ඒවා ගැන අපි බොහෝ අවස්ථාවල මේ පින්වතුන්ට දීර්ඝ වශයෙන් කියලා තියෙනවා. ඔය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එහෙම සම්‍යක් දෘෂ්ටියත් සම්‍යක් සංකල්පයක් අතර එකිනෙකට පුදුම අන්දමේ සම්බන්ධතාවක් තියෙනවා. ආයි කෙනෙක් ඇවිල්ල තල්ලුකරන්න ඕන නෑ. එක තැනකට දම්මට පස්සෙ ඒක අනුව හරියට යනවා. පඩි පෙලක් නගින කෙනාට එක පයක් උස්සන කොට,ඒක තියල ඉවරවෙන කොට, අතින් පය ඉස්සිල ඉවරයි. ඒ වගේම සම්මා දිට්ඨියට යන කොට ඔන්න සම්මා සංකප්පයට ලෑස්ති වෙලා. ඒකට යනකොට සම්මා වාචා, ඔය විදියට ධර්මයේ කොතනින් ගත්තත් ඕපනයික ගුණයක් තියෙනවා. ඉස්සරහට තල්ලු කරගෙන යන ගුණයක් තියෙනවා. සන්දිට්ඨික, අකාලික, එහි පස්සික, ඔපනයික. ඊ ළඟට ඒව නිසාම "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි" - ඥානවන්ත පුද්ගලයෙක් නම් වැඩි උගත්කමක් නැතත් - දැන් මෙතන නම් උපාධිධාරී ස්වර්ණාභරණ





කාරයෙක්. එහෙම එකක් නැතත් සාමාන්‍ය ගොවියෙක් හෝ වේවා අතීතයෙන් අරගෙන ආපු පුණ්‍ය ශක්තිය තුළින්, විදර්ශනා භාවනාව අතීතයේ එහෙම වඩලා තියෙනවා නම්, එබඳු කෙනෙකුට අන්න ඒ වගේ නුවණැත්තෙකුට "පච්චත්තං වේදිතබ්බෝ" - තමාටම ඒ ධර්මයේ සත්‍යතාව දැන ගන්න, ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන්.

අන්න ඒ ගුණය නිසා වෙන්න ඕන මේ මනුෂ්‍යයා අපායට යන්න හිටිය කෙනෙක් නමුත් අනාගාමි වුනා. **අපාගාමී වෙනවා වෙනුවට අනාගාමී වුනා.** ඉතින් එයිනුත් යමක් තේරුම් ගන්න පුළුවන්. මේ කතාන්තරයේ ඔය එක පැත්තක් - ධර්මයේ වටිනාකම. එතකොට අපි අර සාමාන්‍යයෙන් ගවඝාතක පුත්‍රයා කියලා කියන කොටම පුද්ගලයෙකුට හංවඩු ගැහුව වගේ සමාජයෙන් කොන්වෙන කෙනෙක් කියලයි හිතන්නෙ. මේ කථාව තුළ මහ පුදුම සාධාරණත්වයක් තියෙනවා. ඒ අර ගවඝාතක පුත්‍රයා බුදුපියාණන් වහන්සේට තමන් වෙනුවෙන් දානයක් පූජා කරපු දරුවන් වගේ කලින් ධර්මය ගැන යෙදිලා නැතත් අතීත පුණ්‍ය ශක්තිය අනුවත්, බුද්ධ දේශනාව හරියටම එල්ලකළ නිසාත් අර වාගේ තත්ත්වයකට පත්වුනා. ඒක නිසා අපි ඒ වගෙ කෙනෙකුට හංවඩු ගහන්න නරකයි. කෙනෙකුට හැදෙන්න ඉඩ තියෙනවා. බුදුපියාණන් වහන්සේ සංවේගය මතුකරලා දුන්නට පස්සේ අර පුද්ගලයා තමන්ගේ අතීතයේ සංවේගකර අවස්ථාව සිහියට නඟාගෙන - තමන්ගේ මවත් අතහැරලා, ගෙයත් අතහැරලා ගියේ මේ විදිය දර්ශනයකින් කොයිතරම් සංවේගයක් ඇතිවද? ඒක අමතක වෙලා තිබුන එක මතක් වෙන්න ඇති. ඊළඟට අපාය භය ඇතිවුනා ඒ එක්කම. අපායභයත් සංවේගයත් එකතු වුනාට පස්සේ ඔන්න කරන්න තියෙන වැඩේ තේරුණා. දැන් ඉතින් හෙටම මරණය වෙයිද දන්නෙ නෑ. අදම මරණය වෙයිද දන්නෙ නෑ. ලොකු සංවේගයකින් අර පුද්ගලයා බුදුපියාණන් වහන්සේ යම් ධර්ම න්‍යායක් මතු කළා නම් ඒක අනුව හිත යොදන්න ඇති. කොහොම හෝ වේවා ඒ තත්ත්වයට පත්වුනා.

ඉතින් ඊළඟට අපි ආයෙත් එමු අර කතාවෙ මුල හරියට. ඒ කතාන්තරයෙ තියෙන්නෙ මිථ්‍යා ආජීවයක් බව අපි කවුරුත් දන්නවා. මාංස වෙළඳාම මිථ්‍යා ආජීවයක් වෙන්නෙ වසවිස වෙළඳාම, ආයුධ වෙළඳාම වාගේම සත්ත්ව හිංසාවට ඒක හේතුවන නිසා. සතුන් මැරීමට හේතුවන නිසා. ඒ එක පැත්තක්. ආජීවය වශයෙන් බලනකොට ඒ ගවඝාතකයා කෙලින්ම අපාය මාර්ගයට යොමු වෙලයි තියෙන්නෙ. ඊට අමතරව දැන් මේ මාංශ රසයට ඇතිවුන ඇල්ම ගැනත් කල්පනා කරන්න වටිනවා. මොකද? නොයෙකුත් විදියෙ තර්ක ඉදිරිපත් කෙරෙනවා. ඒ තර්ක ඉදිරිපත් කෙරෙන්නෙත් දිවෙනුයි. නමුත් අන්න ඒ **දිව** ගැන ටිකක් අපි හිතලා බලමු. මේ දිව

කියන එක බොහොම සංවේදී ඉන්ද්‍රියයක්. අපේ ශරීරයේ තියෙන ඉතාමත්ම සංවේදී ඉන්ද්‍රියයක් මේ දිව කියන එක. දැන් හොඳ රස ආහාරයක් ගැන කියන කොට රස ආහාරය නැතත් දිව අගට මොකද වෙන්නේ? කෙළ උනනවා නේද? අන්න ඒ විදියෙ දෙයක්. එතකොට ඒ තරම් සංවේදී ඉන්ද්‍රියයක් මේ දිව තුළ සැඟවිලා තියෙනවා. අතීත සංසාරයේදී අපි නොයෙකුත් ජාතිවල තිරිසනුන් වෙලා, යක්ෂ රාක්ෂසයින් වෙලා, රස කර කර මස් කාපු කර්ම වේග මේවායේ එකතුවෙලා තියෙනවා. ඒවා අවදි කරගන්න හොඳ අවස්ථාව තමයි මාංශය මේකට එකතු වීම.

මාංශ රසයත් එක්ක යන තව යාලුවෙක් ඉන්නවා. මත්පැන. ඔය දෙන්න එකට යනවනම් හුඟක් දුර යන්න පුළුවනි. සුරලෝකෙට හොර පාරකින් යන්න වුනත් ඇති. මාංශ රසයයි මත් රසයයි එකට යනකොට ආයි අඩුවක් නෑ. මෙතන මත් රසයක් නැතුවමයි මේ ගවඝාතකයා හොඳට නාලා කියලා ඇවිල්ලා හොඳට හිත තැන්පත්වුන අවස්ථාවෙයි අර තරම් කෲර දෙයක් කළේ. ඕකට මත් රසයත් එකතුවුනාම මොනව කරන්න බැරිද? එබඳු දේවල් කොතෙකුත් මේ සමාජයේ මේ පින්වතුන්ට අහන්න ලැබිලා තියනවා. ඒවා දැන් සාමාන්‍ය සිද්ධි බවට පත්වෙලා තියෙනවා. තරු පහේ හෝටල් ආදියෙ සත්ත්වෝද්‍යාන හෝටල් පිටිපස්සේ තියෙනවා. ඕන වෙලාවක සතෙක් තෝරා ගෙන ඕන හැටියට මේසෙට ගෙනැල්ලා ලුණු ඇඹුල් ඇතුව හෝ නැතුව හෝ - හැබැයි හැඳි ගෑරුප්පු සහිතව - අනුභව කරන්නේ. ඔය විදියට ගිහිල්ලා යම් කිසි අවස්ථාවක අතීත ම්ලේච්ඡ යුගයකට ආපසු යන විදියේ ජීවිත රටාවක් දැන් යනවා.. ඒ වගේම ආජීව ගැන හිතලා බලනකොට ඉතාමත්ම ලේසි ගොවිතැන තමයි සත්ත්ව ගොවිතැන, දැන් බොහොම සත්ත්ව ගොවිපොළවල්වල සත්ත්වයින් වපුරලා දිනගණනකදී කපා පාගා ගන්න - හොඳ අස්වැන්නක් ලබාගන්න - ක්‍රම විද්‍යාත්මකව දක්වලා තියෙනවා. ඉතින් ඒ විදියෙ ආජීවවලින් බොහොම ඉක්මණින් පොහොසත් වෙන්න පුළුවන්. හැම තැනින්ම ආධාර ලැබෙන්නෙ, හැමෝම කතා කරනව අහන්න ලැබෙන්නෙ, අන්න එබඳු අය ගැනයි. සමහරු පුදුමයට පත්වෙනව ඒ අය බොහොම දියුණු වෙනවා කියලා. මුදලින් එහෙම වෙන්න පුළුවන්. ගිහිල්ල වැටෙන්නෙ කොහෙද කියල අපි කල්පනා කරන්න ඕන.

ඉතින් අන්න ඒ හැම එකකටම, ඒ විදියේ ජීවිකාවලට අනුබලය ලැබෙන්නේ අපේ මේ දිවෙනුයි. අර කියාපු මස් රසයට තියන ලොල්බව නිසා අර තරම් කෲර දේවල් කරන්න පෙළඹෙනවා. ඒ වගේම මස් නැතිව කන්න බැරිකම. අර කුණු රහ නැතිව කන්න බැරි නිසාම ගව ඝාතකයට එහෙම නැත්නම් මස් වෙළෙන්දට අපේ අනුග්‍රහය දක්වනවා. ඒ ටික තමයි





ඔය ධර්මයෙන් කියලා තියෙන්නෙ. ප්‍රාණඝාත ශික්ෂාපදය හරියට රකිනවා නම්-

**පාණං න හානෙ**
**න ච ඝාතයෙය්‍ය**
**න චානුජඤ්ඤා**
**හනතං පරෙසං**

පරපණ නොනසන්නේය, නොනසවන්නේය, අනුන්ගේ පරපණ නැස්මට අනුදැන්මක්ද නොකරන්නේය. දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ - අපට ඒක කියන්න බෑ - කොයි ආකාරයෙන් නමුත් අපට මස් ඕන ආහාරයට. ඉතින් ඒක කොතනින් හරි ලබාගන්නත් ඕන. කොහෙන් හරි ලැබෙන්නත් ඕන. එච්චරයි. නමුත් ඔන්න ඔය මසට තියන කෑදරකම නිසා තමයි ඇත්ත වශයෙන්ම - අපට හිතාගන්න තියෙන්නෙ - මිථ්‍යා ආජීවයට මේ තරම් රුකුළක් ලැබිල තියන්නෙ. එතකොට තම තමන් කල්පනා කරල බලන්න ඕන විශේෂයෙන්ම ගවඝාතනය ගැන. බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා. "තයො රොගා පුරෙ ආසුං" ආදී වශයෙන් මුල් කාලයේ තිබුණේ රෝග තුනලු. ඉතාමත්ම ඈත අතීතයේ එහෙම කාල තිබුණ බව සඳහන් වෙනවා. දීඝ ආයුෂ්ක මනුෂ්‍යයින් හිටිය කාල ගැන මහ පුදුම දේවල් ධර්මයේ සඳහන් වෙනවා මේ ලෝක ධාතුව පිළිබඳව. බුද්ධ වචනය වශයෙන් බලනකොට අපට ඒවා පිළිගන්න සිද්ධ වෙනවා. මුල් කාලයේ මනුෂ්‍යයින්ට රෝග තුනලු තිබුනෙ. ආශාව,බඩගින්න, ජරාව. ඔච්චරයි තිබුනෙ. ඕනෑකම් තිබෙනවා, බඩගින්න තිබෙනවා, ජරාවට පත්වෙනවා ඔච්චරයි ලෙඩ. නමුත් ඕවා අනූ අටක් වුනාලු ගවයින් මරන්න පටන් ගත්තට පස්සේ. ඉතින් ගවයින් මරණ එක විශේෂයෙන්ම ඒ ඉන්දියාවේ කොහොමත් ඒ බමුණන් අතරෙ ඇත්ත වශයෙන්ම ගවයින් කියලා කියන්නේ - දැන් මේ කාලය අනුවත්, ඉන්දියාවෙ පරිසරය අනුව පමණක් නෙවෙයි මේ කාලෙ මනුෂ්‍යයින්ගෙ ජීවිතේ ගැන හිතල බැලුවත් - එළදෙන කියන්නේ කිරිමව්. සමහරවිට මවගෙන් බොන්න කිරි නෑ දැන් කාලයේ. මුල ඉඳලම සමහරවිට බොන්නෙ එළදෙනගෙ කිරි. එතකොට ඒ කිරිමව්. කිරිමව් මරන්න තරම් කෲර වෙන එක පුදුමෙකුත් නෑ, සමහර විට, අනිත් මවුත් මරණ නිසා මේ කාලයේ.

මේවායේ විපාක කොයිතරම්ද කියලා හිතන්න ඕන. ඒවාගේම ගවයා ඉතාම අහිංසක සතෙක්. ඒ ඔක්කොම බුදු පියාණන්වහන්සේ ධර්මයේ සඳහන් කරලා තියෙනවා. ගව ඝාතනය ඒ අතින් විශේෂයි. ධර්මයේත් සඳහන් වෙනවා ඈතා ගවයා ආදී සාමාන්‍යයෙන් දියුණු මනසක් ඇති

සතුන් මැරීම ඉතාමත්ම භයානකයි. එපමණකින් හිතන්න නරකයි මාලු කෑම හොඳයි කියල. ඇතැම් කෙනෙක් මස් කන්නේ නෑ මාලු කනව. මාලුවගේ මස් බව දන්නෙ නෑ. මාලුව කියන්නේ වෙනම සතෙක් එතකොට. මස් කියන්නේ හරකා ආදී ලොකු සතුන්ගේ - මාලුවගේ මස් නොවේ, මාලු කන්නේ. ඉතින් කොයිහැටි හෝ වේවා ඒ සංකල්පයෙ මුල තියෙන්නේ දිවෙයි. ඒ දිවම තමයි නොයෙකුත් විදියේ තර්ක ඉදිරිපත් කරන්නේ. ඕන්න ඔය විදියේ තත්ත්වයක් තියෙනවා. අපි කල්පනා කරන්න ඕන අපි යන්නෙ කොහාටද කියලා. එතකොට මේ ලෝකේ කොයි තරම් පුම්බල වගේ මහා දියුණුවක් ඇති වුනාට, හිටිගමන් ආයෙත් ගසාගෙන යනවා මුහුදු වතුර හරි ඇවිල්ලා. අර ඔක්කොම සමෘද්ධි ඇතිවුනාට පස්සේ හොඳට ලස්සනට පෙන්නලා - මාරයාගේ ස්වභාවයක් ඒක. උඩ දාලා ගහන්න වාගේ. ඉතින් කෝටිපතියෙක් දින ගණනකදී. අන්තිමට එක්කෝ මොකක් හරි භයානක අනතුරක් වෙලා, මාරක අනතුරක් වෙලා අර පුද්ගලයා මැරෙනවා. එක්කො පිටතින් අනතුරක් ඇවිල්ලා. එහෙම නැත්නම් ඇතුළතින් යම් කිසි බරපතල රෝග පීඩාවක්. හරියටම "කම්මසරික්ඛතා" කියලා කියන විදියෙ කර්මානුරූප රෝග. එබඳු ප්‍රවෘත්ති අපට කොතෙකුත් අහන්න ලැබෙනවා. මේ කාලයෙ පවා, භයානක අන්දමින් ගවඝාතනය කළ, සතුන් මැරීම කළ, කුකුළන් මැරීම කළ අය පවා තමන් කළ කෲර වදවලට, ඒවා මතක්වෙන, මතක්කරදෙන අන්දමේ රෝග පීඩාවලට භාජනය වෙලා විනාශයට පත්වෙනව. මේවා සමහර විට රහස් හැටියට හංගන්නත් උත්සාහ කරනවා මේ මිථ්‍යා ආජීවයට රුකුල් දීමට. නමුත් මේකයි සනාතන සත්‍යතාව කර්මයෙ.

**යාදිසං වපතෙ බීජං**
**තාදිසං හරතෙ ඵලං**
**කල්‍යාණකාරී කල්‍යාණං**
**පාපකාරීච පාපකං**

ඕන්න බුදු පියාණන් වහන්සේ දෙන ගොවිතැන. **කර්ම ගොවිතැන,** බුදුන් වහන්සේ මතු කරලා දෙන්නෙ. යම් ආකාරයකට වපුරනවා නම් ඒ ආකාරයට කපා පාගාගන්න ඕන. "කල්‍යාණකාරී කල්‍යාණං" - හොඳ දේ වපුරනවා නම් හොඳ දේ කපා පාගා ගන්න පුළුවන්. හොඳ අස්වැන්නක් ලබන්න පුළුවන්. "පාපකාරීච පාපකං" - පව්බීජ වපුරල හොඳ දේවල් ලබාගන්න බෑ කවදාවත්, ඒවගේ පෙනුනට. ඕන්න ඕකයි බුද්ධ වචනය. කර්ම චක්‍රයේ භයානකත්වය එයින් අපට පේනව. අපේ ජීවිකාව සකස්කර ගැනීම- ආජීවය සකස්කර ගැනීම - අපට අයිති දෙයක්. ආජීවය කියන





එක නිකං සිද්ධ වෙන්නෙ නෑ. ඒකට ලොකු උත්සාහයක් දරන්න ඕන. ඒක සම්‍යක් ව්‍යායාමය මතු කරගන්න උපකාර වෙනවා - සම්‍යක් ආජීවයට හිත යෙදීම. සම්‍යක් ආජීවය කියල කියන්නෙ හරි ජීවිකාව. ඇත්ත වශයෙන් කාටත් තියන ලොකුම ගැටළුව තමයි, මව්පිය ආරක්ෂාවෙන් මිදිල සමාජයට වැටුනට පස්සෙ තියන ප්‍රශ්නය තමයි, රක්ෂාව. මව් පිය ආරක්ෂාව නැතිවුනාට පස්සෙ තමන් රක්ෂාව කරන්න ඕන. මොකක්ද ඒකට ලේසි? ඉක්මණට පහසුවෙන් පොහොසත් වෙන්න පුළුවන් එකයි තෝරා ගන්නෙ. ඒවා ඕන්න ඉදිරිපත් කරනවා "ඇයි මේ තියෙන්නේ දවස් ගණනින් පුළුවන්." - නමුත් අන්න අරකයි කාරණය. **ඒ තමන් වපුරන එකම කපා පාගා ගන්න ලැස්ති වෙන්න ඕන.**

ඉතින් අන්න එහෙම නුවණින් කල්පනා කරන්නට ඕන, සමාජය දිහා බලලා. ඒ කෲරත්වයම තමයි - සතුන් කෙරෙහි දක්වන කෲරත්වයම තමයි - එකිනෙකා කෙරෙහි දන් දක්වන්නේ. දන් ඇතැම් අවස්ථාවල මනුෂ්‍යයින්ට හදිසියේ දැනගන්නට ලැබෙනවා තමන් මෙතෙක් කල් රසකරකර යම්කිසි භෝජන ශාලාවක ගත්තු ආහාරය මනුෂ්‍ය මාංශයක් බව. එතකොට ඉතින් වමනෙ දාලාවත් පිරිමහන්න බෑ. නමුත් තව ටික කලක් යනකොට ඒවා සාමාන්‍ය දේවල් බවට පත්වෙලා, අර අතීතයේ එකිනෙකා මරාගෙන කෑමේ ම්ලේච්ඡ ගතිය මතුවෙන්න පුළුවන්. ඇත්ත වශයෙන් අර ජනගහන ප්‍රශ්නය නම් තියෙන්නේ ඒක ඉතාමත්ම පහසුවෙන් විසඳාගන්න ක්‍රමය තමයි එකිනෙකා මරාගෙන කෑම. අතීතයේ වුනෙත් ඒකයි. අතීතයේ බොහෝදෙනාට ඒ ජනගහණ ප්‍රශ්නය තිබෙන්න නෑ. අන්න ඒ තරම් කෲරත්වයකට මනුෂයින්ගෙ සිත් යොමුවෙන්නෙ මේ පොඩි දෙයින්. දන් අර මනුෂ්‍යයාට එක බත්වේලක් කන්න බැරිවුනා මාංශරසය නැතිව. හැමදාම ඒක කාලත් ඒත් මදි. ඉතින් ඒ රසතෘෂ්ණාව ඇති වුනාට පස්සෙ කොහොම හරි - ඒක කොහොමද කියලා නෑ - **කොහොම හරි** ඒක ලැබෙන්න ඕන.

අන්න ඒක තුළින් තමයි ඊළඟට අනිත් ඒවාට පෙළඹෙන්නෙ. ඉතින් අපි ඒක කළේ නැතත් කවුරු හරි ලවා කරවාගෙන තර්කානුකූලව ඒකෙ වරදකුත් නැතෙයි කියලා රස කර කර වින්දනය කරනවා. නමුත් මේක තුළින් මේ සමාජයෙ එන්න එන්නම ගුණධර්ම පරිහානිය. ඒ වගේම ආර්ථිකය පිළිබඳව මේ යන රැල්ල. තමන් කල්පනා කරන්න ඕන නුවණින්, කොයි තරම් ආධාර දුන්නත්. ආධාර නොදියයුතු පැතිවලිනුත් ආධාර දෙනවා මේවාට. නමුත් අපට ඒවා ඕන නෑ. අපි අපේ අවංක ධර්මානුකූල ප්‍රතිපත්තිය පිහිට කරගෙන බුද්ධ වචනයට අනුව ජීවත් වෙනවා කියන ඒ

අධිෂ්ඨාන ශක්තිය - ඒකම තමයි ඒ ආජීවය රැකීමට ව්‍යායාමයක්, විශේෂ වීර්යයක් අවශ්‍යයි කියන්නේ. නොයෙකුත් දේවල් තියෙනවා අර හිතේ කෙලෙස් මතුවෙන ආකාරයට. ඒවාට ඉඩ නොදිය යුතුයි. එහෙම නැතිනම් කෙනෙකුට පුළුවන් ආයුධ වෙළඳාම කරන්න. වස විස වෙළඳාම කරන්න. ඒවායිනුත් ලොකුවට උපයාගන්න පුළුවන්. ඒවාත් මිථ්‍යා ආජීව හැටියට බුදුපියාණන් වහන්සේ දක්වලා තියෙනවා, ඒවාත් සත්ත්ව හිංසාවට හේතුවන නිසා.

මේ අනුව අපි කල්පනා කරන්න ඕන මේ හැම එකක් තුළින්ම, අපි මේ බුදුපියාණන් වහන්සේගේ ධර්මය ගැන කොතෙකුත් කතා කළත් ඒ අනුව ජීවත් වෙන්නේ නැත්නම්, කවදාවත් මෙයින් බලාපොරොත්තු වන ප්‍රතිඵල ලබාගන්න බෑ. එතකොට තමන්ගෙ එදිනෙදා ජීවන රටාව සකස්කර ගැනීමේ වගකීම තමන් සතුයි. ඒ ආජීවය පිළිබඳව වාගේම මාංශ රසය පිළිබඳ තියෙන ලොල්බව යම්කිසි අධිෂ්ඨානයක් තුළින් අතහැරිය යුතුයි. **තමන් යම් ප්‍රතිපත්තියක් රකිනව නම් ඒ ප්‍රතිපත්තිය තවත් ප්‍රතිපත්තියක් රකින්න ශක්තියක් වෙනව.** උපකාරයක් වෙනව. මත් පැනට ලොල් වුන පුද්ගලයාට ඒ මත් පැන් පිළිබඳ ආශාව අතහැරිය අවස්ථාවේ හිතට ලොකු ශක්තියක් ඇතිකරගන්න පුළුවන්. ඒක පිහිට කරගෙන ඉදිරියට යන්න පුළුවන් ධර්ම මාර්ගයේ. ඒ වගේම තමයි මේ කියාපු කාරණයත්.

එතකොට මෙන්න මේ ධර්ම කථාවලින් අපට පේනවා මේවායින් යන තැන. බුදු පියාණන් වහන්සේ දක්වලා තියෙනවා ප්‍රාණඝාත අකුසලයේ විපාක. ඒ ප්‍රාණඝාත අකුසලය ගැන කෙලින්ම කියනවා-"ලුද්දො ලොහිතපාණී" - බොහෝ රෞද්‍ර විදියට ලේ වැකුන අත් ඇතිව සතුන් මරමින් ජීවත්වුන පුද්ගලයා යන්නේ නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත යෝනිය, අසුර යෝනිය කියන ඔය හතරටයි. ඊ ළඟට යම් විදියකින් මනුෂ්‍ය ආත්ම භාවය ලැබුවත් අල්පායුෂ්ක වෙනවා කියල තියෙනවා. මේවාට නොයෙකුත් සාධක බුදුපියාණන් වහන්සේගෙන් පමණක් නොවෙයි මහා සෘද්ධිමත් මුගලන් මහරහතන් වහන්සේගෙනුත් ලැබිලා තියෙනවා. මීට කලින් අවස්ථාවලත් අපි මතක් කරල තියනවා, ඉතාමත්ම හොඳ සිද්ධියක් මේ ගවඝාතක කාරණය සම්බන්ධව.

එක් අවස්ථාවක මුගලන් මහරහතන්වහන්සේත් ලක්ඛණ මහරහතන් වහන්සේත් ගිජ්ජකූළ පව්වේ වැඩ වාසය කළා. එක දවසක්දා මුගලන් මහරහතන් වහන්සේ ලක්ඛණ හාමුදුරුවන්ට කිව්වා අපි රජගහනුවරට පිණ්ඩපාතේ වඩිමු කියලා. ඊළඟට ගිජ්ජකූළ පව්වෙන් බැහැගෙන යන අතරේ මුගලන් මහරහතන් වහන්සේ එක තැනකදී පොඩි හිනාවක් පහළ





කළා. මේ රහතන් වහන්සේලාගේ හිනාවල් ඉතාමත් අර්ථවත්. ලක්ඛණ හාමුදුරුවො ඇහුවා මොකද මේ හිනාවක් පහළ කළේ කියලා. ඒක බුදුපියාණන් වහන්සේ ඉදිරියෙදී අහන්න කිව්වා. මම දැන් කියන්නේ නැහැ කිව්වා. ඊළඟට පිණ්ඩපාතේ කරගෙන දානේ වළඳලා ඉවරවෙලා බුදුරජාණන්වහන්සේ ළඟට වැඩම කළා. එතනදී අන්න ලක්ඛණ හාමුදුරුවෝ මුගලන් මහරහතන් වහන්සේගෙන් අහන හැටියට අහනවා ඇයි අර දහවල් වෙලාවේදී ඔබ වහන්සේ මඳ සිනහාවක් පහළ කළේ කියලා. ඔන්න බුදුපියාණන්වහන්සේ ඇතුළු සංඝයා වහන්සේලා ඉදිරිපිට මුගලන් මහරහතන් වහන්සේ කාරණය හෙළිකරනවා.

"මම දැක්කා ගිජ්ජකූළ පව්වෙන් බහින අතරේ අහසින් යනවා ඇට සැකිල්ලක්. ඒ ඇට සැකිල්ලට ගිජුලිහිණියන්, කපුටන් උකුස්සන් ඉල ඇට අතරට අනිනවා. අර ඇටසැකිල්ල විලාපකියමින් අඬමින් පියාඹාගෙන යනවා. මට ඒ වෙලාවේ සිනාවක් පහළ වුනා මේ විදියේ සත්ත්ව ආත්ම භාව තියනවා නේ" කියලා. ඔන්න එතකොට ඒක කීවාම බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා සංඝයා වහන්සේලා ඉදිරියේ "මහණෙනි, මමත් ඔය පුදුම සත්ත්වයා දුටුවා දිවැසින්. නමුත් මම ඒක ප්‍රකාශ නොකළේ මම ඒක කිව්වට පස්සේ "කෝ අපට පේන්නෙ නෑ නේ" ඒ විදියට කියලා මා කෙරෙහි හිත දූෂ්‍ය කරගන්තා නම් ඒ අයට ඒක නරකට හිටිනවා. ඒකෙන් ඒ අයට අපාගාමී වෙන්නත් පුළුවන්, සමහර විට, බුදු පියාණන් වහන්සේ බොරු කියනවා කියලා. අන්න ඒක නිසයි, මම ඒක නොකිව්වේ. දැන් මට ශාක්ෂිකාරයෙක් හම්බ වෙලා තියෙනවා" කියලා. බුදු රජාණන් වහන්සේ ඒක කියන්න ආරම්භ කළෙත් මාගේ ශ්‍රාවකයින් ඇස් ඇතිව ජීවත්වෙනවා, නුවණ ඇතිව ජීවත් වෙනවා, මේ වගෙ දේවල් මට පමණක් නොවෙයි. මගේ ශ්‍රාවකයින්ටත් පේනවා" කියලා.

අන්න එතකොට බුදු පියාණන් වහන්සේ සාක්ෂි ඇතුව කිව්ව අර ඒ ඇට සැකිල්ලක් වාගේ ගියේ ගවඝාතකයෙක්ය කියල. මේ රජගහනුවරම හිටපු ගවඝාතකයෙක්. ඒ ගවඝාතක කර්මය හරියට කිරීමේ විපාක වශයෙන් **බොහෝ වර්ෂ ගණනක්, බොහෝ වර්ෂ සිය ගණනක්, බොහෝ වර්ෂ දහස් ගණනක්, බොහෝ වර්ෂ සියදහස් ගණනක් නිරයේ පැහිල** දැන් මේ ආත්ම භාවය ලබාගෙන සිටිනවා කියලා. එතකොට අර ගවයින්ගේ මස් හූරලා දාලා ඇට සැකිල්ල කොතෙකුත් ඔය මස්කඩවල දකින්න ලැබෙනව. අන්න ඒ ඇට සැකිල්ලක් වගෙයි දැන් මේ මනුෂ්‍යය. හැබැයි අර කුරුල්ලන් ආදී සතුන් අනින කොට විලාප කිව්ව ඒ ආත්ම භාවය. සාමාන්‍ය පියවි ඇසට පේන්නේ නැති පුදුම විදියේ ජීව, ආත්මභාව මේ ලෝකයේ තියෙනව. දිවැස් ඇති අයටයි පේන්නෙ.

ඒ විදියෙම තවත් කතාන්තරයක් ඒ එක්කම සඳහන් වෙනව. මස් වැදැල්ලක් අහසින් යනවා. ඒත් ගිජුලිහිණියන් කපුටන් අනිනවා. අර මස් වැදැල්ල කෑ ගහ ගහා අහසේ පියාඹනවා. මොකක්ද මේ මස්වැදැල්ල? ඒත් යම් කිසි සත්ත්ව ආත්මභාවයක්. අතීතයේ ගවඝාතකයෙක්. ඔන්න ඔය වාගේම කුරුලු ඝාතකයින් ආදීන් පිළිබඳව ප්‍රවෘත්ති රාශියක් ඒ එක්කම සඳහන් වෙනවා, සතුන් මැරීමේ විපාක වශයෙන්. එතකොට ඒ මෙලොව ප්‍රේත ආත්ම, යක්ෂ ආත්ම, වශයෙන් ලබන්නෙ ඒ කරපු කර්මයේ වල්ගකොන, අග කෙළවර - විපාකාවශේෂ. නියම විපාක විඳින්නේ නිරයේ. නිරාදුක් කල්ප ගණනක්, සියදහස් ගණනක් විඳල ඉවරවෙලයි ඒ ප්‍රේත ආත්ම භාවවල දිවැස් ඇති අයට පමණක් පේන ඒ තත්ත්ව ලබන්නේ. ඊටත් මෙහා ඇවිල්ලා තමයි මනුෂ්‍ය ආත්ම භාවය ලබලා - අපට ඉඳහිටල අහන්න ලැබෙනවා - යක්ෂයින් වගේ දරුවන් උපදිනවා, අංග විකල පුද්ගලයින්, අතපය නැතිව. තව ලෙඩරෝග අතීත කර්ම වේග අනුව, භයානක කර්ම වේග අනුව පුදුම අන්දමේ ලෙඩ රෝග ඇතිවෙනවා. ඕවා යට තියෙන්නෙ අන්න අර විදියේ කර්ම කියලා හිතාගන්න ඕන.

එතකොට ප්‍රාණඝාත අකුසලය ඉතාම බරපතල දෙයක්. ඒකයි ඒක පළවෙනි ශික්ෂාපදය හැටියට දක්වල තියෙන්නෙ. ඒකටම උපකාර වෙන දෙයක් තමයි සත්ත්ව හිංසාව. **ඒ හැම එකකටම මුල්වෙන්නෙ අර තිරිසන් සතාගෙ ස්වභාවය - තව එකෙක් ගිලදාන එක.** සතා මැරෙනකං ඉන්නෙ නෑ. ඇතැම් සතුන් ඉන්නවා - අපට දකින්නත් ලැබෙනවා- ඒ සතාගේ අවසාන දුක්ගැනවිල්ල ඇහෙන්නේ අනිත් සතාගේ බඩ ඇතුළෙන්. දැන් ඔය කබරු එහෙම සතෙක් ගිලිනකොට - සමහරවිට ගෙම්බන් එහෙම. අන්තිම හඬ ඇහෙන්නේ බඩ ඇතුළේදී. අන්න ඒ තරම් පණ පිටින් ගිලින සිරිත. ඒකයි බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නේ යමෙක් තිරිසන් ලෝකෙට වැටුනට පස්සේ ආයි ගොඩ එන එක හරිම අමාරුයි කියලා. මොකද හේතුව? තිරිසන් අපායෙ තත්ත්වය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ **"අඤ්ඤමඤ්ඤඛාදිකා එත්ථ වත්තති දුබ්බල ඛාදිකා"**තිරිසන් ලෝකයේ වැඩි කොටම තියෙන්නේ - හරකුන් වගේ සතුන් නොවෙයි - මස් කන සතුන් පිළිබඳව - අඤ්ඤමඤ්ඤඛාදිකා - ඔවුනොවුන් කා ගැනීම. ඒ වගේම "දුබ්බල ඛාදිකා" දුර්වලයා කා දමනවා. විශේෂයෙන් මුහුදෙ. මුහුදෙ සතුන් පිළිබඳව. ඒකට කියන්නේ මාත්‍ස්‍යන්‍යාය කියල. එකෙක් තව එකෙක් ගොදුරු කර ගන්නව. එතකොට මේ තත්ත්වයට මනුෂ්‍යයා යනව නම් ඒක මනුෂ්‍ය කමක් වෙන්නෙ නෑ.

ඇත්ත වශයෙන් දැන් ඒක රටාවක් වේගෙන යනවා. මළගිය සතකුගෙ මස්වලට වැඩි කැමැත්තක් නෑ. තිරිසන් සතුනුත් එහෙමයි. පණපිටින් ජීව





රුධිරයත් එක්කම ගොදුරු කරගන්න එකයි තිරිසන් සතාගේ සිරිත. දැන් ඉතාම අලුත් මෝස්තරය තමයි ඒක. සතෙක් අවසන් හුස්ම හෙළන්න කලින් ඒ සතාගෙන් ගන්න පුළුවන් මාංශය අරගෙන අපේ දිව පිනවන්න ඕන. ඒකයි අලුත්ම ක්‍රමය. ඔය හෝටල්වල එහෙම මැරෙනකං ඉන්නෙ නෑ. තම තමන්ම ඒවා කරගන්නවා. ඒකෙ අර හැඳිගැරුප්පු ආදී බාහිර ටික ඉවත් වෙනකොට ඇත්ත වශයෙන් මෙතන තියෙන්නේ අර ම්ලේච්ඡ යුගයට ආපසු ඒමක් තමයි. ඉතින් මේවා ගැන අපි නුවණින් කල්පනා කරන්න ඕන. අපි මේ ලොකු ලොකු ගැඹුරු දේවල් අල්ලනවා. නමුත් එදිනෙදා ජීවිතයේ මේ සාමාන්‍ය හැටියට පෙනෙන නමුත් බොහොම දුරයන මේ දුර්වලකම් හඳාගන්න උනන්දු වෙන්නේ නෑ. ඒ වෙනුවට නොයෙකුත් තර්ක ඉදිරිපත් කරලා එවායින් **"ඇඟ බේරගන්න"** හදනවා. ඇඟ බේරා ගත්තත් පින්වතුනි, **හිත බේරගන්න** බෑ. ඇඟත් අන්තිමට භයානක කර්මවලට හේත්තු වෙනවා, යම් අවස්ථාවක.

ඒක නිසා මේවා ගැන කල්පනා කරලා - මේ පින්වතුන් මේ වටිනා දවසේ යම් කිසි ශීලයක් සමාදන් වුනා. ශීලය කියල කියන්නෙ හීලෑකමයි. ඒ හීලෑකමට ඔය කියාපු කොයිවත් අයිතියි. සතුන් මැරීමෙන් වෙන්වෙනවා. සොරකම් කිරීමෙන් වෙන්වෙනවා. ඔය ආදී විරති- "වේරමණී" කියන වචනය නිරන්තරයෙන් මතක් කරගන්න ඕන. මේ ශික්ෂාපදයක වටිනාම වචනය තමයි "වේරමණී" කියන එක. වේරමණී කියලා කියන්නේ වෙන් වීම කියන එකයි. එතකොට, කිරීම පහසුයි වෙන්වීම අපහසුයි. අපහසු දේ කිරීම තුළින් තමයි- අන්න ඒ ශික්ෂණය තමයි - අපේ ජීවිත හැඩ ගස්සවා ගන්න උපකාර වෙන්නෙ. හීලෑකෙනෙක් වෙන්නෙ එතකොටයි. ඒකයි අර ඇතෙක් අශ්වයෙක් හීලෑ කරන්නෙ. ඇත් ගොව්වෙක්, අස් ගොව්වෙක් කොයිතරම් වෙර වෑයම් කරලද ඒ සතා හික්මවා ගන්නෙ? වල් සතෙක්. අපිත් එතකොට වෙන කෙනෙක් කිව්වටම නොවෙයි අපි අපිම හික්මෙන්න ඕන. ඒකට උපකාර වෙන්නෙ තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවයි.

බුදු පියාණන් වහන්සේ අපට දුක් දෙන්න කිව්ව නොවෙයි. අර කිව්ව හැටියට මේ දුකෙන් පෙළෙන සත්ත්වයාට ධර්ම චක්‍රයේ පිහිටෙන් දුක් කෙළවර කරගන්නයි බුදුරජාණන් වහන්සේ මේ ධර්ම චක්‍රය අපට මතු කරලා දුන්නේ. ඒකට අනුවයි මේ ශීලාදී ශික්ෂාපද. වදයක් හැටියට නොවෙයි. අපේම යහපත සඳහායි. අපේ යහපත කියන කොට මෙලොව යහපත පමණක් නොවෙයි. මෙතනින් කෙළවර වෙන්නෙ නෑ ජීවිතය. මෙතනින් කෙළවර වෙනවා නම් ජීවිතය, කොයි විදියට ජීවත් වුනත් කමක් නෑ. නමුත් බුදුපියාණන් වහන්සේ පමණක් නොවේ අතීතයේ

යෝගීන් පවා දක්වලා තියනවා අනන්ත කාලයක් අපි සංසාරයේ නොයෙකුත් ආත්මභාවවල ඉපදෙමින් මැරෙමින් යන බව. බුදුරජාණන් වහන්සෙ ප්‍රකාශ කරලා  තියනවා.

**න තං කම්ම කතං සාධු**
**යං කත්වා අනුතප්පති**
**යස්ස අස්සුමුඛො රොදං**
**විපාකං පටිසෙවති**

"යම් කර්මයක් කරලා ඒකට පසුතැවිලි වෙනවානම්, කඳුලු පිරි මුහුණින් අඬමින් එකේ විපාක විඳිනවා නම් ඒ කර්මය හොඳ කර්මයක් නොවෙයි. එතකොට ඇතැම් කෙනෙක් කියන්න පුළුවන්, "දැන් අපි මේ කර්මය කළාට, ඊළඟට ආත්මභාවයෙ අපි දන්නෙ නෑ නේ." අපි නොවෙයි නේ එතන. 'අපි' කතාව නෑ නේ. මතක නෑ නේ. එහෙම කියල බේරෙන්න බෑ. විඳින අවස්ථාවේ "අනේ! කොහොමද මේක වුනේ?" කියලා දන්නේ නෑ. ඒ වින්දනය තුළ තමන්ට දුකක් අයිති වෙනවා. ඒ දැන දැන කරපු නිසයි. යම් අවස්ථාවක නොදැන හෝ අහවලා කළයි කියලා දන්නේ නැතිව උනත් තමන්ට විඳින්න සිද්ධ වෙන්නෙ. ඉතින් අන්න ඒකයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නේ. දක්ෂ වෛද්‍යවරයෙක් ළඟට ගියාට පස්සේ තමයි අපට තේරෙන්නේ පොඩිකාලේ අපි දන්නේ නැතිව යම් කිසි  අගුණ දෙයක් කාලා තියෙනවා. ඒක මේ ඇවිල්ලා අන්තිමට සමහර විට මේ කාලේ ඔය කියන පිළිකා ආදී රෝගයක්. ඔන්න එතකොටයි අපට මතක් වෙන්නේ අනේ අපි මේ හොඳ රස ආහාරයක් අරගෙන තියෙන්නේ. පස්සේ මේ වෛද්‍යවරයායි කිව්ව මේ තත්වයට මේකයි හේතුව කියලා.

ඒවාගේ බුදු පියාණන් වහන්සේ ලෝකයාට පෙන්නුම් කරලා දෙනවා, දැන් මේ හොඳින් සනීපෙන් වගේ හිටියට, මේ ලෙඩේට ඕන කරන  යම් කිසි විෂ බීජයක් හිතේ තියෙනවා. ඒක ඉවත් කරන තුරු නිරෝගී වෙන්න බෑ. අන්න ඒ විදියට කල්පනා කරන්න ඕන. එතකොට අර නොයෙකුත් තර්ක විතර්ක වලින් 'නැවත උපන්නට ඒ අපි නොවේ' කියලා එහෙම බේරෙන්න බෑ. කර්මයේ විපාක හැටියට තමන්ට ඒ වගකීම ගන්න වෙනවා යම් අවස්ථාවක. ඒ විදියට කල්පනා කරල තමන්ගේ ජීවිකාව හරිගස්සාගන්න ඕන. අන්න අර මහලු ගවඝාතක පුත්‍රයා අවසාන අවස්ථාවෙ නියම පණ්ඩිතයෙක්. දැන් නම් පණ්ඩිතයා කියලා කියන්නෙ දැන උගත්කම්වලට. මෙතන පණ්ඩිතයා කියලා කියන්නේ දැන උගත්කම්වලට නෙවෙයි. දැන උගත්කම්වලට නොවෙයි මෙතන බුදුරජාණන්වහන්සේ





ඉක්මණින් උත්සාහ කරන්න කිව්වෙ. අන්න අර සිත පිරිසිදු කරගැනීම.**"නිද්ධන්තමලො අනඞ්ගණො" ඒකයි පණ්ඩිතකම. නියම පණ්ඩිතකම ඒකයි.**

එතකොට අන්න ඒ විදියෙ පණ්ඩිතයෙක් වෙන්නයි හැම දෙනාටම ආරාධනා කරන්නේ. **"ඛිප්පං වායම පණ්ඩිතො භව"** කියන ඒ පාඨය තමන්ගේ ජීවිතයට ආදර්ශ පාඨයක් කරගන්න වටිනවා මේ ගාථාවලට අනුව. දැන් මේ පින්වතුන්ට තම තමන්ගේ ජීවිකාව, එදිනෙදා දිවි පැවතුම්, සකස් කරගන්න උපකාර වන්නාවූ මේ ධර්ම චක්‍රයේ ඇති ආශ්චර්යවත් භාවය පෙන්නුම් කරන්නාවූ, ධර්ම දේශනාව තුළින් සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන නිවනට උපකාර වන ඉන්ද්‍රිය ධර්ම, බලධර්ම මතු කරගන්න හේතු උනානම් ඒ සියල්ල උපකාර කරගෙන කල්‍යාණමිත්‍ර ආශ්‍රයත් පිහිට කරගෙන ඉක්මණින්ම මේ සියලු ජාති ජරා ව්‍යාධි මරණාදි සංසාර දුකින් අත්මිදිල උතුම් අමා මහ නිවන - සෝවාන්, සකදාගාමි, අනාගාමි, අරහත් කියන මාර්ග ඵල ප්‍රතිවේධයෙන් ලබාගැනීමට මේ කුශල ශක්තිය ඒකාන්තයෙන් උපනිශ්‍රය වේවා කියල ප්‍රාර්ථනා කරගන්න. එසේම අවීචියේ සිට අකනිටාව දක්වාවූ යම්තාක් සත්ව කෙනෙක් ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුශලය අනුමෝදන්වීමට බලාපොරොත්තු වෙනවා නම් ඒ හැම කෙනෙක්ම මේ කුසලය අනුමෝදන් වීම තුළින් උතුම්වූ අමා මහ නිවන සාක්ෂාත් කරගනිත්වා! කියල ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**"එත්තාවතාව අම්හෙහි  .........."**